ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)

Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

දසත Dasatha 8 සංවත්සරය

Pages 52 NOVEMBEr 2016 Issue : 85 මාසික සංග්‍රහය. 2016 නොවැම්බර් 85 කලාපය 50 ¢




ජාත්‍යන්තර සූපවේදයේ විවිධ ඉසව් ගැඹුරින් හදාරමින් ජාත්‍යන්තරයේ ජය කෙහෙළි නැංවූ ප්‍රවීණ සූපවේදී දිමුතු පෙරේරා.

## CANADA - EU වෙළඳ ගිවිසුම

කැනඩාව සහ යුරෝපා සංගමය අතර ඓතිහාසික නිදහස් වෙළඳ ගිවිසුමක් අත්සන් කිරීමේ කටයුතු බෙල්ජියමේ බ්‍රසල්ස් නුවරදී පසුගිය ඔක්තෝබර් 30 දා සිදුකරනු ලැබුණි.

විස්තීර්ණ ආර්ථික හා වෙළඳ ගිවිසුම - The Comprehensive Economic and Trade Agreement, (CETA) ලෙස නම් කර ඇති මෙම ගිවිසුම යුරෝපා සංගම් මූලස්ථානයේදී, කැනඩාවේ අගමැති ජස්ටින් ටෲඩෝ, යුරෝපා කවුන්සිලයේ ප්‍රධානි ඩොනල්ඩ් ටස්ක්, යුරෝපා කොමිසමේ ප්‍රධානි ජීන් ක්ලෝඩ් ජන්කර් යන ප්‍රධානීන්ගේ මූලිකත්වයෙන් අත්සන් කෙරුණි.

මේ වෙළඳ ගිවිසුම අත්සන් කිරීමෙහි ඇති වාසි අවාසි තත්ත්වයන් පිළිබඳව කැනඩාව සහ යුරෝපා සංගමය අතර වසර 7 ක පමණ කාලයක් විවිධ සාකච්ඡා, කේවල් කිරීම් පැවති අතර ඒ සියල්ල මැද මේ ආකාරයෙන්

8 වන පිටුව බලන්න

## සෞඛ්‍ය ප්‍රතිපාදන අඩු වේ ?

කැනඩාවේ වෛද්‍ය සේවා පහසුකම් සැපයීම සඳහා වෙන් කෙරෙන මුදල් ප්‍රමාණය තවදුරටත් කප්පාදු කිරීම පිළිබඳව ෆෙඩරල් රජය සලකා බලමින් සිටී. ඒ පිළිබඳව වූ අනතුරු ඇඟවීම් ෆෙඩරල් රජය විසින් පළාත්බද අමාත්‍යවරුන් වෙත පසුගියදා සිදුකර තිබුණු අතර එහිදී පැවසුණේ සෞඛ්‍ය කටයුතු වෙනුවෙන් මේ වන විට වෙන් කරනු ලබන මුදලින් අඩක් පමණ කපා හැරීමට සිදුවිය හැකි බවයි. රටේ සෞඛ්‍ය කටයුතු සඳහා දෙනු ලබන මුදල් ප්‍රතිපාදන එසේ කප්පාදු කළහොත් ඩොලර් බිලියනයක පමණ මුදල් අඩුපාඩුවක් එම ක්ෂේත්‍රය තුළ ඇති විය හැකි බව සියලුම පළාත් පෙන්වා දී තිබුණි.

8 වන පිටුව බලන්න

Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative
RE/MAX Diamond Realty Inc., Brokerage

Tel: 416 822 2789
www.gaminiabeysinghe.com

Field Fresh Supermarket
好世界 大型超市
New Super Market in Scarborough
Now Hiring
Apply Today
All position need, fill soon
For All Departments
(Sea Food, Grocery, Bakery, vegitables, Fruits and Cashiers)
For inquiries, you may call
647 - 618 - 2068
647 -829 - 8788
You may also e-mail your application to
fieldfresh5661@gmail.com

තිසල් මුදල් හුවමාරුව
THISAL BUSINESS SERVICES INC
විශ්වාසවන්ත හා සුහදශීලී සේවයක් සමගින් ශ්‍රී ලංකාවට මුදල් යැවීමට පහසු මගක්
Registered office:
1315 Lawrence Ave. E, Suit #509 Toronto, ON, M3A 3R3
Tel: 416 546 4488
CASH

JOBS JOBS JOBS
TEAM LEASE
FULL TIME ALL shifts available
WE ARE LOOKING FOR
General Helpers, Forklift Operators and many more positions in the Etobicoke, North York, Aurora, Scarborough and Vaughan area.
Please call : 905 266 0973
Or come in Mon - Fri 8.30 am - 5.30 pm
4000 Steeles Ave. W Unit # 27
Woodbridge, L4L 4V9

# 2016 බසක වරුණි



## කැනඩා සිංහල සංගමය සංවිධානය කරනු ලබන

# සිංහල සාහිත්‍යය හා සංස්කෘතික උත්සවය

## දිනය - 2016 දෙසැම්බර් 03

## ස්ථානය - දොන් බොස්කෝ ශාලාව

**කැනඩාවේ වෙසෙන සිංහල භාෂක සමාජය වෙනුවෙන් කැනඩා සිංහල සංගමය විසින් සංවිධානය කරනු ලබන සිංහල සාහිත්‍ය හා සංස්කෘතික උත්සවය 2016 දෙසැම්බර් 03 වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.**

**එම විචිත්‍රවත් උත්සවයේ එක් ප්‍රධාන අංගයක් ලෙස සිංහල සාහිත්‍යය හා භාෂාව මුල් කොට ගත් තරඟාවලියක් සංවිධානය කෙරෙන අතර සිංහල සාහිත්‍ය නිර්මාණකරණයට උනන්දුවක් දක්වන කැනඩාවේ වෙසෙන ඕනෑම අයෙකුට මෙම තරඟාවලියට ඉදිරිපත් විය හැක.**

## සිංහල සාහිත්‍යය හා භාෂා තරඟාවලිය

### පද්‍ය, ගද්‍ය හා කෙටිකතා තරඟය

පද්‍ය රචනා තරඟය සඳහා තමන් කැමති ආකාරයකින් නිර්මාණය කරනු ලබන සඳැස් හෝ නිසඳැස් නිර්මාණයක් ඉදිරිපත් කළ හැකිය. ගද්‍ය රචනා තරඟය සඳහා නිර්මාණ පහත දී ඇති මාතෘකාවලට අනුව ඉදිරිපත් කළ යුතුය. කෙටිකතා තරඟය සඳහා තමන් කැමති ස්වතන්ත්‍ර කෙටිකතා නිර්මාණයක් ඉදිරිපත් කළ හැකිය.

### ජන ගායනා හා පද්‍ය ගායනා තරඟය

විරිඳු, පැල් කවි, ගොයම් කවි, කරත්ත කවි, පාරු කවි, නෙළුම් කවි, ජන ගී, ජන කාව්‍ය (යසෝදරාවත, වෙස්සන්තර කාව්‍ය, තුන්සරණ ආදි) පැරණි ප්‍රශස්ති ගී, ජන නාටක ගී ආදි කවර හෝ සිංහල ජන ගායනාවක් විනාඩි 03 කට නොවැඩි වන සේ සංගීත වාදනයෙන් තොරව විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ ගායනා කළ යුතුය. තරඟ කරුවන් **ඔක්තෝබර් 31** දිනට පෙර අයදුම් කළ යුතු අතර **නොවැම්බර්** මස ඇතුළත දැනුම් දෙන ස්ථානයකදී තරඟ පැවැත්වෙනු ඇත.

### කථික තරඟය

තරඟ කරුවන් **ඔක්තෝබර් 31** වෙනි දිනට පෙර අයදුම් කළ යුතු අතර නොවැම්බර් මස ඇතුළත දැනුම් දෙන ස්ථානයකදී තරඟ පැවැත්වෙනු ඇත. විනිශ්චය මණ්ඩලය විසින් ලබාදෙන මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන ක්ෂණික කතාවක් ඉදිරිපත් කළ යුතුය. වයස අවුරුදු 20 න් ඉහළ කථික තරඟය සඳහා අදාළ මාතෘකා අයදුම්පත් ලැබුණු පසු තරඟකරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

### තරඟ කොන්දේසි

- එක් අයෙකුට ඉදිරිපත් විය හැක්කේ උපරිම වශයෙන් තරඟ දෙකකට පමණි. එක් තරඟ කාණ්ඩයකට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
- එක් එක් තරඟය සඳහා වෙන වෙනම අයදුම්පත් ඒ සමග අමුණා එවිය යුතුයි.
- සියලුම අයදුම්කරුවන් **2016 ඔක්තෝබර් 31** වෙනි දිනට අදාළ වයස් කාණ්ඩයේ වයස සම්පූර්ණ කර තිබිය යුතුය.
- මෙහි දක්වා ඇති වගුවට අනුව ඔබ තෝරාගන්නා තරඟ අංකයට අදාළව අයදුම් පත්‍රය පුරවා ඔබගේ නිර්මාණය සමග **2016 ඔක්තෝබර් මස 31** වෙනි දිනට පෙර සිංහල සංගමය වෙත ලැබෙන්නට සලස්වන්න. කථික තරඟ සහ ජන ගායනා සඳහා ඉදිරිපත් වන්නන් **ඔක්තෝබර් මස 31** වෙනි දිනට පෙර අයදුම් පත්‍ර සිංහල සංගමය වෙත යොමු කරන්න.
- ඔබ සම්බන්ධ වී සිටින සිංහල භාෂා පන්තිය, ප්‍රජා සංවිධානය, දහම් පාසල, ආදි ශිෂ්‍ය සංගමය, ආගමික සිද්ධස්ථානය, ප්‍රජා සංවිධානය මගින් මෙන්ම පෞද්ගලිකවද තරඟ සඳහා ඉදිරිපත් විය හැක.
- ඔබගේ නිර්මාණ තැපැල් මගින් මෙන්ම ඊ-මේල් මගින්ද එවිය හැකි අතර අදාළ ලිපිනයන් පහත දක්වා ඇත. තැපැල් මගින් එවීමේදී ලියුම් කවරයේ වම් උඩු කෙළවරේ අදාළ තරඟයේ නම සහ අංකය සඳහන් කරන්න.
- නිර්මාණ සමග සම්පූර්ණ කර එවිය යුතු අයදුම්පත්‍රය කැනඩා සිංහල සංගමයේ ෆේස්බුක් අඩවියට පිවිස ඔබට ලබාගත හැක.

**www.facebook.com/CanadaSinhalaAssociation**

| තරඟ ඉසව් අංකය | වයස් සීමාව | අදාළ තරඟය | ගද්‍ය රචනා මාතෘකා | ගද්‍ය රචනා වචන ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | අවුරුදු 6 - 8 | පද්‍ය ගායනා තරඟය<br>කථික තරඟය | | |
| 2 | අවුරුදු 9 - 11 | පද්‍ය ගායනා තරඟය<br>ගද්‍ය රචනා තරඟය<br>කථික තරඟය | මගේ අම්මා | වචන 250 කට නොවැඩි රචනාවක් |
| 3 | අවුරුදු 12 - 15 | පද්‍ය ගායනා තරඟය<br>ගද්‍ය රචනා තරඟය<br>කථික තරඟය<br>ජන ගායනා තරඟය | මා දුටු කැනඩාව | වචන 500 කට නොවැඩි රචනාවක් |
| 4 | අවුරුදු 16 - 19 | පද්‍ය ගායනා තරඟය<br>ගද්‍ය රචනා තරඟය<br>කථික තරඟය<br>ජන ගායනා තරඟය | පරිසර සංරක්ෂණය හා මානව ප්‍රගතිය | වචන 750 කට නොවැඩි රචනාවක් |
| 5 | අවුරුදු 20 න් ඉහළ | කථික තරඟය<br>ජන ගායනා තරඟය<br>කෙටිකතා තරඟය | | |


**නිර්මාණ යොමු කළ යුතු තැපැල් ලිපිනය -**
The Secretary, Sinhalese Association of Canada.
102-5 Richgrove Drive, Toronto. On. M9R 0A3
**Email** - sinhala.sangamaya@gmail.com

**විස්තර සඳහා විමසන්න**
**ගාමිණී අබේසිංහ - 416 822 2789**
**යසන්ත නවරත්න - 416 522 5325**
**අනුර රණවීර - 416 720 2386**


**ප්‍රශස්ත මට්ටමේ කෙටිකතා පොතක් ලෙස මුද්‍රණය කිරීමට බලාපොරොත්තු වේ.**

**සිංහල සාහිත්‍ය උළෙල සහ සංස්කෘතික සංදර්ශනය**
**2016 දෙසැම්බර් 03 වන සෙනසුරාදා දොන් බොස්කෝ රඟහලේදී පැවැත්වේ.**

**www.facebook.com/CanadaSinhalaAssociation**

# සංක්‍රමණිකයන්ට පහසුකම් සැලසීම

පසුගියදා ප්‍රින්ස් එඩ්වඩ් දූපතේ පැවති ෆෙඩරල් සහ පළාත්බද ආගමන කටයුතු පිළිබඳ ඇමතිවරුන්ගේ හමුවකදී, වැඩිවන සිරියානු සරණාගතයින් සඳහා මූලික පහසුකම් සැපයීම පිළිබඳව ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ලක් කරනු ලැබුණි. කැනඩා සංඛ්‍යාලේඛන වාර්තාවලට අනුව 2015 ජූලි 01 වනදා සිට මේ වසරේ ජූලි 01 දා දක්වා වූ මාස 12 ක කාලය තුළ කැනඩාව වෙත පැමිණ ඇති සරණාගතයින් සංඛ්‍යාව 321,000 කි. වර්ෂ 1910 වැනි ඈත අතීතයේදී කැනඩාවේ බටහිර ප්‍රදේශ වෙත යුරෝපීය සංක්‍රමණිකයින් රැල්ලක් මෙන් පැමිණි අතර ඉන් පසු කාල වකවානුවකදී මෙතරම් සංක්‍රමණිකයන් සංඛ්‍යාවක් මෙරටට පැමිණි පළමු අවස්ථාව ලෙස මෙය හැඳින්වේ.

සාමාන්‍යයෙන් වාර්ෂිකව කැනඩාවට විශාල සංක්‍රමණිකයන් සංඛ්‍යාවක් පිළිගනු ලබන නමුත් මෙවර පැමිණ ඇති පිරිස ඒ සියලුම කඩඉම් ඉක්මවා ගොස් ඇත. පසුගිය වසරේදී ආරම්භ වූ සිරියානු සරණාගතයින් සඳහා වූ විශේෂ වැඩසටහන මේ තත්ත්වය ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් ඉවහල් වී ඇති අතර මේ වන විට 30,000 කට අධික සිරියානු සරණාගතයින් සංඛ්‍යාවක් සඳහා කැනඩාව දොරටු විවෘත කර ඇත.

මේ දෙආකාරයෙන්ම කැනඩාවට පැමිණි සංක්‍රමණිකයන් සඳහා ඉදුම් හිටුම් පහසුකම් ඇතුළු මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා රජය මේ වන විට බලවත් පරිශ්‍රමයක් දරමින් සිටී.

මෙහිදී රජය වෙත ඇති අභියෝග පිළිබඳ අදහස් දැක්වූ ෆෙඩරල් රජයේ ආගමන විගමන සරණාගත හා පුරවැසිභාවය පිළිබඳ අමාත්‍ය ජෝන් මැකලම් මෙසේ පවසා තිබුණි.

"සිරියානු සරණාගතයින් සඳහා පහසුකම් සැපයීම ආරම්භ කිරීමේදී කිසිදා අපේක්ෂා නොකළ ඇතැම් අභියෝගවලට අපට මුහුණ දීමට සිදුවුණා. විශේෂයෙන්ම මෙහි පැමිණි බොහෝ සරණාගත පවුල්වල අප බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා දරුවන් සිටීම නිසා ඔවුන්ට සුදුසු නිවාස සපයා දීමත් පාසල් යන වයසේ දරුවන්ට අවශ්‍ය පාසල් සොයා දීමත් ගැටලුකාරී වුණා"

මෙසේ කැනඩාවට පැමිණි සිරියානු සරණාගතයින් සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් ෆෙඩරල් රජය මෙන්ම පළාත්බද රජයයනුත් ප්‍රතිපාදන වෙන්කරනු ලැබුණි. එහිදී ඔවුන් වෙනුවෙන් භාෂා පුහුණුව, රැකියා පුහුණු කටයුතු සහ සමාජ ප්‍රතිෂ්ඨාධාර ගෙවීම් ( social assistance payments) ආදිය සඳහා ෆෙඩරල් රජය විසින් පහසුකම් සපයන අතර සෙසු සියලුම කටයුතුවල වගකීම පළාත්බද රජයයන් වෙත පැවරී ඇත.

කැනඩාවේ ආගමන විගමන නීතියට අනුව නොවැම්බර් 01 වන දින වන විට මැකලම් අමාත්‍යවරයා විසින් ලබන වසර සඳහා වන මෙරට ආගමන විගමන ඉලක්ක හෙළිදරව් කිරීම අත්‍යවශ්‍ය වූවකි. පසුගියදා පැවති පළාත්බද ආගමන විගමන අමාත්‍ය හමුවේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇතත් ලබන වසරට පිළිගන්නා සංක්‍රමණිකයන් සංඛ්‍යාව කොපමණදැයි යන්න ෆෙඩරල් ඇමතිවරයා විසින් හෙළිදරව් කොට නොමැත. ඒ සම්බන්ධයෙන් ඔහු මෙසේ පවසා ඇත.

"ලබන වසරේ කැනඩාවට පිළිගත යුතු සංක්‍රමණිකයන් ප්‍රමාණය පිලිබඳව පළාත්බද ආණ්ඩු සමග ඉතා පුළුල් ලෙස මා සාකච්ඡා කළා. එහෙත් අවසාන අංකය පැවසීමට මෙය සුදුසු කාලය නොවේ. නොවැම්බර් 01 දාට එය දැනගත හැකියි"

# වතුර බෝතලයට අලුත් නීති

අසුරන ලද පානීය ජල බෝතල් නිපදවන ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී වර්තමානයේ පවතින නීති රීති තවදුරටත් දැඩි කිරීමට ඔන්ටාරියෝව පියවර ගනිමින් සිටී. මෙහිදී ජල බෝතල් නියමිත ප්‍රමිතියට සකස් කිරීමේදී සැලකිය යුතු විද්‍යාත්මක සාධක කෙරෙහි දැඩි අවධානය යොමු කිරීමට අදහස් කෙරේ. විශේෂයෙන්ම නියං කාලවලදී දේශීය ජල සැපයුම් මත ජලය බෝතල් කිරීමේදී එම ක්‍රියාවලියේ සමුච්චිත බලපෑම පිළිබඳව මෙහිදී අධ්‍යයනය කෙරෙනු ඇත.

ලිබරල් රජය විසින් මේ පිළිබඳව කර ඇති නිවේදනයට අනුව, මහජනයා පරිභෝජනය කරන ජලය පිළිබඳව විනිවිද පෙනෙන ආකාරයේ සැලැස්මක් මෙම ආයතන වෙත තිබිය යුතු වෙයි. ඒ සඳහා සියලුම ජල බෝතල් සමාගම් තම වෙබ් අඩවි තුළ ඔවුන්ගේ ජල බලපත්‍රය පිළිබඳ සියලුම තොරතුරු ලැයිස්තුගත කොට ඉදිරිපත් කළ යුතු අතර සෑම සතියකම තත්‍ය පරිහරණ තත්ත්වය යාවත්කාලීන කළ යුතු වෙයි.

මේ වන විට සෑම ජල ලීටර මිලියන 1 ක් සඳහාම පළාත් රජය විසින් අයකරනු ලබන ඩොලර් 3.71 ක ගාස්තුව කඩිනමින් වැඩි කිරීමට රජය අදහස් කර නැති අතර මේ පිළිබඳව පවතින මූලාශ්‍ර පිළිබඳව තවමත් විමර්ශනය කරමින් පවතී.

වර්තමානයේ පවතින දේශගුණික විපර්යාසයන්ට එරෙහි සටනේදී පානීය ජල ගැටලු විසඳා ගැනීම ප්‍රධාන අවශ්‍යතාවක් බව ලිබරල් රජය පෙන්වා දේ. මේ පිළිබඳව විශේෂඥයින්ද තම අදහස් දක්වා ඇති අතර ඔවුන් පළ කර ඇති මතයන්ට අනුව අනාගතයේදී නියං ඇතුළු දරුණු කාලගුණ තත්ත්වවලට මුහුණ පෑමේ අවධානම දැඩි විය හැක. මෙවැනි තත්ත්වයන් තුළ ලිබරල් රජය විසින් යෝජනා කර ඇති වෙනස්කම් මහජනයා වෙත පානීය ජලය සුරක්ෂිතව සැපයීමේදී ඇතිවිය හැකි ගැටලු මගහැරවීමට උපකාරී වනු ඇතැයි විශ්වාස කෙරේ.

ටොරොන්ටෝ සිට කිලෝ මීටර 100 ක් පමණ බටහිර දෙසට පිහිටි වෙලින්ටන් ප්‍රදේශයට මේ වසරේදී ඇති වූ දැඩි නියං තත්ත්වයත් සමගම එම ප්‍රදේශයෙන් බෝතල් කිරීම සඳහා ජලය ලබා ගැනීම අඩු කිරීමට රජයට සිදුවිය. ඇතිවූ දරුණු නියං තත්ත්වය තුළ ජල බෝතල් සමාගම් එම කලාපයෙන් ලබාගත් ජල ප්‍රමාණය අඩු කළ අතර ජල පරිහරණයේදී (ගෙවතුවලට ජලය දැමීම, රථවාහන සේදීම ආදිය) සීමා කරන නියෝග ප්‍රදේශවාසීන්ට පනවා තිබුණි.

# මුඛය ආශ්‍රිත පිළිකා රෝගවල තියුණු වැඩිවීමක්

කැනේඩියානුවන් අතර මුඛය සහ උගුර ආශ්‍රිතව ඇතිවන පිළිකා රෝගයන්හි තියුණු වැඩිවීමක් දක්නට ලැබෙන බව කැනේඩියානු පිළිකා සංගමය අනාවරණය කොට ඇත. බොහෝ දුරට මුඛය ආශ්‍රිතව ඇතිවන එම පිළිකා සඳහා මානව පැපිලෝමා වෛසරය ප්‍රධාන හේතුවක් වී ඇති බව සංගමය පෙන්වා දේ.

1992 - 2012 ත් අතර කාලයේදී මේ වෛරසය නිසා මුඛය සහ උගුර ආශ්‍රිතව පිළිකා හටගත්තවුන් අතර ඉතා විශාල ඉහළ යෑමක් දක්නට ලැබෙන අතර පිරිමින් තුළ මෙම වෛරසය නිසා මුඛ ආශ්‍රිත පිළිකා පැතිරීම 2012 වන විට සියයට 56 නුත් කාන්තාවන් අතර සියයට 17 නුත් ඉහළ ගොස් ඇත. එම සංගමයේ ලේඛනවල ඇස්තමේන්තුගත වී ඇති සටහන්වලට අනුව 2012 වසරේදී මානව පැපිලෝමා වෛරසය නිසා පිළිකා හටගත් කාන්තා හා පිරිමි සංඛ්‍යාව 1335 කි. මින් 372 දෙනෙක් මියගොස් ඇත.

මේ අතර කාන්තාවන් අතර සීඝ්‍රයෙන් පැතිරෙන ගැබ් ගෙළ පිළිකාව වැළඳීම සඳහාද හියුමන් පැපිලෝමා - HPV වෛරසය හේතුවක් වී ඇති බව පිළිකා සංගමය පවසයි. මානව පැපිලෝමා වෛරසය නිසා හටගන්නා පිළිකා අතරින් තුනෙන් එකක්ම නියෝජනය වන්නේ ගැබ් ගෙළ පිළිකා රෝගී කාන්තාවන්ගෙනි.

මේ වන විට ලොව පුරා හියුමන් පැපිලෝමා වෛරසය අසාදනය වූවන් සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතින අතර මෙය ලිංගිකව බෝ වන වෛරසයක් වේ. බහු ලිංගික සේවනයේ යෙදෙන බොහෝ දෙනෙකු අතර මෙම වෛරසයට ගොදුරු වූවන් දක්නට ලැබෙන අතර නිසි ප්‍රතිකාර ලබාගැනීම තුළින් බොහෝ දෙනෙකු වසර 2 ක පමණ කාලයකදී වෛරසයෙන් ගැලවීමට සමත් වෙති. නමුත් ඇතැම් ආසාදිතයන් තුළ මෙම වෛරසය දිගින් දිගටම ක්‍රියාත්මක වී පවතින අතර මේ නිසා පසු කලෙක ඔවුන් පිළිකා රෝගයට ගොදුරු වීමේ අවදානමට මුහුණ දේ.

2016 වසරෙහි මේ දක්වා කැනේඩියානුවන් 4400 කට පමණ පැපිලෝමා වෛරසය ආශ්‍රිත පිළිකා වැළඳී ඇති බව සංඛ්‍යාලේඛන වාර්තාවල දැක්වෙන අතර ගැබ්ගෙල, ප්‍රජනක පද්ධතිය හා ගුදය ආශ්‍රිතව හටගත් පිළිකා ඒ අතර වේ. මොවුන් අතරින් 1200 දෙනෙකු මේ වන විට ඒ ආශ්‍රිතව හටගත් රෝගාබාධ නිසා මරණයට පත් වී ඇත.

කැනේඩියානුවන් පැපිලෝමා වෛරසයෙන් ආරක්ෂා කිරීම සඳහා මේ වන විට එන්නත් තුනක් හඳුන්වා දී ඇති අතර රට පුරා වයස අවුරුදු නවය සපිරුණු සෑම දැරියකටම පාසල් මට්ටමින් මෙම එන්නත ලබාගත හැක. ඔන්ටාරියෝ, මැනිටොබා, ඇල්බර්ටා, ක්‍යුබෙක්, නෝවා ස්කෝෂියා හා ප්‍රින්ස් එඩ්වඩ් දිවයින ආදි පළාත් 6 ක සිටින වයස අවුරුදු 9 සපිරුණු පිරිමි දරුවන් වෙතද මෙම එන්නත ලබා දීම මේ වන විට අරඹා ඇති අතර සෙසු පළාත් සඳහාද එය ව්‍යාප්ත කිරීමට රජය බලාපොරොත්තු වේ.

කාන්තාවන්ගේ ගැබ්ගෙල පිළිකාව කල් තියා හඳුනාගැනීමට විධිමත් පැප් පරීක්ෂණයක් මගින් හැකි වුවත් පිරිමින්ට බහුලව වැළඳෙන මුඛය සහ උගුර සම්බන්ධ HPV ආශ්‍රිත පිළිකා හඳුනාගැනීමට නිසි ක්‍රමවේදයක් නොමැත. මේ නිසා වඩාත්ම සුදුසු ක්‍රමය HPV වෛරසයෙන් බැහැරව සිටීම බව වෛද්‍යවරුන් පෙන්වා දේ.

'පිළිකා හට ගන්නා ඇතැම් තත්ත්වයන් ලිංගික පුරුදු නිසා ඇතිවන බව පිළිගැනීමට මිනිසුන් කැමති නෑ. ඒත් කණගාටුවෙන් වුවත් අප පිළිගත යුතු දෙයක් තියෙනවා. ඒ තමයි අප විසින් සිදුකරන ඇතැම් අයථා ලිංගික ක්‍රියාකාරකම් නිසා වැළඳෙන බොහෝ රෝගකෙළවර වන්නේ පිළිකා රෝගයෙන් බව' මොන්ට්‍රියල්හි මැක්ගිල් විශ්වවිද්‍යාලයේ පිළිකා රෝග අංශයේ ප්‍රධානී වෛද්‍ය Eduardo Franco පවසයි.

# මිනිසුන් 8 දෙනෙකු මැරූ හෙදිය !

මනුෂ්‍ය ඝාතන 8 ක් සිදුකිරීම සම්බන්ධයෙන් ඔන්ටාරියෝවේ සාත්තු සේවිකාවකට චෝදනා ගොනු කිරීමට පසුගියදා අධිකරණය පියවර ගෙන තිබුණි. එලිසබෙත් ට්‍රේසි නමැති 49 හැවිරිදි මෙම හෙදිය වසර 7 ක් පුරා වරින් වර මෙම ඝාතන සිදුකොට ඇති බව සනාථ වී ඇත.

ඔන්ටාරියෝවේ ලන්ඩන් හා වුඩ්ස්ටොක් නගරවල පිහිටි Caressant Care වැඩිහිටි සාත්තු නිවාසවල ලියාපදිංචි හෙදියක ලෙස කටයුතු කර ඇති ඇය එම නිවස්නවල සිටි වයෝවෘද්ධ පුද්ගලයන් ඝාතනය කර ඇත්තේ ඔවුන් වෙත ඖෂධ අධිමාත්‍රාවලින් ලබා දීමෙනි. ඇය විසින් එසේ ඝාතනය කරනු ලැබූ පුද්ගලයන් 8 දෙනා වයස අවුරුදු 75-96 ත් අතර පසුවූවෝ වෙති. ඇය විසින් මෙම ඝාතන සියල්ල 2007-2014 අතර කාල සීමාවේදී සිදුකොට ඇති බව හෙළිදරව් වී ඇත.

මේ සිදුවීම් පිළිබඳව අදහස් දැක්වූ එම සාත්තු නිවාස ජාලයේ ප්‍රකාශකවරයා පවසා ඇත්තේ මෙම හෙදිය මීට වසර දෙකහමාරකට පමණ පෙර එම ආයතනයේ සේවයෙන් ඉවත් වී ගොස් ඇති බවයි. එහෙත් තම නිවාසවල සිටියදී මෙම කණගාටුදායක ඉරණමට මුහුණ පෑ වැඩිහිටියන්ගේ ඥාති හිතමිත්‍රාදීන් වෙත තම ආයතනයේ බලවත් ශෝකය පළ කරන බව එහිදී ඔහු ප්‍රකාශ කර තිබුණි.

මෙම හෙදිය මෙවැනි සාපරාධී ක්‍රියාවකට සම්බන්ධ බවට පළමු තොරතුර පසුගිය සැප්තැම්බරයේදී ලැබී ඇති බව පැවසෙන අතර මේ පිළිබඳව පොලිස් පරීක්ෂණ තවදුරටත් සිදුකෙරෙමින් පවතින නිසා වැඩිදුර තොරතුරු හෙළිදරව් කොට නැත. මේ වන විට හෙළිදරව් වී ඇති මනුෂ්‍ය ඝාතන 8 ට අමතරව ඇය තවත් ඝාතන සිදුකර ඇත්ද යන්න පිළිබඳව සොයා බැලීමට පුළුල් පරීක්ෂණ මේ වන විට අරඹා ඇත.

Caressant Care වැඩිහිටි නිවාස ජාලය ඔන්ටාරියෝව තුළ වැඩිහිටි නිවාස 15 ක් පවත්වාගෙන යන අතර එම නිවාසවල ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 1250 ක් පමණ රැකවරණය ලබති. ඔන්ටාරියෝවේ පවතින සමස්ත වැඩිහිටි නිවාස සංඛ්‍යාව 630 ක් පමණ වන අතර ඒවායෙහි ජීවත් වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සංඛ්‍යාව 77,000 ඉක්මවති.












## ටොරොන්ටෝ මහා විහාරයේ කඨින පූජෝත්සවය

ටොරොන්ටෝ මහා විහාරස්ථානයේදී වාර්ෂික කඨින පූජෝත්සවය විහාරාධිපති අතිපූජ්‍ය අහංගම රතනසිරි නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේගේ අනුශාසකත්වයෙන් ඔක්තෝම්බර් 22 සහ 23 යන දෙදින පුරා ඉතාමත් අලංකාරවත් අන්දමින් පවත්වන්නට යෙදුණි.

මෙවර කඨින පිංකමෙහි දායකත්වය දරනු ලැබුවේ,

පුබුදු සහ මංජුලා ආරියරත්න, ඩොන් සහ දිල්ලා පෙරේරා, බොනී සහ තුෂාරි ලොකුගේ, රන්ජිත් සහ සුමිත්‍රා තිසේරා, තිස්ස සහ සුමිතා ආරච්චි, ගාමිණී සහ දයා කොලොන්න, ප්‍රියන්ත සහ කල්‍යානි ගුණරත්න විසිනි.











# ඖෂධ වර්ග 48 ක මිල පහළට

ශ්‍රී ලංකාවේ අලෙවි කෙරෙන ඖෂධ වර්ග 48 ක මිල අඩු කිරීම සඳහා වන ගැසට් නිවේදනය ජාතික ඖෂධ ප්‍රතිපත්තිය යටතේ පසුගිය ඔක්තෝබර් 21 වෙනිදා නිකුත් කෙරුණි.

ඖෂධ මිල සූත්‍රයට අනුව ක්‍රියාත්මක කෙරුණු මෙම මිල අඩු කිරීම් ශ්‍රී ලංකාවේ සියලුම ඖෂධ වෙළඳසල් සඳහා වලංගු වේ. බෙහෙත් මිල අඩු කිරීමේ ගැසට් නිවේදනයට අනුව බෙහෙත් වර්ගවල මිල ඉහල සීමාවන් එම බෙහෙත් වර්ගවල වෙළඳ හා ඖෂධීය නාමයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා වැඩි මිලකට ඖෂධ විකිණීම තහනම් වේ. යම් ඖෂධ වෙළඳසලක් මෙම ඖෂධ වර්ග වැඩි මිලට විකුණුව හොත් ඔවුනට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමටද මෙම ගැසට් නිවේදනයෙන් නීතිමය බලය පැවරී ඇත. එසේ වැඩි මිලට ඖෂධ විකුණන ඖෂධ වෙළඳ සල් වැටලීම සඳහා පාරිභෝගික අධිකාරිය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශයට බලය පැවරී ඇත.

දියවැඩියාව, අධිරුධිර පීඩනය, හදවත් රෝග, කොලෙස්ටරෝල්, අපස්මාරය, ඇදුම, ආතරයිටීස්, මානසික රෝග සඳහා භාවිත කරන ඖෂධ, වේදනා නාශක, ඇතැම් ප්‍රතිජීවක ඖෂධ වැනි රෝග රැසක් සඳහා නියම කෙරෙන ඖෂධ වර්ග 48 ක් මෙම මිල අඩු කිරීමට යටත් වී ඇත. මෙම සියලුම ඖෂධ ශ්‍රී ලංකාව තුළ බහුලව භාවිත වන ඒවා වන අතර එම 48 අතරින් මුලින්ම සඳහන් ඖෂධ 24 හි මිල අඩුකිරීමෙන් පමණක් රටේ ජනතාවට වසරකදී ඉතුරු වන මුදල රුපියල් කෝටි 450 ක් පමණ වෙතැයි පැවසේ.

මෙම ඖෂධ වර්ග අඩු කිරීමේ වාසිය ඔක්තෝබර් 24 වෙනිදා සිට ජනතාවට ලබා දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යවරයා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට නියෝග කරනු ලැබ ඇත. ඒ අනුව රට පුරා පිහිටි රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට අයත් ඔසුසල් 32 කින් සහ නියෝජිත ඔසුසල් 130 කින් අඩු කළ මිලට ඖෂධ ලබාගැනීමේ අවස්ථාව ජනතාවට ලැබේ.

මෙම ඖෂධ වර්ග 48 ට තොග වශයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ රැස්කර තබා ඇති බවත් එම ඖෂධ ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත බවත් එහි කළමණාකාර අධ්‍යක්ෂවරයා පවසා සිටියි.

මේ අතර ඖෂධ මාපියාව විසින් රට තුළ ඖෂධ හිඟයක් ඇති කළහොත් ඊට මුහුණ පෑම සඳහා අවශ්‍ය ඖෂධ තොග වශයෙන් ආනයනය කොට රැස් කර තබා ගන්නා ලෙස රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට සහ වෛද්‍ය සැපයුම් අංශයට දැනුම් දී ඇත. ජාතික ඖෂධ ප්‍රතිපත්තිය යටතේ ඖෂධ මිල ගණන් අඩු කිරීම තව දුරටත් සිදු කිරීමට නියමිතව ඇති අතර මෙහි දෙවන අදියරේදී අධික මිල ගණන් යටතේ අලෙවි කරන ඖෂධ වර්ගවල මිල අඩු කිරීමට නියමිතව ඇත.

# ත්‍යාගශීලීන් අතර 5 වෙනි තැන ලංකාවට

රටවල් 140 ක් සම්බන්ධ කරගනිමින් සිදුකරනු ලැබූ CAF World Giving Index, සමීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව ලොව සිටින ත්‍යාගශීලීන් අතර 5 වෙනි තැන ලබාගැනීමට ලංකාව සමත් වී තිබේ.

ශ්‍රී ලංකාවේ සමස්ත ජනතාව අතරින් සියයට 61 ක් නාඳුනන අයට වුවත් උදව් උපකාර කිරීමට සූදානම්ව පසුවන්නන් බවත්, සියයට 61 ක් තමා සතු මුදල් වුවත් පරිත්‍යාග කිරීමට සූදානම් වූවන් බවත්, සියයට 49 ක් අන් අය වෙනුවෙන් තම කාලය ශ්‍රමය ස්වේච්ඡාවෙන්ම සැපයීමට ඉදිරිපත් වන්නන් බවත් එම වාර්තාව හෙළිදරව් කර සිටී.

ලෝක ත්‍යාගශීලී දර්ශකයේ පළමු ස්ථානය මියන්මාරයට හිමි වී ඇති අතර ඉහත කරුණු සඳහා පිළිවෙළින් ඔවුන් ලබාගෙන ඇති ලකුණු ප්‍රතිශතය සියයට 63, 91 සහ 55 ලෙස දර්ශකයේ දැක්වේ. දෙවන ස්ථානයට ඇමරිකා එක්සත් ජනපදයත්, තෙවන ස්ථානයට ඕස්ට්‍රේලියාවත්, හතරවන ස්ථානයට නවසීලන්තයත් පත් වී ඇත.

මෙම දර්ශකයේ කැනඩාව හිමිව ඇත්තේ හයවන ස්ථානයයි.

# ප්‍රවෘත්ති නියාමනයට කමිටුවක් !

'ප්‍රවෘත්ති කියන්නේ මොනවද? සදාචාරය කියන්නේ මොකක්ද? ආචාර ධර්ම කියන්නේ මොකක්ද? කියා මතක් කර දීමට සිදුව ඇති බව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් රංග කලන්සූරිය මහතා පවසා සිටියි. තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳ මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා පසුගියදා පැවති මාධ්‍ය වැඩමුළුවකදී ඒ මහතා මේ අදහස් පළ කොට ඇත. මාධ්‍ය ආයතන තුළ ඇති තරගකාරිත්වය නිසා මාධ්‍ය ආචාර ධර්ම කඩ කරමින් කටයුතු කරන බවද මෙහිදී අධ්‍යක්ෂ ජනරාල් වරයා පවසා තිබුණි.

මේ කරුණු සියල්ල සලකා බැලීමේදී ඉතාමත් ඉක්මනින් ප්‍රවෘත්ති නියාමනය පිළිබඳ ස්වාධීන කොමිසමක් ගෙන ඒමේ අවශ්‍යතාවක් පවතින බව ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙන්වා දී ඇත. ස්වාධීන කොමිසමක් යනු ආණ්ඩුවෙන් පත් කරන කොමිසමක් නොවන බවත් මෙම ප්‍රවෘත්ති නියාමන කොමිසම පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායකයෙන් පත් කරන කොමිසමක් බවත් ඔහු අවධාරණය කර සිටී.

# මත් ජාවාරම අඩපණ කරන්න බුද්ධි ඒකකයක්

ශ්‍රී ලංකාවේ මහා පරිමාණයෙන් සිදුකරන මත්ද්‍රව්‍ය ජාවාරම සම්පූර්ණයෙන්ම මැඩලීම සඳහා අන්තර් ආයතන බුද්ධි ඒකකයක් ස්ථාපිත කිරීමට නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

ත්‍රිවිධ හමුදාව, පොලිසිය, විශේෂ කාර්ය බලකාය, රේගුව, ආගමන විගමන හා සිවිල් ආරක්ෂක බලකාය ආදියෙන් තෝරාගත් බුද්ධි නිලධාරීන්ගේ එකතුවෙන් මෙම විශේෂ බුද්ධි ඒකකය පිහිටුවීමේ මූලික කටයුතු මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින බව වාර්තා වේ.

මත්ද්‍රව්‍ය බුද්ධි ඒකකය මගින් රැස්කරන තොරතුරු හරහා දැවැන්ත මෙහෙයුම් ක්‍රියාත්මක කොට රට පුරා ව්‍යාප්තව ඇති මත්ද්‍රව්‍ය ජාවාරම අඩපණ කිරීමට අදහස් කෙරේ. මෙම විශේෂ බුද්ධි ඒකකය මීට මාස තුනකට පෙර පිහිටුවා ඇති අතර එම බුද්ධි තොරතුරු ඒකකයට සම්බන්ධ කර ගනිමින් අනාගතයේදී ජාත්‍යන්තර බුද්ධි ඒකකයක්ද පිහිටුවීමට බලාපොරොත්තු වන බවද පැවසේ. ගුවන් ගමන් හරහා මෙන්ම වරාය හරහා විශාල මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ගෙන එනු ලබන අතර මීට අමතරව විවිධ මුහුදු මාර්ග ඔස්සේද රට තුළට මත්ද්‍රව්‍ය ගෙන එනු ලබයි. මේ විවිධ ආකාර ඔස්සේ රට තුළට මත්ද්‍රව්‍ය ගෙන ඒම වැළැක්වීම සඳහා මත්ද්‍රව්‍ය මෙහෙයුම් කටයුතු දිගටම ක්‍රියාත්මක වුවත් ඒ සියල්ලටම වඩා වෙනස් ආකාරයකින් මෙවර මෙහෙයුම් කටයුතු සිදුකිරීමට විශේෂ බුද්ධි ඒකකය කටයුතු කරනු ඇත.

2020 වසර වන විට රටේ මත්ද්‍රව්‍ය ජාවාරම මුළුමනින්ම අඩපණ කිරීමේ ඉලක්කය මූලික කරගනිමින් මෙම නව වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම රජයේ අරමුණයි.

# සීනිවලින් ස්වයංපෝෂිත රටක් !

ශ්‍රී ලංකාව තුළ සීනි නිෂ්පාදනය වැඩි කොට සීනිවලින් ස්වයංපෝෂිත රටක් බිහිකිරීම සඳහා අවශ්‍ය පියවර මේ වන විට ගනිමින් සිටින බව වාර්තා වේ. ඒ අනුව සීනි නිෂ්පාදනයට මූලිකව අවශ්‍ය වන උක් වගාව ප්‍රවර්ධනය කිරීමටත් සීනි කර්මාන්ත ශාලා 15 ක් ස්ථාපිත කිරීමට කටයුතු සම්පාදනය කර ඇතැයි සඳහන් වේ.

දිගු කාලීන සහ මැදි කාලීන ලෙස ක්‍රියාත්මක වන මෙම දෙයාකාර වැඩ පිළිවෙළෙහි පළමු අදියර යටතේ 2020 වන විට රටේ සමස්ත සීනි අවශ්‍යතාවයෙන් සියයට 50 ක් දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමට අදහස් කෙරේ. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇතැයි පැවසේ.

මේ වන විට ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්ත ශාලා 04 ක් ක්‍රියාත්මකව පවතින අතර මෙම කර්මාන්ත ශාලා මගින් සීනි මෙට්‍රික් ටොන් 56,000 ක් පමණ වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලැබෙයි. මෙය රටේ වාර්ෂික සීනි පරිභෝජනයෙන් සියයට 8 ක පමණ ප්‍රමාණයක් වන අතර ලංකාවේ වාර්ෂික සීනි පරිභෝජන අවශ්‍යතාව මෙට්‍රික් ටොන් හත් ලක්ෂයක් පමණ වේ. මෙම පරිභෝජන අතිරික්තය පිරවීමට වාර්ෂිකව ලංකාවට තොග වශයෙන් සීනි ආනයනය කිරීමට සිදුවී ඇති අතර එයින් විදේශ කරා ඇදී යන මුදල් ප්‍රමාණයද ඉතාමත් අධික වී ඇත.

# ආහාර වර්ග 74 ක් වැට් බද්දෙන් නිදහස්

හාල්, තිරිඟු පිටි, තිරිඟු පිටි ආශ්‍රිත නිෂ්පාදන, සීනි, පරිප්පු ආදි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 74 ක් වැට් බද්දෙන් නිදහස් කර ඇත. ඔක්තෝබර් 26 වෙනිදා වැට් බදු පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් මුදල් අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කර තිබුණි. සෞඛ්‍ය, නිවාස, රෝහල්, ස්මාර්ට් ෆෝන් ආදියද වැට් බද්දෙන් නිදහස් කරන ලද බව එහිදී ඇමතිවරයා පැවසීය.

රටේ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය සපයන කුඩා ව්‍යාපාරද මෙවර වැට් බද්දෙන් නිදහස් කර ඇති අතර ඔවුන් වැට් ගෙවූ පුද්ගලයන් ලෙස සැලකේ. සියයට 11 ක්ව තිබූ වැට් බද්ද සියයට 15 දක්වා වැඩිකිරීමෙන් රටේ සාමාන්‍ය ජනතාවගේ ජීවන වියදමට බලපෑමක් සිදු නොවන බව මෙහිදී අමාත්‍යවරයා පවසා ඇත. මේ ආකාරයට වැට් බද්ද ඉහළ දැමුණේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හෝ වෙනත් කිසිවකුගේ වුවමනාවක් නිසා නොවන බවත් පසුගිය රජය කාලයේ සිදුකර ඇති නාස්තිකාර වියදම් නිසා රට තුළ ඇති වූ ණය බර පියවීමට මෙම පියවර ගත් බව ඇමතිවරයා පවසයි.

මේ ආකාරයට වැට් බද්ද වැඩිකිරීමෙන් මේ වසරේදී රුපියල් කෝටි 180 ක් උපයාග ැනීමට රජය අපේක්ෂා කරයි.

මේ අතර පසුගියදා සිදුකරන ලද වැට් බදු සංශෝධනය එනම් මෙතෙක් සියයට 11 ක්ව තිබූ වැට් බද්ද සියයට 15 ක් දක්වා වැඩි කිරීම ඔක්තෝබර් 26 වෙනිදා මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වේ.

# වෛද්‍ය හිඟය උග්‍රයි !

සැත්කම් සිදුකිරීමේදී ඒ සඳහා අත්‍යවශ්‍ය සේවාවක් වන නිර්වින්දන වෛද්‍යවරුන්ගේ සහ සැත්කමින් පසු රෝගීන් අධීක්ෂණය කළ යුතු දැඩි සත්කාර ඒකක විශේෂඥ වෛද්‍යවරුන්ගේ දැඩි හිඟයක් පවතින බව ශ්‍රී ලංකාවෙන් වාර්තා වේ.

රජයේ රෝහල්වල දිනපතා සිදුකරන ශල්‍යකර්ම සඳහා නිර්වින්දන සහ දැඩි සත්කාර ඒකක වෛද්‍යවරුන් 300 ක් පමණ සිටිය යුතු වුවත් ඒ සඳහා වෛද්‍යවරුන් අඩකටත් අඩුවෙන් සිටින බව පැවසේ. ශ්‍රී ලංකා නිර්වින්දන හා දැඩි සත්කාර විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය පවසන ආකාරයට මෙම සේවාවන් සඳහා දැනට සිටින්නේ වෛද්‍යවරුන් 130 ක් පමණකි.

පවතින තත්ත්වය මත රට පුරා රජයේ රෝහල්වල සිදුකරන හදවත්, ස්නායු, ප්‍රසව ඇතුළු ප්‍රධාන සැත්කම් සිදුකෙරෙන්නේ දැඩි අසීරුතා මත බව එම සංගමයේ සභාපති වෛද්‍ය කණිෂ්ක ඉන්ද්‍රරත්න මහතා පවසා සිටී.

නිර්වින්දන සේවාව සඳහා පවතින වෛද්‍ය හිඟය නිසා ශ්‍රී ලංකාවේ විවිධ ශ්‍රේණිවලට අයත් වෛද්‍යවරුන් 410 දෙනෙකු පමණ නිර්වින්දන වෛද්‍යවරුන් ලෙස කටයුතු කරමින් සිටින බව අනාවරණය වී ඇති බව ඒ මහතා සඳහන් කර ඇත. මෙතරම් දැඩි හිඟයක් ඇතත් මේ වන විට මෙම සේවාවන් සඳහා පුහුණුව ලබමින් සිටින්නේ 24 දෙනකු පමණක් බවද ඔහු පවසයි.

Dasatha

2016 නොවැම්බර් November 2016

Published by Dasatha Publications
Publisher - Gamini Abeysinghe
Consultant Editors - Sirisena Vithanage
Editor in Chief - Chamari Abeysinghe
Associate Editors - Nandana Prasadh
Graphic Design & Layout - Sampath Ranaweera
Creative graphics - Jagath Hewapanna
Web Master - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the [financial] support of the Government of Canada.
«Nous reconnaissons l'appui [financier] du gouvernement du Canada'
www.canada.ca

# අදූරදර්ශී දේශපාලන ගමන් මග වෙනස් කරමු.....?

වර්තමානයේ අප විදේශගතව සිටියද අපි නිරතුරුවම අප ඉපදුණු හැදුණු වැඩුණු මවුබිම ගැන, මවුබිමේ අපේ නෑසියන් ගැන සිත යොමු කරන්නෙමු. අප මෙහි කෙබඳු සුවපහසුකම් භුක්ති විඳිමින් සිටියද මවුබිමේ අපේ අය විඳින දුක් ගැහැට නිරතුරුවම අපේ සිහියට නැගෙන්නේය.

අපේ මවුබිම පිළිබඳව මවුබිමෙන් බැහැරව සිටින අප තුළ ඉමහත් අභිමානයකුත් ඒ ආකාර වූම කණගාටුවකුත් ඇති වන්නේය. අභිමානයට තුඩු දී ඇත්තේ අප රටේ අභිමානවත් අතීතයයි. කණගාටුවට තුඩු දී ඇත්තේ වර්තමානයයි. අපේ මවුබිම වෙනුවෙන් මේ සටහන තබන්නට අදහස් කළේ මේ හේතුවෙනි.

1948 දී අධිරාජ්‍යවාදීන්ට යටත්ව තිබී නිදහස ලත් තැන් පටන් මේ වන විට වසර 69 කට ආසන්න කාලයක් ගත වී තිබේ. මේ කාලය තුළ ධනවාදී, සමාජවාදී, මධ්‍යස්ථ ආදි හංවඩුවලින් හඳුන්වනු ලැබූ ආණ්ඩු ගණනාවක් ශ්‍රී ලංකාව පාලනය කොට ඇත. එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ සහ විවිධ ද්‍රවිඩ දේශපාලන පක්ෂ පාලක පක්ෂ ලෙසත් පාලනය නිවැරදි කරන්නට කටයුතු කළ විරුද්ධ පක්ෂ ලෙසත් කටයුතු කර තිබේ. මේ අතර තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රටේ දියුණුවට අහිතකර යැයි කියමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කීපයක්ද බිහිකොට තිබේ.

ගත වූ අවුරුදු 70 කට ආසන්න කාලය තුළ රටේ කිසිදු වෙනසක් සිදුවී නැතැයි කිවහොත් එයද මුසාවකි. ඇසට පෙනෙන අන්දමේ මහා මාර්ග පමණක් නොව, අධිවේගී මාර්ගද ඉදි වී ඇත. අහස උසට නැගුණු මහල් හැට හැත්තෑවේ ගොඩනැගිලිද දක්නට ලැබේ. මහමග ඉඩ මදි වන තරමට යාන වාහනද පිරී පවතී. කොළඹ ඇතුළු දිවයිනේ ප්‍රධාන නගර තුන හතරක දියුණු රටක නගර තරමට භෞතික දියුණුවක්ද පෙනෙන්නටද තිබේ. එහෙත් නිදහස ලැබූ වෙනත් රටවල් සමග සසඳන කල මෙවැනි අවිධිමත් සාටෝපවත් බවක් දක්නට ලැබුණද අවුරුදු හැට ගණනක් මුළුල්ලේ පැමිණ ඇති ගමන කිසිසේත් ප්‍රමාණවත් නොවන බව නම් කිව යුතුමය.

ආර්ථික විද්‍යාත්මක වුත් දේශපාලන විද්‍යාත්මක වුත් උද්ධෘත තර්ක ගෙන හැර පාමින් ඒකපුද්ගල ආදායම, ජීවන අංකය ආදි විවිධ මිම් භාවිතයට ගනිමින් අප රට දියුණු යැයි පෙන්වමින් වැදි බණ දෙසන්නට ඇතැම්හු උත්සාහ ගනිති. ඇත්තෙන්ම සැබෑ තත්ත්වය එය නොවේ. සැබෑ තත්ත්වය සොයා යන්නට නම් ජන ජීවිතවලට එබී බැලිය යුතුය.

ඉතාම අතළොස්සක් වූ පිරිසක් අධිසුඛෝපභෝගී ජීවිත ගත කරන බව සැබෑය. ඔවුහු නිවාස, යානවාහන, දැසි දැස්සන් ආදීන් පිරිවරා සුපිරි ජීවිත ගතකරති. ඒ අතර රජයේ හෝ පෞද්ගලික ආයතනයක රැකියාවක් කරන මධ්‍යම පන්තිය යැයි විහිළු නමකින් හඳුන්වන මාසික හෝ දෛනික වැටුපකින් යැපෙන පිරිසක් වෙසෙති. ඔවුහු තේරෙන භාෂාවෙන් කිවහොත් 'ලෙව කමින්' ජීවත් වෙති. ගෙවල් කුලී, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, එදිනෙදා ආහාරපාන ආදිය වෙනුවෙන් ඔවුන් ගතකරන්නේ අතිශය සීමිත ජීවිතයකි. සෙසු බහුතර ජනතාව දැඩි පීඩාකාරී තත්ත්වයක් මැද දිවි ගෙවන්නෝ වෙති. ඔවුන් මූලික ජීවන අවශ්‍යතාවන් පවා සලසා ගන්නේ ඉතා දුෂ්කරතා මැදය. සමස්ත ජනතාවගේ සැබෑ තත්ත්වය එයය.

නගරවලින් සැතපුම් තුන හතරක් ඈතට යන විට මිනිසුන් ජීවත් වන්නේ කෙතරම් සීමිත මානව හිමිකම් මැදදැයි සිතට එකඟව බැලීමේදී සිතාගත හැකිය. පාලකයන්ගේ වාසනාවට හෝ අවාසනාවට මේ අය අතරින් බොහෝ දෙනා තමන්ගේ රටේ පාලකයන් විසින් තමන්ට අත්කර දිය යුතු වරප්‍රසාද ගැන නොදැන එළි වූ මොහොතේ පටන් රෑ වන තුරු සුපුරුදු ලෙස ගතවන තම ජීවිත තමන්ට හිමි සැබෑ ජීවිත යැයි සිතමින් නිහඬව දිවි ගෙවති. තවත් පිරිසක් 'මේ අපි ලබා උපන් හැටි' යැයිද 'මීට වැඩි හිමිකමක් අපට නැතැ' යිද සිතමින් සියල්ල කරුමයට භාර දී දිවි ගෙවති. එක් අතකට තමන්ගේ උරුමය ලබාදෙන්නට කිසිවෙකු නැති රටක ලද පමණින් සතුටු වී සැනසිල්ලේ සිටීමද හොඳ යැයි සිතේ. මෙවැනි අය ජීවිතයේ අවම සීමාවන් කරා වත් පමුණුවන්නට වගකිව යුත්තන්ගේ ඇස් නොඇරීම කොතරම් නම් අභාග්‍යයක්ද?

මට මෙහිදී අතීතයේ යුරෝපයේ කාර්මික විප්ලව අවධියේදී එක්තරා පූජකවරයෙකු කියූ කියමනක් සිහියට නැගේ. ඒ 'දෙව්ලොවත් අපායත් දෙකම ඇත්තේ මෙහිමය' යන්නයි. අධිසුඛෝපභෝගී සුළුතරයකටත් අන්ත දුගී දුප්පත් බහුතරයකටත් පාලනය විසින් ඉඩකඩ සලසා දී ඇති අයුරු සලකන කල එය වර්තමාන ලංකාව වැනි රටවලටද නොගැලපෙන්නේ නොවේ.

මේ සියල්ල ශ්‍රී ලංකාව තුළ නිදහසින් පසු ක්‍රියාත්මක වන අදූරදර්ශී දේශපාලන ගමන් මගෙහි ප්‍රතිඵල බව අමුතුවෙන් කිව යුතු නොවේ.

නිදහස ලැබූ අලුතදී තරමක් දුරට හෝ රට කෙරෙහිත් ජනතාව කෙරෙහිත් අවංක වූ දේශපාලනඥයන් රටෙහි ක්‍රියාත්මක වූ බවක් පෙනෙතුදු එන්න එන්නම එය නොමගට යොමු වූ බව කිව යුතුය. එය කොතරම් දුරට සටකපට වුත් ආත්මාර්ථය ඉහවහා ගියා වුත් තත්ත්වයකට පැමිණ ඇතිද යන්න ගතවූ රජය අවධියේදී සිදුවූ දැයෙනුත් වර්තමාන රජය සමයේ වුවද සිදුවෙමින් පවතින දැයෙනුත් සලකා ගත හැකිය. එය පැවති රජය අවධියේ පාලකයන් තමන්ගේ පෞද්ගලික ලාභය සඳහා ජනපති කාලය තුන්වන වර දක්වා දීර්ඝ කරන්නට ගත් ව්‍යායාමයෙනුත් මේ රජය අවධියේ තම පෞද්ගලික හිතවතුන් රකින්නට මහ බැංකු සිද්ධියේදී පාලකයන් ක්‍රියා කළ ආකාරයෙනුත් සලකා ගත හැකිය. මේ පහසුවෙන් තේරුම් ගත හැකි උදාහරණ දෙකක් පමණි.

පාලක පක්ෂය රටේ දැවෙන ජනතා ප්‍රශ්න යට ගසා තම පෞද්ගලික අභිමතාර්ථයන් උඩට ඔසවාගෙන යන ගමනත් විරුද්ධ පක්ෂය කිසිදු දැක්මකින් තොරව ජනතාව රවටමින් ඊළඟ පාලන බලය ලබාගන්නට දඟලන දැඟලිල්ලත් දෙකම එක හා සමාන නොවන්නේද? දෙපිරිසෙහිම ක්‍රියා කලාපයෙන් ජනතාව අඟලක් හෝ උඩට ඔසවා තැබීමට ගන්නා අවංක උත්සාහයක් පෙනෙන්නේද? මේ බව ඔවුහු ඔවුහුම වහ වහා කල්පනා කළ යුතුය. ආත්ම පාපෝච්චාරණයක යෙදී නිවැරදි විය යුතුය.

ජනතාව වෙනුවෙන් අනවශ්‍ය කතාබහ අඩු කොට එකිනෙකාට චෝදනා කර ගැනීම් අඩු කොට තමන්ට හැකි උපරිමය කිරීමට රජය වගබලා ගත යුතුය. යුතු අයුතු සියල්ල ඇද බාමින් යහමගට කිසිදු මාවතක් නොපෙන්වමින් පවත්නා රජය පෙරළීමට හැර වෙනත් කිසිදු අරමුණක් නැති විරුද්ධ පක්ෂයද තම ගමන් මග වහා වෙනස් කළ යුතුය. එසේ වුවහොත් පමණක් අප සමග නිදහස ලද වෙනත් රටවල ජනයා මෙන් නැගී සිටින්නට අප මවුබිමේ අපේ නෑ සියන්ටද හැකි වනු ඇත. එසේ නොවුවහොත් ශ්‍රී ලංකාව අනාගතයේදී තව තවත් දිළිඳු බවේ අගාධයට ගිය රටක් වනු නොවැළැක්විය හැක්කේය.

# ආන්දෝලනයට තුඩු දුන් ශ්‍රී ලංකා ජනපතිගේ ප්‍රකාශය

■ **දූරදර්ශී විසිනි**

දේශපාලනඥයන් වරින් වර කරන ප්‍රකාශ එතරම් ගණන් ගත යුතු ඒවා නම් නොවේ. වර්තමානයේ ඔවුන් පුරුදු වී සිටින්නේ කෙරුවාවට වඩා කියමනට හෙයිනි. එහෙත් මෑතකදී ශ්‍රී ලංකාවේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා කළ ආන්දෝලනාත්මක ප්‍රකාශය ගැන නම් සටහනක් තැබිය යුතුවම තිබේ. එය ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයෙහිත් මාධ්‍ය ක්ෂේත්‍රයෙහිත් පමණක් නොව ජනතාව අතරද විවිධ ආකාරයේ කතාබහට ලක්වූවක් වන හෙයිනි.

ශ්‍රී ලංකාවේ අල්ලස් කොමසාරිස් ජනරාල් දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මිය සිය තනතුරෙන් ඉල්ලා අස්වීමත් සමග ජනාධිපතිවරයාගේ මෙම ප්‍රකාශය වඩාත් ඉලිප්පීමකට ලක් වී තිබේ. තමන් ඉල්ලා අස්වූයේ ජනපති ප්‍රකාශය නිසා යැයි අද වනතුරුත් ඇය විසින් ප්‍රකාශ කොට නැතත් හදිසියේ ඇයගේ අස්වීම සිදුවූයේ එම ප්‍රකාශය නිසා බව පැහැදිලිව පෙනෙන්නට තිබිණි.

මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති ධුරයට පත් වූ දා පටන් මේ දක්වා කරගෙන ආ කතා මාලාවේ වාග් විලාශයත් අන්තර්ගතයත් මේ ප්‍රකාශයේදී හිටි හැටියේම වංගුවක් ගැනීමක් බඳු වීම කිසිසේත් සැඟවිය නොහැකි විය. එහි එතෙක් ඔහුත් අන් කිසිවෙකුත් නොසිතූ විරූ අන්දමේ ආවේගයක් සහ කෝප සහගත බවක් ගැබ්වී තිබුණි. හදිසියේ තමන් තුළ පහළ වූ ප්‍රත්‍යක්ෂයක් එයට හේතු වූ බවද මැනවින් පළ විය. එහිදී තමන් කිසිවෙකු කෙරෙහි බැඳීමකින් තොර බව කී ජනාධිපතිවරයා තවමත් තමන් කෙරේ විධායක ජනාධිපති බලතල ඇති බවද මතක් කර දුන්නේය.

ඉහත ප්‍රකාශය පිළිබඳව විරුද්ධ පක්ෂයේ හා ආණ්ඩු පක්ෂයේ දේශපාලනඥයන් තම තමන්ට වාසි සහගත යැයි සිතනු ලබන විවිධ මත පළ කරතත් (ඒකාබද්ධ විපක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් මෙය අගමැති ඇතුළු එක්සත් ජාතික පක්ෂයත්, ජනපති ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් අතර විරසකයක ප්‍රතිඵලයක් ලෙස හුවා දක්වන්නට උත්සාහ ගන්නා අතර ආණ්ඩුවේ මැති අමැතිවරු මෙය ජනපතිගේ සාමාන්‍ය ප්‍රකාශයකට එහා ගිය එකක් නොවේ යැයි පෙන්වන්නට උත්සාහ දරති.) මේ ප්‍රකාශය තුළින් අධිකරණය පිළිබඳව පළවූ අදහස් නම් එතරම් හෑල්ලු කොට තැකීමට පුළුවන් කමක් නැත්තේය. එහෙත් ඒ විරුද්ධ පක්ෂ අදහස් කරන අන්දමට ආණ්ඩු පෙරලීමට නම් නොවේ. ඊට එහා ගිය රටේ ජනතාවගේ අභිලාෂයන් මුදුන් පත් වන අන්දමේ දෘෂ්ටි කෝණයකින් බැලීමෙනි.

දැනට පවත්නා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය යනුවෙන් බල අධිකාරි තුනක් ක්‍රියාත්මක වෙයි. විධායකයේත් ව්‍යවස්ථාදායකයේත් පැන නගින ප්‍රශ්න පිළිබඳ අවසන් විසඳුම යොමුවන්නේ අධිකරණයටය. ඉන් කියවෙන්නේ එය පූර්ණ ස්වාධීනත්වයකින් යුක්ත වූවක් බවයි. ගතවූ ජනාධිපතිවරණයේදීත් මහ මැතිවරණයේදීත් ආණ්ඩු පක්ෂයේ අය දිගින් දිගටම කියා සිටියේ පැවති රජය අධිකරණයට ඇඟිලි ගැසීම බරපතල වරදක් බවයි. ජනාධිපතිත් ආණ්ඩුවත් පත් කරන්නට සහයෝගය දුන් විවිධ සිවිල් සංවිධාන හා ජනතාවගේ එක් ඉල්ලීමක් වූයේද මහින්ද රාජපක්ෂ සමයේ මෙන් අධිකරණයේ ආධිපත්‍යයට බලපෑම් නොකරන ලෙසයි. තමන්ට ඕනෑ අන්දමට පාර්ලිමේන්තු ඡන්ද පවත්වා නීතිපති නෙරපා හැරීම වැනි නීතියට පටහැනි නීච සහගත වූ ක්‍රියාවන්ගෙන් වළකින ලෙස ඔවුහු එහිදී ඉල්ලා සිටියහ. ජනතා අභිලාෂය වූයේ එයයි. එතරම්ම නිහීන දෙයක් වර්තමාන ජනාධිපති අතින් තවමත් සිදුවී නැතද එවැන්නක ඉඟියක් පසුගියදා ඔහු සිදුකළ ප්‍රකාශයෙන් පළ වීම ඉහත කී ආන්දෝලනයට හේතු වී ඇත. එබැවින් ඔහු මෙවැනි ප්‍රකාශයක් නොකළා නම් හොඳය යනු අපගේ හැඟීමයි.

ඉහත කී ආන්දෝලනයෙන් පසු ඔක්තෝබර් 23 වෙනිදා ජනපති ලංකාදීප පුවත්පත සමග කළ සාකච්ඡාවේදී තමන් කළ කතාව වරදවා වටහා ගැනීමෙන් මෙම ආන්දෝලනය හටගත් බවට කළ නිදහසට කරුණු

7 වන පිටුව බලන්න

# මරිජුවානා නීතිගත කිරීම....?



කැනඩාව තුළ මරිජුවානා (ගංජා) නීතිගත කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඇති සූදානම පිළිබඳව මේ දිනවල බොහෝ දෙනෙකුගේ අවධානය යොමු වී ඇත. මේ සම්බන්ධයෙන් පළාත්බද දේශපාලනඥයින්ද සිය අදහස් දක්වා ඇති අතර එහිදී ඇතැම් අය පවසා ඇත්තේ මෙය ක්‍රියාත්මක වුවහොත් වෙනත් සමාජ ප්‍රශ්න රැසක් මෙන්ම මහාමාර්ගවලදී රථවාහන රියදුරන් විසින් සිදුකරන වැරදිද වැඩි විය හැකි බවයි.

ෆෙඩරල් අධිකරණ ඇමතිවරයා පසුගියදා පළාත් හා ප්‍රාදේශීය අධිකරණ ඇමතිවරුන් සමග පැවති සාකච්ඡාවකදී පළාත් තුනක අධිකරණ ඇමතිවරුන් මේ පිළිබඳව අනතුරු ඇඟවා තිබුණි.

පළාතේ තරුණ පිරිසගේ ආරක්ෂාව සහතික කිරීම පිළිබඳව සැලසුමක් අත්‍යවශ්‍ය බවත් හානි අවම කිරීම පිළිබඳව එහිදී අවධානය යොමු විය යුතු බවත් ඔන්ටාරියෝ ඇටර්නි ජනරාල්වරයා පවසා ඇත. ඉදිරියේදී රටේ මාර්ග ආරක්ෂිතව තබාගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම කෙරෙහි වැඩි වගකීමක් දැරීමට පළාත්බද ආණ්ඩුවලට සිදුවන බව ඔහු පෙන්වා දේ.

මරිජුවානා නීතිගත කිරීමේ හානිදායක බව පිළිබඳවත් එයින් රියදුරන් සිදුකරන වැරදි ඉහළ යා හැකි බවටත් කැනඩාවේ ඇටර්නි ජනරාල් විල්සන් රේබවුන්ඩ් පසුගිය ජනවාරියේදී පවසා තිබුණි.

මරිජුවානා නීතිගත කිරීමෙන් පසු රථවාහන අනතුරු වැඩිවූ ආකාරය පෙන්වීමට ආසන්නතම උදාහරණය ඇමරිකාවේ කොලරාඩෝ ප්‍රාන්තයෙන් හමුවෙයි. පසුගිය වසරේදී එහි මරිජුවානා නීතිගත කිරීම සිදුකරනු ලැබූ අතර ඉන්පසු එම පළාතේ මරිජුවානා ආශ්‍රිතව සිදුවූ රථවාහන අනතුරුවලින් මිය යන සංඛ්‍යාව සියයට 32 කින් ඉහළ ගොස් තිබුණි.

මේ පිළිබඳව අදහස් දැක්වූ බ්‍රිටිෂ්කොළොම්බියාවේ මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයා පැවසූවේ, මාර්ග ආරක්ෂාව රටක ප්‍රමුඛතම සැලකිල්ල යොමු කළ යුතු අංගයක් බවයි. විශේෂයෙන්ම මරිජුවානා නීතිගත කිරීම සිදුකෙරෙන සංක්‍රාන්ති සමයේදී රට තුළ සාපරාධී කටයුතු සිදු නොවීම සඳහා ප්‍රධාන රජය වග බලා ගත යුතු බව ඔහුගේ අදහසයි.

මරිජුවානා නීතිගත කිරීම පිළිබඳව නෝවා ස්කෝෂියා අධිකරණ අමාත්‍ය ඩයනා වෙලන් සිය අදහස් දක්වා ඇති අතර මෙහිදී ඇය ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි මූලිකත්වය දී කටයුතු කරන බව පවසා ඇත. එසේම මාර්ග අනතුරු වැඩි වීම පිළිබඳවද ඇය අවධානය යොමු කොට තිබුණි.

රට තුළ මරිජුවානා නීතිගත කිරීම සම්බන්ධයෙන් කුමන කථිකා ගොඩ නැගුණත් එය සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක කිරීම ෆෙඩරල් රජයේ අරමුණයි. මරිජුවානා නීතිගත කිරීමේදී කැනඩාව විසින් ගෙන ඒමට සැරසෙන නීති පද්ධතිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සිදුකෙරෙන බවත් ඒ සඳහා අවධානයෙන් යුතුව ජනතාව දැනුවත් වීම අත්‍යවශ්‍ය බවත් ටොරොන්ටෝවේ හිටපු පොලිස් ප්‍රධානි වත්මන් ලිබරල් මන්ත්‍රී බිල් බ්ලෑයාර් පවසා ඇත.

## ආන්දෝලනයට තුඩු දුන්...

6 වන පිටුවෙන්

කීමේදී මෙසේ පළ කොට ඇත. 'මේකෙන් අදහස් කරන්නේ රජයේ මැති ඇමතිවරුන්ට විරුද්ධව මොනවා හරි දූෂණ, වංචා, නීති විරෝධී දේවල් තියෙනවා නම් පරීක්ෂා කරන්න එපා කියන එක නොවේ. ඒ ගැන මගේ කිසිම විරුද්ධයක් නැත' යනු එම ප්‍රකාශයයි. මෙහිදී අතීත යමක්ද සිහිපත් කිරීම වටී. එනම් පරාජයට පත් වූ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා කළ ප්‍රකාශයයි. 'මම අපේ ඇමතිවරු කරපු වැරදි දිහා බැලුවේ නැති එක මම කරපු ලොකුම වරදයි' යනු ඔහුගේ ප්‍රකාශයයි.

ලොකු වුවද කුඩා වුවද වරද වරදමය. මැති වුවද ඇමති වුවද සාමාන්‍ය ජනයා වුවද වරදකරු වරදකරුමය. වර්තමාන වුවද අතීත වුවද වරද වරදමය. තම රාජ්‍යය තුළ කුමන හෝ වරදක් කළ අයෙක් වෙත්නම් තරාතිරම නොබලා දඬුවම් ලැබීමට ඔවුහු සුදුස්සෝ වෙති.

දැනට වැරදි කර ඇතැයි චෝදනා නැගී ඇති වර්තමාන ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ නම් කීපයක් මාධ්‍යවල පළ විය. අනුර ප්‍රියදර්ශන යාපා, රාජිත සේනාරත්න, රවි කරුණානායක, රිෂාඩ් බද්දුදීන්, ඒ. එච්. එම්. ෆවුසි ආදි වර්තමාන ඇමතිවරුන්ගේ නම් මේ අතර විය. මෙකී අමාත්‍යවරුන්ට විරුද්ධව නැගී ඇති චෝදනා පිළිබඳවත් පසුගිය රජයේ සිට මේ දක්වා අධිකරණය හමුවට පැමිණ ඇති රටේ ධනය කොල්ල කෑ මහා පරිමාණ වංචා සිදුකළ අයගේ පැමිණිලි ගැනත් කල් නොමරා විසඳුම් දෙන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටීමට ඇති ඉඩකඩෙන් ප්‍රයෝජන නොගැනීම සැලකිල්ලට ගත යුතුය. මේ සියලු ප්‍රශ්නවලට මුල් වී ඇත්තේ එයයි.

රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කර ගැනීමේ කාර්යයද දවසින් දවසම කල් දමමින් තිබීමද මෙවැනි ප්‍රශ්න මතු වීමට හේතු වී ඇති බව අපගේ විශ්වාසයයි. මෙම කරුණු සලකන කල ජනාධිපතිවරයාගේ කතාවෙන් මතු වූ ආන්දෝලනය තරමක් දුරට හෝ හේතු සහගත වූවක් බව පිළිගත යුතුව ඇත.

## ගුරාගේ කොළම

### ...මට හිතෙන හැටිය



සූරිය උදා වනතුරු පිනි | බෑවිල්ල
පාරුව පදිනතුරු සයුරේ | සෙලවිල්ල
මාරුව බල බලා සිත යට | ළතැවිල්ල
කාරිය කෙරෙනතුරු කාගෙත් | රැවටිල්ල

මේ අප සැමටම වාගේ පොදු ධර්මතාවකි. බොහෝ මිනිසුන් කරනුයේ තමන්ගේ වැඩේ කරගන්නා තුරු අනුන්ව රැවටීමය. නැතිනම් බොරු සැලකිලි දැක්වීමය. එනිසා ඉහත කවියේ අවසාන පදය 'කාරිය කෙරෙන තුරු කාගෙත් සැලකිල්ල' කියාද කිව හැක. තමන්ගේ වැඩේ කරගත් පසු පැත්ත පළාතකවත් නැත. සැලකිලි තබා නිකන්වත් බලන්නේ නැත. මෙවැනි මිතුරන් නෑදෑයන් අප සැමටම ඇත. හැමදෙනාම එහෙම නැත. මේ සමහරක් අයගේ හැටිය.

තමන්ගේ වැඩේ කරගැනීම සඳහා විවිධ උප්පරවැටි කරයි. චාටු බස් කියයි. මුරුංගා අත්තේ තබයි. සමාජ භාෂාවෙන් කියනවා නම් 'බටර් ගායි'. 'ගොනාට අන්දවයි'. හැමදේටම 'එහෙයි' කියයි. එහෙමත් නැතිනම් තමන්ගේ දුක කියමින් අඬා වැටෙයි. නාහෙන් අඬයි. 'අරයට කිව්ව.... මෙයාට කිව්ව... ඒත් කවුරුවත් බැලුවෙ නැහැ. ඔයා විතරයි අපට ඉන්නෙ' කියමින් වර්ණනා කරයි. මේ සියලුම රැවටිලි රඟපෑම් තමන්ගේ වැඩේ කරගන්නා තුරු පමණකි. තමන්ට අවශ්‍ය දේ යම් අයෙකුගෙන් කරගත් පසු ඔවුන්ව සොයාගන්නටවත් නැත. කළුනික හොයා ගැනීමටත් වඩා අපහසුය.

වැඩේ කරගන්නා තුරු ආවතේවකම් කරමින් ලැගගෙන සිටිති. නිතර නිතර පැමිණෙති. ටෙලිපෝන් කරති. සැපදුක් විමසති. අවශ්‍යතාවය ඉටු වූ පසු මගහරිති. සමහරෙක්ගේ මෙය ජන්ම ගතියකි. වෙනස් වෙන්නේම නැත. තමන්ගේ 'නැති බැරි' වෙලාවට අනුන්ගේ උදව් ලබාගැනීමට යාප්පුවෙන් කතාකරයි. සැලකිලි දක්වයි. තමන්ට 'ඇති හැකි' වූ විට අර උදව් කළ අය නොදන්නා සේ හැසිරෙයි. අපගේ එදිනෙදා ජීවිතයේ බොහෝ අවස්ථාවලදි මෙවැනි අය ඇසුරු කිරීමට සිදුවේ.

මෙවැනි අය විවිධ සේවා සපයන ආයතන සහ පුද්ගලයන් තුළද අනන්තවත් දක්නට ඇත. අපව මුලා කරමින් චාටුබස් කියමින් ඔවුන්ගේ දේ විකුණා ගනිති. සේවය ලබාගැනීමට අප පොලඹවති. අපට සැලකිලි දක්වති. හැබැයි ඔවුන්ගේ වැඩේ කෙරුණු පසුව අපට ලැබෙන සැලකිලි සේවා කිසිවක් නැත. අඩුපාඩුවක් කිවූ විට වැඩේ මගහරිති. කලින් පොරොන්දු වූ 'පසු සේවා' කිසිවක් නිසි ලෙස ඉටුනොකරති. අප හැමටම නිතරම අවශ්‍ය වන සේවාකිහිපයක් ගතහොත්, නිවාස දේපල මිල දී ගැනිම්වලදී, රක්ෂණ වැඩවලදී, අන්තර්ජාල දුරකතන පහසුකම් සැපයිමේදී, විවිධ උපකරණ මිල දී ගැනිම්වලදී මෙන්ම අපට අවශ්‍යය වන විවිධ සේවා සැපයුම්වලදී ඔවුන්ගේ දේ අපේ ඇඟේ ගසයි. අපට ලැබෙන දේ හොඳ වුවහොත් හොඳය. සේවා සපයන්නාත් අපත් දෙදෙනාම දිනුම්ය. හැබැයි අපට ලැබුන දේ අප බලාපොරොත්තු වූ දෙය නොවේ නම් එහි අඩුපාඩු තිබුණහොත් ඒවා නිවරුදි කරගැනීමට අප ඔවුනට දැන්වූ පසු ලැබෙන සහයෝගය අල්පය. ඉන්පසු වැඩේ මගහරියි. ඔවුන්ගේ වැඩේ කෙරී ගනුදෙනුව අවසන්ය. හැමෝම එහෙම නැත. එක අතකින් බැලූවිට තරඟකාරී සමාජයේ තමන්ගේ පැවත්ම සඳහා රැකියාවේ කොටසක් ලෙස එලෙස රැවටීමට ඔවුන්ට සිදුවෙනවා විය හැක. ව්‍යාපාරික ලෝකයේ කියන පරිදී 'හොඳම අලෙවිකරුවා වන්නේ අධික ශීතල පරිසරයක ජීවත්වන එස්කිමෝවරුන්ට ශිතකරණයක් අලෙවි කිරීමට හැකි දක්ෂයාය'. වරද ඇත්තේ විකිණීමේ නොව පසුව අවශ්‍යතාවයන්හිදී මගහැරීමයි. උදව් නොකිරීමයි. 'කියනකොට එහෙමයි කරනකොට මෙහෙමයි' කියන කතාව මතක් වන්නේ එවිටයි.

අප කළ යුත්තේ හොඳ මිනිසුන් හඳුනාගැනීමයි. වැඩේ කෙරෙන තුරු රවටන්නන්ගෙන් ගැලවිය යුතුය. එවැනි පුද්ගලයන් හෝ සේවා සපයන ආයතන ගැන දන්නේ නම් එවැන්නන් පිළිබඳව අපගේ හිතවතුන් දැනුවත් කිරීම අපගේ යුතුකමයි. වගකීමයි. එවිට ඔවුනට ඔවුනගේ රැවටිල්ල දිගටම කරගෙන යා නොහැක.

මේ මට හිතෙන හැටිය.

මේ වගට

ගුරා

පාඨක ප්‍රතිචාර එවීමට : gura.kolama@gmail.com

# ජය කාටද?

ඇතැම් විට ඔබ මෙම පුවත කියවන විට ඇමරිකාවේ ජනධිපතිවරණය නිමා වී තිබිය හැක. නොවැම්බර් 08 වන දින පැවැත්වීමට නියමිතව ඇති ඇමරිකාවේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වන ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා දෙස මේ වන විට මුළු ලොවම ඇස් අයාගෙන බලා සිටී. මහත් ආන්දෝලනාත්මක පුවත් මවමින් සිය ප්‍රචාරණ කටයුතු සිදුකළ මෙම අපේක්ෂකයින් දෙදෙනාගෙන් එක් අයෙකු සැනසුම් සුසුම් හෙළද්දී අනෙකාට කුමක් සිදුවේදැයි බොහෝ දෙනෙකු කුතුහලයෙන් යුතුව බලා සිටී.

ජනපතිවරණය වෙනුවෙන් රට පුරාම ගොස් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදුකළ අපේක්ෂකයන්, එම කටයුතුවල අවසන් අදියර ලෙස රූපවාහිනි විවාදවලට සහභාගි වී සිටින අයුරු පසුගිය දිනවල දක්නට ලැබුණි. එහිදී ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා වන ඩොනල්ඩ් ට්‍රම්ප් සහ හිලරි ක්ලින්ටන් රූපවාහිනී විවාද තුනකට සහභාගි විය. එම විවාද ලොව වැඩිම පිරිසක් නැරඹූ දේශපාලන විවාද බව පැවසෙන අතර ඒවා දෙස බලා සිටි බොහෝ දෙනෙකු පැවසූයේ, එය දෙදෙනාගේම කුණු කන්දල් තොග පිටින් වමාරා ගත් අවස්ථාවන් වූ බවයි.

ඇමරිකාව වැනි බටහිර රටවල පැවැත්වෙන මැතිවරණ පිළිබඳව ජනතාවගේ එතරම් උනන්දුවක් නැතත් මෙවර ජනපතිවරණය ඊට වෙනස් මුහුණුවරක් ගෙන ඇත. ඒ මෙවර ජනපතිවරණයේ ජය කාට හිමිවේද යන කුතුහලය ජනතාව තුළ ඇති නිසාය.

ඇමරිකාවේ මැතිවරණ ඉතිහාසය දෙස බැලූ විට ඒ බොහෝ මැතිවරණ ඉතාමත් මහත්මා ආකාරයෙන් අවසන් වී ඇති බව පෙනී යයි. එහෙත් මෙවර ජනපතිවරණය තුළින් ඒ මහාත්මා ගතිය බොහෝ ඈත් වී ගොස් ඇති බවක් දක්නට ලැබේ. එකිනෙකාගේ පෞද්ගලික තොරතුරු පවා ඇද ගනිමින් කරගන්නා චෝදනාවලින් දෙපැත්තේම සායම හේදී යයි. ඒ හෙළිදරව් වූ කරුණු පිළිබඳ සොයා බැලීමේදී ඇතැම් චෝදනා සාවද්‍ය යැයි කෙළින්ම බැහැර කළ හැකි නොවේ. විශේෂයෙන්ම හිලරි ක්ලින්ටන් සම්බන්ධයෙන් පවතින ඊ-මේල් වංචා විභාගය දැක්විය හැක. ජනාධිපතිවරණයට ඔන්න මෙන්න කියා තිබියදී දැන් එහි පරීක්ෂණ කටයුතු නැවතත් අරඹා ඇත.

හිලරි සම්බන්ධයෙන් ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ පැත්තෙන් නැගෙන චෝදනාවලද නිමක් නොමැත. හිලරි විසින් මාධ්‍යවල සහාය ලබාගෙන වංචනික ලෙස ජනපතිවරණය ජය ගැනීමට සූදානම් වන බව ඉන් එකකි. විශේෂයෙන්ම සී.එන්.එන් නාලිකාව සජීවීව පවත්වන කතාබහවලදී හිලරිගෙන් අසන ප්‍රශ්න ඇය වෙත කල් තියා දැනුම් දී ඇතැයි ට්‍රම්ප්ගේ සහායකයෝ පවසති.

වරෙක ට්‍රම්ප් විසින් හිලරි වෙත දමා ගැසුවේ කාන්තා හිංසන චෝදනාවකි. මෙයට ක්ෂණයකින් ප්‍රතිචාර දැක්වූ හිලරි පාර්ශ්වය, ට්‍රම්ප් විසින් ලිංගික හිංසන සිදුකර ඇති බව පැවසෙන කාන්තාවන් කිහිප දෙනෙකු මැතිවරණ වේදිකාවලට ගෙන ආහ.

ට්‍රම්ප් වෙත නැගෙන චෝදනාවලද නිමක් නොමැති අතර විදේශ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඔහුගේ ස්ථාවරය පිළිබඳව බොහෝ දෙනෙකු තුළ ඇත්තේ අප්‍රසාදයකි. වරෙක හිලරි පවසා තිබුණේ ට්‍රම්ප් රුසියානු ජනාධිපති ව්ලදිමීර් පුතින්ගේ රූකඩයක් බවයි.

දේශපාලන වේදිකාවේ ඔවුන්ගේ මතවාද එසේ වෙද්දී දේශපාලන විචාරකයින් මේ දෙපළ පිළිබඳ දක්වන අදහස් පිළිබඳවද සොයා බැලීම වටී. බොහෝ විචාරකයින් පවසන්නේ දෙදෙනාගෙන් කවුරු දිනුවද එය ඉතිහාසයේ ලියවෙන ජයග්‍රහණයක් බවයි. විශේෂයෙන්ම මේ දෙදෙනාගේ වයස සලකා බැලීමේදී එය පැහැදිලි වේ.

පසුගිය ජූනි 14 වෙනිදා ඩොනල්ට් ට්‍රම්ප් 70 වැනි උපන්දිනය සැමරූ අතර, ඔහු ඇමරිකාවේ ජනාධිපති වුවහොත් එතෙක් මෙතෙක් ඇමරිකාවේ නායකත්වයට පත් වයස්ගතම පුද්ගලයා බවට ඔහුගේ නම ඉතිහාසගත වෙයි. හිලරි ක්ලින්ටන් ජනාධිපති වුවහොත් ඇය ඇමරිකාවේ පළමු ජනාධිපතිනිය වෙමින් ඉතිහාසයට එක්වන අතරම ඇයගේ වයස නිසාද ඉතිහාසයට එක් වීමේ අවස්ථාව හිමිවේ. මන්ද යත්, ඇයගේ 69 වන උපන්දිනය ඔක්තෝබර් 26 වන දින සැමරූ හෙයිනි. නමුත් මෙහිදී ඇයට ඇමරිකාවේ පළමුවෙනි වයස්ගතම ජනාධිපතිනිය වීමේ අවස්ථාව නොමැත. ඒ එම අවස්ථාව මින් පෙර ජනාධිපති ලෙස කටයුතු කළ රොනල්ඩ් රේගන් විසින් හිමිකරගෙන ඇති හෙයිනි. 1981 සිට 1989 දක්වා ඇමරිකාවේ ජනාධිපති ලෙස කටයුතු කළ රොනල්ඩ් රේගන් එම පදවියට පත් වන විට 69 හැවිරිදි වියේ පසුවිය.

විචාරකයින් ඔවුන්ගේ වයස සම්බන්ධයෙන් දක්වන තවත් අදහසක් වන්නේ එක්තරා ආකාරයකින් මෙය ඇමරිකානුවන්ට අලුත් අත්දැකීමක් විය හැකි බවයි. මේ දෙදෙනා හා සැසඳීමේදී ඉතාමත් ලාබාල ඔබාමා අතින් වසර 08 ක් පාලනය වූ රට විශ්‍රාම ගත යුතු වයසේ වියපත් පුද්ගලයකු අතට පත් වීමේ වාසිය කෙසේ වේදැයි මත පළ කිරීමට තවමත් කල් මදි බව ඒ බොහෝ දෙනෙකුගේ අදහසයි.

# Galaxy Note 7

සැම්සුන් සමාගමේ නවතම හඳුන්වාදීම වන ගැලැක්සි නෝට් 7 ස්මාර්ට් දුරකතනයේ පවතින කිසියම් දෝෂයක් නිසා එම දුරකතන ගිනි ගැනීමේ අවස්ථා වැඩි බැවින් ගැලැක්සි නෝට් 7 නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම නවතා දැමීමටත් අලෙවි කළ දුරකතන නැවත ගෙන්වා ගැනීමටත් එම සමාගමට සිදුවී ඇත. මේ පිළිබඳව නිවේදනයක් නිකුත් කරන සැම්සුන් සමාගම පවසා ඇත්තේ 'පාරිභෝගියන්ගේ ආරක්ෂාව' පිළිබඳව සැලකිලිමත් වී මේ තීරණය ගත් බවයි.

ගැලැක්සි දුරකතන ගිනිගත් බව මුලින්ම අනාවරණය වූ අවස්ථාවේදී හානියට පත් දුරකතන පමණක් නැවත ගෙන්වා ගැනීමට සමාගම කටයුතු කළ අතර වරද නිවැරදි කළ බව පවසමින් අලුත් ගැලැක්සි ෆෝන් එම පිරිස වෙත ලබාදීමට පියවර ගෙන තිබුණි. නමුත් එසේ දුන් දුරකතනද ගිනි ගැනීම නිසා එය නිෂ්පාදනයේම දෝෂයකින් සිදුවන්නක් බව පිළිගැනීමට සැම්සුන් සමාගමට සිදුවිය. ඒ සමගම ගැලැක්සි දුරකතනය ගිනි ගන්නා අයුරු දැක්වෙන ඡායාරූප සහ වීඩියෝ සමාජ ජාල හරහා දිගට හරහට ප්‍රචාරය වීමට පටන් ගැනුණු අතර අලෙවි කර තිබූ දුරකතන සියල්ල නැවත ගෙන්වා ගැනීමත් නිෂ්පාදනය නවතා දැමීමත් හැර වෙනත් විකල්පයක් සමාගමට නොතිබුණි.

දකුණු කොරියාවේ ආර්ථික කටයුතු පිළිබඳ ඇමතිවරයාද සැම්සුන් සමාගම හා සාකච්ඡා කර තිබූ අතර ඔහු පවසා තිබුණේ සමාගම විසින් වරද පිළිගෙන එය නිවැරදි කිරීමට කටයුතු නොකළොත් දකුණු කොරියාවේ සමස්ත අපනයන කටයුතුවලට එය විශාල හානියක් විය හැකි බවයි.

එම දුරකතනයේ බැටරියේ හටගත් දෝෂයක් මෙම ගිනි ඇවිලීමට හේතු වී ඇති බව ඒ පිළිබඳව කරන ලද පරීක්ෂණ මගින් තහවුරු වී ඇත. ගැලැක්සි නෝට් 7 සඳහා යොදා ගැනුණු බැටරිය නිර්මාණය කිරීම සඳහා සියයට 70 ක් සැම්සුන් නිෂ්පාදනයක් වන SDI බැටරි භාවිතයට ගෙන ඇති අතර ඉතිරි සියයට 30 සඳහා චීනයේ නිෂ්පාදිත ATL බැටරි යොදාගෙන ඇත. ගිනි ගැනීම සඳහා හේතුව වී ඇත්තේ සැම්සුන් සමාගමේ SDI බැටරිවල හටගත් දෝෂයකි.

2016 අගෝස්තු 19 වන දින නිල වශයෙන් ලොවට විවර වූ ගැලැක්සි නෝට් 7 දුරකතනය මාස දෙකහමාරක් ඉක්ම යෑමට මත්තෙන් දුරකතන මිලියන 2.5 ක් පමණ අලෙවි කිරීමට සමත් වී තිබුණි. එහෙත් හටගත් අනතුරුදායක තත්ත්වය තුළ අලෙවි කරනු ලැබූ සියලුම දුරකතන නැවත ගෙන්වා ගැනීමට සමාගම පියවර ගනු ලැබුණි. එසේ නැවත ගෙන්වා ගැනීමේදී තැපැල් මගින් දුරකතනය හරවා යැවීමට උත්සාහ කළ ඇතැම් රටවල පාරිභෝගිකයන් දැඩි දුෂ්කරතාවලට මුහුණ පා ඇති අතර බොහෝ තැපැල් හල් මෙම දුරකතනය භාර නොගැනීම ඊට හේතුව වී ඇත.

එසේම ලෝකයේ ගුවන් සේවා රැසක් ගුවන් ගමන් අතරතුරදී ගැලැක්සි 7 භාවිත කිරීම තහනම් කර තිබුණි. ඊට හේතුව ලෙස ඔවුන් දක්වා තිබුණේ එහි බැටරිය පිපිරීමට හා ගිනි ගැනීමට ලක්විය හැකි නිසා එය ගුවන් යානයේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බවයි.

මේ අතර ගැලැක්සි නෝට් 7 දුරකතනය සම්බන්ධ කරගනිමින් හාස්‍ය උපදවන ආකාරයේ පරිඝනක ක්‍රීඩාවක් මෑතකදී යම් අයෙකු විසින් අන්තර්ජාලයට මුදා හැර තිබුණි. බොහෝ දෙනෙකු විසින් දන්නා GTA 5 පරිඝනක ක්‍රීඩාවේ බෝම්බයක් වෙනුවට ගැලැක්සි නෝට් 7 දුරකතනය භාවිත කරන ආකාරය මෙහි දැක්වේ. ක්‍රීඩාව තුළදී ගැලැක්සි නෝට් 7 දුරකතනයෙන් දමා ගැසූ විට එය බෝම්බයක් ලෙස මහ හඬින් පුපුරා යයි. තම සමාග මේ දුරකතනය යොදාගනිමින් මෙවැනි දෙයක් නිර්මාණය කිරීම පිළිබඳව සැම්සුන් සමාගම දැඩි කණස්සල්ල පළ කොට තිබුණු අතර ඒ බව යූ ටියුබ් වෙත දැනුම් දී අදාළ වීඩියෝව මකා දැමීමට ක්‍රියා කර තිබුණි. එහෙත් මේ වන විට නැවතත් එය යූ ටියුබයේ දක්නට ලැබේ. එම වීඩියෝව ඉවත් කිරීමට තරම් සෑහෙන සාධක සැම්සුන් විසින් ඉදිරිපත් නොකළ නිසා නැවතත් එය දැමූ බව යූ ටියුබ් ඒ පිළිබඳව පවසා ඇත.

සැම්සුන් සමාගම ගැලැක්සි 7 දුරකතනය නිෂ්පාදනය නතර කිරීමත් විකුණූ දුරකතන නැවත ගෙන්වා ගැනීමත් නිසා එම සමාගමට සිදුවී ඇති පාඩුව ඩොලර් බිලියන 17 කට ආසන්න බව පැවසේ. ඒ සමගම සැම්සුන් සමාග මේ කොටස් අලෙවියද සියයට 2.7 කින් පහළ බැස ඇත. සැම්සුන් ගැලැක්සි 7 අලෙවිය ඇරඹීමේදී එම සමාග මේ ඉලක්කය වූයේ ලොව පුරා මෙම දුරකතන ලක්ෂ 190 ක් අලෙවි කිරීමය.

1 වන පිටුවෙන්

## CANADA - EU ....

මෙම ගිවිසුමට අත්සන් කිරීමට හැකිවීම විශාල ජයග්‍රහණයක් බව ආර්ථික විශ්ලේෂකයෝ පවසා සිටිති.

කලාපයක් සහ රටක් අතර අත්සන් කෙරුණු මෙම යෝධ වෙළඳ ගිවිසුමට පක්ෂපාතී වන්නෝ මෙන්ම ඊට විරෝධය දක්වන්නෝද රැසකි. මේ පිළිබඳව අදහස් දක්වන පක්ෂපාතී පිරිස පවසන්නේ, CETA නිසා වෙළඳ කටයුතුවල විශාල වර්ධනයක් දැකිය හැකි වනු ඇති බවයි. විශේෂයෙන්ම කැනඩාව හා යුරෝපා කලාපය හරහා සිදුකරන ගනුදෙනුවලදී තීරුබදු ඇතුළු බොහෝ ගාස්තුවල වෙනසක් සිදු කිරීමෙන් කෘෂිකාර්මික, ඖෂධ, මෝටර් රථ වැනි විවිධ නිෂ්පාදන අංශයන්හි පුළුල් දියුණුවක් දැක ගැනීමට ඔවුහු අපේක්ෂා කරති.

ඒ අතර මෙම ගිවිසුමට දැඩි විරෝධය දක්වන වෘත්තීය ක්‍රියාකාරීන් සහ ඇතැම් යුරෝපා රටවල වාමාංශික දේශපාලන පක්ෂ පවසන්නේ, ගිවිසුම මගින් පරිසරය, සෞඛ්‍යය, කම්කරු රෙගුලාසි ආදි බොහෝ අංශයන් තර්ජනයට ලක්වී ඇති බවයි. මෙම ගිවිසුමට අනුව බහුජාතික සමාගම් විසින් එම රටවලට අහිතකර බලපෑම් එල්ල කිරීමේ බලය අසීමාන්තිකව වැඩි වී ඇති බව ඔවුන් පවසා සිටී. ඊනියා වෙළඳ ගිවිසුම උඩින් එකක් පෙන්වන යටින් වෙනමම දෙයක් ක්‍රියාත්මක කෙරෙන ට්‍රෝජන් අශ්වයෙක් ලෙස ක්‍රියාකරන බව එහිදී ඔවුන් පෙන්වා දේ. ගිවිසුම අත්සන් කිරීමට පෙර ඊට දැඩි විරෝධය පළ කළ මෙම විරුද්ධවාදීන් යුරෝපය පුරා උද්ඝෝෂණ රැසක් සංවිධානය කර තිබුණි.

කැනඩාවේ මෙන්ම ලෝක ආර්ථිකය තුළද යහපත් ආකාරයේ ප්‍රගතියක් CETA තුළින් ලබාගත හැකි බවට තමා තුළ විශ්වාසයක් පවතින බව ගිවිසුම පිළිබඳ අදහස් දක්වන ටෘඩෝ අගමැතිවරයාගේ අදහසයි. විශේෂයෙන්ම මධ්‍යම පාන්තිකයන් සඳහා ගිවිසුම තුළ වැඩි වාසි අත්වී ඇති බව ඔහු පවසා සිටී.

කැනඩාවේ අන්තර්ජාතික වෙළඳ කටයුතු පිළිබඳ ඇමතිනී ක්‍රිස්ටියා ෆ්‍රීලන්ඩ් ගිවිසුම අත්සන් කිරීම පිළිබඳව කරුණු දැක්වීමේදී පවසා තිබුණේ " එය කැනඩාවට විශිෂ්ට දවසක්. යුරෝපයට විශිෂ්ට දවසක්" ලෙසයි.

## සෞඛ්‍ය ප්‍රතිපාදන....

මේ පිළිබඳව අදහස් දක්වන ඔන්ටාරියෝ සෞඛ්‍ය අමාත්‍ය එරික් හොස්කින්ස් පවසන්නේ, ෆෙඩරල් රජයේ මේ මුදල් කප්පාදුව සිදුවුවහොත් ඔන්ටාරියෝව සඳහා සපයන ප්‍රතිපාදනවලින් ඩොලර් මිලියන 400 ක් පමණ අඩු වන බවයි. එවැනි තත්ත්වයක් ඇති වුවහොත් ඔන්ටාරියෝවේ සෞඛ්‍ය කටයුතු නවීකරණය හා සංවර්ධනය කිරීම ඉතාමත් අපහසු විය හැකි බවත් විශේෂයෙන්ම වැඩි පිරිවැයක් වැය වන මානසික සෞඛ්‍ය සේවාවන් සහ ඇබ්බැහි වීම් සඳහා සපයන සේවාවන් (addictions services) වඩාත් ඵලදායී ලෙස පවත්වාගෙන යෑමේදී දැඩි අසීරුතාවන්ට මුහුණ පෑමට සිදුවිය හැකි බවත් අමාත්‍යවරයා පවසා සිටී.

ෆෙඩරල් රජය විසින් වාර්ෂිකව සියයට තුනක transfer payments වැඩිකිරීමක් සිදුකළද එය සෞඛ්‍ය සේවා යහපත් තත්ත්වයකින් පවත්වා ගැනීමට කිසි සේත් ප්‍රමාණවත් නොවන බව හොස්කින්ස් අමාත්‍යවරයා පවසයි.

ඉදිරි වසර 10 ක කාලයේදී මේ කප්පාදුව මගින් රටේ සෞඛ්‍ය සඳහා වැය කරන මුදලින් ඩොලර් බිලියන 60 ක් ඉතිරි කර ගැනීමට ඔටාව රජයට අවස්ථාව ලැබේ. රජය බලාපොරොත්තු වන අන්දමට මෙම කප්පාදුව ක්‍රියාත්මක වුවහොත්, පළාත් බද සෞඛ්‍ය සේවාවන් වර්තමාන මට්ටමට හෝ පවත්වා ගැනීමට නම් ඒ ඒ පළාත්වල සෞඛ්‍ය පහසුකම් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පළාත් රජයයන් විසින්ම පිරිමසා ගැනීමට සිදුවනු ඇති බව පළාත්බද සෞඛ්‍ය අමාත්‍යවරුන් ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කර ඇත.



SRI LANKA'S NO.1
Trico te
TRICO
TRICO MARITIME
(Sole Authorized Agent of
Trico Meritime (Pvt) Ltd. Sri Lanka)
The first Customs Bonded Warehouse for Personal
Effects and gift items clearance in Sri Lanka
Serving People Worldwide Reliably for 35 Years
SRI LANKA'S BEST AND
LARGEST CLEARING
FACILITIES IN THREE
MAJOR CITIES SINCE 1980
COLOMBO
GALLE
KURUNEGALLA
DOOR TO DOOR SERVICE
to any part of Sri Lanka
special service to
Colombo, Jaffna,
Kilinochchi, Batticaloa,
Trincomalee, Vavuniya
& Mannar
TRICO
SINCE 1975
TRICO MARITIME FREIGHT FORWARDING CANADA INC.
CONTACT : DERRICK ANTON
647.833.3020 | 416.335.8800
Our Canadian Agents
OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL)
CALGARY: 403 971 6721 (SAMAN) • ALBERTA : 587 708 5665 (TONY) • WINNIPEG: 204 800 2364 (MANGALIKA)
Trico Maritime Customer Services & Warehouses in Sri Lanka
HEAD OFFICE
Trico Maritime (Pvt) Ltd
50K Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580 / 2345581
Fax: 2432000
COLOMBO WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
414/17 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2448270 / 2440114
Fax: 2432000
KURUNEGALA WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
Humbara Road Sandagala
Uhumeeya
Tel: 073 2238924 / 037 2238925
Fax: 037 2238967
GALLE WAREHOUSE
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd, Kangoda, Galle
Tel: 091 2234842
Fax: 2234841
Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On. M1V 4B9
Tel: 413 335 8800
email: info@tricomaritime.ca

# මේ ඔරලෝසු කණුව ලන්දේසීන්ගේ නොවෙයි



■ අහුන්ගල්ලේ දේ. සු. ද සොයිසා

ගාලු කොටුව මත ඉදිව ඇති ඔරලෝසු කණුව දකින අද අප රටේ සිටින බොහෝදෙනා මෙම ඔරලෝසු කණුව ලන්දේසීන්ගේ සේවාවක් ලෙස එම ගොඩට දමා සලකන්නට පුරුදුව සිටිති. ගාලු කොටුව සැකසුණ කළුගල් බැම්මට සමානවම එහි පෙනුමට කිසිම හානියක් නොවන සේ ඉදිවුණ මෙම ඔරලෝසු කණුව අද ගාලු කොටුව ලොවට හඳුන්වන සංකේතය බඳුය. අද වෙළෙඳ දැන්වීම්වලටද මැතිවරණ සමයේ පෝස්ටර්වලටද ගාලු කොටුව හා ඔරලෝසු කණුවේ සේයා රූ යොදා ගන්නා පිරිසද මෙම ඔරලෝසු කණුව ඉදි වූයේ කුමන කාලයේද? කුමක් සඳහාද? කවුරුන් විසින් කරවන ලද්දේද? යන්න නොදැනීම ඉතා විශාල අඩුපාඩුවකි. මේ නිසා එහි අතීත කථාවද නිර්මාණය කරවූ පුද්ගලයාද හඳුන්වා දෙන්නට මෙම ලිපිය ලියන්නට අදහස් කළෙමි.

දහනව වැනි සියවසේ අවසාන කාර්තුවේ ගාලු දිසාවේ විශේෂයෙන්ම ගාලු නගරයේ ජනතාවට වෙද හෙදකම් කළ ජනතා ප්‍රසාදය දිනාගත් ඉංග්‍රීසි ජාතික වෛද්‍යවරයෙක් විසූහ. පීටර් ඩැනියෙල් ඇන්ටනීස් යන නාමයෙන් හඳුන්වන ලද මෙතුමා සිය සේවය නිමා කර සමුගෙන යෑම සම්බන්ධයෙන් අනුස්මරණය කිරීමට කුමක් කරමුදැයි ගාල්ලේ ජන ප්‍රධානීන් සාකච්ඡා කළහ. ඒ සඳහා ඔරලෝසු කණුවක් ඉදිකිරීම සුදුසු යැයි යෝජනා වූයෙන් එම ඔරලෝසු කණුව තැනවීම සඳහා වියදම ලෙස රුපියල් තුන්දහස් පන්සියයක් යන බවට පසුව ඇස්තමේන්තු සකස් විය. මෙම මුදල ගාලු නාගරික ජනතාවගෙන් එකතු කර ඉදිකිරීමට යළි සැළසුම් කළහ. මේ අවස්ථාවේදී ඒ සඳහා යන බර පැන එකතු කිරීම අවශ්‍ය නොවන බව පෙන්වා දුන් වාසල මහ මුදලි කළුහත් සැම්සන් ද ආබ්‍රෙව් විජය ගුණරත්න රාජපක්ෂ මැතිතුමන් වැය වන මුළු මුදල තමා විසින් දරන බව සභාවට දැන්වීය. ඒ අනුව ගාලු කොටුවේ ඉදිවුණ එම ඔරලෝසු කණුව එම කොටුවේ පෞරාණික භාවයට හානියක් නොවන ලෙස නිමා කර එය දොස්තර පීටර් ඩැනියෙල් ඇන්ටනීස් මහතා විසින් මීට වසර 133 කට පමණ පෙර විවෘත කරන්නට යෙදී ඇත.

මෙය ඉදිකරවන ලද්දේ සැම්සන් රාජපක්ෂ මැතිතුමන් විසින් බව ඔරලෝසු කණුවේ පාමුල ආසන්නයේ සවි කර ඇති. සිහිවටන පුවරුවෙන් සනාථ වේ. දැනට මැකීගෙන යමින් පවතින දුර්වර්ණ වී ඇති එම පුවරුවේ ඉංග්‍රීසි බසින් ලියැවුණ සටහන මෙසේය.

The Clock is the Gift of Samson D Abrew Rajapakse JP of Kosgoda Mdccel xxxiii - 1883

මෙලෙස ගාලු දිසාවේ සිංහල බෞද්ධ දානපතියන් විසින් සිදුකළ සේවාවන් විචාරයෙන් තොරව විදේශිකයන්ට පවරා ඔවුන් විසින් සිදු කළා යැයි අප තුළ මානසික තත්ත්වයක් ගොඩනැඟී ඇත්තේ, නිදහස ලැබීමෙන් පසු වුවද ඒවා බාරගත් අපේ පාලකයන්, නායකයන් මේවා සොයා බලා නිසියාකාරව සංරක්ෂණය නොකරන නිසාය. වර්තමානයේ ලෝක උරුමයක් ලෙස සුරකින ගාලු කොටුවේ තිබෙන මෙම ඉපැරැණි සිංහල බෞද්ධ උරුමය ලන්දේසීන්ට නොපවරා එහි තිබෙන ඉංග්‍රීසි සිහිවටන පුවරුව සිංහලයටද පරිවර්තනය කර භාෂා තුනෙන්ම සවිමත් පුවරු සටහනක් එම ඔරලෝසු කණුව අබියස සවිකරන ලෙස වගකිව යුත්තන්ට සිහිපත් කරමු.

මෙම අභිමානවත් ක්‍රියාව සිදු කළ සැම්සන් රාජපක්ෂ මුදලිතුමන් කවුරුන්දැයි දැන හඳුනා ගැනීමද වැදගත් වනු ඇත. එබැවින් එතුමන් පිළිබඳව යම් සටහනක් තැබීම වැදගත් යැයි සිතමි. ශ්‍රී මහාබෝධි රාජයාණන් ලක්දිවට වැඩම කරවීමේදී මෙරටට පැමිණි බමුණු පිරිස අතර විසූ ඉසුරුමුණි කප්පිණ බමුණා පදිංචියට පැමිණියේ එම දෙතිස් ඵල රුහ බෝධියේ එක් ඵල රුහ බෝධියක් වූ ඇඹලව රහත් ගල්වෙහෙර රෝපණය කළ බෝධියත් සමග එකල රෝහණයේ මුහුදුබඩ චිර ප්‍රසිද්ධ ග්‍රාමයක් වූ වැලිතොට ගල්වෙහෙරටය. මෙහි පදිංචි වූ මෙතුමා එම ප්‍රදේශයේ බ්‍රාහ්මණ සෙනඟ සමඟ සහයෝගයෙන් ජීවත් වූයේ දේවානම්පියතිස්ස රජුගේද රාජානුග්‍රහය ලබමිනි.

මෙලෙස සියලු රාජ සමයන්හි ප්‍රදේශාධිපතීන් විලස ක්‍රියා කළ මෙම බමුණු පරපුර සීතාවක රාජසිංහ සමයේ පරංගීන් සමඟ සිදු කළ සටන්වලදී ඔහුට ඉතා උදව් උපකාර කළේය. එකල වැලිතොට විසූ කප්පිණ සේනානායක මුදලිවරයා ප්‍රබල රණශූරයකු ලෙස ක්‍රියා කර ඇත. පසුව සීතාවක රාජසිංහයන් සමග ඇතිවූ මතබේදයක් නිසා රජු විසින් මෙම මුදලිවරයා මරා දමන්නට ක්‍රියා කළේය. මෙයින් පෘතුගීසීන් සමග එක්වුණ අතර ඔහු මරා දැමුණේ ඔහුගේ හිස ගෙනැවුත් දුන් අයට තෑගිබෝග දෙන බවට සිදු කළ ප්‍රචාරය නිසාය. ඔහුගේ මරණය සම්බන්ධව එන ජන කවියක් මෙසේය.

කඳගෙන ගොසින් බගවත්තේ දමා පිලූ
හිස ගෙන ගොසින් සීතාවකට දී පිලූ
රුව ගෙන ගොසින් කොඩිලන්සේ ලියා පිලූ
කප්පිණ මුදලි නයිනංකඩ මරා පිලූ

මෙම පරපුරේ දහනව වැනි සියවසේ ප්‍රධාන පුරුෂයා වූයේ මෙම ගාලු ඔරලෝසු කණුව තැනවූ සැම්සන් රාජපක්ෂ මුදලිතුමන්ය.

දහනව වැනි සියවසේ මැද භාගයේ මහබද්දේ මහ මුදලි පදවිය දැරූ අදිරියන්ද ආබ්‍රෙව් විජයගුණරත්න මහතාගේ පුතණුවන් ලෙස 1830 දෙසැ. 30 වැනි දින උපත ලද සැම්සන් රාජපක්ෂ මහතා බළපිටියේ ධීරානන්ද හිමියන්ගෙන් මූලික අධ්‍යාපනය ලබා එදා කොළඹ ඇකඩමිය ලෙස හැඳින්වූ වත්මන් රාජකීය විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය ලබා ඇත. 1844 සිට කොළඹ වලව්වෙන් බළපිටියට පැමිණි සැම්සන් රාජපක්ෂ වැලිතර අඹගහපිටිය මහා විහාරයේ වැඩ විසූ කහවේ ශ්‍රී ගුණානන්ද මාහිමියන් වෙතින් සිංහල හා පාලි භාෂාවන් මනා ලෙස උගත්තේය. ලංකාගොඩ සිරි ධීරානන්ද මාහිමියන් වෙතින් බුදුදහම හා අභිධර්මය උගත් අතර මිගෙට්ටුවත්තේ ගුණානන්ද මාහිමියන් වහන්සේ ඉතා සමීපව ඇසුරු කළේය.

තරුණ වියට පිවිසීමෙන් පසුව 1856 සැප්තැම්බර් 10 වන දින කොළඹ ලුණුපොකුණේ සීමන් ද සොයිසා සෙනෙවිරත්න ශ්‍රී වර්ධන මහතාගේ දියණිය වූ ජොහානා ඩොරතියා ඇමලියා ද සොයිසා සෙනෙවිරත්න මෙනවිය සමග විවාහ ගිවිස ගත්හ. මෙම විවාහයෙන් ටික කලකට පසු ඇය මියගිය හෙයින් දෙවන විවාහය සිදු කරගන්නා ලද්දේ සිය නැන්දණියගේ දියණිය වූ කැරොලයින් ද සොයිසා සිරිවර්ධන මෙනවිය සමඟය.

1870 දී මීගමු ප්‍රදේශය සඳහා සාමදාන විනිශ්චයකාර පදවියෙන් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් සම්මානිත වූ සැම්සන් රාජපක්ෂ මහතාට 1974 අප්‍රියෙල් 17 වැනි දින එවකට ලංකාණ්ඩුකාර ධුරන්දර ශ්‍රීමත් හර්කියුලස් රොබින්සන් ආණ්ඩුකාරවරයා විසින් වාසල මුදලි පදවිය පිරිනමා උපහාර කරන ලදී. 1876 දී ලංකාවටම බලපාන පරිදි සාමදාන විනිශ්චයකාර පදවියක්ද පිරිනැමූ අතර දේශීය හා විදේශීය වශයෙන් විවිධ ගෞරව නාමයන්ට පාත්‍ර විය.

සිය උපන් දේශයට පිළිපදින ආගමට දහමට අමරණීයම සේවයක් කළ මෙතුමා අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු කරන ලද මෙහෙවරද අති විශාලය. කොළඹ වෛද්‍ය විද්‍යාලය ගොඩනඟන්නට අවශ්‍ය කරන ඉඩම එතුමා විසින් පරිත්‍යාග කරන ලදී. එම පරිත්‍යාගය එවකට ආණ්ඩුකාර ධුරය ඉසිලූ ග්‍රෙගරිතුමන් විසින් 1875 ජුනි 04 වැනි දින වෛද්‍ය විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවයට පැමිණ ඉතා අගය කළේය. රට පුරාම ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දෙමින් මිෂනාරි පාසල් ගෙන යන වැඩසටහන දුටු සැම්සන් රාජපක්ෂ මුදලිවරයා තම ගම් ප්‍රදේශයේ 1879 ජනවාරි 07 වැනි දින ප්‍රථම බෞද්ධ ඉංග්‍රීසි පාඨශාලාව විවෘත කර අවශ්‍ය ගොඩනැඟිලිද ඉඩම්ද ගුරුවරුන්ට වැටුප්ද තම වියදමෙන් පරිත්‍යාග කරන්නට යෙදුණි. කොළඹ වෛද්‍ය විද්‍යාලයේ දක්ෂතම ශිෂ්‍යයාට 'රාජපක්ෂ ත්‍යාගය' නමින් තිළිණයක් ලබා දුන් අතර කොළඹ සාන්ත තෝමස් විද්‍යාලයට ශිෂ්‍යත්ව කිහිපයක්ම පිරිනමන්නට යෙදුණි. විද්‍යෝදය පිරිවෙනෙහි ඉගෙනුම ලබන ස්වාමීන් වහන්සේලාට අධ්‍යාපන කටයුතුවලට දිරි දීම සඳහා සිංහල පාලි සංස්කෘත භාෂාවන්ගෙන් විශිෂ්ට සාමාර්ථ ලබා ගන්නා සිසුන්හට වාර්ෂිකව ත්‍යාග පිරිනමන්නටද යෙදුණි. මිගෙට්ටුවත්තේ ගුණානන්ද මාහිමියන් ගෙන ගිය ජාතික ආගමික සටන්වලදී උන්වහන්සේට අවශ්‍ය ආර්ථික ශක්තිය නොමඳව ලබා දුන් අතර කොළඹ හා බළපිටියේ විහාරාරාම රාශියක් තමාගේ ධන පරිත්‍යාග යෙන් තනවන්නට යෙදුණි. බලපිටියේ මහ කප්පිණ මුදලින්දාරාම මහා විහාරය කරවා 'රාජපක්ෂ පිරිවෙන' නමින් ආයතනයක් ගොඩනංවා හික්කඩුවේ ශ්‍රී සුමංගල මා හිමියන් ගෙන්වා විවෘත කරවා ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් විශාල සේවයක් සිදු කළහ. මාදුගඟ මැද කොත්දූවේ විහාරය කරවා සංඝරත්නයට පූජා කළහ. වත්මන් බළපිටියේ මූලික රෝහල එතුමාගේ ඉඩමක ගොඩනැංවීමට කටයුතු කළහ.

කොළඹ කුරුඳුවත්ත, වර්තමාන බණ්ඩාරනායක ගුවන් තොටුපළට අයත් අක්කර දහසකට අධික ඉඩම් හා තවත් අක්කර දහස් ගණනක් හිමිව සිටි මෙම අසහාය දානපතියා සිදු කළ සමාජ මෙහෙවර මෙවන් කුඩා ලිපියකින් සඳහන් කිරීම අලියකු පොල් කට්ටකින් වසන්නට යනවා වැනි ක්‍රියාවකි. එතුමාගේ එකම පුතණුවන් වූ ටියුඩර් රාජපක්ෂ වාසල මුදලිවරයාද පියාගේ අඩිපාරේ යමින් අතිවිශාල සේවයක් සිදු කළහ. ඒ සේවා අතරින් ප්‍රධාන තැනක් ගන්නේ තමාට අයත් අක්කර තුනකට අධික කොළඹ මරදානේ පරණ වාඩියවත්ත තුළ තමාගේ වියදමින් ප්‍රථම ගොඩනැගිල්ල තනවා තමා විසින්ම එය විවෘත කර කොළඹ ආනන්ද මහා විද්‍යාලය ස්ථාවර තත්ත්වයකට පත් කිරීමයි. අද මෙම සේවාවන් අගය කිරීමක් හෝ සිහිපත් කිරීමක් සිදු නොකර විවිධ උපක්‍රමවලින් යටපත් කිරීම සිදු කරගෙන

16 වන පිටුව බලන්න

# LAL LAW OFFICE



- Real Estate
- Mortgages
- Immigration Law
- Family Law
- Tax Law



## Lal Handapangoda

Barrister & Solicitor

90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com






RUUD · TRANE · Amana · HEIL

- Install Repair Service
- Furnace and Air condition
- Roof top Units Heating / Cooling
- Water Heaters
- Humidifiers
- Electronic Air cleaners
- Ultraviolet Air Treatment
- Gas stove and Gas Dryer
- Gas piping

Rheem · Carrier · Goodman · American Standard · GOETTL · LENNOX · YORK · Coleman · Day & Night · bryant · Comfortmaker · TEMPSTAR

## Climax Comfort Air

Your Comfort is our Satisfaction

Contact: **Kithsiri Mallawaarachchi**

Certified Gas Technician TSSA Authorize Contractor

Call **416-889-5796**

www.climaxcomfortair.com

7/24 Emergency service REPAIRS ON ALL MAKES AND MODELS WARRANTY ON REPAIRS



# TAX, ACCOUNTING AND BOOKKEEPING SERVICE

**We provide Personal and Corporate Tax Services**

- Friendly Personalized Service
- Fast Refund
- Provide tax planning advices to minimize your taxes

## OUR SERVICES

**Tax Services**

- Personal Tax Services
- Corporate Tax Services
- HST Filling

**Web Design**

- We can help you to design a website.

**Accounting and Bookkeeping Services**

- Annual Financial Statements
- Payroll Service
- Complete Accounting Outsource
- Day to day bookkeeping/ Processing
- Audit assistance

**Accounting and Bookkeeping Services**

- Annual Financial Statements
- Payroll Service
- Complete Accounting Outsource
- Day to day bookkeeping/ Processing
- Audit assistance

**Please contact Anura or Yacintha**

**PYNAX ACCOUNTING AND BUSINESS SOLUTIONS**

**Phone : 416-264-6850 | 647-789-7990**

18 Bedle Avenue, Toronto M2H 1K8

www.pynax.com

# මහායාන ධර්මයේ ආරම්භය සහ විකාශය



▪ බලපිටියේ පී. ඩී. සුමිත් ද සිල්වා

බුදුරදුන් ජීවමාන කාලයේදී මහායාන-හීනයාන වැනි හඳුන්වාදීම් නොතිබූ බව දක්නට ලැබේ. එහෙත් මහායානයේ බිහිවීම උදෙසා හේතු වන්නා වූ යම් යම් හේතු සාධක තිබූ බව දක්නට ලැබෙන නමුදු සෘජුවම එම අර්බුද හෝ සිද්ධි මහායානයේ ආරම්භය උදෙසා හේතු වූ බව තීරණය කිරීම බුද්ධි ගෝචර නොවන්නේ ඕනෑම සංවිධානයක් තුළ කල් යෑමේදී යම් යම් ගැටුම්, ප්‍රතිවිරෝධතා ඇතිවීමේ සම්භාවිතාව වැඩි හෙයිනි.

හතරවන සංඝායනාවට පෙර 'මහායාන' යන වචනය දක්නට නොලැබේ. එහෙත් සර්වපල්ලි රාධාක්‍රිෂ්ණන් පවසන්නේ ඊට පෙර 'දේවයාන', 'පීතෘයාන' වැනි වචන තිබූ අතර මහායාන සංකල්ප ඒ තුළ තිබූ බවය.

'මහායානය' යන වචනය පැහැදිලිව අපට හමුවන්නේ හතරවන සංඝායනා සමයේදී අශ්වඝෝෂයන්ගේ 'මහායාන ශ්‍රද්ධෝත්පාද සූත්‍රයේ'ය. වචනාර්ථ ලෙස ගතහොත් 'මහායානය' යනු 'උසස් යානය' වේ. 'හීනයානය' යනු 'පහත් යානය' වේ. ඒ අනුව ථෙරවාදී ගුරුකුලයට දක්වනු ලැබූ ප්‍රති විරෝධයක ප්‍රතිඵලයක් වශයෙන් මහායානය දක්නට හැකිය. කෙසේ වුවද මහායාන නිකායන්ගේ සහ ථෙරවාදීන්ගේ ඒකමතික තීරණය මත ලංකාවේ පැවැති ප්‍රථම ලෝක බෞද්ධ සම්මේලනයේදී හීනයානිකයන් 'ථෙරවාදීන්' ලෙස හඳුන්වන්නට තීරණය කරන ලදී.

මහායානිකයන් අතින් ලියවුණු ප්‍රථම විධිමත් කෘතිය මහා කවි අශ්වඝෝෂයන්ගේ 'මහායාන ශ්‍රද්ධොත්පාද සූත්‍රය' වේ. (Critical Survey of Indian Philosophy Sharma) මහායාන සූත්‍ර පැහැදිලිවම කණිෂ්ක රජුගේ අනුග්‍රහය යටතේ පැවැත්වුණු හතරවන සංඝායනාවෙන් පසු කාලයේ ලියැවී ඇත. එහෙත් මහායානිකයෝ එම සූත්‍ර බුද්ධ භාෂිත ලෙස සලකති. සංස්කෘතික භාෂාව මහායානිකයන්ගේ නිල භාෂාව වන නමුදු එම භාෂාවද ඒ තරම් පැරණි භාෂා ශෛලියක් අනුගමනය නොකරයි. මහායානිකයන්ගේ ප්‍රධාන සූත්‍ර නවයක් දක්නට ලැබේ.

1. අෂ්ට සහශ්‍රිකා ප්‍රඥා පාරමිතා සූත්‍රය
2. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය.
3. ලංකාවතාර සූත්‍රය
4. ලලිත විස්තරය
5. ස්වර්ණ ප්‍රභාස
6. ගණ්ඩව්‍යූහ සූත්‍රය
7. තථාගත ගුස්හක සූත්‍රය
8. සමාධිරාජ සූත්‍රය
9. දශ භූමිශ්වර සූත්‍රය

මෙම සූත්‍රද ආරම්භ කෙරෙන්නේ ථෙරවාදී සූත්‍ර ආරම්භ කරන 'ඒවං මේ සුතං' යන අයුරින්ම 'එවං මයා ශ්‍රැතම්' යනුවෙනි.

ඒ තුළින් ඔවුන් එම සූත්‍ර බුද්ධ භාසිත ලෙසට ස්ථිර කරන්නට ගත් උත්සාහයක් දක්නට ලැබේ. මහායානයේ ආදිම ගුරුකුලය 'මහා සංඝතයන්' වන අතර ආදිම සාහිත්‍ය 'මහායාන සූත්‍ර සාහිත්‍යය' වේ.

මහායාන සූත්‍ර දෙවන සියවස වනතුරු නොතිබූ අතර එය උතුරු ඉන්දියාවේ නාලන්දාවේ සිදු වෙන්නට ඇති බව වෝඩර් මහතා සිතන අතර පසුකාලීනව විශාල උගත් මහායාන ආචාර්යවරු පිරිසක් බිහිවීමට මෙම පෙර සූදානම බොහෝ ඉවහල් වූ බව පෙනෙන බව දක්වයි. මෙම සූත්‍ර සහ මහායාන දර්ශනය ප්‍රවර්ධනය කිරීමේදී මහා සාංඝිකයන්ගේ සිතුම්-පැතුම් ඉගැන්වීම් මුල් වූ බව ටී. එච්. ෂර්බැට්ස්කි පවසයි. අශෝක රජුගේ කාලයේ සිට කනිෂ්ක රජුගේ කාලය තෙක් ව්‍යක්ත බවට පත් අදහස් තුළින් මහායානය උපන් බව සර් රාධා ක්‍රිෂ්ණන් පවසයි. කෙසේ වූවද මහායානික යන වචනයෙන් හතරවන සංඝායනාවට පෙර භික්ෂූන් හඳුන්වා නැත. එබැවින් මහායාන ශ්‍රද්ධොත්පාද සූත්‍රය හා සෞන්දරානන්ද මහා කාව්‍ය ලියූ අශ්ව ඝෝෂපාදයන් ප්‍රථම මහායානිකයා ලෙස ඩී. ටී. සුසූකි මහතා කල්පනා කරයි. මෙම සූත්‍ර තුළ මුල් ත්‍රිපිටකයේ බුදුරදුන්ගේ මානුෂීය බව අමතක කොට අධි මානුෂිකත්වයක් නිරූපණය කොට ඇති බැවින් මහායාන සූත්‍ර තුළ පළමුව දාර්ශනික බවක් නොව ආගමික ස්වරූපයක් දන්නට ඇති බව වී. කේ. වෝඩර් කියයි. ටී.ආර්.වී. මූර්ති පවසනුයේ මහායාන සාහිත්‍ය 'හීනයාන' සංකල්ප විකාශනය කරනු ලැබූ බවත් මහායාන සූත්‍ර සාහිත්‍ය මෙම සම්ප්‍රදායයන් දෙක වෙන් කරන කඩඉම බවය. එබැවින් මහායාන සාහිත්‍ය එක පාදයක් හීනයානයේද අනෙක් පාදය මහායානයේද තබාගත්තේය.

මහායාන සම්ප්‍රදාය හා හීනයාන හෙවත් ථෙරවාදී සම්ප්‍රදාය දෙක විවිධ හේතු නිසාවෙන් විවිධ නම්වලින් හඳුන්වා ඇත.

1. හීනයාන බුදු දහම - මහායාන බුදුදහම
2. දක්ෂිණ බුදු දහම - උත්තර බුදුදහම
3. ශුහ්‍යයාන බුදු දහම - ව්‍යක්තයාන බුදුදහම
4. සහජයාන බුදු දහම - කඨිනයාන බුදුදහම

යනුවෙනි.

පළමු බෙදීම ආගමික ඉගැන්වීම් හේතුකොට ගෙන බිහි වූ බව පෙනේ. දෙවන බෙදීම භූගෝලීය සාධක හේතුවෙන් සිදු වුවද රයන් කිවුරා පවසනුයේ උත්තර බුද්ධාගම ලෙස හඳුන්වන මහායානයද දකුණේ වැඩී පසුව උත්තර දේශයට සම්ප්‍රාප්ත වූ බවය.

තෙවන බෙදීම බුදු රදුන්ගේ ඉගැන්වීම් ක්‍රමය පාදක කොට බිහිවූ අතර සතරවන ක්‍රමය ආචාර විද්‍යාත්මක සාධක හේතුවෙන් නම් කරන ලදී.

'මහායාන' යන වචන මුල් බුදු සමය තුළ දක්නට නොලැබුණද එයට තුඩු දෙන ඒකයාන, බුද්ධයාන, බෝධිසත්වයාන, බ්‍රහ්මයාන, ධම්මයාන වැනි යාන පිළිබඳ සංයුක්ත නිකායෙන් සොයා ගැනීමට හැකිය. මහායාන-හීනයාන බෙදීමට පෙර බෝධිසත්වයාන, ප්‍රත්‍යෙයකයාන, බුද්ධයාන, ශ්‍රාවකයාන යනුවෙන් බෙදීමක්ද වූ බව සුසූකි දක්වයි. කෙසේ වුවද මහායානය නම් ප්‍රබල නිකාය ක්‍රි. ව. 1 හෝ 2 සියවසේදී ආරම්භ වූ බව නීත් ස්ථිරවම ප්‍රකාශ කරයි.

මහායානයේ ප්‍රභවය පිළිබඳ විවිධ වියතුන් විවිධ මතවාද ඉදිරිපත් කර ඇත. කර්න සහ වින්ටර්නිට්ස් පවසනුයේ භගවත් ගීතාවේ ඇති භක්තිය පිළිබඳ ඉගැන්වීම් මහායානයේ ප්‍රභවයට හේතු වූ බවයි. ෂර්බැට්ස්කි කල්පනා කරනුයේ මහායානය උපනිෂද්වලටද ණය ගැති බවයි. මුල් බුදු සමයේ මූලධර්ම විවරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මහායානය බිහි වූ බව කීත් කියයි. අනවශ්‍ය පරිකල්පනය ප්‍රතික්ෂේප කළ බුදු සමය ථෙරවාදී දාර්ශනික විචාරයට බාධාවක් වූ හෙයින් තාර්කිකව කරුණු ඉදිරිපත් කිරීමේදී මහායානිකයෝ ථෙරවාදීන්ට වඩා ඉදිරියෙන් සිටින බව බෂාම් පවසයි. මුල් බුදු සමයේ මූලධර්ම විවරණය කිරීම හේතුවෙන් මහායානයේ එම දේශනා විචිත්‍ර දේශනා බවට පත්වූ බව වෝඩර් කියයි. බුදු රදුන්ගේ අනුගාමිකයන් විවිධ අවශ්‍යතාවන්ට අනුව බුදු රදුන්ගේ ධර්මය දියුණු කිරීමේ ප්‍රතිඵලය වූයේ හීනයාන - මහායාන දර්ශන දෙකක් බිහිවීම බව සුසූකි පවසයි.

ප්‍රධාන වශයෙන් මහායානය බිහිවීමට කරුණු තුනක් හේතු විය.

- බුදු රදුන්ගේ පෞරුෂයේ ලෝකෝත්තර බව ප්‍රපංචයන්හි සාරය පිළිබඳ සංකල්පය
- අර්හත් බව වෙනුවට බුද්ධත්වය, බෝධිසත්ව සංකල්පය, ශ්‍රාවකයන්ගේ පෞද්ගලික විමුක්තිය සාධනය වෙනුවට සියල්ලන්ගේම විමුක්තිය.
- ධර්ම පරමාර්ථවාදයට විරුද්ධ වූ ධර්ම ශුන්‍යතාව පිළිබඳ ඉගැන්වීම.

ඊට අමතරව බුද්ධ පරිනිර්වාණයෙන් පසු බ්‍රාහ්මණ බලවේගය යළිත් ඉස්මතු විය. එම ඉස්මතු වූ බ්‍රාහ්මණ බලවේගය දාර්ශනික අංශයෙන් මෙන්ම ආගමික අංශයෙන්ම පරාජය කරනු ලැබූවේ ථෙරවාදීන් නොව මහායානිකයන්ය. එම වාතාවරණය තුළ මහායානිකයෝ තවදුරටත් ප්‍රබලත්වයට පත් වූහ.

දෙවන සංඝායනාවේ සිට තෙවන සංඝායනාව දක්වා කාලය තුළ ඇතිවූ විවිධ ගුරුකුලයන්හි විවිධ මත තුන්වන සංගායනාවේදී මොග්ගලීපුත්ත තෙරුන් විසින් රචිත 'කථා වස්ථූප්පකරණයේ' සාකච්ඡා කරනු ලැබේ. මෙහිදී විනය ප්‍රශ්නවලට වඩා දාර්ශනික ගැටලු කෙරෙහි මේ යුගයේ වූ ප්‍රවණතාව වැඩි බව දක්නට ලැබේ. ධර්මාශෝක රජු සමයේ සිදුවූ සාසන සංශෝධනයේදී භික්ෂූන්ගෙන් අසනු ලැබූ පොදු ප්‍රශ්නයෙන්ද මේ තත්ත්වය ප්‍රකට වේ. එනම් 'කුමන වාදීද?' යන්නය. එහිදී 'විභ-ජවාදී' යන පිළිතුර ලැබුණු භික්ෂූන් සිල්වතුන් ලෙස සැලකූ අතර අනෙක් පිළිතුරක් ලත් අය සුදුවත් හඳවා සසුනින් නෙරපූ බව සඳහන් කරයි.

විභ-ජවාදී යන්න බුදු සමයේ මූලික තේමාවක් වූ බව මින් පැහැදිලිය. එබැවින් ස්ථවිරවාදීන්ගේ මෙම මතය සනාථ කිරීමට ඔවුහු උත්සාහ ගත්හ. එහෙත් ස්ථවිරවාදීන්ගේ මෙම ස්ථාවරයට පිටු පා වෙනත් ස්ථාවරයක් දැරූ විශාල භික්ෂූන් පිරිසක් වූ බව විශාල භික්ෂු පිරිසක් දුසිල්වතුන් යයි සලකා සුදුවත් හඳවා සසුනින් බැහැර කිරීම තුළින් පැහැදිලිය.

මහායානයේ මූලික සිද්ධාන්ත එක්වරම ගොඩනැගුනක් නොව ක්‍රමයෙන් මුල් බුදු සමයෙන් ලත් ආභාෂ තුළින් පසුකාලීන ගුරුකුල විසින් විශ්ලේෂණය කරනු ලැබීමෙන් සිදු වූවකි. මහායානයේ සංකල්ප පිළිබඳ විමසා බැලීමේදී වරින් වර නිර්මාණශීලී ලෙස හා ඒවා දාර්ශනික විග්‍රහයකට ලක්වීමෙන් මෙම සංකල්ප යුගයෙන් යුගය සංවර්ධනය කරනු ලැබූ බවක් පෙනේ.

පළමු සංඝායනාවේදී බිඳී ගිය භික්ෂූන්ගෙන් ඇරඹුණු මහා සංඝික නිකාය ථෙරවාද බුදුසමයෙන් භින්න වී වෙනමම නිකායක් ලෙස සංවර්ධනය වූ පළමු නිකාය වේ. පළමු සංඝායනාවේදී මොවුන් බෙදී වෙන්වී ගියද නිකායයක් ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනු ලැබුවේ දෙවන සංඝායනාවෙන් පසුව බව පෙනේ. වජ්ජිපුත්තක භික්ෂූන් මෙහිදී මූලිකව කටයුතු කරනු ලැබූවද මෙම

20 වන පිටුව බලන්න

# පුංචි හපනා

ඒ මහා කැළයේ රජා සිංහයායි. සිංහයාට ඉහළින් කිසිවෙකුත් කිසිම දෙයක් කළේ නෑ. දවසක් මේ සිංහ රජා තමාගේ ගුහාව ඉදිරිපිට ගල් තලාවේ නිදාගෙන සිටියා.

මේ වෙලාවේ කොහේදෝ ඉඳල ආපු මී පැංචෙක් සිංහයා නිදා සිටි තැන තිබුණු තණකොළ පඳුරු අතර සෙල්ලම් කරමින් සිටියා. මී පැංචා එහෙට පනිනවා. මෙහෙට පනිනවා. එයාට ඉන්නෙ කොහෙද කරන්නෙ මොකක්ද කියල කිසිම නිනව්වක් නෑ. සෙල්ලමේ සිහියම විතරයි. සිංහ රජා එතන ඉන්න බව වත් එයාට මතක නෑ.

ටික වේලාවයි ගියේ. පැංචා පැනපු පිම්මක් වැරදුණා. නිදාගෙන සිටි සිංහයාගේ හිසටත් උඩින් ගිය ඒ පිම්මේදී මී පැංචා වැටුණේ සිංහයාගේ මුහුණ ඉදිරිපිටටයි.

මහා ඝෝෂාවක් කරමින් අවදි වුණු සිංහයා දැක්කෙ තමන්ගෙ මූණ ඉදිරිපිට ඉන්න මී පැංචව. තමන්ගේ නින්දට බාධා කළ එක ගැන සිංහයාට හරිම කේන්තියි. සිංහයා තරහින් ගොරවනවා. මී පැංචා බයේ වෙවුලමින් පැනල යන්න ඉසව්වක් සොයනවා. කොහෙ පනින්නද? සිංහයා එක පාරටම අතක් ඉදිරියට දාලා මී පැංචව යට කර ගත්තා. කැළේටම රජා වුණු මේ මහා සිංහයාට මේ පුංචි මී පැංචව එක කටටකටවත් මදි. ඒත් තරහින් සිටි සිංහයා මේ සැරසෙන්නේ මී පැංචව ගිල දැමීමටයි. සිංහයා කට විවර කළා. බයේ වෙව්ලමින් සිටි මී පැංචා වැඳ වැටෙමින් මෙසේ මොර ගෑවා.

"අනේ රජතුමනි.... මම ඔබෙන් සමාව අයදිනවා... මාව මරන්න එපා. අනේ මේ වතාවට පමණක් මම කළ වරදට මට සමාව දෙන්න. මම කිසිමදාක ඔබතුමාට බාධා වන දේවල් කරන්නෙ නෑ. මගේ ජීවිතය ඉතිරි කරන්න. ඔබ මට දක්වන කරුණාව මම කිසිමදාක අමතක කරන්නෙ නෑ. සමහරවිට කවදාක හරි ඔබටත් උපකාරයක් කිරීමට මට හැකි වේවි..."

මී පැංචගේ මේ කතාව අහන් හිටිය සිංහ රජාට සිනහව නවත්වා ගැනීමට නොහැකි වුණා. සිංහයා මහා හයියෙන් හිනා වුණා... හිනා වුණා... හිනා වුණා.....

"ඔබ වැනි පුංචි සතෙක් මට උදව් කරන්න.... කුමන විහිළුවක්ද මෙය... " සිංහයා පැවසුවා.

තමාගේ මරණය දැන් නම් ස්ථිරයි කියා මී පැංචාට සිතුණා. දැන් කරන්නට දෙයක් නෑ. සිංහ කටට යන තුරු මී පැංචා බයෙන් මිරිකෙමින් බිම බලා සිටියා. මර බයේ ගුළි වී සිටින මී පැංචා දිහා සිංහයා හොඳට බැලුවා.

"හොඳයි.... ඇඟේ මස් කළඳක්වත් නැති නිසා උඹ මගේ ආහාර වේලකට සෑහෙන්නෙත් නෑ. ඒ නිසා මම උඹව නිදහස් කරනවා...." යැයි පැවසූ සිංහයා මී පැංචාගේ ඇඟ උඩ තිබුණු සිංහ අත ඉවතට ගත්තා. නිදහස ලැබූ මී පැංචා පසුපස නොබලා කැළෑවට දිව ගියා.

මෙහෙම ටික කාලයක් ගත වුණා. සිංහයන් දඩයම් කරන දඩයක්කරුවන් කිහිප දෙනෙක් දවසක් මේ කැළෑවට ඇතුළු වුණා. හොඳට වැඩුණු සිංහයකු පන පිටින් අල්වාගෙන ගොස් රටේ රජතුමාට දී තෑගි ලබාගැනීමට මේ දඩයක්කරුවන්ට වුවමනා වුණා. කැළය මැදට ආපු දඩයක්කරුවන් සිංහ දඩයම සඳහා හොඳ මහත කඹ යොදපු උගුලක් ඇටෙව්වා.

ඒ වෙලාව කැළේ රජා සිංහයා ආහාර සොයාගෙන යන වෙලාවයි. හරියටම උගුල අටවලා තිබුණේ සිංහයාගේ ගමන් ගන්නා මාර්ගයේයි. මේ කිසි දෙයක් නොදන්න සිංහයා එතනින් යද්දි උගුලට හසු වුණා. උගුලෙන් ගැළවෙන්න දඟලද්දි තව තවත් ඒකට හිර වුණා. සිංහයාට කිසිම දෙයක් හිතා ගැනීමට බැරි වුණා.

'මොකක්ද මේ වුණේ. ඉතිං නම් මට කවදාවත් මෙතනින් ගැළවිලා යෑමක් නෑ....' යි සිතූ සිංහයා මහ හඬින් බෙරිහන් දීමට පටන් ගත්තා.

"මාව බේරාගන්න.... මාව බේරාගන්න... මම උගුලක හසුවෙලා.... මාව බේරාගන්න...."

සිංහයාගේ හඬ කැළෑව පුරා රාව ප්‍රතිරාව නගමින් විහිදී ගියා. සිංහයාගේ හඬ ඇසුණත් කිසිම සතෙක් ඒ අහලකටවත් ආවේ නෑ...

සිංහයා නොනවත්වාම කෑ ගැසුවා. සිංහයාගේ මේ කෑ ගැසිල්ල පුංචි මී පැංචට ඇසුණා. 'එකත් එකටම මේ එදා මාව නිදහස් කළ ඒ උත්තමයගේ හඬම තමයි' සිංහයා ඉදිරිපිට එදා තමා දුන් පොරොන්දුව මී පැංචට සිහි වුණා. මී පැංචා ඉක්මනින්ම ඒ හඬ ආ පැත්තට දුවගෙන ආවා.

උගුලට හසු වී සිටි සිංහයා දුටු මී පැංචට හරියට දුක හිතුණා. සිංහයා හොඳටම කලබල වෙලා. බියෙන් ගිගිරුම් දෙමින් කෑ ගසන දෙස මී පැංචා මොහොතක් බලා සිටියා. ඉන්පසු වහාම උගුල ළඟට පැන සිංහයාට මෙසේ කිව්වා.

"රජතුමනි.... රජතුමනි... සංසුන් වෙන්න. ඔබ ඔහොම කෑ ගසන්න එපා. මේ විදියට ගර්ජනා කරමින් කැළය දෙදරවන්න කෑ ගැසුවොත් දඩයක්කරුවන් දැනගන්නවා ඔබ උගුලේ අසුවී සිටින බව. නිහඬව ඉවසිල්ලෙන් ඉන්න. මම ඔබතුමාව මේ උගුලෙන් ගලවා ගන්නම්...."

මේ කෙසඟ පුංචි මී පැංචට තමන්ව ගලවා ගැනීමට හැකියාවක් ඇද්ද යන්න ගැන සැක හිතුණත් සිංහයා නිහඬව සිටීමට තීරණය කළා. ඉන්පස්සෙ පුංචි මී පැංචා තමන්ගේ තියුණු දත්වලින් අර උගුලේ තිබුණු ලණු සපා කඩා දැමීමට පටන් ගත්තා. මී පැංචා නොනවත්වාම ඒ විශාල මහත කඹ සපා කැඩුවා. මී පැංචගේ කටත් තුවාල වෙලා. ලේත් පෙරෙනවා. ඒත් මී පැංචා නොනවත්වාම සිංහයා නිදහස ලබන තුරුම කඹ සපා දැම්මා.

අවසානයේදී සිංහයා නිදහස ලැබුවා. උගුලෙන් එළියට ආ සිංහයා පුංචි මී පැංචව දෑතට ගත්තා.

"මගේ පුංචි යාළුවා.... මාව මේ උගුලෙන් ගළවාගත්තට ඔබට බොහොම ස්තූතියි. එදා ඔබ දුන් පොරොන්දුව ඉටු කළා.... මටයි වැරදුණේ. මා මෙතෙක් කල් සිතා සිටිය හැටි වැරදියි. ශරීරයෙන් කුඩා වුවත් ඔබ වැනි අයටත් කළ හැකි දේවල් තියෙනවා. ඔබගේ කරුණාවන්ත කම නිසා කෙළෙහි ගුණ දැක්වීමේ ගුණය නිසා අද මම නිදහස් වුණා. මම නැවතත් කිසිම කෙනෙකු ගැන අඩුවෙන් සිතන්නේ නෑ... අද සිට ඔබ මා සමගම සිටිය යුතුයි" කියා මී පැංචාත් සමග සිංහ ගුහාවට ගියා.



## ළමා කවි

### ලෝ වැඩ සඟරාව

කාලා රස මුසු භොජන කර පෙම් සාර නූ කුණු කයක් ඇරගෙන කරන බහු නාටක තදේ
ගාලා සුවදැති සඳුනුත් මනරම් නෑර තම හිමි සමග දවසැර උන්නමුත් සැප විඳ විදේ
ලාලා අබරණ රිසි ලෙස සැරසුම් ගෝර මරුවා පැමිණි කල් දැන යන්ට කැඳවා එන සදේ
පාලා ගිය වැනි බහු රූ කෝලම් බාරවම සිටුවන්ට බැරි වෙද පිනක් කරගත්තොත් සොදේ

මෙබස් තම නුවණින්ම විමසා නොතිර වූ කය ගති අසන්නේ සරණ මුනිඳුගේ අදහ පිනකුත් නොකර ඉන්නේ කුමටදෝ
දෙතිස් කුණුවෙන් යුතුව මඳකුත් සාර නූ බව නැණින් දන්නේ මරණ පැමිණෙන කලට යමයා අවුත් කැඳවා යන්ට දෝ
මිනිස් බව ලත් තැනේ කුසලක් නොකර උන්නොත් අපල වන්නේ කරන සොඳකම් දන් පිනක් කළ කියනු නුවණින් සොඳ වේදෝ
සතිස් එක්සිය නිරේ වැටුණොත් එදයි අනුවණ කම් දැනෙන්නේ කුමන අනුවණ කම්ද නෑයිනි අඬනු සිටුවා ගන්ට දෝ

පෙරත් ජාතියෙ පතා ගත් දැන් හේතු බලයෙන් මෙතැන්නේ අඬාලා කම්පාව වුන්නත් ඉතින් දැක්මක් නොවන්නේ
ළඟත් වෙන් නොව සමග දවසැර උන් නමුත් සෙනෙහසින්නේ තනාලා සිත පිනක් නොකරම කුමට උපයා තබන්නේ
පණත් යන කල තනිව ගෙයි උන් අයත් වෙන් වෙති බඳින්නේ දමාලා යන නරක කුණු කය කුමටදෝ සැප විඳින්නේ
පිනුත් කළ නිති කැටුව යෙයි ගිය තැනේදී සැප විඳින්නේ දිනාලා මොක් පුරට යන්නට ම කී මේ බණ අසන්නේ

**වීදාගම මෛත්‍රිය හිමියන් විසින් රචනා කරන ලද 'ලෝවැඩ සඟරාව' කෝට්ටේ යුගයේදී ලියවුණු වටිනා ග්‍රන්ථයකි. ජීවිතය යහපත්ව පවත්වා ගැනීමට වුවමනා දහම් කරුණු රැසක් මනරම් ලෙස කාව්‍යාකාරයෙන් මෙහි ඉදිරිපත් කර ඇත.**

## ළමා ගී

### මල් මල් වාරම් හරිමැ උදාරම්

**මල් මල් වාරම් හරිමැ උදාරම්**
**ගයවා ගයවා ගුවනේ**
**ලංකා නම වෙනුයෙන් පුරසාරම්**
**කියවා කියවා මෙදිනේ**

**හෙළ මල් රඟ දී පිපී නටනවා - තිසා වැවේ ඉවුරේ**
**රතඹල රදලිය රජලිය වෙනවා - සීගිරි ගිරි මැදුරේ**
**සමනොල කන්දේ උඩවැඩියා මල - සීතලයෙන් පිපිරේ**
**මිහින්තලා ගල මලින් පිරිලා - සේදේ සිල් මිහිරේ**

**මල් මල් වාරම් හරිමැ උදාරම්.....**

**බඹරා බඹරී නුරානුරාගය - ඉබේ බිඳී යනවා**
**මී මී පැණි පැණි වද වද රොද රොද - ඉබේ බැඳී යනවා**
**මුළු ලොව සත්නගෙ විඩා කඩා හැර - කුසුමින් නැහැවෙනවා**
**කවියෙන් ගීයෙන් විරිතින් තනුයෙන් - අළුත්වැ පණ එනවා**

**මල් මල් වාරම් හරිමැ උදාරම්.....**

**හිරු රැස් නාමින් නෙළුම් පිපීලා - පොකුණු හිනා වෙනවා**
**මැයි ගස නන් සිරි පින් සිරි රුසිරින් - මනමාලිය වෙනවා**
**බඳු වද කිණිහිරි ඉද්ද සමන් මල් - තරගෙට පිබිදෙනවා**
**මල් මල් මල් මල් දෙගොඩ තලා මල් - ගඟක් ගලා එනවා**

**මල් මල් වාරම් හරිමැ උදාරම්.....**

**ගායනය, සංගීතය - සුනිල් සාන්ත සූරීන්**
**ගී පද - කැලිස්ටස් ජයසිංහ**



# ඉතිහාසයේ අයවැය

■ නන්දලාල් වාකිස්ට විසිනි

**අලෙවිකරණය විෂයයේදී 'අයවැය ලේඛනය' යන්න අර්ථ දක්වා ඇත්තේ 'කිසියම් නිශ්චිත කාල පරිච්ඡේදයකදී සිදුකළ යුතු සියලුම වියදම් සහ එම කාලය තුළදී අපේක්ෂිත සියලුම ආදායම් වාර්තාගත කර සකස් කරන මූල්‍ය සැලසුම් පතක්' ලෙසිනි. නිවැරදි අයවැය ලේඛනයක් සහිත වීම කුඩාම ව්‍යාපාරයක් නිසි ලෙස පවත්වාගෙන යාමේ සිට රටක පරිපාලනය නිසි ලෙස පවත්වාගෙන යාම දක්වාම අත්‍යවශ්‍ය වන්නකි. එම නිසා සෑම වසරකට වරක්ම රටක ආදායම් වියදම් තත්ත්වය දැක්වෙන නිවැරදි 'අයවැය ලේඛනයක්' සකස් කිරීම සිදු කෙරේ. ඒ අනුව 2017 වසර සඳහා ශ්‍රී ලංකාවේ අයවැය යෝජනාවලිය නොවැම්බර් මස දෙවන සතියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. ඒ නිසාම අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති 'අයවැය' ඉදිරිපත් කිරීම් පිළිබඳව සොයා බැලීමට අප අදහස් කළා. මේ ඒ ගැන ලියවුණු ලිපියකි.**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ආරම්භය සිදුවූයේ 1947 මැතිවරණයෙන් පසුවය. මුල්ම අයවැය ලේඛනය ඉදිරිපත් කළේ එකල තිබූ එ.ජා.ප. රජයේ මුදල් අමාත්‍ය ලෙස සිටි ජේ. ආර්. ජයවර්ධන මහතාය. එම අයවැය ලේඛනය විවේචනය කළ විපක්ෂයේ මන්ත්‍රීවරයකු වූ මොරටුව මන්ත්‍රී ධුරය දැරූ සෝමවීර චන්ද්‍රසිරි මහතා 'ගොවියාට සහනය නෑ...' 'කම්කරුවාට සහනය නෑ...' 'ජනතාවට සහනය නෑ...' යනුවෙන් 'නෑ... නෑ...' කියමින් කතා කළේය.

ඒ අවස්ථාවේදී ඔහු නිහඬ කිරීමට ඉදිරිපත් වූයේ එකල එ.ජා.ප. රජයේ සභානායක ලෙස සිටි එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාය. "නිශ්ශංකගේ ප්‍රෙස් එකත් නෑ. මගේ ඔස්ටින් සෙවන් කාර් එකත් නෑ..." කියමින් බණ්ඩාරනායක මහතාද කතා කරන්නට විය. ඊට හේතු වූයේ සෝමවීර චන්ද්‍රසිරි මහතා කුරුණෑගල මන්ත්‍රීව සිටි රාජ නීතිඥ එච්. ශ්‍රී නිශ්ශංක මහතාගේ මුද්‍රණාලයත් බණ්ඩාරනායක මහතාගේ මෝටර් රථයත් ලබාගෙන පසුව නොදී සිටීමය. සෝමවීර චන්ද්‍රසිරි මහතා ඉන් නිහඬ විය.

## පෙරළිකාර අයවැයක්

ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ පෙරළියක් කිරීමට හේතු වූ අයවැයක් ඉදිරිපත් කළේද ජේ. ආර්. ජයවර්ධන මහතාය. ඩඩ්ලි සේනානායක මහතාගේ නායකත්වයෙන් තිබූ එ.ජා.ප. රජය යටතේ ජේ. ආර්. ජයවර්ධන මහතා 1953 ජූලි මස 23 වන දින ඉදිරිපත් කළ අයවැය ලේඛනය තුළින් මේ රටේ විශාල වශයෙන් දේශපාලන විපර්යාසයක් ඇති විය. ඊට හේතුව එම අයවැය ලේඛනය තුළ හාල් සේරුවේ මිල සත 25 සිට සත 70 දක්වා වැඩි කිරීම, දුම්රිය ගාස්තු වැඩි කිරීම වැනි යෝජනා තිබීමය.

මේ නිසා ශ්‍රී ලංකාවේ අදත් වාර්ෂිකව සමරන හර්තාලය 1953 අගෝස්තු මස 12 වෙනිදා ඇතිවිය. මුළු රටේම ජනතා කෝපය උත්සන්න විය. අම්බලන්ගොඩ, රන්දොඹේ, මාදම්පේ, අකුරල, තොටග මුව, බලපිටිය, කරන්දෙණිය, ඌරගහ, අහුන්ගල්ල ආදි ප්‍රදේශවල මහජන විරෝධතා පැතිර ගියේය. කොළඹ වරායේත්, වැල්ලවත්ත රෙදි මෝලේත් කම්කරුවෝ සංකේත වැඩ වර්ජන මගින් විරෝධය ප්‍රකාශ කළහ.

මේ නිසාම එ.ජා.ප. රජයට කැබිනට් රැස්වීමක් පැවැත්වීමට සිදුවූයේ බ්‍රිතාන්‍යයට අයත් එච්.එම්.එස්. නිව්සවුත්ලන්ඩ් නමැති යුද නෞකාවේ සිටය. ඒ අනුව හදිසි අවස්ථාව සහ ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කළේය. ඒ සමගම හර්තාලය මැඩ පැවැත්වීම සඳහා රජය විසින් විරෝධතා දක්වන අයට වෙඩි තැබීමට ක්‍රියා කරන ලදී. මෙම වෙඩි තැබීම්වලින් නව දෙනෙකු මිය ගියහ. වාමාංශිකයන් රාශියක් පොලිස් අත්අඩංගුවට ගනු ලැබීය. වාමාංශික පක්ෂවලට අයත් පත්තර තහනම් විය. සිය ගණනකට විරුද්ධව නඩු පවරා උසාවියට ඉදිරිපත් කෙරිණි. 1953 අගෝස්තු 12 වෙනිදා ඇති වූ හර්තාලය ලංකාවේ ධනපති පාලනයට විරුද්ධව ඇති වූ පළමුවැනි ජනතා නැගිටීම විය. එම හර්තාලයෙන් නව දෙනෙකු මිය යාම ගැන අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මහතා කම්පාවට පත් විය. එ.ජා.ප. රජයේ තිබූ ජනප්‍රියතාව අඩු විය.

මේ නිසාම කලකිරීමට පත් වූ අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මහතා 1953 ඔක්තෝබර් 12 වැනිදා අග්‍රාමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්විය. පසුව සභානායක ලෙස සිටි සර් ජෝන් කොතලාවල මහතා නව අග්‍රාමාත්‍ය ලෙස පත් වුණි. 1953 හර්තාලයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එතරම් සහයෝගයක් නොලැබිණි. නමුත් වාමාංශිකයන් මෙහෙය වූ හර්තාලයෙන් නියම ප්‍රයෝජනයක් ගත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. 1956 මැතිවරණයේදී එ.ජා.ප. රජය බිඳ වැටීමට ප්‍රබල සාධකයක් වූයේ එම 53 හර්තාලයයි.

## ඇමති ධුර වෙනස් කළ අයවැය

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමයේදී මුදල් අමාත්‍ය ලෙස සිටි ෆිලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක මහතා 1962 ජූලි මස 26 වනදා ඉදිරිපත් කළ අයවැය ලේඛනය නිසා ආණ්ඩු පක්ෂයේ පවා නොසන්සුන්තාවයක් ඇති විය. අයවැය ලේඛනයෙන් පැනවුණ අලෙවි බද්ද සීමා වූයේ දින කීපයකට පමණි. සහල් සලාකය සේරු භාගයකින් අඩු කිරීමේ යෝජනාවක්ද මුදල් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලදී. 1962 ජූලි මස 27 වනදා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ රැස්වීමේදී අයවැය යෝජනාවලට විරුද්ධව ඡන්දය දෙන බවට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු තර්ජනය කළහ.

ඒ සමගම මුදල් උප ඇමතිව සිටි ජෝර්ජ් රාජපක්ෂ මහතාද අයවැය යෝජනාවට විරුද්ධ වෙමින් තම තනතුරින් ඉල්ලා අස්විය. ඊට අමතරව දෙනියාය මන්ත්‍රීව සිටි සුමනපාල දහනායක මහතාද ශ්‍රී.ල.නි. පක්ෂයෙන් අස්වී ල.ස.ස. පක්ෂයට එක් විය. අයවැය විවාදය අවසානයේදී ෆිලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක මහතා මුදල් ඇමති ධුරයෙන් ඉල්ලා අස්විය. පසුව වැඩ බලන අමාත්‍ය ලෙස සභානායක ධුරය දැරූ සී.පී. ද සිල්වා මහතා පත් විය. මාස කීපයකට පසුව පී.බී.ජී. කළුගල්ල මහතා මුදල් අමාත්‍ය ධුරයට පත් විය. 1963 සිට මුදල් අමාත්‍ය ලෙස පත්වූයේ ටී. බී. ඉලංගරත්න මහතාය. ෆිලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක මහතාගේ අයවැය නිසා මෙවැනි වෙනස්වීම් ඇති විය.

## පළමු සිංහල අයවැය

1963 වර්ෂයේදී ටී.බී. ඉලංගරත්න මහතා ඉදිරිපත් කළ අයවැය ලේඛනය ඉතා වැදගත් විය. එක් හේතුවක් වූයේ ප්‍රථම වරට සිංහලෙන් එම අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමය. එහි ආර්ථික උපදේශක වශයෙන් කටයුතු කළේ සුප්‍රකට ආර්ථික විශේෂඥයෙකු වූ ජයන්ත කැලේගම මහතාය. එම අයවැය යෝජනා අනුව පිටි, සීනි හා ලාම්පුතෙල් මිල අඩු විය. අලුතෙන් ශත 50 ක වටිනාකමකින් යුත් ජාතික ලොතරැයි පතක් බිහි විය. ඉලංගරත්න මහතාගේ අයවැය ලේඛනය ජනතාවට සහනදායක එකක් වූයේය.

## මැතිවරණයකට පාර කැපූ අයවැය

1964 ජූනි 11 වන දින ශ්‍රී.ල.නි. පක්ෂය හා ල.ස.ස. පක්ෂය හවුල් රජය ඇතිවීමෙන් පසුව එහි මුදල් අමාත්‍ය ලෙස පත් වූයේ ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතාය. ඒ අනුව ඔහු 1964 ජූලි 30 වනදා තම කුළුදුල් අයවැය ලේඛනය පාර්ලිමේන්තුවය ඉදිරිපත් කළේය. එකී අයවැය ලේඛනය තුළින් ඉදිරිපත් කර තිබූ පොල් රා මැදීමට අවසර දීම හා පුවත්පත් පාලනය කිරීම වැනි යෝජනා නිසා රට තුළ විශාල වශයෙන් ආන්දෝලනයක් ඇති විණි. විශේෂයෙන් පොල් රා මැදීමට අවසර දීම නිසා බෞද්ධ භික්ෂූන් විරෝධය පළ කළහ. මල්වතු හා අස්ගිරි නායක හිමිවරුද විරුද්ධ වූහ. රට පුරා විරෝධතා රැස්වීම් ඇතිවිය. භික්ෂූන් වහන්සේලාගේ විරෝධය නිසා රජයට සිදුවූයේ පොල් රා මැදීමේ යෝජනාව ඉල්ලා අස් කර ගැනීමටය.

එහෙත් පුවත්පත් පාලනය හා ලේක්හවුස් ආයතනය ජනසතු කිරීමය රජය අදහස් කළේය. ඒ සමගම විපක්ෂය ශක්තිමත් විය. පුවත්පත් පනත ක්‍රියාත්මක කිරීමට එරෙහිව දැවමොට්ටාවේ අමරවංශ හිමි සහ මීටියාගොඩ ගුණරතන හිමි ඇතුළු භික්ෂූන් වහන්සේල පෙරමුණ ගත්හ. විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය සමග මහජන එක්සත් පෙරමුණේ නායක පිලිප් ගුණවර්ධන මහතාද ජාතික විමුක්ති පෙරමුණේ කේ. එම්. පී. රාජරත්න මහතාද ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක විජයානන්ද දහනායක මහතාද එක් වූහ. විපක්ෂයට ශක්තිමත් තුරුම්පුවක් මතු විය. එනම් ඇන්. ඇම්. පෙරේරා මහතා ඉදිරිපත් කළ අයවැය ලේඛනයේ යෝජනාවක් වූ පොල් රා මැදීම අස්කර ගැනීමය. ඒ අනුව මුදල් අමාත්‍යවරයා පරාජය වූ බවටද ඔහු ඉල්ලා අස්විය යුතු බවටද විපක්ෂය උද්ඝෝෂණය කළෝය.

ඇන්. ඇම්. පෙරේරා මහතා ඉදිරිපත් කළ අයවැය තුළින් යෝජනා කළ පුවත්පත් පාලනය සඳහා සකස් කළ පුවත්පත් පනත පාර්ලිමේන්තුවට ගෙන ආවේ 1964 ඔක්තෝබර් 15 වන දිනයේදීය. නමුත් පුවත්පත් පනතේ නීති ප්‍රශ්න නිරාකරණය කරගැනීමට අවශ්‍ය නිසා පාර්ලිමේන්තු සැසිවාරය අවසන් කොට 1964 නොවැම්බර් 20 වන දින අලුත් සැසිවාරය ආරම්භ කිරීමට යෙදුණි. ඒ අනුව රාජාසන කතාව තුළින් ඡන්ද විමසීම තිබුණේ 1964 දෙසැම්බර් මස 03 වනදාය. මේ වන විට විපක්ෂය ශක්තිමත්ව තිබූ නිසා එම ඡන්ද විමසීම සිදුවන විට ශ්‍රී.ල.නි.ප. සභානායක ලෙස සිටි සී.පී. ද සිල්වා ඇතුළු 14 ක් විපක්ෂයට එක් වූහ. රාජාසන කතා ඡන්ද විමසීමේදී විපක්ෂයේ සංශෝධනයට පක්ෂව ඡන්ද 74 ක්ද විරුද්ධව ඡන්ද 73 ක්ද ලැබිණි. මේ අනුව ශ්‍රී.ල.නි.ප.-ල.ස.ස.ප. රජය බිඳ වැටුණි. පසුව පාර්ලිමේන්තුව විසුරුවා හැර 1965 මාර්තු මස නව මැතිවරණයක් පැවැත්වීමට කටයුතු කළේය. ඒ සඳහා මුල් වූයේ 1964 වර්ෂයේදී ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතා අයවැය ලේඛනය තුළින් ඉදිරිපත් කළ සමහර යෝජනා නිසා බව පෙන්නුම් කළ හැකිය.

## ජන හද දිනූ අයවැය

1965 මැතිවරණයෙන් පසු බලය ලැබූ ඩඩ්ලි සේනානායක මහතාගේ නායකත්වයෙන් තිබූ එ.ජා.ප. රජයේ මුදල් අමාත්‍ය ලෙස කටයුතු කළේ යාපහුව මන්ත්‍රී ධුරය දැරූ යූ.බී. වන්නිනායක මහතාය. එ.ජා.ප. රජයේ සම්පූර්ණ කාලය තුළම අයවැය ලේඛනය ඉදිරිපත් කළේ වන්නිනායක මහතා පමණි. නමුත් ඔහු ආර්ථික විශේෂඥයකු නොවූවත් ජනතාවගේ හද ගැස්ම හඳුනන පුද්ගලයකු විය. ඔහුගේ ආර්ථික උපදේශකවරයා වූයේ ගාමිණී කොරයා මහතාය. 1965 වර්ෂයේදී යූ.බී. වන්නිනායක මහතා ඉදිරිපත් කල ප්‍රථම අයවැය ලේඛනය තුළින් පිටි, ලාම්පුතෙල්, ගොවි උපකරණ ආදි ජනතාවට අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල අඩුකිරීමට යෙදුණි. විපක්ෂයේ සමහරු පවා ප්‍රකාශ කළේ යූ.බී. වන්නිනායක වැනි අයකුට ඩඩ්ලි සේනානායක මහතා විසින් මුදල් අමාත්‍ය

15 වන පිටුව බලන්න

# කැනඩාවේ නිවාස වෙළඳපොළට

# රතු එළියක් !



■ **ගාමිණී අබේසිංහ** ABR. CNE.
**ඔන්ටේරියෝ නිවාස හා දේපළ වෙළඳාම් සංගමයෙහි බලයලත් දේපළ හා නිවාස වෙළඳාම් අලෙවි නියෝජිත**

අතේ ඇති මුදලට හිතේ හැටියට නිවසක් මිල දී ගැනීම කැනඩාව තුළ මේ වන විට සිහිනයක්ම වී ඇත. අතේ සෑහෙන මුදලක් තිබුණද මේ කාලයේ පවතින නිවාස මිල ගණන් නිසා මිල දී ගැනීමට සිදුවන්නේ නොසෑහෙන වටිනාකමකින් යුත් නිවසකි.

නිරතුරුව දක්නට ඇති විවිධ පුවත් වාර්තාවලින් ටොරොන්ටෝව හා වැන්කූවර්හි නිවාස මිල ගණන් ඉහළ යෑම පිළිබඳව කතා බහ කෙරුණත් එම නගර දෙකට සාපේක්ෂව රටේ අනෙකුත් නගර බොහොමයකද නිවාස මිල මේ වන විට ඉහළ ගොස් තිබේ.

පසුගිය කාලය පුරා නිවාස වෙළඳපොළ තුළ සිදුවෙමින් පවතින මෙම තත්ත්වයත් සමග අද වන විට කැනඩාවේ බොහෝ පළාත්වල නිවාස මිල ගණන් අධිප්‍රමාණ අගයකින් වැඩි වී ඇත. කැනඩා උකස් හා නිවාස නීතිගත සංස්ථාව (Canada Mortgage and Housing Corporation (CMHC) ) විසින් ත්‍රෛමාසික නිකුත් කරනු ලබන වෙළඳපොළ තක්සේරු වාර්තාව මගින්ද මේ බව තහවුරු කොට ඇත.

CMHC නවතම තක්සේරු වාර්තාව පෙන්වා දෙන්නේ රටේ ජනගහන වැඩිවීමට හා ජනතාවට භාවිත කළ හැකි ආදායමට වඩා අධි තක්සේරුගත අගයකින් නිවාස මිල ගණන් ඉහළ ගොස් ඇති බවයි. මෙය ආර්ථික මූලධර්ම පවා ඉක්මවා යෑමක් බව CMHC අදහසයි.

මේ සියලු කරුණු පිළිබඳ අවධානය යොමු කළ CMHC අධි තක්සේරුගතව ඉහළ යන නිවාස වෙළඳපොළ කෙරෙහි පළමු අනතුරු ඇඟවීම පසුගියදා කර තිබුණි. මෙතරම් ඉක්මනින් වෙළඳපොළ තත්ත්වය ඉහළ යෑම රටේ ආර්ථිකයට කිසිසේත්ම සුදුසු නොවන්නක් බව ඔවුන් පෙන්වා දේ.

කැනඩා දේපළ වෙළඳාම් සංගමයේ (CREA) MLS ලැයිස්තුවේ දැක්වෙන ආකාරයට 2016 වසරේ නිවාස මිල ගණන්හි සාමාන්‍ය අගය (average price) ඩොලර් 473,400 - 495,000 ත් අතර වේ. මෙය 2017 වසරේදී ඩොලර් 483,000 - 507,800 දක්වාත් 2018 දී ඩොලර් 497,700 සිට 525,100 දක්වාත් ඉහළ යා හැකි බවට CMHC අපේක්ෂා කරයි.

වෙළඳපොළ තුළ නිවාස මිල ගණන් මේ ආකාරයට අසමතුලිත වීම එතරම් සුදුසු තත්ත්වයක් නොවූවත් එය ඇමරිකාව මුහුණ දුන් ආකාරයේ මූල්‍ය අර්බුදයකයක් දක්වා යාමට ඉඩක් නොමැති බව CMHC අදහසයි.

වෙළඳපොළ තත්ත්වය මැනීම සඳහා CMHC විසින් යොදාගන්නා ප්‍රමිති මානයන් කොළ, කහ සහ රතු යන ආකාරයට බෙදා වෙන්කර ඇති අතර එහිදී අධික ගොඩනැගිලි ඉදිකිරීම්, මිල ත්වරණ වේගය, මිල අධිතක්සේරුව ආදිය පිළිබඳව සලකා බැලේ. මෙහි කොළ එළියෙන්, පවතින තත්ත්වය පිළිබඳව සෑහීමකට පත්විය හැකි බවද කහ එළියෙන්, එය මධ්‍යස්ථ තත්ත්වයක පවතින බවද රතු එළියෙන්, අනතුරුදායක මට්ටමට පැමිණ ඇති බවද දැක්වේ.

මෙම ප්‍රමිතිකරණයට අනුව පහත දැක්වෙන නගර 4 වෙත CMHC මේ වන විට රතු එළිය දල්වා ඇත.

- ටොරොන්ටෝ
- වැන්කූවර්
- හැමිල්ටන්
- ක්‍යුබෙක්

ඒ සමගම පහත දැක්වෙන නගර 5 ක් වෙත කහ එළි අනතුරු ඇඟවීම කිරීමටද CMHC කටයුතු කර ඇත

- එඩ්මන්ටන්
- කැල්ගරි
- සස්කැචූන්
- රෙජිනා
- මොන්ට්‍රියල්

CMHC විසින් කැනඩාවේ දේපළ වෙළඳපොළ තුළ මේ ආකාරයට 'රතු එළිය' දැල්වූ ප්‍රථම අවස්ථාව මෙය බව සඳහන් වේ.

ටොරොන්ටෝ සහ වැන්කූවර්හි නිවාස මිල ගණන් ඉහළ යෑමේ උණුසුම ඊට ආසන්න නගරවලට පැතිර යෑමත් සමගම නිරායාසයෙන්ම ඒවායේද මිල ගණන් ඉහළ යති. ඒ අනුව වැන්කූවර්හි මිල ගණන් ඉහළ යෑම ඒ ආසන්නයේ ඇති වික්ටෝරියා, ඇබොට්ෆෝර්ඩ්, කෙලෝවා ඇතුළු ආසන්න නගරවලටද ටොරොන්ටෝවේ මිල ගණන් ඉහළ යෑම මිසසාගා, වෝන්ග්, බ්‍රැම්ප්ටන්, පිකරින් ඇතුළු ආසන්න නගරවලටද තදින්ම බලපා ඇත.

මේ අතර ෆෙඩරල් රජය විසින් උගස් ණය ගැනුම් පිළිබඳව මෑතකදී කරන ලද වෙනස් කිරීම සම්බන්ධවද CMHC අදහස් දක්වා ඇත. ඔවුන් පවසන්නේ මෙය කැනඩාවේ නිවාස මිල ගණන් ඉහළ යෑම සම්බන්ධයෙන් එතරම් ලොකු බලපෑමක් සිදුකරනු ඇතැයි බලාපොරොත්තු විය නොහැකි බවයි. සියයට පහක දහයක පමණ පිරිසක් පළමු වසර තුළදී මෙයින් යම් පසුබෑමකට ලක් විය හැකි වුවත් නියත වශයෙන්ම නිවසක් මිල දී ගැනීමට කැමැත්ත ඇති බහුතරයකට මෙය එතරම් ගැටලුවක් විය නොහැකි බව ඔවුන්ගේ අදහසයි.

## ඉතිහාසයේ අයවැය...

6 වන පිටුවෙන්

ධුරය ලබාදීම ඉතාමත් බුද්ධිමත් තීරණයක් වූ බවය.

### මුදල් නෝට්ටු අවලංගු කළ අයවැය

1970 මැතිවරණයෙන් පසු ඇතිවූයේ සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් බිහිවූ සමගි පෙරමුණු රජයයි. මුදල් අමාත්‍ය ධුරයට පත් වූයේ ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මහතාය. පළමු අයවැය ලේඛනය 1970 ඔක්තෝබර් 25 වන දින ඉදිරිපත් විය. මේ රටේ විශාල ආර්ථික විපර්යාසයක් ඇතිවූයේ එකී අයවැය ලේඛනය තුළිනි.

ශ්‍රී ලංකාවේ ධනේශ්වර පන්තියට විශාලම ප්‍රහාරයක් එල්ල කිරීමට එම අයවැය ලේඛනය සමත් විණි. ඊට එක් හේතුවක් වූයේ රුපියල් 50 සහ රුපියල් 100 මුදල් නෝට්ටු අවලංගු කිරීමය. රුපියල් 50 සහ රුපියල් 100 මුදල් නෝට්ටු අවලංගු කිරීම නිසා බැංකු ඉදිරිපිට විශාල ලෙස පෝලිම් ඇති වුණි. සමහරුන්ගේ නිවෙස්වල හංගාගෙන සිටි මුදල් එළියට වැටුණේ මේ නිසාය. මේ අනුව මේ රටේ ආර්ථික ක්ෂේත්‍රයේ විශාල පෙරළියක් කිරීමට 1970 වර්ෂයේදී ඇන්. ඇම්. පෙරේරා මහතා ඉදිරිපත් කළ අයවැය ලේඛනය හේතු විය.



NOVA Immigration Solutions Inc.
A CANADIAN IMMIGRATION CONSULTANCY FIRM
100% PARENTAL SUPER VISA AND 98% STUDENT VISA SUCCESS RATES
416 298 0990
shani.hanwella@novaim.ca
SHANI HANWELLA
Registered Canadian Immigration Consultant, CEO,
Former Visa Officer, Canadian High Commission,
Colombo, Sri Lanka
1585 Markham Road, Suite 407, Scarborough, ON M1B 2W1
www.novaim.ca

## දැනුම සමග කටට රසට

# ආප්ප



### ආප්ප සාදමු

**අවශ්‍ය දේ**

- හාල් පිටි 400 ට
- ඊස්ට් තේ හැදි 1
- රස අනුව ලුණු
- සීනි මේස හැදි 1
- උකු පොල්කිරි කෝප්ප 2 ක් පමණ

**සාදා ගන්නා ආකාරය**

බාජනයක් අරගෙන එයට පිටි, ලුණු, ඊස්ට් සහ සීනි එකතු කරන්න. දැන් පොල්කිරි කෝප්පයක් විතර දමා පිටි ටික අනා ගන්න. බාජනය හොඳින් වසා පැය 8 - 9 ක් විතර පිපෙන්න තියන්න. ඇනූ පිටි ටික හොඳින් පිපී ඇති බව පෙනේවි. දැන් නැවත ඉතිරි කිරි ටික එකතු කරන්න. හැන්දෙන් පිටි වත් කළාම නූලක් ගානට ඇදෙන තරම තමයි හරි පදම. ලුනු ඇතිද කියල බලන්නත් අමතක කරන්න එපා. දැන් තෙල් ගා ගත් තාච්චියක ආප්ප හදා ගන්න.

(මීට අමතරව මාරි බිස්කට් එකක් කුඩු කර පිටි මිශ්‍රනයට එක් කිරීමෙන් වාටිය කරවන බව පැවසේ. හීනි පාන් පෙත්තක් කුඩාවට කඩා පිටි මිශ්‍රනයට එකතු කිරීමෙන් වඩාත් හොඳින් පිපෙන බව පැවසේ.)

■ තිසරි ශිඛා - Shikifood

එකල අප වත්ත පල්ලෙහා තිබුණු පොල් අතු පැලේ ජීවත් වූ ආප්ප නැන්දා අහිංසක ගැහැනියකි. තරුණ වියේදීම ඇගේ සැමියා මිය ගොස් සිටි අතර ඈ ආප්ප සාදා විකුණා දිවි ගැට ගසා ගත්තීය. ඇයට දරුවන් සිව් දෙනෙකු වූ නමුත් ඒ කිසිවකු හරි හමන් රැකියාවක් නොකර නිකරුණේ කාලය ගත කළත් ඇගේ වැඩිමහල් දියණිය පියවතී අප නිවසේ වැඩපල කළ අතර ආත්තම්මා ඇයට ඇගේ දියණියක සේ සැලකුවාය. අදටත් ඈ ආත්තම්මාගේ නිවසේ ජීවත් වන්නීය.

ආප්ප නැන්දා උදෑසන පිටි කොටන සද්දෙන් එකල අප ඇහැරෙන අතර බොහෝ විට ඇය විසින් සකසන ආප්ප උදෑසන අපේ කුසගිනි නිවයි. ඇය එදා ආප්පයක් විකුණු මුදල මට මතක නැතත් එය ජැකොලින්ගේ ආප්ප තරම් මිල අධික වූයේ නම් නැත. එතරම්ම උජාරු ලීලාවක් ගත්තේද නැත. ඒත් ආප්ප නැන්දාගේ ආප්පවල රස අදටත් මගේ මතකය අවදි කරයි. එය ආදරණීය මතකයකි. ඇතැම් දිනවල පාසල් යෑමට බාගෙට ලෑස්ති වී මා ආත්තම්මාගෙන් මුදල් ඉල්ලාගෙන වත්ත පල්ලෙහාට දිව යන්නේ ආප්ප නැන්දාගෙන් ආප්ප මිල දී ගැනීමටය. දර ලිප් දෙකක් අතරට මැදි වී ආප්ප පුච්චන නැන්දා කදිම දසුනකි. ඇගේ කෝටු ගැසුණු අත මැෂිමක් වාගේ වැඩ කළාය.

"චූටි මැණිකෙට ආප්ප කීයද....?"

"දෙකයි...."

"කිරි අප්පේ දෙකක් කාල මක් කොරන්නෙයි...? හතරක්ම අරන් යන්න පුතේ...."

"එච්චර සල්ලි ගෙනාවෙ නෑ නැන්දා, දෙකක් ඇති...."

"චූටි මැණිකෙ රස්සාවක් කරල මට හිඟ සල්ලි දෙන්න. ඒක මම පොතක ලියල තියන්නම්...."

ආප්ප නැන්දා කිසි දිනක මට ඉල්ලපු ආප්ප ගාන දුන්නේ නැත. ඕ මට වැඩියෙන් ආප්ප දුන්නේ පසුව මුදල් දෙන්නැයි ඇය විසින්ම කළ යෝජනාවකටය. නැන්දා මා ගිය විට වැඩිපුර ආප්ප දෙනවා යැයි දැන ගත් චූටි චම්මා හැමවිටම ආප්ප ගැනීමට මා පිටත් කර යැව්වාය. ඒ ගෙනා වැඩිපුර සෑම ආප්පයකටම වග කිව්වේ මා නොව ඇයයි. ඒ ගැන ඇගෙන් ප්‍රශ්න කළ විට ඇය පැවසුවේ එකම වදනකි. "අපෝ චූටි දූ එක වෙරළු ගෙඩිය හත් දෙනෙක් බෙදා ගෙන කෑවා කියල අහල නැද්ද..?"

හිඟ ආප්ප සල්ලි නැන්දා පොතක ලිව්වාදැයි මම නොදන්නෙමි. මා කිසිදිනෙක ඇගේ හිඟ සල්ලි ගෙව්වේ නැත. එකල මට ඒ ගැන තිබුණේ අසීමිත කුතුහලයකි. දැඩි බියකි. ණය පොත ඉහළ ගියොත් එය ගෙවා ගැනීමට නොහැකිව හිරේ විලංගුවේ වැටේදැයි මා කල්පනා කළ වාර බොහෝය. දිනක් මම එය සුදිල් අයියාට පැවසූ විට ඔහු පැවසුවේ නැන්දා දෙන වැඩිපුර ආප්ප ඔහු හා බෙදා ගන්නේ නම් ණය පොත හොරකම් කිරීමට ඔහුට හැකි බවයි. අයියා සොරකු වනු දැකීමට මා කැමති වූයේ නැත.

කෙසේ වුවත් ආප්ප නැන්දාගෙන් ආප්ප ගැනීම මා නැවැත්වූයේ නැති අතර නැන්දා මට වැඩිපුර ආප්ප දීමත් නැවැත්වූයේ නැත. වැඩිපුර ආප්ප දෙන හැම වාරෙකම ඈ පැවසූවේ ඔන්න මේ ටිකත් ණය පොතට කියාය. බයෙන් බිරාන්ත වී මා බලා සිටින විට ඇය සිනාසෙන්නීය. ඒත් නැන්දා දෙන වැඩිපුර ආප්ප මම කිසිදිනෙක ප්‍රතික්ෂේප කළේද නැත. දිනක් සුදිල් අයියා පැවසුවේ 'ආප්ප නැන්දාගේ ණය පොත ඔහු දුටු බවත් එය ඔසවා ගැනීමට තරම් නොහැකි බවත්, මේ ආත්මයේ එය මට ගෙවා ඉවර කිරීමට නොහැකි බවත්' ය. ඔහු ඒ ගැන බොහෝ දුක් වූ අතර බොරුවට හෙලූ කිඹුල් කදුළු නිසා මා ඔහු විශ්වාස කළේ නැත. නැන්දා වැඩිපුර දෙන ආප්ප චූටි චම්මාට හොරෙන් ඔහු හා බෙදා ගන්නේ නම් ණය පොතේ දැවෙන ප්‍රශ්නය විසඳිය හැකි බව ඔහු ඒ දිනවල මා දුටු හැම විටම පස්සෙන් පැමිණෙමින් පැවසීය. එකල බදාගෙන කෑමට විනා බෙදාගෙන කෑමේ පුරුද්දක් මට නොතිබුණු හෙයින් අයියාගේ යෝජනාව මා කනකට ගත්තේ නැත.

කෙසේ වුවත් දිනක් උදෑසන වෙනදා මෙන් මා පාසල් යෑමට සූදානම් වී ආත්තම්මා සොයා ගියේ ආප්ප නැන්දාගෙන් ආප්ප මිල දී ගැනීමට මුදල් ඉල්ලීමටය. "අද නම් නැන්දා ආප්ප පුච්චන එකක් නෑ පුතේ. ඊයෙ පිටි කොටන සද්දෙ ඇහුනෙ නෑනෙ..." මා නැන්දාගේ ගෙදරට ගොස් කතා කළත් කිසිදු හැලහොල්මනක් නොමැති වූ කල නැවත හැරී ආවෙමි. එදින පාසල් ගොස් නිවසට පැමිණි විට වෙනදා නැති අමුතු කලබලයක් පෙනුණි. ගමේ බොහෝ පිරිසක් අප වත්තේත්, ආප්ප නැන්දාගේ නිවසේත් තැන තැන සිටිනු දුටිමි. ආත්තම්මාගේ සුදු මූණ කළු වී තිබුනු අතර චම්මලාගේ ඇස් රතු වී තිබුණි.

"චූටි දෝණි, ආප්ප නැන්දා නැතිවෙලා..." චූටි චම්මා ඉකි ගසමින් පැවසුවාය.

"නැන්දා නැති වුණු එක හොදයි චම්මා. නැන්දා හිටිය නම් මට හිරේ යන්න වෙනවා..."

"අර මොකටද....?"

චූටි චම්මා විසල් කර ගත් දෙනෙතින් ඇසුවාය

"ණය පොත නිසා...."

කිසිත් නොපැවසූ චම්මා මට ඔරවමින් එතැනින් යන්නට ගියා මතකය. ආප්ප නැන්දාගේ ආදරණීය මතකයන් ණය පොත නිසා එකල මට වඩාත් වැඩියෙන් නොදැනුණත් අද ඒ මතකයන් අවදිවන විට දෑසට නැගෙන්නේ කඳුළකි. ඇය විඳි දුක් දන්නේ ඒ කටුමැටි බිත්ති හතර පමණි. ඇය හෙලූ සුසුම් ඒ වා තලයේ මුසුව ගසා යන්නට ඇත. අහිංසක ගැමි ගැහැනියක වූ ආප්ප නැන්දාගේ නිරහංකාර සිනාව තවමත් මගේ මතකයෙන් බැහැර නොවන්නකි. කිසිදිනෙක ළිද ළඟ සංගමයට නොගිය ඕ අනුන්ගේ වැරදි තැන තැන කතා නොකළාය. ඕපාදූප නොසෙව්වාය. උදෑසන සිට ආප්ප තාච්චි සමග ඔට්ටු වූ ඈ ලැබෙන සුලු මුදලින් දරුවන් රැක ගත්තීය. කිසිවකුගෙන් කිසිවක් බලාපොරොත්තු නොවූවාය.

ආදරණීය නැන්දා, ජීවිතය ජය ගනු වස් ආප්ප තාච්චි සමග ඔට්ටු වන ගැහැණුන් ඔබ හැරුණු විට තව බොහෝ ඇත. මේ සටහන ඔබට වගේම ඔවුන්ටත් උපහාරයක් වනු නිසැකය.

thisu.shika@gmail.com

## මේ ඔරලෝසු කණුව...

10 වන පිටුවෙන්

දන්නෝ බුදුන්ගේ, ගීතය ගුවන් විදුලියෙන් විකාශනය වන්නේ හියුබට් රාජපක්ෂ මහතාගේ කටහඬිනි.

බලපිටියේ මෙම රාජපක්ෂ පරපුරේ කප්පිණ වලව්ව, ගම්පෙරළිය, විරාගය, මඩොල්දූව, ඇතුළු චිත්‍රපට රැසකට යොදාගත් ඉපැරැණි ගෘහයයි. ගාලු කොටුවේ ප්‍රතාපවත් ඔරලෝසු කණුව සිය වියදමෙන් තැන වූ මෙම අසහාය සිංහල බෞද්ධ දානපතියා මීට වසර 122 කට පෙර එනම් 1888 ජනවාරි මස 26 වැනි දින කොළඹ මෝදර කාරලු වලව්වේදී අභාවප්‍රාප්ත විය.

මෙතුමා එදා සමාජයේ කුමන අන්දමේ ගෞරවාදරයකට පාත්‍ර වී සිටියාද යන්න. සැම්සන් රාජපක්ෂ මුදලිතුමාගේ මරණයෙන් පසු ඇම්. ධර්මරත්න පඬිතුමන් විසින් සිය 'ලක්මිණි පහන' පුවත්පතින් සිදු කළ ප්‍රකාශයෙන් පෙනේ. මා එය ඉදිරිපත් කරමින් මෙම ලිපිය අවසන් කරමි.

'බුද්ධාගම්කාර යම් පමණ සමූහයක් ඇත්නම් ඒ සියලුදෙනාගේම සිත්වලට මෙතුමාගේ ජීවත්ව සිටීම මහත් ධෛර්යක්ව තිබුණෝය. මක්නිසාද යත් ලංකාව පරදේශීන්ට අත්පත් වුණායින් පසු පාතරට විසූ පුරාණ ඇමැති පෙළපත් සියල්ලම වාගේ නිලතල ලාභකීර්ති ආදිය සඳහා පරදේශීන්ගේ සිත් ගන්නා අදහසින් මිථ්‍යා දෘෂ්ටික වූවෝය. සමහරු බුද්ධාගම අදහන්නේත් විහාර පන්සල්වලට යන්නේත් බණ පිරිත් අහන්නේත්, දන් දෙන්නේත් වට පිට බල බලා මහත් බයකින් නමුත්, මුන්නාන්සේට භයක් චකිතයක් වීමට හේතු නැති බැවින් නිර්මල බුද්ධාගම්කාරයෙක් වී සිටියා පමණක් නොව බුද්ධාග මිකාරයන්ට නොඉසිලිය හැකි මහත් බරක් පැමිණිවිට ඉසිලීමට සිටියේත්, මුන්නාන්සේ පමණයි. එබැවින් සියලු බුද්ධාග මිකාරයන්ගේ කටයුතු කර්මාන්ත අත්හැර මුන්නාන්සේගේ මරණය සඳහා සතියක් මුළුල්ලේ හඬා වැළපෙමින් ශෝකය ප්‍රකාශ කරත් නම් මැනවැයි සිතමි'



# රිය අනතුරු සම්බන්ධයෙන් ලබා ගත හැකි වන්දි

■ **සකස් කළේ - සිල්වි ප්‍රනාන්දු** LL.B.
Barrister, Solicitor & Notary Public

රිය අනතුරකට ලක් වීම කායික මෙන්ම මානසික වශයෙන්ද බරපතළ ලෙස පීඩා දෙන සිදු වීමකි. එය ඔබගේ රැකියාවට මෙන්ම පෞද්ගලික ජීවිතයට සහ තම පවුලේ අන් අයගේ සාමාන්‍ය ජීවිතයට බලපාන සිදුවීමකිශ්‍රී එවැනි අවස්ථාවකදී සිදුවන පාඩුව නීතිමය වශයෙන් අවම කරගත හැකි ක්‍රම පිළිබඳව වැදගත් කරුණු කීපයක් පැහැදිලි කිරීම මෙම ලිපියේ අරමුණ වේ.

ඔන්ටේරියෝවේ රිය පදවන සියලු දෙනාටම රක්ෂණයක් තිබිය යුතු බව ඔබ දන්නා කරුණකි. එහෙත් රිය අනතුරක් සිදුවූ අවස්ථාවේදී අදාළ රියදුරුට රක්ෂණයක් තිබුණත් නැතත් එම රිය අනතුරට මුහුණ පෑ සියලු දෙනාටම වන්දි ලබා ගැනීමේ නීතිමය ඉඩ කඩ පවතී.

එනම් රියදුරුට මෙන්ම එම වාහනයේ ගමන් කළ සියලු දෙනාටද, එම රිය අනතුරට සම්බන්ධ අනෙකුත් වාහනවල සිටි සියලු දෙනාටද, එම රිය අනතුර අසල සිට අනතුරට ලක් වූ අයටද වන්දි ලබා ගත හැකිය.

රිය අනතුරකදී ලබා ගත හැකි වන්දි, මූලික වශයෙන් නීති මාලා දෙකකට අයත් වේ.

ඉන් පළමු වැන්න වන්නේ, රිය අනතුරු ප්‍රතිලාභ වන්දියයි (Accident Benefits). මෙම ප්‍රතිලාභ ගැනීම සඳහා රිය අනතුර සිදුවූ දින සිට දින 30 ක් ඇතුළත අයදුම් කළ යුතුය. රිය අනතුරු ප්‍රතාලාභ වන්දිය මගින් රැකිරක්ෂාවලින් අහිමි වුණු ආදායම, පුනරුත්ථාපන වියදම්, වෛද්‍ය ගාස්තු, බෙහෙත් හේත් වියදම් සහ උපස්ථායක ගාස්තුවලට යන වියදම් යම්තාක් ප්‍රමාණයකට පියවා ගත හැකිය.

දෙවැනි වන්දි මුදල් වර්ගය වන්නේ, එම රිය අනතුර සිදුවූයේ අනෙක් රියදුරුගේ නොසැලකිලිමත් කම නිසා නම්, ඒ සදහා ලබා ගත හැකි වන්දියයි (Tort Claim). මෙම වන්දි මුදල රිය අනතුරින් සිදුවුන හානිවල බරපතල කම මත තීරණය කරනු ලබයි. එනම්, මෙම වන්දිය තීරණය කරනු ලබන්නේ එම රිය අනතුර හේතුවෙන් කායික, මානසික, හෝ මානසික ක්‍රියාකාරිත්වයට බරපතල සහ ස්ථිර ලෙස හානියක් සිදු වී ඇත්ද යන්න මතයිශ්‍රී මෙම වන්දි මුදල ලබා ගැනීමට නම් රිය අනතුර සිදුවී වසර දෙකක් ඇතුලත නීති මගින් කටයුතු කිරීම ආරම්භ කළ යුතුවේ.

මෙම වන්දියේ අරමුණ වන්නේ රිය අනතුරින් සිදුවූ දුක් වේදනා සඳහා සහනයක් ලබා දීමයි. එමෙන්ම ඉදිරියට රැකියාවක් කරගත නොහැකි වීම, එදිනෙදා කටයුතු පෙර පරිදි කර ගත නොහැකි වීම, සහ පවුලේ අයට යුතුකම් ඉටු කළ නොහැකි වීම වැනි කරුණුවලින් ඇති වන පාඩු සඳහා මෙම වන්දි ක්‍රමය මගින් සහන ලබා ගත හැකිය.

රිය අනතුරකින් පසුව පහත දැක්වෙන කරුණු අනුගමනය කිරීම ඉහත වන්දි ලබා ගැනීමට උපකාරී වේ.

- රිය අනතුරෙන් පසු මොනයම් හෝ ආකාරයක අපහසුතාවයක් තිබෙන්නේ නම් ගිලන් රථයක් ගෙන්වා ගැනීමට කටයුතු කරන්න.
- අනතුරට සම්බන්ධ සියලු දෙනාගේම විස්තර ලබා ගැනීමට සැලකිලිමත් වන්න.
- ඔබට හැකියාවක් ඇතොත් අනතුරට ලක් වූ සියලු වාහනවල ඡායාරූප ලබාගන්න.
- පොලිසිය එම ස්ථානයට නොපැමින්නේ නම් පැය 24 ක් ඇතුළත අනතුරු මධ්‍යස්ථානයකට වාර්තා කරන්න.
- රිය අනතුර නිසා ඇති වූ සියලු තුවාල, කායික සහ මානසික අමාරුකම් නිට්ටාවටම සුව වනතුරු දිගටම වෛද්‍ය ප්‍රතිකාර ලබාගන්න.
- හැකි ඉක්මනින් නීතිමය පියවර ගැනීම ආරම්භ කරන්න.

**මෙම ලිපියේ අරමුණ ඔබට දැනුමක් ලබාදීම පමණය. මෙම ලිපියේ අඩංගු කරුණු මත ඔබ වැඩිදුරටත් ක්‍රියා කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා නීතිඥ උපදෙස් ලැබිය යුතුය.**



SILVY FERNANDO, LL.B.
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC

LAWYER FOR:
- HOME REFINANCE, PURCHASE AND SALE
- PERSONAL INJURY (NO LEGAL FEE UNTIL SETTLEMENT)
- DEBT RECOVERY/DEBT SETTLEMENT
- SEPARATION AGREEMENTS, AND DIVORCE (ACCEPT LEGAL AID CERTIFICATES)
- POWER OF ATTORNEY, AFFIDAVITS, AND WILLS
- ALL IMMIGRATION MATTERS
- LAND LORD-TENANT DISPUTES
- NOTARIZING AND COMMISSIONING

UNIT 111 – 7800 WOODBINE AVENUE, MARKHAM, ON L3R 2N7
TEL: 416-272-6587/905-604-7771, FAX: 905-604-5529
EMAIL: SILVY@SFLEGALSERVICE.COM

# තිබහට වතුර බීමෙන් ඵලක් නැත



■ උපාලි ද සේරම්

"හරිම තිබහයි...."

එහෙම කියමින් අපි තිබහා නිවාග න්න වතුර වීදුරුවක් හෝ පැණි බීම බෝතලයක් බීමට පුරුදුව සිටින්නෙමු. තිබහ නිවාගන්න පිරිසිදු වතුර වීදුරුවක් පානය කිරීම වරදක් නැති වුවත් පැණි බීම බෝතලයක් ඒ සඳහා භාවිත කිරීම නම් එතරම් හොඳ නැත. එය පුරුද්දක් බවට පත්වුවහොත් අනාගතයේදී අප ඉතා ඉක්මනින්ම දියවැඩියාව, වකුගඩු රෝග ආදියට පහසුවෙන්ම ගොදුරු විය හැකිය.

අප තිබහට වතුර බොනවා මෙන්ම අපට තිබහා ඇතිවන්නේ ඇයිදැයි කියාද අවබෝධයක් තිබිය යුතුය. මිනිස් සිරුරේ ඇති සංයුතියෙන් සියයට හැත්තෑතුනක (73%) ඇත්තේ ජලයය. එය පෘථිවියේ ඇති සංයුතියටද සමානය. පෘථිවියේ සියයට හැත්තෑතුනක් ඇත්තේද ජලයය.

## ජලය පානය කළ යුතු ප්‍රමාණය

එබැවින් අපට ජලය යනු අත්‍යවශ්‍ය ද්‍රව්‍යයකි. සිරුරේ සියලු ක්‍රියාකාරකම් සඳහා ජලය අත්‍යවශ්‍යය. නමුත් මෙය අප බොහෝ දෙනා නොසලකා හරිති. එනිසා ඇතැම් දෙනා ජලය පානය කරන්නේ තිබහ ඇති වූ විටදී සහ ආහාර ගැනීමෙන් පසුය. නමුත් අප ශරීරයට දිනකට අවශ්‍ය ජලය ප්‍රමාණයක් තිබේ. එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. එසේ වන්නේ අපගේ සිරුරට දිනකට අවශ්‍ය ජලය ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ එම පුද්ගලයාගේ බර අනුවය. පුද්ගලයාගේ සිරුරේ බර කිලෝග්‍රෑම්වලින් මැන එය 7 න් බෙදූ විට ලැබෙන අගය එම පුද්ගලයා දිනකට පානය කළ යුතු ජලය කෝප්ප ගණන වේ.

උදාහරණයක් ලෙස කිලෝග්‍රෑම් 60 ක් බර පුද්ගලයකු දිනකට පානය කළ යුතු ජලය කෝප්ප ගණන ආසන්න වශයෙන් 8 කි. වතුර කෝප්පයක් ලෙස සැලකෙන්නේ මිලිලීටර් 250 කි. එසේ නම් කිලෝග්‍රෑම් 60 ක් බර අයකු දිනකට ලීටර් දෙකක් පිරිසිදු පානීය ජලය ශරීරයට එක්කර ගත යුතුය.

## ජලය පානය කරන හැටි

පුද්ගලයකු දිනකට පානය කළ යුතු ජලය ප්‍රමාණය එකවර හෝ දෙවාරයකට පානය කිරීමෙන් ඵලක් නැත. එසේ වුවහොත් එය මුත්‍රා සමග පිටව යයි.

අප බොහෝ දෙනා ජලය පානය කිරීමට එතරම් අකැමැත්තක් දක්වන්නේද මෙම ගැටලුව නිසාය. 'වතුර බොනකොට නිතර මුත්‍රා කිරීමට අවශ්‍ය වෙනවා' යැයි පවසති. රැකියාවක නිරත අයකු නම් පාසල් යන දරුවන් නම් මෙය මහත් කරදරයකි. එනිසා ඔවුනගේ ගැටලුව සාධාරණය. නමුත් මෙය සාධාරණ ලෙස පිළිගත හැක්කේ ඔවුන් ජලය පානය කරන ක්‍රමය නිවැරැදි නම් පමණි. ජලය පානය නිසා නිතර මුත්‍රා කිරීමට අවශ්‍ය වන බව පවසන්නේ සහ සිතෙන්නේ වැරදි අයුරින් ජලය පානය කරන අයටය.

අප දිනකට අවශ්‍ය ජලය කෝප්ප ගණන පානය කළ යුත්තේ දවස පුරාවටය. උදෑසන අවදි වූ විට ජලය කෝප්පයක් පානය කළ හැකිය. ඉන්පසු උදෑසන ආහාරයට පෙර සහ ආහාරයට පසු ජලය කෝප්පයක් බැගින් පානය කළ හැකිය. දහවල් ආහාරයට පෙර සහ පසුද රාත්‍රි ආහාරයට පෙර සහ පසුද ලෙස ගැනීමට හුරු වූ විට ජලය කෝප්ප 6 ක් පානය කර ඇත. ඒ අතර පැය දෙකකට වරක් ජලය කෝප්පයක් පානය කළ හැකිය.

## වායුසමීකරණය සහිත ස්ථානවල සිටින විට

අප ජලය පානයට හුරුව ඇත්තේ තිබහ ඇති වූ විටදී බැවින් වායුසමීකරණ සහිත ස්ථානවල සිටින විට තිබහ නොදැනේ. එනිසා ජලය පානයටද එතරම් යොමු නොවේ. නමුත් වායුසමීකරණ සහිත ස්ථානවල සිටින විට අපගේ සිරුර මතුපිට සිසිල් වුවත් අපගේ සිරුර ඇතුළත ඇති ජලයෙන් සියයට විසිපහක (25%) පමණ ප්‍රමාණයක් ඉවත්ව තිබේ. එනිසා වායුසමීකරණය සහිත ස්ථානවල සිටින විට අනිවාර්යයෙන්ම පැය දෙකකට වරක් ජලය මිලි ලීටර් 250 කෝප්පයක් පානය කළ යුතුය.

## ජලයට ආදේශක පානය කිරීම

ඇතැම් දෙනා ජලය වෙනුවට ඊට ආදේශක පානය කරති. තේ, කෝපි, පැණි බීම, කැඳ වර්ග, ස්වාභාවික පලතුරු යුෂ ආදිය පානය කර ඉන් සිරුරට අවශ්‍ය ජලය ලබාගත හැකි බව සිතති. නමුත් සිරුරට අවශ්‍ය වන්නේ පිරිසිදු ජලය ($H_2O$) මිස ආදේශක නොවේ. එනිසා දිනකට සිරුරට අවශ්‍ය ජලය, ආදේශකවලින් ලබා ගැනීම වැරදිය.

## ජලය අඩු වූ විට

දිනකට අපගේ සිරුරට අවශ්‍ය ජලය ප්‍රමාණය අඩු බව දවසකින් දෙකකින් දැනෙන්නේ නැතශ්‍රී සති කිහිපයක් ගතවන විට මුත්‍රා ආසාදන ඇතිවීම, රුධිර පීඩනය ඉහළ යෑම, ඇඟපත වේදනාව, හිසරදය, ගැස්ට්‍රයිටීස් අපහසුතා මතුවීම, සමේ පැහැය වෙනස්වීම, අධික වෙහෙසක් දැනීම ආදිය මතුවන විට සිරුරට දිනකට අවශ්‍ය ජලය ප්‍රමාණය නොලැබීමේ ප්‍රතිඵල මතුවන්නට පටන් ගනී. එවිට අප වේදනානාශක ඖෂධ ගැනීම, ආහාර පාලනය ආදියට යොමු වේ. එසේත් නොහැකි වන විට වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වේ. මෙම රෝග සියල්ලටම බොහෝ විට මූලික වී ඇත්තේ දිනකට අවශ්‍ය ජලය ප්‍රමාණය ශරීරයට නොලැබීම බව රෝග පරීක්ෂාව අනුව හෙළි වී තිබේ.

දිනකට සිරුරට අවශ්‍ය ජලය ප්‍රමාණය නොලැබීම දිගින් දිගටම සිදුවන විට එහි භයානක ප්‍රතිඵල ලෙස වකුගඩු අක්‍රිය වීම, අක්මා රෝග මතු වීම, සමේ රෝග හටගැනීම, පිළිකා ඇති වීම ආදිය සඳහා සිරුර අභ්‍යන්තරයේ පසුබිම සැකසේ. එසේම ආහාර ජීර්ණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය 15% කින් අඩු වන බව හෙළිවී ඇත.

මේ සියල්ලේම අවසාන ප්‍රතිඵලය වන්නේ දිනකට අවශ්‍ය ජල ප්‍රමාණය පානය නොකිරීම නිසා පුද්ගලයකු තම ජීවත්වීමේ ආයු කාලය වසර කිහිපයකින් අඩුකරගන්නා බවය.

යම් පුද්ගලයකු කෝලා වර්ගයේ පැණි බීම 'ලීටරයක්' පානය කළොත් ඉන් ශරීරයට සිදුවන හානිය අවම කරගැනීම සඳහා ජලය 'ලීටර තුනක්' පානය කළ යුතුය.

## බීමට සුදුසු ජලය

වර්තමානයේ අප බොහෝ දෙනා ප්ලාස්ටික් බෝතල්හි බහා ලූ පානීය ජලය භාවිත කරති. ඒ අතර තවත් පිරිසක් උණුකර නිවාගත් ජලය පානය කරති. පිරිසක් ශීත කළ ජලය පානය කරති. තවත් පිරිසක් ළිං ජලය පානය කරති.

නළ ජලය, ළිං ජලය හෝ බෝතල් කළ පානීය ජලය යන කුමන වර්ගයක් වුව පිරිසිදු ඇල් ජලය, උණුකර නිවාගත් ජලය සහ ශීත ජලය යන ජල වර්ග සියල්ලම අපගේ ශරීරයට හුරු කරගත යුතුය. එනිසා නීරෝගී පුද්ගලයකු දිනකට පළමුව මද රස්නයෙන් යුත් ජලය කෝප්පයක්, ඇල් ජලය කෝප්පයක් සහ ශීත කළ ජලය කෝප්පයක් බැගින් විවිධත්වයකින් යුතුව පානය කිරීම වඩාත් සුදුසුය.

ලුණු සහිත ආහාර වර්ග ගත් විට ශරීරයේ ඇති ජලය ප්‍රමාණය ඉතා ඉක්මනින් අඩු වේ. එබැවින් එවැනි ආහාර වර්ග අඩු ප්‍රමාණයකින් ආහාරයට ගත යුතුය. එවැනි ආහාර ගත් විට සාමාන්‍යයෙන් දිනකට ගත යුතු ජලය කෝප්ප ප්‍රමාණයට වඩා වැඩිපුර ජලය කෝප්ප කිහිපයක් පානය කළ යුතුය.

ජලය පානයෙහි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ අපගේ සිරුරට තිබහ ඇති වීමට ඉඩ නොදීමය. තිබහ යනු රෝග යකි. එනිසා 'තිබහට තිත' තැබීමට ජලය පානයට හුරු විය යුතුය.






■ සිරිසේන විතානගේ

# නාම පද

පුරුෂ, ස්ත්‍රී, නපුංසක (අප්‍රාණවාචී) යන ලිංග වශයෙනුත් ප්‍රථමා, කර්ම, කර්තෘ ආදි විභක්ති වශයෙනුත් උත්තම, මධ්‍යම, ප්‍රථම යන පුරුෂ වශයෙනුත් උක්ත, අනුක්ත වශයෙනුත් ඒකවචන, බහුවචන ආදි සංඛ්‍යා වශයෙනුත් ඒ ඒ අතට නැමෙන ශබ්ද 'නාම පද' වශයෙන් හැඳින්වෙයි. සප්‍රාණික, අප්‍රාණික සියලු දෑ විවිධාකාරයෙන් හඳුන්වනු පිණිස මේ නාම පද භාවිත වෙයි.

නාම පද පස් වර්ගයක් වේ. එනම්

1. නාම නාම
2. සර්ව නාම
3. සමාස නාම
4. තද්ධිත නාම
5. කෘදන්ත නාම යනුවෙනි.

## 1. නාම නාම

යම් යම් දේ හඳුන්වනු පිණිස යෙදෙන නාම පද 'නාම නාම' නම් වෙයි. ඒ ඒ නාමයෙහි ස්වභාවය අනුව මේ නාම නාම වර්ග පහකට වෙන් කෙරෙයි.

1. ජාති නාම
2. ද්‍රව්‍ය නාම
3. ගුණ නාම
4. ක්‍රියා නාම
5. සංඥා නාම යනුවෙනි.

උපතින්ම ඒ ඒ ජාතීන් හැඳින්වීමට යෙදෙන නාම **ජාති නාම** වේ.

උදා - මිනිස්, දෙවි, වැදි, ගොන්, බලු

ඒ ඒ අචේතනික ද්‍රව්‍යයන් හැඳින්වීම පිණිස යෙදෙන නාම **ද්‍රව්‍ය නාම** වේ.

උදා - ගස්, වැල්, ලී, පෑන්, පැන්සල්

කිසියම් ගුණයක් හඟවනු පිණිස යෙදෙන නාම **ගුණ නාම** වේ.

උදා - උස, මිටි, මහත, කෙට්ටු, සුදු, කළු, නපුරු

කිසියම් ක්‍රියාවක්, වීමක්, කරන්නෙකු හඟවනු පිණිස යෙදෙන නාම **ක්‍රියා නාම** වේ.

උදා - නැටීම්, බැලීම්, නටන්නා, ගයන්නී

කිසියම් කෙනකු, දෙයක්, ස්ථානයක් එවැනි තවත් කෙනෙකුගෙන්, දෙයකින්, ස්ථානයකින් වෙන් කොට හඳුනාගැනීම පිණිස භාවිත වන්නේ **සංඥා නාම** යි.

උදා - ගුණදාස, නාලිනී, කොළඹ, පැරකුම්බා, සමනළ, අඹ

## 2. සර්ව නාම

ප්‍රාණවාචී, අප්‍රාණවාචී සියල්ලන් සඳහා පොදුවේ භාවිත කළ හැකි නාම 'සර්ව නාම' යි. පියල්, කමල්, නිමල් තිදෙනා සඳහාම පොදුවේ 'ඔබ' යන්න භාවිත කළ හැකිය. ගස්, මල්, ලී යන සියල්ල සඳහා 'ඒවා' යන පොදු නම භාවිත කළ හැකිය. ගොනා, අලියා, බල්ලා යන සියල්ල සඳහා 'ඌ' යන පොදු නම යෙදිය හැකිය. එබඳු නම් සර්ව නාම වෙයි.

| පුරුෂය | ඊට අයත් පද |
|---|---|
| උත්තම පුරුෂ | මම, අපි, මා, අප |
| මධ්‍යම පුරුෂ | නුඹ, තා, තී, තෝ, තොපි, තෙපි |
| ප්‍රථම පුරුෂ | නිමල්, කමලා, මිනිසා, ගොනා, ඔහු, ඇය, එය, ඒවා, සමහරු, ඇතැමෙක් ආදිය |

සියලු සර්ව නාම උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ යනුවෙන් කොටස් තුනකට බෙදේ.

මින් උත්තම පුරුෂ සර්ව නාම 'ම' ශබ්ද කාරක ලෙසත් මධ්‍යම පුරුෂ සර්ව නාම 'ත' ශබ්ද කාරක ලෙසත් ප්‍රථම පුරුෂ සර්ව නාම 'අන්‍යකාරක' ලෙසත් හැඳින්වෙයි.

## 3. සමාස නාම

සමාස යනු කෙටි වීමයි. වෙන් වෙන් අරුත් සහිත ශබ්ද කිහිපයක් එකතුව කෙටි එක් පදයක් වී සෑදෙන නාම 'සමාස නාම' යි.

උදා - නිලුපුල්, දසබල, බඹසර

(මෙහි සමාස පිළිබඳ කොටසේදී විස්තර සහිතව මෙය හඳුනාගත හැකිය)

## 4. තද්ධිත නාම

නාම ප්‍රකෘතියකින් පසුව විශේෂ අර්ථයක් සහිත ප්‍රත්‍යයන් යොදා සාදා ගන්නා නාම තද්ධිත නාම නම් වේ. රුවන් යනු නාම ප්‍රකෘතියකි. එයට පසුව විශේෂ අරුත දෙන 'මුවා' යන ප්‍රත්‍යය යොදා 'රුවන් මුවා' යන තද්ධිත නාමය සාදා ගනු ලැබේ. පහත උදාහරණ බලන්න.

නැකත් + ඉ = නැකති (නැකැත් දන්නා)
තොට + ඉ = තොටි (තොටෙහි නියුතු වූයේ)
වක + අටු = වකුටු (වක ඇත්තේ)
රන් + මුවා = රන්මුවා (රනින් කළ)
ගං + බඩ = ගඟබඩ (ගඟ සමීපයෙහි)
ලැදි + ආ = ලැදියා (ලැදි කමක් ඇති)

'වත්', 'මත්' ප්‍රත්‍ය යෙදීමෙන් සාදා ගන්නා තද්ධිත නාම විශේෂයක්ද වේ. මේවා 'අස්ත්‍යර්ථ තද්ධිත' නමින් හඳුන්වයි. ඒ නම යෙදී ඇත්තේ 'ඇත' යන අරුත මේ තද්ධිත ප්‍රත්‍යවල ඇති හෙයිනි. 'ගුණවත්' (ගුණ+වත්) යන තද්ධිත නාමය ගුණ ඇත්තේ යන අරුත දෙයි.

මුල් ශබ්ද ප්‍රකෘතිය හල් අකුරකින් අවසන් වන විට හෝ අකාරාන්තව සිටීමේදී 'වත්' ප්‍රත්‍යය යෙදේ. මුල් ශබ්ද ප්‍රකෘතිය ඉ, උ, ඌ යන ස්වරයකින් අවසන් වන විට 'මත්' ප්‍රත්‍යය යෙදේ.

පහත සටහන බලන්න.

| මුල් ශබ්ද ප්‍රකෘතිය | අවසන් අකුර හෝ ස්වරය | ප්‍රත්‍ය | එක් වූ පදය |
|---|---|---|---|
| පින් | හල් නයන්න | වත් | පින්වත් |
| සිල් | හල් ලයන්න | වත් | සිල්වත් |
| ගුණ | අ ස්වරය | වත් | ගුණවත් |
| ප්‍රබෝධ | අ ස්වරය | වත් | ප්‍රබෝධවත් |
| සිරි | ඉ ස්වරය | මත් | සිරිමත් |
| ඉසුරු | උ ස්වරය | මත් | ඉසුරුමත් |
| රූමත් | ඌ ස්වරය | මත් | රූමත් |

## 5. කෘදන්ත නාම

ධාතුවකට පසුව විශේෂ අර්ථ සහිත ප්‍රත්‍යයන් යොදා සාදා ගන්නා නාම කෘදන්ත නාම වේ. 'පා' යන ධාතුවට පසු 'ඇන්' යන ප්‍රත්‍යය එක් කොට පැන් (ජලය) යන කෘදන්ත නාමය සෑදේ.

පහත උදාහරණ බලන්න.

කර + නු = කරනු (කිරීම)
තව + ලි = තැවුලි (තැවීම)
දා + උන් = දුන් (දෙන ලද)

## ස්ත්‍රී වාචී නාම පද

සිංහලයෙහි ස්ත්‍රී වාචී නාම පද සෑදෙන ක්‍රම කිහිපයක් වෙයි.

### 1. පුරුෂවාචී ශබ්ද ප්‍රකෘතියට ප්‍රත්‍ය එක් කිරීමෙන්

ඇත් + ඉනි = ඇතිනි
සුදු + ඉ = සුද්දි
පාලක + ඉකා = පාලිකා
කුමර + ඊ = කුමරී
එළු + ඉච්චි = එළිච්චි

### 2. ස්වර විපර්යාසයෙන්

වස්සා - වැස්සි (ආ, ඉ වීමෙන්)
කවුඩා - කැවිඩි (ආ, ඉ වීමෙන්)
මකුණා - මැකිණි (ආ, ඉ වීමෙන්)
යහළු - යෙහෙළි (උ, ඉ වීමෙන්)
හොරා - හෙර (ඔ, ඒ වීමෙන්)

### 3. පුරුෂවාචී නාම ප්‍රකෘතිය සමග ස්ත්‍රීවාචී පද යෙදීමෙන්

සිංහ + ධේනුව = සිංහධේනුව
සුර + අඟන = සුරඟන
කොටි + දෙන = කොටිදෙන
සිටු + දේවි = සිටුදේවි
නා + මෙනෙවි = නාමෙනෙවි
ගුරු + මහත්මිය = ගුරුමහත්මිය

### 4. පුරුෂවාචී පදයට මුළුමනින්ම වෙනස් නාම පද භාවිතයෙන්

තාත්තා - අම්මා
අලියා - කෙණෙර
අශ්වයා - වෙළඹ
මොනරා - සෙබඩ
සැමියා - බිරිඳ
බාප්පා - පුංචි අම්මා
සීයා - ආච්චී
අයියා - අක්කා

### 5 කෘදන්ත නාමයන්හි අගට 'ඊ' ප්‍රත්‍යය යෙදීමෙන්

ගයන්නා - ගයන්නී
යන්නා - යන්නී
නටන්නා - නටන්නී
බලන්නා - බලන්නී

### 6. නාමය මුලට හෝ අගට ස්ත්‍රීවාචී පද භාවිතයෙන්

ගැහැනු ළමයා
ගැහැනු සත්තු
පරෙවි කිරිල්ලී
බඹර පැටික්කී

### අභ්‍යාස

■ පහත දැක්වෙන වැකිවල කළු අකුරු සහිත නාම පද නාම නාම, සර්ව නාම, සමාස නාම, තද්ධිත නාම, කෘදන්ත නාම යන මේවායින් කුමන ගණයට අයත්දැයි ලියන්න.

1. ඇතැමෙක් දහමට ගරු නොකරති.
2. නාගරිකයෝ අඩුපාඩුකම් සහිතව දිවි ගෙවති.
3. වනාන්තරය රූස්ස ගස්වලින් පිරී පවතී.
4. ලංකාව සෞභාග්‍යවත් රටකි.
5. අපි නැටුම් බලන්නට කැමැත්තෙමු.

■ පහත දැක්වෙන වාක්‍යවල කළු අකුරින් ඇති පද ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා යන කුමන වර්ගයට අයත්දැයි ලියන්න.

1. ඌ දිග සර්පයෙකි.
2. ගයන්නාගේ ගීය මනහරය.
3. මේ දිනවල රෙදි හරි ගණන්ය.
4. ධර්මපාලතුමා අපේ පිනට පහළ වූවෙකි.
5. දිලිසෙන සියල්ල රන් නොවේ.

**ලබන කලාපයෙන් සිංහල පාඩම තවදුරටත් හදාරමු**

# මහායාන ධර්මයේ ...

12 වන පිටුවෙන්

නිකායයක් ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනු ලැබුවේ දෙවන සංඝායනාවෙන් පසුව බව පෙනේ. වජ්ජිපුත්තක භික්ෂූන් මෙහිදී මූලිකව කටයුතු කරනු ලැබූවද මෙම නිකාය හඳුන්වනු ලැබුවේ 'මහා සංඝික' යන නාමයෙනි. දෙවන සංඝායනාවේදී මහා සාංඝිකයන් හෙවත් වජ්ජින්, දුස්සීල අලජ්ජීන් ලෙස හංවඩු ගසා බැහැර කරනු ලැබූ අතර ඉන් පසු වජ්ජිභූ ස්ථවිරවාදීන්ට එරෙහිව ප්‍රබල ලෙස ධර්ම කරුණු විග්‍රහයේදී ප්‍රතිකාර දක්වනු ලැබූහ. එය පසුකලෙක මහායානය බවට පත්විය. (ලක්දිව මහායාන අදහස් - මොරටුවේ සාසන රතන හිමි) එසේම මහායානිකයන්ගේ ආදිම ගුරුකුලය වනුයේ මහා සංඝිකයෝය. වජ්ජිපුත්තක මහාසංඝික භික්ෂූන් පැහැදිලිවම මහායාන සාම්ප්‍රදාය අනුගමනය කරනු ලැබූ නිකායයෝය.

දෙවන සංඝායනාවේදී සහාසංඝික මහාදේව තෙරුන් විසින් දක්වන රහතුන් වහන්සේ පිළිබඳ සිද්ධාන්ත පහ සෘජු ලෙසම මහායානයේ ආරම්භයට හේතු වූවාට සැක නැත. මේ මනස පිළිබඳ වසුමිත්‍ර 'අෂ්මාදශ නිකාය ශාස්ත්‍රයේ' දක්වයි. (ලක්දිව මහායාන අදහස් - මොරටුවේ සාසන රතන හිමි) කථාවත්ථුප්පතරණයේද මේ මත කිහිපයක් පිළිබඳ සඳහන් වේ. එබැවින් රහතන් වහන්සේලා කෙරෙහි ප්‍රබල විරෝධාකල්පයක් මහා සාංඝිකයන් තුළ වූ බව පෙනේ. එක් අතකින් ථෙරවාදී රහතන් වහන්සේලා විසින් පළමු සංඝායනාවේදී මහා සංඝික යැයි පසුකාලීනව ප්‍රකට වූ භික්ෂූන් වහන්සේලා නොසලකා හරින ලදී. එයින්ද නොනැවතී සිය ඒකාධිකාරිය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් දෙවන සංඝායනාවෙන්ද ඔවුන් 'දුස්සීලයන්' 'අලජ්ජීන්' ලෙස සලකා බැහැර කරනු ලැබූවේය. මේ ඉතිහාසගත වූ මහාසංඝයන් උදෙසා සිදුවූ යම් යම් විරෝධතාය. ඊට අමතරව ඉතිහාසගත නොවූ දෑ කොතරම්දැයි අපි නොදනිමූ. මෙබඳු වාතාවරණයක් යටතේ මහා සංඝිකයන් පළමුව උත්සහ ගනු ලැබූවේ රහතන් වහන්සේලාගේ ඒකාධිකාරය බිඳ දැමීමට බව පැහැදිලිය. එබැවින් මහාදේව් තෙරුන් පහත සඳහන් රහතන් වහන්සේලාගේ අඩුලුහුඬුකම් පෙන්වා දෙනු ලැබූවේය.

1. රහත් නමකට නොදැන පවක් සිදුවිය හැක.
2. රහත් වූවද ඒ පිළිබඳ නොදැන සිටිය හැක.
3. රහත් නමකට ධර්මය පිළිබඳ සැක ඇති විය හැක.
4. ආචාර්යවරයකුගේ උපදේශයෙන් රහත්විය නොහැක.
5. භාවනා කරන විටදී 'අහෝ දුකකි' කීමෙන් රහත් විය හැක

මෙම කරුණු පහ විවිධ ගුරු කුලයන්හි විවිධ මුහුණුවරින් ඉදිරිපත් වී ඇත. වජ්ජිපුත්තයන් මීටත් වඩා ඉදිරියට ගොස් පවසනුයේ රහතන් වහන්සේ රහත් බැවින් පිරිහී යා හැකි බවය. සබ්බර්ථවාදීන්ද ඒ මතය පිළිගනී. පුබ්බසේලිය, අපරසේලිය යන නිකාය දෙකද රහතුන්ට නොදැනීම ඇති බව පිළිගනී. (ථෙරවාදී බෞද්ධ දර්ශනය - අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි)

ඉහත කරුණු තුළින් අටළොස් ගුරුකුල අතර රහතන් වහන්සේ පිළිබඳ කිසියම් විරෝධාකල්පයක් හා අර්බුදකාරී බවක් ඇතිබව දක්නට ලැබේ.

බොහෝවිට රහතුන් අනෙක් භික්ෂූන්ට වඩා කිසියම් වැඩි වරප්‍රසාද ලැබූ බව පෙනේ. එය බොහෝ විට අනෙක් සාමාන්‍ය භික්ෂූන් නුරුස්සන්නක් වූ බවට සැකයක් නැත. එබැවින් මෙම විරෝධතාවයේ පෙරමුණ ගන්නට මහා සාංඝිකයෝ උනන්දු වූහ. එම වරප්‍රසාද අතිවිශේෂ බලය අනෙකුත් භික්ෂූන් අතරේද බෙදීයා යුතුය යන ප්‍රගතිශීලී විප්ලවවාදී ස්ථාවරයක මහාසංඝිකයෝ වූහ. එහිදී ඔවුන්ට රහතන් වහන්සේලාගේ සිල්වත් ගුණවත්කම් පිළිබඳ තැකීමක් නොවූ අතර ඔවුන්ට අවශ්‍ය වූයේ සංවිධානයක් වශයෙන් පොදුවේ සමූහයාට ලැබිය යුතු වරප්‍රසාද සියලු දෙනාටම ලබාදීමටය. එම ඉල්ලීම් දිනා ගැනීමට ඔවුන් රාජ්‍ය මට්ටමින්ද ක්‍රියාත්මක වූ බව පෙනේ.

මේ අයුරින් රහතන් වහන්සේ ප්‍රතිකෙෂ්ප කිරීම සහ ඒ වෙනුවට විකල්පයක් සෙවූ පසුකාලීන සහායානිකයෝ 'බෝධිසත්ව සංකල්පය' ඉදිරිපත් කරනු ලැබූහ. රහතන් වහන්සේලාගේ හා පසේ බුදුවරුන්ගේ පෞද්ගලික විමුක්ති සාධනය නිර්දය විවේචනයට ලක් කළ මහායානිකයෝ බුදුරදුන්ද අතිමානුෂිකත්වයකින් විවරණය කළ අතර බෝධිසත්වයන්ට රහත් පසේබුදු දෙදෙනාට වඩා උසස් ස්ථානයක් ලබා දුන්හ.

'බෝධි සත්ව' සංකල්පය සේම 'බුද්ධ සංකල්පයද' මහායානය බිහිවීමෙහිලා හේතුවූ අතර මහායාන දර්ශනයේ කේද්‍රීය සංකල්පයක්ද වේ. මුල් බුදුසමයේදී රහතුන් සහ බුදු රදුන් අතර විශාල පරතරයක් දැක්වෙන අයුරින් සාකච්ඡා නොකළද මහායානිකයෝ බුදුරදුන් ඉතා ප්‍රබල සංකල්පයක් ලෙස දක්වන ලදහ. 'නිකාය' සිද්ධාන්තය ඒ සඳහා කදිම උදාහරණයකි. මෙම බුද්ධ සංකල්පය පිළිබඳ අපූර්වතම වූ වර්ණනයක් 'මහාවස්තුව' නම් කෘතියේ සඳහන් වේ. මේ පිළිබඳ 'අෂ්ටාදශ නිකාය ශාස්ත්‍රයේ' මෙසේ දක්වයි.

■ බුදුරදුන් ආශ්‍රවයන්ගෙන් විමුක්ත බැවින් ලෞකික ශරීරයක් නොවේ. උන්වහන්සේට කැමති රූපකායක් මවා ගැනීමට හැකියාව ඇත. සිහින පෙනීම, නිදා ගැනීම නොකරයි. ආයුෂය පිළිබඳ මිම්මක් නැත. අසංඛ්‍යය.

■ පරමාර්ථ සත්‍ය මිස අනෙකක් නොදෙසයි. සියලු දේශනා පරමාර්ථ සත්‍ය කේන්ද්‍ර කොට ඇත. ව්‍යවහාර සත්‍ය දේශනා නොකරයි. සම පරමාර්ථ සත්‍ය ව්‍යවහාරික භාෂාවෙන් ප්‍රකාශ කළ නොහැක.

■ යම් ලෞකික ශක්තියක් ලබාගැනීමට අවශය වුවහොත් එයද ලබාගත හැකිය.

■ රහතුන්ට සේම බුදුරදුන්ටද බල දහයක් ඇති නමුත් බුදුරදුන්ගේ ඥානය සියලු ආකාරයෙන්ම දත් ස්වභාවයකි.

මෙම අතිමානුෂීය ස්වභාවය තවදුරටත් වර්ධනය වූ අයුරු අශ්වඝෝෂයේ 'බුද්ධ චරිතය' හෙවත් ලලිත විස්තරයෙන් හඳුනාගත හැකිය.

මහාසාංඝිකයන්ගේ සංකල්ප තව දුරටත් වර්ධනය කරමින් සහ ස්ථවිරවාදීන්ගේ මතයක් නිශේධනය කරමින් සහ ප්‍රතිකෙෂ්ප කරමින්ද මුල් බුදුසමයේ සිද්ධාන්ත විවරණය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස මහායානය බිහි වූ බව පෙනේශ්‍රී එහෙත් කෙතරම් ගුරුකුලවලට බෙදී ගියද මෙහි ඇති අපූර්වත්වය වනුයේ මේ සියලු දෙනාම ගෞතම බුදුරදුන් සිය ශාස්තෘවරයා ලෙස අවිවාදිතව පිළිගැනීමය.

Western

## උපන් රටෙන් බැහැරව වෙනත් රටකදී වියපත් වීම පිළිබදව ඔබගේ අත්දැකීම් මොනවාද?

මේක තමයි මගේ පශ්චාත් උපාධිය සඳහා මම තෝරාගත් පර්යේෂණයේ මාතෘකාව. මෙම පර්යේෂණය සඳහා අධීක්ෂණ දායකත්වය ලබාදෙන්නේ ලන්ඩන් නුවර වෙස්ටන් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය Jan Polgar මහත්මියයි.

මෙම පර්යේෂණයේදී අපි බලන්නේ වෙනත් රටකදී වියපත් වීමේදී ඔබේ අත්දැකීම් මොනවාද කියලා.

**පර්යේෂණය සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලබන්නේ පහත අවශ්‍යතා සපුරන අයයි.**

1. ඉංග්‍රීසි හෝ සිංහල කතා කරන,
2. වයස අවුරුදු 65 හෝ ඊට වැඩි,
3. පසුගිය වසර 10 තුල ශ්‍රී ලංකාවේ සිට කැනඩාවට සංක්‍රමණය වී දැනට එහි ජීවත් වන,
4. ශාරීරික අපහසුතාවයකින් තොරව කැමරාවක් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් ඇති වැඩිහිටි අයයි.

**කළ යුත්තේ කුමක්ද?**

1. සම්මුඛ පරීක්ෂණ දෙකකට සහභාගී වීම (පැය 1-2)    2. ඡායාරූප ගැනීම (විස්තර පසුව ලබා දෙමි)

**පර්යේෂණය පවත්වන ස්ථානය**

ඔබගේ නිවසේ හෝ ඔබගේ කැමැත්ත පරිදි වෙනත් ස්ථානයකදී

**පර්යේෂණයේ අරමුණ**

මෙම පර්යේෂණයෙන් අපිට විවිධ රටවල සිට මෙරටට පැමිණ ජීවත් වන වැඩිහිටි අය, උපන් රටෙන් බැහැරව වියපත් වීමේදී ලබන අත්දැකීම් ගැන අලුත් දැනුමක් ලබා ගත හැක.

ඔබ මේ පර්යේෂණයට සහභාගී වීමට කැමති නම් හෝ ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් කරුණාකර අමතන්න

**සචින්ද්‍රි විජේකෝන්**
**swijekoo@uwo.ca**
**(647) 865 2306**

**මේ සඳහා ඔබගේ සහයෝගය කාරුණිකව ඉතා අගය කරමි. ස්තූතියි.**

LESSON 32




Hello Dasatha French lesson followers! Hope all of you are having a wonderful time enjoying the colourful views around you. At the same time, we hope you had found some time to go through the lesson provided last time. If you have any problems regarding the lessons and if something is not clear, you can always drop an email to kumudu4444@gmail.com. We will try our level best to answer your questions about the problematic areas in a more helpful way. Hope the vocabulary list provided in the last issue was helpful in getting to know the dairy products that French people use. As practice makes you perfect, you are expected to keep on studying and revising. If you are as dedicated and enthusiastic as we are, learning French will not be hard anymore.

This month's Dasatha issue presents you again with a very relevant vocabulary list that will help you enrich your French vocabulary and improve your French reading and pronunciation apart from improving your conversing skills. Moreover, it will help you get an idea about sentence structures and how the words are used in sentences. As usual, the grammar lesson aims to improve your grammar knowledge and to help you construct sentences using correct grammar. Exercises will help you put what you learnt so far in to practice. Enjoy learning! Thank you!



## Le Vocabulaire (ලවොකැබියුලෙර්) - Vocabulary

The words presented in the last issue were related to dairy products that French people use. Knowing these terms in French would be very useful as we all are living in a bilingual country. If you go to countryside or to the French speaking provinces in Canada, you will now be able to figure out what kind of products they have in their farms and stores. Hope you have memorized these terms. It is very important to learn and review all the words in the vocabulary lists regularly. It will help you in enriching your vocabulary and remembering all the words without any difficulty. It is also very important to learn all the words in each lesson before the issue of the next. In order to converse well in a foreign language, it is necessary to have a rich vocabulary. This month's Dasatha issue will present you with a vocabulary that deals with most of the terms related to baking and types of bread that the French people use. It is important to state that French people use a very big variety of bread.

| Desserts in French | Meaning |
|---|---|
| Le chocolat chaud | Hot chocolate |
| La crème allégée | Single cream |
| La crème épaisse | Double cream |
| La crème fouettée | Whipped cream |
| Le yaourt | Yoghurt |
| La glace | Ice-cream |
| Le lait pasteurisé | Pasteurized milk |
| Le lait non-pasteurisé | Unpasteurized milk |
| Le milk-shake | Milkshake |
| Le yaourt surgelé | Frozen yoghurt |
| Le lait de brebis | Sheep's milk |
| Le babeurre | Buttermilk |
| Le lactose | Lactose |
| Le lait homogénéisé | Homogenised milk |
| Le lait en poudre | Powdered milk |
| Sans matières grasses | Fat free |
| La baguette | Baguette |

| | |
|---|---|
| Le pain | Bread |
| Le pain tranché | Sliced bread |
| La croûte | Crust |
| Le pain complet | Granary bread |
| Le pain au levain | Sourdough bread |
| Le petit pain rond | Bap |
| Le bagel | Bagel |
| Le pain aux graines | Seeded bread |
| La matza/Le pain non levé | Matzo |
| La farine complète | Brown flour |
| La farine traitée | Strong flour |
| La boulangerie | Bakery |
| Le pain de seigle | Rye bread |
| Le pain | Loaf of bread |
| La tranche de pain | Slice of bread |
| Le pain plat | Flat bread |
| Le petit pain | Roll |

| | |
|---|---|
| Le naan | Nan bread |
| Le biscuit scandinave | Crispbread |
| Le boulanger | Baker |
| La farine brute | Wholemeal flour |
| La farine avec la levure | Self-raising flour |
| La baguette | Baguette |
| Le pain blanc | White bread |
| Le pain de son | Wholemeal bread |
| Le pain de maïs | Corn bread |
| Le pain au bicarbonate de soude | Soda bread |
| Le pain aux raisins secs | Fruit bread |
| La pita | Pita bread |
| Le pain au chocolat | Chocolate bread |
| La farine blanche | White flour |
| La levure | Yeast |
| La machine à couper | Bread slicer |
| Le pain du blé complet | Wholewheat bread |

## Grammaire (ග්‍රාමෑර්) Grammar



In the last issue, we went further into details on adjectives and how their meaning change according to their placement on a sentence. Now, when you place an adjective you have to be more careful about the meaning that it would give. French people are very strict about their rules about positioning and correct formation. As French grammar is a little complicated with many exceptions and grammar rules, you have to study and make use of what you have learnt regularly to practice. In this month's issue, we are going to learn the near future. It is not a complicated tense. Near future tense is one of the easiest and most frequently used tense in both English and French.

### Near Future (Le futur proche)

There are two future tenses in French, the simple future and the near future (le futur proche). The 'futur proche' is usually translated into English as going + infinitive (e.g., going to eat, going to drink, going to talk). Le futur proche is more frequently used in spoken French than in written French. However, it could be used in informal writing as well.

*Formation*

It is formed with the verb aller (to go) conjugated in the present tense followed by an infinitive.

| Nager (to swim) | |
|---|---|
| Je vais nager (I am going to swim) | Nous allons nager (We are going to swim) |
| Tu vas nager (You are going to swim) | Vous allez nager (You are going to swim) |
| Il/Elle/On va nager (He/She/It/One is going to swim) | Ils/Elles vont nager (They are going to swim) |

To put le futur proche in to negative, place ne ... pas around the conjugated form of aller:

Ex: Je ne vais pas manger. (I am not going to eat)

**USES**

Le futur proche is used to refer to most actions happening in the near future. Simple Future is used to express actions that would happen in an unknown time in the future. But these actions will take place in the immediate future:

| | |
|---|---|
| Je vais manger une pomme pour mon déjeuner demain. | I am going to eat an apple for my lunch tomorrow. |
| Il va pleuvoir. Je ne vais pas aller à la plage. | It is going to rain now. I am not going to go to the beach. |
| Je vais aider mes parents parce qu'ils vont préparer le repas bientôt. | I am going to help my parents because they are going to prepare the meal soon. |

**Kumudu Abeywardena**
Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com



# සන්දේශ සාහිත්‍යය

## කෝකිල සන්දේශය

### 2 - කොටස

■ සිරිසේන විතානගේ

## සසුන රකින සුරිඳුන්

'තොසේ මුනිඳු සාසන රකිනා නිබඳ' යනුවෙන් උපුල්වන් දෙවියන් පිළිබඳ පළ කළ පුවතම,

මුනිඳුන් වදන් මුනිදුන් ගත් සුරිඳු සඳ
නිරිඳුන් ලක රකිනුව බුදු සසුන් සොඳ
(පරෙවි සන්දේශය)

යනුවෙන් සෙසු සන්දේශ කරුවෝද සනාථ කළහ.

'සූර්යයා හා චන්ද්‍රයා සමාන වූ මේ දිව්‍ය රාජයාගේ තේජස හා කීර්තිය අහසෙහිත් පොළොවෙහිත් එක සේ පැතුරුණෝය'. යන සරල අදහස් මෙන්ම දේව කතාව පිළිබඳ දැනුමක් නැති නම් කිසිසේත්ම තේරුම් ගත නොහැකි පද්‍යද මෙහි ඇතුළත්ව ඇත. 'පැහැති සිපත් මින් පටහළ කුමු පෙළඳ' ආදි 25 වන පද්‍යය එවැන්නකි.

එය නවකයකුට කිසිසේත් විෂය නොවේ. එයට හේතුව එයට සම්බන්ධ දේව කථාව පිළිබඳ අනවබෝධයය. දානව යනු අසුරයෝයි. අසුරයෝ සුරයන්ගේ සතුරෝය. සුරයන්ට ප්‍රතිවිරුද්ධව ආ දානව අසුරයන් උපුල්වන් දෙවියන් විසින් පරාජය කරන ලදුව ඔහුගේ පාමුලදී කරුණාව ලැබීය. මෙහි 'රද සෙන් මුහුඳ' යන රූපකය දානව සේවාවෙහි විශාලත්වය මැනවින් පෙන්නුම් කරයි.

මීළඟට කෝකිලයෙහි දක්නට ලැබෙන්නේ 'ජයවර්ධනපුර වැනුමයි'. ජයවර්ධනපුර වර්ණනා කිහිපයක්ම අසා පළපුරුදු පාඨකයිනට මේ ජයවර්ධනපුර වැනුම තරමක් ආගන්තුක වූවක් සේ දැනෙනු නිසැකය. ඒ පද්‍ය දහතුනක් වූ වැනුම සකල නගරාංගයන්ම අතොරක් නොතබා වර්ණනයට ලක් කරන බැවිනි. මේ වර්ණනය ඇරඹෙන්නේ රමණීය උපමාවකිනි.

සෑදූ මිණි බරණ මිහිලිය හස ලෙස ට
මූදූ පුලින දිසි වේ මඟ නිසි ලෙස ට

මෙහි වැලි සහිත මග මැණික් ආභරණයෙන් සැරසුණු මිහිකතගේ සිනහවට උපමා කොට තිබීම කොතරම් නම් අපූර්වද? ජයවර්ධනපුරය මිහිකතගේ මුහුණ බඳු යයි නොකියා කිවූ අයුරක්ද මින් ධ්වනිත වෙයි. මාර්ගයක් මිහිකතගේ සිනහවට උපමා කළ තවත් අවස්ථා නැතැයි සිතමි. කවියා පුරාංගනාවන් වර්ණනයට ලක් කළේ මෙසේය.

සිටිනා තුඟු ලකුළු යුග පියොවුරු බරි නි
මිටිනා ගතැකි ඉඟ සුඟ දසත නැමෙමි නි
වටිනා මෙමුළු ලොව මුව මදහස දෙමි නි
සිටිනා කලුන් බල දොර දොරෙහි පෙනෙමි නි

කාන්තාවන්ගේ ශරීර ශෝභාව කරුණු තුනකින් කවියා වර්ණනා කරයි. පළමුවැන්න උස පියොවුරු යුග්මයයි. එයින් ඔවුන්ට අමුතුම අලංකාරයක් එක් වී තිබේ. දෙවැන්න නම් මිටින් ගත හැකි සිහින් ඉඟයි. එය කාන්තාවන්ට දසතට නැමීමට උපකාර වෙයි. තෙවැන්න මඳහසයි. එය මේ මුළු ලොවම වටින්නකි. බොහෝ විට බසෙහි ගැඹුරක් ඇති කිරීමට උත්සාහ ගැනීම කෝකිල කවියාගේ ලක්ෂණය වුවත් මේ වැනි පද්‍ය සරල, සුගම ස්වභාවයක් පළ කරන බව කිව යුතුය.

කාන්තාවන් පිළිබඳවම වූ මේ පද්‍යයද රමණීයාර්ථ නඟන්නකි.

පයින් කොමළ ලිය රන් සලඹ සල සලා
වෙයින් කෙළෙන ලෙන නිල්වරල මල් සලා
මෙයින් ගලන දිය බිඳු විලස සිතු නොලා
මෙයින් පිටත් කෙවුවම් කියති කිවි බලා

ජයවර්ධනපුර කාන්තාවෝ වේගයෙන් පාදයන්හි රන් සලඹ සලමින් ක්‍රීඩා කරති. එවිට ඔවුන්ගේ වරලස පැළඳි මල් බිම වැටෙති. මේ අදහස අලංකාර කරනු පිණිස කෝකිල කවියා තම කවිත්වය පිළිබිඹු කරමින් කාන්තාවන්ගේ කේශකලාපය මේඝය ලෙසත් ඉන් වැටෙන මල් වැහි බිඳු ලෙසත් දක්වයි. එපමණක් නොව, වැහි වසිද්දී මේඝ ගර්ජනවාක හඬද අපට අස්වයි. ඒ පයේ සලඹ සැලීම තුළිනි. කේශකලාපයෙන් මල් වැටීම වළාවෙන් වැහි වැටීමට සම කිරීමත් සලඹ නගන හඬ ව්‍යංගයෙන් මේඝ ගර්ජනා හඬ ලෙස දැක්වීමත් කවියාගේ දක්ෂතාවට, කවිත්වයට දෙස් දෙන්නේමය.

## ප්‍රහේළිකා

කෝකිල කවියා කවියෙන් ප්‍රහේළිකාකරණයෙහිද යෙදුණු අන්දම ජයවර්ධනපුර වැනුමේ එන පද්‍යයකින් දත හැකිය.

දෙකකින් සතර තිසවන විසි මහ පසැ ති
අනු අට තුණු නවසිය අක් දලැ ති
අසූ සත ගණන් එක් කොට සැටනි නි ති
එපුර ලියෝ විසි එකකින් දස කෙරෙ ති

තිහේ ඒවා දෙකින් (තිසවන දෙකින්) හා එයට එකතු කළ සතරකින්ද (30 x 2 = 60 + 4 = 64) යුත් වශී (විසි) නමැති මහ යදම් ඇති ඊශ්වර (අටතුනු) ගේ අළුත් බිරිඳට අනුකූල වූ නවසිය අනූ දෘෂ්ටීන්ගෙන් යුක්ත වූ මෙනුවර කාන්තාවෝ තමන්ට අසූ වූ සත්ව (පුරුෂ) සංඛ්‍යාවන් (අසූ සත ගණන්) හැට ගණනින් (සැටින්) එක් කොට එක වචන මාත්‍රයකින් (විසි එකකින්) දාස භාවයට පත් කර ගනිති.

ජයවර්ධනපුර කාන්තාවන් හැට හතර මායම් යොදා වචන මාත්‍රයකින් පුරුෂයන් බැඳගත් අන්දම මින් කියවේ. සංස්කෘත සාහිත්‍යයෙහි ශබ්දාලංකාරයක් වශයෙන් ගනු ලබන සංඛ්‍යාතා නම් ප්‍රහේළිකා නියමයට අනුව මෙය ප්‍රබන්ධ කර තිබේ.

කවියා මේ පුරවරයෙහි ශෝභාව වර්ණනා කිරීම හමාර කරන්නේ සකු කවීන්ටත් පැරණි සිංහල කවීන්ටත් හොඳින් හුරු පුරුදු නිමාවකිනි.

සිත වෙනසක් නොව පවසත අනත සරි
වත දහසක් තව ලදුවොත් මිසක් බැරි

කවියා ජයවර්ධනපුර වැනුමින් පසු කෝට්ටේ සන්දේශ කවීන් කවුරුත් වාගේ මහත් අභිරුචියකින් කළ පැරකුම් රජ වැනුමට පිවිසෙයි. සිවුපද පද්‍ය එකොළොසක් මේ සඳහා වෙන් කොට ඇත. මෙම රජ වැනුම වෙනත් සඳෙස් රජ වැනුම්වලින් වෙනස් නොවන්නකි. 'රජ ග්‍රීෂ්මයෙන් ගහන මිහි මඬලට මේඝ රාජයකු වැනිය. ලෝකයා සතුටු කරන්නෙකි. යාචක භෘංගයන් පිනවන්නෙකි. රුපු සයුරු වියලා හැරියේය. නිසල ගුණයෙන් මහ පොළොවට සමාන විය. සූර්ය වංසයෙහි උපත ලද මොහු සුරතුරට සමාන විය. සතුරු රජුන්ගේ භාර්යාවන්ගේ කියඹු වැල් කඳුළු හැලිවලින් නැහැවූයේය. සතුරු රජවරු මෙරජ ඉදිරියේ හිරු දුටු කදෝකිමියන් වූහ.' වැනි අදහස්වලින් එය ගහනය. මේ පද්‍යාවලියෙහි උසස් ගණයේ කවියක් සොයා ගැනීම දුෂ්කරය.

ඒ සමගම එන රජ සබ වැනුමද වෙනත් රජ සබ වැනුම් අනුගමනයකි. මෙය රාජ නිල මඬුල්ල පිළිබඳ ඓතිහාසික වටිනාකමකින් යුත් විස්තරයක්ව ඇති බව කිව යුතුය.

මෙහි එන 'යාපා පටුන් වැනුම' දෙස විශේෂ බැල්මක් හෙළිය යුත්තේ මෙනුවර ගැන වැනුමක් එන එකම සන්දේශ කාව්‍යය මෙය වන බැවිනි. මෙම වැනුම තුළින් එවකට සිංහලයන් යටතේ වූ යාපනයෙහි ශ්‍රී විභූතිය පළ වන බව ඇතැමෙක් පෙන්වා දෙති. මේ එහි ආරම්භක පද්‍යයයි.

රන් දද කිකිණි දැල් බැඳි පා පෙළැති රුදු
තැන් තැන් සැදූ මිණි මුතු දිගත අලු විදු
නන් සිරි සපිරි නිති කිඳුරිඳුගෙ පුර බඳු
මන් තොස් වෙමින් ගොස් යාපා පටුන් වදු

මෙනුවර කුවේරයාගේ ආලකමන්දා පුරය බඳු යයි පවසන කවියා වෙනත් නුවරවලදී හුරු පුරුදු පරිදිම රන් දද, කිකිණි දැල්, බැඳි ප්‍රාසාද, දිගත ආලෝක කළ තැන තැන යොදා තිබුණු මිනි මුතු මෙහි දිස් වූ බව පවසයි. මින් මතු පද්‍යවලදී හමුවන්නේද එබඳු නගරාංගයන්මය.

මේ වැනුමේදී පහත සඳහන් පද්‍යය වැදගත් වන්නේ තම දූතයාට සම්බන්ධ කොට මෙවැනි අදහසක් පළ කළ වෙනත් කවියකු නැති බැවිනි.

පුලා නිලු පුලෙව් දිගු නෙතිනි මන කලා
කලා සපිරි සඳවන් මුවැති පුර කලා
බලා මිනිස් බව නොලදින් සුසුම් ලලා
ලොලා නොවන් උන් වෙත මිතුර දුකු සුලා

පිපුණු නිළුපුල් වැනි දිගු නෙතින් සිත් ඇඳගන්නා වූ කලා සපිරි සඳ බඳු මුහුණු ඇති මේ නගරයෙහි කාන්තාවන් බලා තමන් මිනිස් බව නොලද හෙයින් දුකට පත්ව සුසුම් ලමින් ඔවුන් කෙරේ ලොල් නොවන්නැයි කෝකිලයාට කියයි. මුලදී කළ දූත වර්ණනයේදී කෝකිලයාගේ තිරිසන් බව මතු නොවන සේ කළ වර්ණනා කවියාට අමතක වූ සේය.

එවකට යාපා පටුනෙහි වූ යුද්ධ ස්වරූපය පහත දැක්වෙන පද්‍යයෙන් විවරණය වේ.

කරළ දළ විරිදු බිඳ හළ ඔළ මොළය
දෙමළ මළල දොලුවර සීහ ළබලුය
පටළ ලෙළ විසුරතින් ගෙන කෙළ කෙළය
ඔසළ වෙළව දිවෙනුය එහි පෙළ පෙළය

දෙමළ, මළයාල, තුලුවර්, සිංහල යන භට සේනා පලිහ හා අවි ආයුද අතැතිව පෙළ පෙළ වහ වහා දිව ගිය ආකාරය මින් කියැවේ.

**ලබන කලාපයෙන් 'කෝකිල සන්දේශ' කාව්‍යය පිළිබඳ තවදුරටත් විමසා බලමු.**

# JAY PLUMBING



**WHY SPEND TWICE**
**WHEN YOU CAN DO IT RIGHT....**

**AT FIRST TIME !**



**YOU DESERVED TO GET YOUR WORK DONE BY**

- LICENSED PLUMBER
- LICENSED GAS TECHNICIAN
- LICENSED ELECTRICIAN



**PROBLEM IN YOUR**

★ WATER TANK ★ FIRE PLACE
★ BBQ, DISH WASHER ★ FURNACE
★ WASH ROOMS

**PLEASE CALL**
JAYANTHA @ 905 450 9005
416 882 8591
Web : www.jayplumbing.ca

Electrical Contractor Registration Agency of the Electrical Safety Authority

Licence No 7011266
WWW.esaecra.info
T S S A # 000261790

TB
TISSA BOYAGODA, LLM

KNOW YOUR RIGHTS



## TISSA BOYAGODA, LLM
Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law
with Manitoba Legal Aid, Former Judge, Sri lanka

**Areas of Practice**

- Criminal Law
- Family Law
- Real Estate
- Immigration Matters
- Civil Litigation
- Small Claim Court Matters
- Power of Attorneys
- Last Wills
- Notarizations

GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED

1965 Britannia Road West, Suite 208
Mississauga, ON, L5M 4Y4

100 Consilium Place, Suite 200
Scarborough, ON, M1H 3E3

TEL: 416.627.6090
FAX: 289.997.3426
EMAIL: tboyagoda@gmail.com

www.tissaboyagodalaw.com

# කම්කරුවෙක් විවෘත කළ ලොව පළමු පාලම

## නව කැලණි පාලම



■ විමල් වීරසේකර

වික්ටෝරියා පාලම ඉදිකිරීමට පෙර ග්‍රෑන්ඩ්පාස් තොටුපලේ තිබූ ඔරු පාලමකි. 1822 දී තැනූ මෙම පාලම ලුතිනන් ජෙනරාල් ජෝන් ෂෙෆර් විසින් නිර්මාණය කරන ලදී. එක ළඟ නවත්වන ලද ඔරු 21 කින් සමන්විත වූ මෙහි දිග අඩි 999 ක් විය.

හරියටම මීට වසර 120 කට පෙර පටන් වසර 47 ක් ගෙවෙනතුරුම උතුර, උතුරු මැද, වයඹ හා මධ්‍යම පළාත්වල සිට හෝ සබරගමු, නැගෙනහිර හා බස්නාහිර පළාත්වල යම් යම් ප්‍රදේශයන්හි සිට හෝ ශ්‍රී ලංකාවේ අගනුවර වන කොළඹට මහා මාර්ගයෙන් එන්න හැකි වූවා නම් හැකි වූයේ කැලණි ගඟේ වික්ටෝරියා පාලම ඔස්සේ පමණය. ඒ කාලයේ එතරම් මෝටර් රථ නොතිබුණු නිසාත්, ගැල් කරත්ත, රික්ෂෝ ආදියෙන් හා පයින්ම ගමනාගමන කටයුතු හා බඩු ප්‍රවාහනයද බොහෝදුරට සිදුකෙරුණු නිසාත් කොළඹට ගමන්බිමන් සිදුකෙරුණේ සාමාන්‍ය මට්ටමකිනි.

ජනගහනය ඉහළ යෑමෙන් හා මෝටර් රථ පාවිච්චිය නොසිතූ විරූ ලෙස ඉහළ යෑමෙන් වික්ටෝරියා පාලම අසල තදබල අවහිරතාවක් පැන නගින්න පටන් ගත් හෙයින් අගනුවරට ඇතුළුවන්න තවත් පාළමක් අවශ්‍ය වග පෙනී ගියේ ඉබේමය. නව කැලණි පාලම ඉදිකරන ලද්දේ එහෙයිනි.

නුවර - කොළඹ මහා මාර්ගයේ කැපී පෙනෙන ස්ථානයක් වන නව කැලණි පාලම, වික්ටෝරියා පාලම මෙන් කැලණි ගඟ හරහා ඉදි වූවකි. නව කැලණි පාලම සැබවින්ම වාර්තා පිහිටවූවක් වශයෙන් සැලකිය හැකිය. 1953 හය වැනි නිදහස් දිනය දා එවක අගමැති සර් ජෝන් කොතලාවල මහතා විසින් පාළම සඳහා මංගල පස් පිඩැල්ල කපන ලද අතර විවෘත කරන ලද්දේ 1959 වසරේ පැවති 12 වැනි නිදහස් දිනයට පෙරදාය.

එවක අගමැතිව සිටි එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා අතින් පාලම විවෘත කිරීමට නියමිතව තිබුණත්, පාලම ඉදිකරද්දී ජීවිත හානි වූ කම්කරුවන් පස්දෙනකුට ගරුකිරීමක් වශයෙන් බණ්ඩාරනායක අගමැතිතුමන්ගේ ඉල්ලීමක් අනුව විවෘත කරන ලද්දේ පාලමේ කම්කරුවකු වශයෙන් කටයුතු කළ කෙනෙකි. කුණ්ඩසාලේ, නත්තරම්පොළ පී. බී. මාරසිංහ මහතා ඔහුය. කම්කරුවකු අතින් ලෝකයේ පාලමක් විවෘත කෙරුණු ප්‍රථම අවස්ථාව හැටියට සැලකෙන්නේද එම අවස්ථාවයි.

නව කැලණි පාලමේ අත්තිවාරම මුහුදු මට්ටමේ සිට අඩි 75 ක් 95 ක් පමණ යටැති කළුගල මත සිට දැමූවක් වන අතර ගඟ පත්ලක සිට කෝල්ක්‍රීට් නමැති විශේෂිත කොන්ක්‍රීට් වර්ගයක් යොදා ලෝකයේ තැනූ මුල්ම පාලම හැටියට සැලකෙන්නේද මෙම පාලමය.

මීට අමතරව ලෝකයේ ප්‍රථම වරට කෝල්ක්‍රීට් සිමෙන්තියෙන් ගඟ පත්ලේ පටන් අත්තිවාරම ගොඩනැගූ මුල්ම පාලම හැටියට සැලකෙන්නේද මෙයයි. මීට වසර ගණනාවකට පෙර පාළමේ අලුත්වැඩියාවන් සිදුකෙරුණු අවස්ථාවේ පාලම රඳා පවත්නා, කල් ඉකුත් වූ පැද්දෙන රොකර් බෙයාරින් මෙන්ම රෝලර් බෙයාරින්ද ඉවත් කිරීමට සිදු වූ විට දැඩි පීඩනයකට ලක් කෙරුණු අතිශයින් ප්‍රබල දිය පහරකින් කොන්ක්‍රීට් කැඩීමක් ලංකාවේ මුල්වරට සිදුවූයේද නව කැලණි පාලමේදීමය.

හා හා පුරා කියා ලංකාවේ රොකර් බෙයාරින් හා රෝලර් බෙයාරින්ද පාවිච්චි කරන ලද්දේද මේ පාලම සඳහාය.

නව කැලණි පාලම ගොඩනැඟීමට යොදා ඇති කොන්ක්‍රීට් ඝනඅඩි ප්‍රමාණය 4,22,000 කි. පාවිච්චි කර ඇති වානේ කම්බි ප්‍රමාණය ටොන් 1500 කි. සහභාගි වූ කම්කරු සංඛ්‍යාව දිනකට 300 කි.

පාලම දරා සිටින කෝල්ක්‍රීට් සිමෙන්ති කණුවක වට ප්‍රමාණය අඟල් 42 12 ක් තරම්ය. කෝල්ක්‍රීට් කොන්ක්‍රීට් තාක්ෂණයෙන් සකස් කෙරුණු පාලමේ දිග අඩි 900 ක් පමණ වන අතර දෙදිශාවට ගමන් මාර්ග හයකින් සමන්විතව දෙපස පදික වේදිකාද සමග පාලමේ පළල අඩි 80 කි. පදික වේදිකාව අඩි 10 ක් පළල්ය. ජල නළ, විදුලි රැහැන් ආදිය පාලමේ යටින් දිව යයි. පාලම ඉදිකිරීමට වසර හයක පමණ කාලයක් ගත විය.

එවක මාර්ග පාලම් ආදිය 'ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව' නමැති දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද අතර පාලමේ කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඉන්දියාව, ජපානය, ප්‍රංශය, බ්‍රිතාන්‍ය, ජර්මනිය ඇතුළු රටවල් 20 ගණනකින් මිල ගණන් ඉදිරිපත් කෙරුණු අතර අන්තිමේදී කොන්ත්‍රාත්තුව එංගලන්තයේ සමාගමකට පැවරිණි. සමහර විට ඊට හේතුව එම සමාගම ඉදිරිපත් කළ මිල ගණන් සාධාරණ යැයි හැඟී ගිය නිසාත්, බ්‍රිතාන්‍ය කාන්තාවක වූ වික්ටෝරියා රැජනගේ උපන් දිනය සමරනු වස් අසල පිහිටි වික්ටෝරියා පාලම බ්‍රිතාන්‍යයෙන් ඉදිකෙරුණක් වීම නිසාත්, ලංකාව ඒ වන විට බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති නිසාත් වන්නට පුළුවන.

පාලම් ඉදිකිරීමේ තාක්ෂණය ගැන අවබෝධයක් ලබාදීමේ අරමුණින් මේ සඳහා අලුතින් ඉංජිනේරුවන් හා කාර්මික නිලධාරීන්ද බඳවාගත් වග දැනගන්නට ඇත. ඉදිකිරීම් සඳහා යොදාගෙන ඇත්තේ කන්කසන්තුරේ සිමෙන්තිය. පාලමේ හරස් බාල්ක මත පාලම් තට්ටුව ඉදිකර ඇති අතර පොළව යට කළු ගලේ සිට ඉහළට ඉදිකෙරුණු කෝල්ක්‍රීට් සිමෙන්ති කණු ගණනාවක් මත මේ හරස් බාල්ක තබා ඇත.

කොන්ක්‍රීට් ගොඩනැඟිලි මෙන්ම පාලම්ද තැනීම පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ලබා තිබුණු ඉන්දියාවේ ඊ. නිකොලයිඩිස් මහතා විසින් පාලමේ ආකෘතිය සකසන ලදැයි කියන අතර සැලැස්ම සැකසීම හා නිර්මාණය සඳහා ගැමන් ඉන්දියා සමාගම මෙන්ම මලයාවේ ගැමන් සමාගමත් දායක වූ බැව් කියති.

නව කැලණි පාලමේ වයස දැන් අවුරුදු 57 කි. පැරණි වික්ටෝරියා පාලමේ වයස 121 කි.

පාලම විවෘත කිරීමේ උත්සවයට මෛත්‍රීපාල සේනානායක මහතාද (එවක ඒ මහතා ගමනාගමන ඇමැති හෝ මහා මාර්ග ඇමැති හෝ වශයෙන් කටයුතු කළා විය හැකිය.) සහභාගි වූ අතර පාලමේ සිට රත්මලාන දක්වා පාරක් ගොඩනගන්න විධිවිධාන සලසා ඇතැයි එහිදී කියා සිටියේ ඒ මහතාය. දැන් දක්නට ඇති බේස්ලයින් පාර ඒ පාරය.

නව කැලණි පාලම විවෘත කිරීමේ සුබ මොහොත 1959. 02. 03 වැනිදා පස්වරු 5.45 ට යෙදී තිබුණු අතර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ එනම් පී. ඩබ්ලිව්. ඩී. එකේ අධ්‍යක්ෂවරයාව සිටි ප්‍රේමරත්න මහතාගේ ආරාධනය මත අගමැති බණ්ඩාරනායක මහතා පාළම විවෘත කරන්න පැමිණ සිටියේය. ආරාධිත අමුත්තන් හා මහජනයා බලගතු ප්‍රීතියකින් බලා සිටියදී ගරුතර මහා සංඝරත්නය විසින් පිරිත් සජ්ඣායනය කරන ලද්දේ පසඟතුරු, ජයසක් හඬ මධ්‍යයේය.

සුබ මොහොත කිට්ටුවත්ම කම්කරු ජනතාව ඇතුළු පීඩිත පංතිය කෙරෙහි දක්වන ලැදියාව, හිතෛෂීවන්තකම නිසාදෝ පාලම ගොඩනැඟීමේදී දිවි අහිමි වූ කම්කරුවන් පිරිස ගැන බණ්ඩාරනායක අගමැතිතුමන්ට සිහිපත් වූයේ නිතැතිනි. පාලම ඉදිකිරීමට දහදිය වැගිරූ කම්කරු මහතකු ලවාම පාලම විවෘත කරවන්න තමන් අදහස් කරන වග අගමැතිතුමන්ගෙන් පැවසුණු විට ආරාධිත අමුත්තෝත් බලා සිටි අයත් අන්දමන්ද වූහ. අගමැතිවරයා එවැන්නක් කළේ යට කී කම්කරුවනට ගරුකිරීමක් හැටියටය. පාලම විවෘත කිරීම සඳහා එහි ඉදිකිරීම්වලට සම්බන්ධ වූ කම්කරු මහතකු හනික එන ලෙස එතුමා ඉල්ලා සිටි විට ජේ. සී. ගැමන් සමාගමට සම්බන්ධව කටයුතු කළ පී. බී. මාරසිංහ මහතා ඉදිරියට පැමිණියෙන් ඒ කාර්යය ඔහුට පැවරිණි. විදුලි බලෙන් ක්‍රියාත්මක වූ පොලු දෙකක් පාලම වැසෙන අයුරින් දෙපසේ සවිකර තිබුණු අතර පිරිත් සජ්ඣායනය කරන අතරතුර කම්කරු මහතා අදාළ විදුලි බොත්තම තද කළ විට පොලු දෙක දෙපසට ගියේ අත්පොළසන් හඬ මධ්‍යයේය.

නව කැලණි පාලම ඔස්සේ හා හා පුරා කියා පියමං කළේ බණ්ඩාරානායක අගමැතිතුමනුත්, ආරාධිත අමුත්තනුත්ය.

පාලමේ වැඩ අවසන් වීමෙන් පසු තමන් රැකියා විරහිත කෙනකු බවට පත්වන වග කියා සිටිමින් පාලම විවෘත කළ මාරසිංහ කම්කරු මහතා උත්සව අවස්ථාවේදී බණ්ඩාරනායක මහතාට ලිපියක් බාරදුන් බවක්ද දැනගන්නට ඇත. එය සැබවින්ම සිනා ගෙන දෙන කරුණක් හැටියට සැලකිය හැකිය.

එවක වික්ටෝරියා හා නව කැලණි පාලම් ඔස්සේ මෙන්ම රට පුරාද ධාවනය වූයේ ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර අංක තහඩුවලට යෙදූ යාන වාහනය. ඉංග්‍රීසි හෝඩියේ අවසාන අක්ෂරය වන ඉසෙඩ් අක්ෂරය සහිත වාහන දැනුදු කලාතුරකින් දැකගත හැකි අතර මේ පාලම් දෙක ඔස්සේ ඒවා අපමණ වාරයක් එහා මෙහා ගොස් ඇතිවාට සැකයක් නැත.

නව කැලණි පාලමට පවා වාහන ප්‍රශ්නය බලගතු ගැටලුවක්ව ඇති වග අමුතුවෙන් කිව යුතු නැත. මීගමු පාරෙන් හා නුවර පාරෙන් කොළඹට ඇතුළු වන වාහන කන්දරාවට අමතරව කොළඹින් ඒ පැතිවලට දිවෙන කන්දරාවද ගණන් කරන්න බැරි තරම්ය.


ANTON
DHARMASEELAN
MORTGAGE AGENT
Available Till Midnight
Including Weekends & Holidays
CALL ME FIRST
FOR ALL YOUR MORTGAGE NEEDS
PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY
416 704 1200
MAJOR BANKS-BEST RATES
MORTGAGE ALLIANCE
BROKER #10530

# ANOMA PERERA

Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)

- REAL ESTATE - Residential & Commercial
- WILLS & POWERS OF ATTORNEY

EVENING & WEEK END CONSULTATIONS
AVAILABLE BY APPOINTMENT



## ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

# IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage, Refinancing, Second Mortgage, First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

**Abby Sri Haran**
Senior Mortgage Specialist

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

# නිව් වන්නි මාර්කට් ඉන්ක්.

## NEW VANNI MARKET INC.

**40 Bristol Rd E. Unit 7. Mississauga, ON. L4Z 3K8**

**Tel: 905 566 5550**




BECOME A MEMBER AT NEW VANNI MARKET AND RECEIVE POINTS FOR EVERY PURCHASE AND REDEEM THEM FOR FREE ITEMS.

අලුත්ම අලුත් මාලු, නැවුම් එළවළු පළතුරු, කුළුබඩු සහල්
ඇතුළු ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සියලුම ආහාර වර්ග වඩාත්
පහසුවෙන් ඔබේ සිතැඟි පරිදි තෝරා ගැනීමට
**නිව් වන්නි මාර්කට් ඉන්ක්** වෙත එන්න.

වියළි හාල්මැස්සන්
සියලුම කරවල වර්ග
උම්බලකඩ

පොල්, රතුළූණු, කෙසෙල් කොළ, බුලත්
ගොටුකොළ, මුකුණුවැන්න, කතුරුමුරුංගා
අලුත් එළවළු සහ පළතුරු වර්ග රැසක්

**SEND MONEY TO SRI LANKA, INDIA OR OTHER COUNTRIES**

* all prices are subject to change without prior notice

ගෙදර යන ගමන් අතේ ඇති මුදලට හිතේ හැටියට ඔබට අවශ්‍ය සියලුම ශ්‍රී ලාංකේය නිෂ්පාදන එකම තැනකින් ලබාගන්න **NEW VANNI MARKET INC.**වෙත පැමිණෙන්න.



# දසත Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

## වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

**Gamini - 416 822 2789**

**All Ads & Classified Ads are also Published in the ONLINE Edition at**

**WWW.DASATHA.COM**

**For NO ADDITIONAL CHARGE**

**Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com**

# පිළිකාව



## නවීන විද්‍යාව ඔබව පිළිකා රෝගියෙක් කර අවසන්!

**ඇමෙරිකානු ජාතික වෛද්‍ය රික් කැන්ට්‍රලේ (Dr.Rick Cantrell - PhD, MD, PsyD) මහතාගේ පෞද්ගලික අත්දැකීම් අසුරින් රචිත මෙම ලිපිය විද්යුත් තැපැල් (E-mail) පණිවිඩයකින් මා වෙත ලැබුණකි. උගත් වෛද්‍යවරයකු වන වෛද්‍ය රික් කැන්ට්‍රලේ මහතාගේ අත්දැකීම් හා යෝජනා ජනතාවගේ දැන ගැනීම පිණිස මෙසේ ඉදිරිපත් කරමි.**

■ **වෛද්‍ය ජේ. එම්. කේ. බී. ජයවීර**

මා විසින් පහත විස්තර කරන කරුණු සියයට සියයක්ම සත්‍ය බව ප්‍රථමයෙන්ම ප්‍රකාශ කරමි. පසුගිය වසර 15 ක් තිස්සේම විවිධ පුද්ගලයන්ට මෙම කරුණු පිළිබඳව මා විසින් පවසා ඇත. එහෙත් කිසිවෙක් ඒවාට ඇහුම්කන් දුන්නේ නැත. දැන් නම් බලා සිටියා ඇතැයි සිතේ. ජනතාව අවදි කළ යුතු අවස්ථාව පැමිණ ඇත. වර්තමානයේ පිළිකා රෝගයට ප්‍රතිකාර කිරීම වනාහී සල්ලි ගසක් සෙලවීම වැනි විශාල ලාභදායී ව්‍යාපාරයකි. මෙකී ප්‍රතිකාර නිසා අමෙරිකාව පමණක් ගතහොත් වසරකට ඩොලර් මිලියන 120 ක ශුද්ධ ලාභයක් ලබන අතර මෙය ලොව පුරා ව්‍යාපාරිකයන් විසින් ඩොලර් මිලියන 600 ක් උපයන ව්‍යාපාරයකි.

අමෙරිකානු පිළිකා සංගමය සහ අමෙරිකානු රක්තවේදීන්ගේ සංගමය යන ආයතන දෙකින්ම පිළිගෙන ඇති අයුරු පූර්ණ ලෙස පිළිකාවක් වැළඳී ඇති අයෙකු ජීවත් වන්නේ වසර 5 ක් පමණි. ඒ අතර අමෙරිකානු පිළිකා සංගමය මෙන්ම, අමෙරිකානු පිළිකා සහ රක්තවේද අධ්‍යයන ආයතනය විසින්ද දැනට පිළිගෙන ඇති අයුරු පිළිකා රෝගියෙකුට කිසිදු ප්‍රතිකාරයක් නොකළා වුවද වසර 7 සිට 10 දක්වා කාලයක් ජීවත් වන බවද නොරහසකි. මෙවැනි ප්‍රවෘත්ති පළවන වෛද්‍ය සඟරා කියවන්නේ වෛද්‍යවරුන් පමණක්ම නිසා ඒවා පිළිකා රෝගීන්ට මෙන්ම මුළු ලෝකයටම රහස් වෙති.

වෛකල්පික වෛද්‍ය ක්‍රම මගින් පිළිකා රෝග යක් සුවකිරීම, එනම් සම්පූර්ණ සුවය උදෙසා ඇති ක්ෂමතාව, බටහිර වෛද්‍ය ක්‍රමයෙන් ලැබෙන සුවය මෙන් 10 ගුණයක් ප්‍රත්‍යක්ෂ බව මම ප්‍රකාශ කරමි. මතක තබාගන්න. ශරීරය මතුපිට හෝ අභ්‍යන්තරයේ ඇතිවන ගැටයක් (tumour) යනු රෝග ලක්ෂණයක් පමණි. එය පිළිකාවක් බවට පත් කරවන්නේ නවීන විද්‍යාව විසින්ය. (පුදුම නොවන්න) පිළිකා රෝග කාරකය විද්‍යාවයි. විද්‍යාත්මක ක්‍රම මගින් රෝගය සුව කිරීම නොව, වන කිරීමක් සිදු කෙරේ. එමනිසා (බටහිර ඖෂධ) නොකළ තරමට රෝගය පැතිර යෑම වළක්වාගත හැකිය.

මේ වන විට මා තුන්වැනි වතාවටත් පිළිකාවකින් පීඩා විඳින්නෙමි. කිසිම විටෙක මා රසායනික ඖෂධ (chemotherapy) භාවිත නොකළ අතර ශල්‍යකර්මවලින්ද වැළකී සිටියෙමි. එකී ප්‍රතිකාර නොමැතිව මම ලියුකේමියා රෝගයෙන්ද සුවය ලබාගතිමි. එසේම මට වැළඳුණු නොන් හොජ්කින් ලිම්ෆෝමා (Non Hodgkin's Lymphoma) නමැති පිළිකාවෙන් සුවය ලබා ගත්තේද බටහිර ප්‍රතිකාර නොමැතිවය. දැනට ග්ලියෝබ්ලාස්ටෝමා (Glioblastoma) නමැති (බටහිර වෛද්‍ය ක්‍රමයේ ප්‍රතිකාර අනුව) සුවකළ නොහැකි මොළයේ පිළිකාවෙන් පෙළෙන්නෙමි. මෙකී රෝගය හඳුනාගත් වෛද්‍යවරු පැවසුවේ මා ජීවත් වන්නේ මාස දෙකක් පමණ බවය. ඔවුන් එසේ කියා දැන් මාස පහක් ගතව ඇත.

### මා මරණයෙන් ජය ගත්තේ කෙසේද?

පහත සඳහන් වෛකල්පික වෛද්‍ය ක්‍රම මගිනි.

- චීන දේශීය ශාක ඖෂධ ප්‍රතිකාර (Chinese Herbal Medicine)
- විටමින් සී (vitamin C) අධිමාත්‍රා ගැනීමෙන්
- නිල චිකිත්සාව (කටු චිකිත්සාව Acupuncture & කශේරුක සන්ධි චිකිත්සාව (Chiropractic)
- හෝමියෝපති (Homoeopathy)
- යහපත් පෝෂණ උපක්‍රම
- යනාදිය භාවිතා කරමින් එකී රෝග සුවකර ගතිමි.

වෛකල්පික ප්‍රතිකාර ආරම්භ අවස්ථාවේදී රෝගය තරමක් අසාධ්‍ය තත්ත්වයට පත් වූ බව සැබෑය. එම නිසා එකල මා පෙළුණු පිළිකාව ආරම්භක ස්ථානයේ සිට වෙනත් ඉන්ද්‍රියයන් දක්වා එනම් වසා ග්‍රන්ථි, පෙනහළු සහ අස්ථි දක්වාම පැතිර ගියේය. එහෙත් මේ වන විට වසා ග්‍රන්ථි හෝ අස්ථිවල කිසිදු පිළිකා සේයාවක් හෝ නොමැති අතර පෙණහල්ලේ තිබුණු පිළිකා ගැට 6 න් දැනට ඇත්තේ දෙකක් පමණි. එසේම මාස දෙකකින් මගේ මරණය නියත යයි වෛද්‍යවරු පවසන ලද්දේ මාගේ මොළයේ තිබූ භයානක ගැට කිහිපයක් නිසාය. මේ වන විට මෙකී ගැට සියල්ලම පුදුම සහගත ලෙස සම්පූර්ණයෙන්ම හැකිළී ඇත. ඉහත කී රෝග කිසිවක් උදෙසා රසායනික ඖෂධ ප්‍රතිකාර, විකිරණ ප්‍රතිකාර හෝ ශල්‍යකර්මවලට හෝ භාජනය නොවූයෙමි.

වෛද්‍යවරු පමණක් දන්නා රහසක් මෙහිදී ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. එනම් වසරකට ලොව පුරා සිටින පිළිකා විශේෂඥයන් අතුරින් 1000 කට වැඩි ප්‍රමාණයකට පිළිකා රෝගය වැළඳීමේ ප්‍රවනතාව ඇත. එහෙත් තමාගේ යටතේ සිටින රෝගීන්ට කරන ප්‍රතිකාර, එනම් රසායනික ඖෂධ ප්‍රතිකාර ලබා ගන්නේ එකී වෛද්‍ය රෝගීන් සංඛ්‍යාවෙන් 10% ක් පමණි. රෝගී වූ අවශේෂ පිළිකා විශේෂඥයෝ එකී ප්‍රතිකාර ප්‍රතික්ෂේප කරති.

මෙහිදී වෛද්‍යවරුන්ගේ තවත් රහස් ක්‍රියා කලාපයක් මතක් කර දිය යුතුය. එනම් සියලුම ළදරුවන්ට අනිවාර්යයෙන් දිය යුතු වූ එන්නත් වර්ග ඇතැම් ළමා විශේෂඥ වෛද්‍යවරු (එනම් එකී වෛද්‍යවරුන් ගෙන් 25% ක් පමණ අය) තම දරුවන්ට ලබාදීමෙන් වැළකී සිටිති. එයට හේතුව වන්නේ, ඇතැම් ළදරුවන් මේ බොහෝ එන්නත් වර්ග නිසා විෂ වී ක්ෂණික මරණයට පත්වීමට ඉඩ ඇති හෙයිනි. එසේ නැතහොත් එන්නත නිසා වළක්වා ගත හැකි රෝගය වැළඳුණාටත් වඩා බරපතළ තත්ත්වයේ අතුරු ආබාධ දරුවන් තුළ ඇති විය හැකි බව දන්නා හෙයිනි.

ඖෂධ නිෂ්පාදන ව්‍යාපාරය යනු මුදල් ඉපයීමේ ප්‍රධානතම මාර්ගවලින් එකකි. රෝග සුවවීම කෙසේ වෙතත් ලාභ ලැබීම එකී නිෂ්පාදන සමාගම්වල ඒකායන අරමුණයි. බොහෝ ඖෂධ විෂ වීම නිසා, එම සැර ඖෂධ වර්ග නිසා ඇතැම් පුද්ගලයන්ගේ (විශේෂයෙන්ම වියපත් වූ අය) මරණය ඉක්මන් විය හැකිය. ඒ බව දන්නා ඖෂධ නිෂ්පාදනය කරන කෝටිපතියෝ, තමාට රෝගය වැළඳුනහොත් යුරෝපයට ගොස් ඉතා අධික මිලක් ගෙවා වෛකල්පික ඖෂධවලින් තම රෝග සුවකර ගනිති.

මරණය වන්නේ කවදාද? එදාට එය සිදුවනු ඇත. ඊට වඩා මොහොතක් හෝ ජීවත් වීමට කිසිවෙකුට ඉඩක් නොමැත. එහෙත් ජීවත් වන කාලය තුළ ජීවිතයේත් මිනිසත් භවයේත් පැවතිය යුතු ගුණාත්මක භාවය ගැන අවධානය යොමුකළ යුතුය. කුණු වී ජරාජීර්ණ වී අධික වේදනා විඳ මිය යනවාද නැතහොත් ගෞරවාන්විතව මෙලොවින් සමුගන්නවාද?

වෛකල්පිත ප්‍රතිකාර ගන්නා පිළිකා රෝගීහුද අවසානයේදී මියයන බව සැබෑය. එහෙත් ඔවුන් අවසන් ගමන් යන්නේ ඉහත කී ලෙස ජරා ජීර්ණව නොව යහපත් වූත් ගුණාත්මක වූත් තත්ත්වයක් යටතේය. මියයන තුරුම ඔවුන්ට තම පවුලේ අය සමග ළංව ඇසුරු කිරීමේ වාසනාව ඇත. තම දූ දරුවන් හා කතාබහ කිරීමටත් ඔවුන් හඳුනා ගැනීමටත් ඔවුන්ගෙන් සාත්තු සප්පායම් ලැබීමටත් එසේම ඔවුන් හා ප්‍රීති වීමටත් අවස්ථාව ඇත.

ලක්ෂ ගණන් වටිනා බටහිර රසායනික ඖෂධ භාවිතා කරන්නවුන් හෝ ශරීරය තුළට කාවදින විකිරණශීලී ආලෝක ධාරා ප්‍රයෝග කිරීම නිසා දිරාපත් වූත් ශල්‍යකර්ම නිසා විකෘති වූත් රෝගීන් මෙන් නොව වෛකල්පික ප්‍රතිකාර ගත් රෝගීන් සාමාන්‍යයෙන් විකෘති වීමකින් හෝ දිරාපත් වීමකින් තොරව මරණ මංචකයේදී පවා අන් අයට හඳුනාගත හැකි වන පරිදි සාමාන්‍ය ශරීර ලක්ෂණයන්ගෙන් යුක්ත වෙති. විකිරණ ප්‍රතිකාර හෝ රසායනික ඖෂධ ප්‍රතිකාර හෝ ලබන්නන්ගේ සිත සැනසීමට එකී වෛද්‍යවරු උනන්දු වෙති. "හා දැන් හොඳටම හොඳයි නේද?" ආදි වශයෙන් කියා නැවත නැවතත් නොකඩවාම එකී ප්‍රතිකාරම ලබා දෙති. අවසානයේ රෝගියා මියයන තුරුම මෙකී රැවටීම කරති.

මෙහි බරපතළම පාපය වන්නේ වෛද්‍යවරු මේ බව දැන දැනත් දිගින් දිගටම මෙසේ රෝගීහු රැවටීමේ යෙදී සිටීමය. වෛද්‍යවරයකු ලෙස යහපත් සේවාවක් ඉටුකිරීම උදෙසා මම දිවුරුම් දී සිටිමි. එම දිවුරුම (Hippocrates Oath) මම සියලු කල්හි ආරක්ෂා කර ඇත්තෙමි. මෙකී දිවුරුමේ ප්‍රකාර හොර බොරු, වංචා හෝ රැවටිලි නොමැතිව යහපත් ලෙස වෘත්තියේ යෙදීම නිසා ආර්ථික වශයෙන් නම් කිසිම දියුණුවක් නොලද්දෙමි. කොතරම් පාඩුවක් හෝ අලාභයක් වූවා වුවද මම රෝගීන්ට සත්‍යය පහදා දෙමි.

පහත දක්වා ඇති උපදෙස් පිළිපැද අත්දැකීමෙන්ම එහි සත්‍යතාව විඳගන්න.

### පිළිකා වළක්වා ගන්නේ කෙසේද?

සෑම පුද්ගලයකුගේම ශරීරය තුළ පිළිකා සෛල පවතී. ක්‍රියා විරහිතව පවතින මෙකී සෛල, පිළිකා හඳුනා ගැනීම උදෙසා ඇති විශේෂ පරීක්ෂණවලට අසුවන්නේ නැත. රෝගය පැතිර ගොස් එකී සෛල කෝටි ප්‍රකෝටි ප්‍රමාණයක් වර්ධනය වූ පසු පමණක් එවන් පර්යේෂණවලට හසු වේ. එසේ ක්‍රියා විරහිත සෛල පරීක්ෂණවලට හසු නොවීම පදනම් කරගෙන (වෛද්‍ය ප්‍රතිකාර කිරීම නිසා) රෝගය සුව වී ඇතැයි වෛද්‍යවරු පවසන්නේ වුවද ඇත්ත වශයෙන්ම රෝගය සුව වී නැතශ්‍රී එනම් රෝගියා තුළ යම් ප්‍රමාණයකට පිළිකා සෛල විනාශ වී ඇතත් එවැන්නකු තුළ රෝගී තත්ත්වය සැඟවී පවතී. තරමක් සුව වූවා වුවද තවත් පිළිකා සෛල විශාල ප්‍රමාණයක් ශරීරය තුළ සක්‍රීයව පැවැතිය හැකියි. එහෙත් නවීනතම පර්යේෂණවලට පවා ඒවා හසුවන්නේ නැත. රෝගය සුව වූවා යැයි කීවද සම්පූර්ණ සුවයක් ලැබී නැත.

එක් පුද්ගලයකුගේ ජීවිත කාලසීමාව තුළ 6 වතාවක සිට 10 වතාවක් පමණ වාර ගණනක් පිළිකා සෛල උග්‍රවීමේ ප්‍රවණතාවක් ඇත.

යම් පුද්ගලයකුගේ ශරීරයේ ප්‍රතිශක්තිය ඉහළ තත්ත්වයේ පවතින තුරු එම පුද්ගලයාගේ ශරීරය තුළ පවතින පිළිකා සෛල නිෂ්ක්‍රීයව පවතී. එකී හේතුවෙන්

**46 වන පිටුව බලන්න**


"කරදරයක් නැති උකසක් සමග
ඔබේ සිහින නිවසට පිවිසෙන්න."
"නිසි රක්ෂණ සැලසුමක් සමග
ඔබේ පවුලේ අයගේ
අනාගතය සුරක්ෂිත කරන්න."
MEGA Financial Group
MORTGAGE ALLIANCE
RIGHTBROKER=RIGHTMORTGAGE
රොයි විග්නරාජා
උකස් හා රක්ෂණ නියෝජිත
බලපත්‍ර අංකය M12001846
විමසන්න
416-457-1633
5694 Hwy 7 East 2nd Floor
Markham ON. L3P 1A9


MATTRESS !!!
MATTRESS !!!
MATTRESS !!!
Huge Manufacturer's Sale
Factory Direct Mattresses
Visit Our Factory Showroom Today
RayZzz
Personalize Your Mattress
RayZzz Custom Mattresses
31 Progress Ave. Unit 24
Scarborough Ont. M1P 4S6
(Kennedy Rd & Hwy 401)
Tel : 647 786 0865
Email : rayzzzcustommattresses@gmail.com


"Committed To Turning Your Dream Home Into Reality"
Dissa
Dissanayake Danapala Mudiyanselage
B.A., PGDIP in Urban Development
Sales Representative
Committed to meeting your real estate services.
Let us discuss your requirements.
Contact me @ 416- 697 9925, no obligation
dissahomes@gmail.com
Century 21
Percy Fulton Ltd.
Brokerage* Office:416-289-8200
2911 Kennedy Rd, Toronto, M1V 1S8
MLS MULTIPLE LISTING SERVICE
REALTOR


Attrell TOYOTA
Brampton Auto Mall
Christmas Sale
X'mas Sale on All NEW + USED Vehicles
ඉක්මන් කරන්න ඉක්මන් කරන්න මේ අවස්ථාව ඔබටයි
ඔබ කැමති වාහනය ඉතා විශ්වාසවන්තව, හොඳ වට්ටම් සහිතව
ලබා ගැනීමට සිංහල භාෂාවෙන් කතා කරන ජේ (JAY) හමුවන්න.
ඔබට විශේෂ ත්‍යාගද හිමිකර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.
Call Jay : 647 - 893 - 9661
110 Canam Crescent Brampton ON L7A 1A9



9 කොටස

පියදාස වැලිකන්නගේ

# එයා හරි අපූරු ළමයෙක්

මල්ලිගේ භූමිදාන කටයුතුවලින් පසු ඒ දින කීපය ගෙවී ගියේ දුකිනි. වේදනාවෙනි. කඳුළිනි. හඬා වැළපීමෙනි. අම්මාට කතා කරගත නොහැකි විය. ඇගේ කටහඬ බොල් වී තිබිණි. ඒ බොල් හඬින් ඇය පපුව බදාගෙන කඳුළු සලමින් කියන කිසිවක් ළඟ සිටි කෙනෙකුට වුවද පැහැදිලිව ඇසෙන්නට ඇතැයි මට කිව නොහැක.

"මගේ පුතා මාව මරණෙන් බේරා ගත්තේ මට මේ දුක දීල යන්ටද දෙයියනේ..." යි අම්මා ඒ දින කීපය තුළ ගෙදරට ආ ගිය හැම කෙනෙකු සමගම කීවේ පපුව බදාගෙන කෑ ගසමිනි. ඇය කුමක් කියන්නේදැයි ගමේ උදවිය තේරුම් ගත්තේ මල්ලී මිය ගිය මොහොතේ සිට දෙඩූ දෙඩුම් අසා පුරුදුකම් තිබුණ නිසා යැයි මට සිතිණි. එහෙත් මල්ලිගේ භූමිදාන කටයුතු කෙරුණ දවසේ ගෙට ගොඩ වූ ලොකු මහත්තයා ඉදිරියේ දණින් වැටී ඇය නැගූ ඒ විලාපයෙන් කුමක් කියවෙන්නේදැයි එකවරම තේරුම් ගත නොහැකිව ඔහු අසල සිටි වැඩිහිටියකුගේ මූණ දෙස බලන සැටි මම බලාගෙන සිටියෙමි.

"ගුරුන්නාන්සේ මහත්තයා ඔය ඇත්තී කියන්නෙ මේං මේකයි..." කියමින් වැඩිහිටියා අම්මාගේ ශෝකාලාපය තේරුම් කර දුන්නේය. මහත් දුකින් අම්මා දෙසත් මල්ලිගේ නිසල දේහය දෙසත් බලාගෙන සිටි ලොකු මහත්තයා දිග සුසුමක් ඉහළට ඇද මිදුලේ තනා තිබුණ මඩුව තුළට ගොස් වාඩි විය. අක්කත් මාත් ඇතුළු ගෙදරට පැමිණ සිටි ගෝල බාලයනුත් වැඩිහිටියනුත් ඔහුට වැඳ ආචාර කරන්නට පටන් ගත්තේ එතැනදීය. ඔහු වැඩිහිටියන් කීප දෙනෙකු සමග බොහෝ වේලාවක් කතාබහ කරමින් සිට මගේ හිසද අත ගා බිම බලාගෙන පිට වී ගියේය.

මාසයකට ආසන්න කාලයක් අප්පච්චි බූරු පොළට ගියේ නැත.

"ඒ කොල්ලා මරාගත්තේ උඹයි. උඹට තිබුණා ඌව ඉස්පිරිතාලෙට එක්ක ගිහින් බෙහෙත් කරන්ට. උඹ ඒක කළේ නෑ...." උක්කුං මාමා තර්ජනාංගුලිය ඔසවමින් ගමේ මිනිසුන් ඉදිරියේ බැණ වැදුණ නිසා ඔහු බූරුපොළට නොගියේද, නොඑසේ නම් ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන් ඇතුළු වැඩිහිටි කීප දෙනෙකු පියෙකු සතු වගකීම් ගැන දැඩි ස්වරයෙන් කතා කළ නිසා එහි නොගියේදැයි නිසැකව කිව නොහැක. කවදාවත්ම උඩට මතු වී නොපැමිණි දරු සෙනෙහස මල්ලීගේ මරණයෙන් පසු උඩට අවුත් ඔහු කම්පනයට පත් කළ නිසා ඔහුගේ පැවතුම් වෙනස් වන්නට ඇතැයි ඇතැමෙක් කීහ. හේතුව කුමක් වුවද ඔහු සිටියේ තෝන්තුවාවට පත් ගතියකිනි. අන්‍යයන්ගේ ඇනුම් බැණුම් තර්ජනය කිරීම් කෙසේ වෙතත් ජීවිතයේ පළමු වරට ඔහු සිය හෘදය සාක්ෂිය ඉදිරියේදී චූදිතයෙකු බවට පත්ව ඇතැයි ලොකු හාමුදුරුවන්ගෙන් ප්‍රකාශ වී ඇති බව මට දැනගන්නට ලැබුණේ වැඩිහිටියන්ගේ කතා බහෙනි. හාමුදුරුවන් ඉන් කුමක් අදහස් කළේදැයි සිතාගන්නට පුළුවන් දැනුමක් මා තුළ නොවීය. උන්වහන්සේගේ වදන් ඒ අයුරින් කියා පෑවත් ඔවුන්ගෙන් වැඩිදෙනෙකු මා මෙන්ම එහි සැබෑ අරුත තේරුම් ගෙන සිටියහයි කීමට මට පුළුවන්කමක්ද නැත. හේතුව කුමක් වුවද මල්ලිගේ අකල් මරණය නිසා අප්පච්චි කිසියම් මානසික පීඩනයකට පත්ව සිටින්නට ඇතැයි යන හැඟීම මා තුළ මෝදුවෙන්නට පටන් ගත්තේ එදා නොවේ. වයසින් හා දැනුමින් මුහුකුරා යන්නට පටන් ගත් පසුය.

ඔහු මාර්ටින් මුදලාලි ළඟ ලී ඉරන්නට ගියේය. ලැබෙන මුදලින් කිසියම් ප්‍රමාණයක් අම්මා අතට දීමට අමතක නොකළේය. ඇතැම් විට ඒ මුදලත් සමග දඩ මස් ටිකක් හෝ දෙනියෙ කඩෙන් මිල දී ගත් පාන් ගෙඩියක් ඇගේ අතට දී බූරුපොළට යන්නට තරම් 'හැදුන' බවක් ඔහුගෙන් පෙනිණ.

"අනේ ඉතින් ඔය කී දවසකටදැ" යි අම්මා කීවත් අප්පච්චිගේ ඒ වෙනස්වීම ගමේ බොහෝ දෙනෙකුගේ ඇගයීමට හේතු විණැයි මට සිතේ.

"මං උඹට දවසක් කිව්වා මතකද නගා උඹයි ඔය මිනිහා නරක් කළේ කියල. ඒ මිනිහගෙ බරත් උඹ තනියම කර ගහගෙන යන්ට පටන් ගත්තා. ඒ හින්දා මිනිහට දරුවන් ඉන්න වගක්වත් මතක් වුණේ නෑ. පොඩි එකා මළාට පස්සෙ තමයි ඒක තේරිලා තියෙන්නෙ..." දිනක් අතීත කතාවක් සිහිපත් කරමින් පොඩිමැණිකේ නැන්දා අම්මාට කීවාය.

අපේ ජීවිත බදාගෙන ඇති අවුල් වියවුල් හා තැවුල් මැද කාලය අප පසුකරගෙන ගියේ වේගයෙනි. මල්ලී මිය ගොස් මාස කීපයකට පසු එළැඹි එක් උදෑසනකදී පන්සිල් දීමෙන් පසු අප ඇමතූ ලොකු මහත්තයා අපූරු ආරංචියක් අපේ දෙසවන් තුළට රිංගවූයේය.

ජපානයේ හිරෝෂිමා සහ නාගසාකි යන නගර දෙකට පරමාණු බෝම්බ දැමීමෙන් පසු දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන් විණැයි ඔහු කීවේය. ඔහුට කන් දීගෙන සිටි ළමයි අරුම පුදුම කතාවකට සවන් දීගෙන සිටියවුන් මෙන් එකිනෙකාගේ මූණු දෙස බලන්නට වූහ. සත්‍ය වශයෙන්ම ඔහු කීවේ කුමක්දැයි මට නොවැටහිණ. යුද්ධයක් ගැන අසා තිබුණත් ජපානයේ හිරෝෂිමා-නාග සාකි සහ පරමාණු බෝම්බ ගැන ඉන් පෙර කිසි දිනෙක කිසිවෙකුගෙන් කිසිවක් අසන්නට ලැබී තිබුණු වගක් මට සිහිපත් කළ නොහැකි විය. එදා ගෙදර පැමිණි සැටියේම මම ඒ කතාව අම්මා සමග කීවෙමි.

"ලොකු ගුරුන්නාන්සේ මහත්තයද කිව්වේ...?"

"ඔව්..."

"යුද්දෙ ඉවර වුණා නම් ආයෙමත් සමුපෙට බඩු ගෙනේවි..."

ඉන් දින කීපයකට පසු අම්මා සමූපකාරයට ගොස් ඇත්තේ වෙනදාට වඩා අඩු මිලට බඩු ගත හැකි යැයි යන හැඟීමෙනි. එහෙත් බජිරිවලවත්, කම්බුවලවත්, පිටිවලවත් මිල අඩු වීමක් සිදු වී නැත. ලොකු මහත්තයා කී කතාව සිහිපත් කොට ඒ ගැන මැනේජර් මහතාගෙන් ප්‍රශ්න කළ විට ඔහු කියා ඇත්තේ හාල් ඇටේ පරිප්පු ඇටේ හා සීනි ඇටේ ඉඳල බඩු ජාති නැව්වලින් අපේ රටට ගෙනෙන නිසා යුද්දෙ ඉවර වුණ හැටියෙම බඩු එන්නෙ නැතෙයි කියාය.

"ඒවා කොළඹට ඇවිත් මෙහාට එනකොට තව අවුරුද්දක්වත් යාවි බං. එතකන් ඉතින් මෙහෙම තමයි..." යනුවෙන් ඔහු වැඩිදුරටත් පවසා ඇත. ඇය ඒ කතාව අප සමග කීවේ දිග සුසුමක් ඉහළට අදිමිනි.



අපේ ජීවිත දිනෙන් දින වඩාත් දුඃඛිත තත්ත්වයට ඇද වැටෙමින් තිබිණ. ඇතැම් දිනෙක මා පාසල් ගියේ අම්මා දුමේ තබා වේලා ගන්නා තේ කොළවලින් පිළියෙල කර දෙන කහට පොල්කට්ට හකුරු කෑල්ලක් සමග බීමෙනි. කුසගින්න අකා මකා ගත්තේ යන එන මග අසල අඹ, පේර, දං, කටු ඇඹිල්ල වැනි අතට අසුකොට ගත හැකි ගඩා ගෙඩිවලිනි. පාසල් එන අපේ පන්තියේ ළමයින් අට දෙනාගෙන් හතර දෙනෙකුම පාසල් ගමන නතර කර තිබිණ. පාසලට පැමිණි ළමයින් තිහ හතලිහෙන් ඇතැමෙක් දහය එකොළහ වන විට ක්ලාන්තව ඇද වැටුණාහ. ක්ලාන්ත වීමට හේතුව ඉතා පැහැදිලි වුවත් ඊට කිසි විසඳුමක් කිසිවෙකු ළඟ තිබුණ බවක්ද නොපෙනිණ.

දෙසතියකට වරක් කිසියම් මුදලක් අතට ගත්තේ තේ වත්තේ වැඩට ගියවුන් පමණි. ඒ සඳහා ඔවුන්ට වතු අධිකාරීනුත්, කන්කානියනුත් කියන කියන විදියට වැඩ කරන්නට සිදුවිය. උදේ පාන්දරින් පෙරෙට්ටුවට යන ඔවුන් සවස ගෙදර එන්නේ කළුවර වැටුණාටත් පසුය. දවසකට පැය දහයක් දොළහක් වැඩ කරන්නට ඔවුන්ට සිදුවී තිබුණි. එහෙත් ඊට අමතර දීමනා කිසිවක් නොලැබිණ. අපේ පවුලේ කෙනකු හැටියට වත්තේ ස්ථිර සේවකයෙකු ලෙස වැඩ කළේ උක්කුං මාමා පමණි. මා ඒ තොරතුරු දැනගත්තේ ඔහු අම්මා සමග කළ කතාබහට කන් දීමෙනි. ලොකු මාමා ගොවිතැන් කිරීමෙන් තමාගේත් මුත්තාගේත් වියදම සොයා ගත්තේය. එහෙත් එය ස්ථිර ආදායම් මාර්ගයක් නොවීය. ඒ නිසා තැනින් තැන යමින් ගස් කැපීම, ලී ඉරීම, තේ ෆැක්ටේරියට දර පලා දීම වැනි වැඩද ඔහුට කරන්නට සිදුවිය.

මල්ලී අසනීප වූ තැන් සිට වත්තේ වැඩට යා නොහැකි වූ නිසා අම්මා කළ දින තුනේ රක්ෂාවද ඇයට අහිමි වී තිබිණ. ඒ වැඩ කොටස වතු කම්කරු සමිතියේ බලපෑම මත ලැයිමේ දෙමළ කාන්තාවකට පැවරී ඇති බව ඒ දිනවල අපට දැනගන්නට ලැබුණේ පොඩිමැණිකේ නැන්දාගෙනි. අම්මාට රක්ෂාව අහිමි වූ විට මටද 'රක්ෂාව' අහිමි විය. ඒ නිසා අපේ නැති බැරි කම් අහස උසට නැගිණ. ඇතැම් දිනෙක ලොකු මාමා රුපියලක් දෙකක් අම්මා අතට දෙයි. සතියකට හෝ දෙකකට වරක් ඔහුගේ කුඩා එළවළු කොරටුවෙන් කඩා ගන්නා පිපිඤ්ඤා, කැකිරි, බණ්ඩක්කා වැනි එළවළුවක්ද ගෙනවුත් දෙයි. තේ වත්තේ වැඩ කළත් පවුල් බරින් මිරිකී සිටි උක්කුං මාමා සිටියේ එවැනි උදව්වක් කළ නොහැකි තත්ත්වයකය.

ගස් යට අහුලන්නට තරම් පුවක් නොවීය. පොළට ගෙන ගොස් විකුණා කීයක් හෝ ලබා ගැනීමේ අදහසින් කොයි කවුරුත් තම තමන්ගේ වතුවලද, බඩ වැටිවලද, කනතුවලද වැටී ඇති පුවක් එක්රැස් කරන්නට වූහ. හොරෙන් කඩන්නවුන්ගෙන් පුවක් වලු බේරා ගැනීම පිණිස යන්තම් පැහීගෙන එන විට කඩා පොළට ගෙන යන්නෝද වූහ. කෝපි සහ ගම්මිරිස් කඩා එකතු කර ගතහැකි වූයේ ගෙවත්තේ වැවුණ ගහකොළවලින් පමණි. අඩුවක් නැතිව තිබුණේ කොස් හා දෙල්ය. එහෙත් ඒවා අලෙවි කළ හැකි වූයේ වතුවල සිටින දෙමළ මිනිසුන්ටය. හැම තැනින්ම පොළට එන කොස් හා දෙල් ප්‍රමාණය වැඩි වෙන්නට වූ විට ඒවායේ මිලද පහත වැටිණ. ඒ නිසා අපට ජීවත් වන්නට සිදුවූයේ නිරන්තරයෙන් අපේ ජීවිත සමග පොර බදන්නවුන් ලෙසිනි.

★ ★ ★ ★ ★

ලුණුගල කන්දට ඉර මුවාවෙත්ම අඳුර සිය අඩුපඩු දිග හැරගෙන ගෙතුළට රිංගන්නට හදන්නේ සොරෙකු මෙනි. එදත් එහි කිසි වෙනසක් නොවීය.

"අක්කෙ කුප්පි ලාම්පුව පත්තු කරපන්කො..." කියවමින් සිටි 'ශික්ෂා මාර්ගය' පොත වසා දමා මම අක්කාට කීවෙමි.

"භූමිතෙල් නෑ මල්ලියේ..."

"දෙයියෝ සාක්කි එහෙනම් අද කළුවරේනෙ ඉන්ට වෙන්නෙ... කෝ අම්මා...?"

"අම්මා පොඩි මැණිකෙ නැන්දලාගේ ගෙදෙට්ට ගියා. භූමිතෙල් ටිකක් ඉල්ලාගෙන එන්ට..." මම වටපිට බැලීමි. පිටත නැති අඳුරු ගතියක් ගෙතුළ ගුලි ගැසෙමින් තිබිණ.

මඳ වේලාවකට පසු අම්මා ගෙට ගොඩවූයේ "මං එහාට යනකොට පොඩිමැණිකේ අක්කා මෙහාට එන්ට දොට්ට බැස්සා විතරයි ලොක්කියේ...." යි කියාගෙනය.

"ඇයි අම්මේ නැන්දා අපෙන් භූමිතෙල් ටිකක් ඉල්ලා ගන්ටද එන්ට හදලා තියෙන්නේ...?" අක්කා සිනාසෙමින් ඇසුවාය.

"නෑ... මේං මේ භූමිතෙල් ටික දාල ඔය කුප්පි ලාම්පුව පත්තු කරපන්කෝ..." යි කී අම්මා සිය අතෙහි වූ කුඩා බෝතලයක් අක්කා අතට දෙන සැටි මම මඳ අඳුර අතරින් බලාගෙන සිටියෙමි.

"ඕං ඒ පාර ආයිමත් දෙයියෝ අපේ මූණ බලලා තියනවා ලොකු පුතේ..." අක්කා කුප්පි ලාම්පුවට භූමිතෙල් දමා පත්තු කරන සැටි නිරීක්ෂණය කරන්නියක මෙන් බලා සිටි අම්මා මවෙතට හැරී කීවාය. ඇගේ කට හඬෙහි

32 වන පිටුව බලන්න

# ඒයා හරි...

31 වන පිටුවෙන්

වූයේ සතුට තැවරුණ ගතියකි. ඒ සතුට ඇගේ දෙනෙත් තුළ නලියන සැටි පත්තු කරන ලද කුප්පි ලාම්පුවේ එළියෙන් මට පෙනිණ. එහෙත් ඊට හේතුව කුමක්දැයි මට සිතාගත නොහැකි විය.

"මට ආයෙමත් වත්තේ වැඩට එන්ටෙයි කියල මලරම්බන් කන්කානි පොඩිමැණිකේ අක්කා අත පණිවිඩයක් එවලා තියනවා..."

"එහෙනම් කලින් වගේ සඳුදා, බදාදා, සිකුරාදා අම්මට වැඩ කරන්ට පුළුවන් වේවි...." මම කීවෙමි.

"ඔව්... වෙලාවේ හැටියට දෙයියෝ උඹලගෙ මූණ බැලුවා පුතේ..."

"ඉතින් අම්මා හෙට වැඩට යනවද? හෙට බදාදා..."

"නොගිහින් පුළුවනෑ... පොඩි මැණිකේ අක්කා කිව්වා හෙට ඉඳලා වැඩට වරෙන් කියල..."

වත්තේ වැඩ නැතිව සිටි දිනවල දවසේ වියදමට කීයක් හෝ සොයාග නු පිණිස කොතැනක කිනම් වැඩක් වුවද කිරීම අම්මා කිසිවිටෙකත් පැහැර නොඇරියාය. ඇය ආරච්චිලාගේ හෝ සමූපකාරයේ මැනේජර් මහත්තයාගේ හෝ වෙල් විදානෙගේ හෝ කුඹුරක, හේනක හෝ එළවළු කොටුවක වැඩට ගියේ ඒ සඳහාය. ඔවුන්ද යම් තරමකට නමුත් අසීරු තත්ත්වයකට පත්ව ඇතැයි කියන කාලවකවානුවක යළිත් තේ වත්තේ දවස් තුනක් වැඩ කරන්නට ලැබීම පවා අපට දැනුණේ අති විශාල සහනයක් ලෙසිනි. මා නිසා මලරම්බන් කන්කානිගෙන් පඩි දාට අම්මා අතට වැඩිපුර ලැබෙන රුපියලද වහා මගේ සිහියට නැගිණ.

"එහෙනම් ලොකු මල්ලිටත් හොඳයි. ඔය කොහේ හරි අම්මත් එක්ක වැඩ කළාම සත දහයක් පහළොවක් වැඩිපුර ලැබෙනවාට වඩා මලරම්බන් කන්කානිගෙන් අම්මට රුපියලක් වැඩිපුර ලැබෙනවානේ..." අක්කා මගේ සිත කියැවූ එකියක මෙන් කීවාය.

පාසල ඇරී ගෙදර අවුත් අක්කා විසින් පිළියෙල කර තැබුණු කිසිවක් ගිල දමා අම්මා වැඩ කරන තැනට ගොස් ඇයට උදව් කිරීම හය හතර දැනගත් දා සිට මම පුරුද්දක් කරගෙන සිටියෙමි. එසේ වැඩ කළ ඇතැම් තැනක කිසිවෙක් මා දෙස බලා "පොඩි එකාත් වැඩ කළානෙ බං... ඉඳා මේකත් තියාගනින්..." යි වැඩිපුර සත දහයක් පහළොවක් අම්මා අතට දෙති. අක්කා අර විදියට කීවේ ඒ ගැන සිහිපත් කිරීමෙන් බව තේරුම් ගතිමි. එහෙයින් පඩි දාට මලරම්බරන් කන්කානිගෙන් නොවරදවා වැඩිපුර ලැබෙන රුපියල මහමෙරක් මෙන් මට දැනිණ.

"හෙට ඉඳලා මාත් වැඩට එනවා අම්මේ..." මම කීවෙමි.

"ලබන සුමානෙ ඉඳලා පාස්-පේල් දාන විභාගෙත් පටන් ගන්නවයි කිව්වා නේද? වත්තේ වැඩ කරන එක ඔය අනිත් තැන්වල වැඩ කරනව වගේ ලේසි නෑ පුතේ..."

"ඒක එච්චර දෙයක් නෙමෙයි. මට පහට පාස් වෙන්න පුළුවන්..." අම්මා කිසිවක් නොකියා දුකෙන් මෙන් මා දෙස බලාගෙන සිටියාය.

"උඹ හෙට වැඩට යනකොට ඔය කන්ට මොනවා හරියි මගේ සරම් කෙටියයි අරන් පලයන් අම්මේ..."

උදෑසන ගෙදරින් පිටවී එද්දී අම්මා මගේ දිවා ආහාරයද මගේ සරම් කෙටියද ගෙන එයි. පාසල ඇරී කෙළින්ම මා යන්නේ අම්මා වැඩ කරන තැනටය. පොත් පත් ටික ගල් දෙබොක්කක් යට හෝ සෙවණැති ගසක් මුල හෝ තබන මම අම්මා විසින් ගෙන එන ලද කිසිවක් කා ලුණුගල කන්දේ සිට ගලා බසින දිය පාරකින් වතුර බොමි. ඉන්පසු සරම් කෙටිය ඇඳගෙන අම්මාගේ වැඩට උදව් කරමි. ඉතිරි දවස් දෙකේ සවස් වරු දෙකත් සෙනසුරාදා දවසත් ගත වූයේ අම්මා වැඩ කළ වෙනත් තැන්වලය. ඉරිදා ඇයත් සමග මම පස්සර පොළට ගියෙමි.

"උඹට ඔය විදියට රක්ෂාව දීපු එකටත් ලොකුබණ්ඩා කටුව ගහන්ට හදලා තියනවා බං. ඌ දෙමළ වතු සමිතියේ ඌර්කාලයන් කියන එකා උසි ගන්නලා, තොපි ඉස්ටයික් කරපියව් කියල කිව්වලු. මලරම්බන් කන්කානිට ඕක ආරංචි වෙලා ලොකු බණ්ඩව හොයාගෙන තේ පැට්ටේරියටම ගිහින් බල්ලෙකුට වගේ බැණ වැදුනලු..." දෙසතියකට පසු පඩි ගෙවූ දා වත්තේ තාර පාර දිගේ එද්දී පොඩිමැණිකේ නැන්දා අම්මා සමග කීවාය.

"මං දන්නව අක්කේ... අපේ මිනිහට තේ වත්තෙ වඩු මඩුවෙ රස්සාව නොදෙන්ට කටුව ගැහැව්වෙත් ඕකා... ඌ එතැන ලොකු බාස්ට කියලා තියෙනවා අපේ මිනිහගෙ කැරැට්ටුව..."

"හැබෑට මොකක්ද බං ඔය නයි වයිරයට හේතුව...?"

"හේතුව මං උඹට පස්සෙ කියන්නම්... ඒවා මෙහෙම කියන්ට බෑ..." යි කියමින් අම්මා මා දෙස බැලුවාය. ඇය එසේ කීවේ ගෙදර යන්නට ඇති හදිස්සිය නිසා විය හැකි යැයි මට සිතිණ.

"මලරම්බන් කන්කානි ළඟ මනුස්සකම් තියනවා අක්කෙ... ඒ කාලෙ වගේමයි කිසි වෙනසක් වෙලා නෑ... කොල්ලා වෙනුවෙන් කියලා රුපියලක් ඒ කාලෙත් දුන්නා. අදත් දුන්නා..." මඳ නිහැඬියාවකට පසු අම්මා කීවාය.

"ඒ මිනිහා රත්තරන් මනුස්සයෙක් බං..."

**ලබන කලාපයෙන් තවත් කොටසක්**











# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2016 නොවැම්බර් 01 දින සිට නොවැම්බර් 30 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)

### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි 10 වැන්නේ ගමන් කරයි. වැඩ කටයුතු අධික වන කාර්යබහුල කාලයකි. ගමන් බිමන්ද අධිකව යෙදේ. උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සැලසේ. රැකි රක්ෂා කටයුතුවල පදිංචියෙහි වෙනසක් ඇති වීමට ඉඩකඩ සහිතයි. භූමිලාභ ඇත. ලැබීම අතින් යහපත් කාලයකි. රැකියා කටයුතුවලට ශුභයි.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 7 වැන්නේ ගමන් කරයි. රැකි රක්ෂා කටයුතුවලට ශුභයි. රැකියා අපේක්ෂිත අයට රක්ෂා ලබාගැනීමේ අවස්ථාවත් උසස් තනතුරුවලට පත් වීමේ අවස්ථාවත් සහිතයි. ඉඩකඩම් දේපළ ලැබීමේ භාග්‍යය ඇත. කොටස් ව්‍යාපාරවලින් ජය ලැබේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. ධන ලාභ ඇත.

### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ මේ මස 10 වැන්නේ ගමන් කරයි. ඉදිරිපත් වීමේ හැකියාව ඇත. ක්‍රියා ශූරත්වය අනුව තම වැඩ කරගැනීමේ භාග්‍යය ඇත. රැකිරක්ෂා දියුණු ඇති වේ. පදිංචියේ වෙනසක්, රැකියාවේ වෙනසක් ඇතිවිය හැක. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. ආදායම් මාර්ග සරු වේ. ශනි 8 වැන්නේ ගමන් කිරීම ශුභ නැත.

### වෘෂභ ලග්නය

ලලග්නාධිපති සිකුරු 7 වැන්නේ ගමන් කරයි. තම වැඩකටයුතු සංවිධානාත්මකව කර ගැනීමේ හැකියාව ඇත. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. රැකියා කටයුතු දියුණුව සැලසේ. රැකියා සම්බන්ධයෙන් වෙනස්කම් ඇති විය හැක. ආදායම් මාර්ග සරු වේ. ශනි 7 වැන්නේ සිකුරු සමග යෝග වී සිටී.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 5 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. සතුරු බාධක අඩු වේ. වෙළඳ ව්‍යාපාරවලින් ලාභ ලබා ගැනීමේ වාසනාව ඇත. රැකි රක්ෂා කටයුතුවලින් දියුණුව සැලසේ. ආදායම් මාර්ග සරු වේ. ගේ දොර ඉඩකඩම් ලැබීමේ භාග්‍යය ඇත.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කරයි. රැකියා රක්ෂා කටයුතුවලට ශුභ වේ. තනතුරු, උසස් වීම් ලැබීමට භාග්‍යය ඇත. රැකියා අපේක්ෂිත අයට රැකියා ලබාගැනීමේ අවස්ථා සැලසේ. අධ්‍යාපන කටයුතුවලට වඩාත් ශුභ කාලයකි. ගරු සැලකිලි ලැබේ. ධන සම්පත් ඇත. විදෙස් සංචාරවල නිරත වීමේ අවස්ථාව සහිතයි.



### කටක ලග්නය

ලග්නාධිපති සඳු 4 වැන්නේ ගමන් කරමින් මේ මාසය ඇරඹේ. උසස් අධ්‍යාපනය ලැබීමේ භාග්‍යය සහිතයි. රැකියා කටයුතුවලට ශුභ වේ. රැකියාවේ වෙනසක් ඇති කිරීමට සිත් දේ. පිරිස් බලය ලැබෙන කාලයකි. හිතුන දේ කිරීමට සිත් දේ. ගමන් බිමන් අධික වේ.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 10 වැන්නේ ගමන් කරයි. රැකියා දියුණුව ඇති කෙරේ. ගුණ යහපත් කමින් බුද්ධිමත්ව තම වැඩකටයුතු කර ගැනීමේ හැකියාව ඇත. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. අලුත් දේ ඉගෙනීමට සිත් දේ. දෙස් විදෙස් සංචාරක ගමන් බිමන් යාමට අවස්ථාව සැලසිය හැක. ඉදිරිපත් වීමේ හැකියාව ඇත.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 3 වැන්නේ නීචව ගමන් කරයි. තම වැඩ කටයුතු සාර්ථකව, නිහතමානීව කරගෙන යෑමේ හැකියාව ඇත. ගමන් බිමන් අධිකව යෙදේ. මිතුරු මිතුරියන්ගේ උදව් උපකාර ලැබේ. පදිංචිය වෙනස් විය හැක. අධ්‍යාපන කටයුතුවලට ශුභ වේ. අදායම් මාර්ග සරු වේ.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ 3 වැන්නේ ගමන් කරයි. රැකියා අපේක්ෂිත අයට රැකියා ලබාගැනීමේ භාග්‍යය ඇත. තනතුරු වරප්‍රසාද ලැබෙන කාලයකි. රැකියා ව්‍යාපාර කටයුතුවල දියුණුව සැලසේ. උත්සාහයේ ප්‍රතිඵල ලැබීමට වාසනාව ඇත. ක්‍රියාශූරත්වය සහිතයි. වචනය බලවත් වේ. ආදායම් මාර්ග සරු වේ. ලැබීමේ භාග්‍යය ඇත.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු දෙවැන්නේ ගමන් කරයි. ප්‍රසිද්ධිය, බලය ලැබෙන කාලයකි. රැකියා කටයුතුවලින් ව්‍යාපාර කටයුතුවලින් ජය ලැබේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විභාග ජය ලැබේ. බාධක බිඳ ඉදිරියට යාමේ හැකියාව ඇත. ලැබීම් අතින් යහපත් කාලයකි.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ දෙ-වැන්නේ ගමන් කරයි. රැකියා කටයුතු දියුණු වේ. උසස් තනතුරු හා ප්‍රසිද්ධිය ලැබේ. අධ්‍යාපන කටයුතුවලට සුභ කාලයක් වන අතර එම කටයුතු සාර්ථක වේ. හදිසි තීරණ ගනී. තම අදහස් අනුව වැඩකිරීමට සිත් දේ. ගමන් බිමන් අධික කාලයකි. ධන ලාභ සහිතයි.

එම්. වයි. ධර්මවිජය
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca





# ජීවිතය ලෙඩ කරන අපද්‍රව්‍ය

■ පාලිත සේනානායක

වස විස භාවිතය පිළිබඳ ලෝක ඉතිහාසයේ කතාව සියවස් ගණනක් ඈත අතීතයට දිවයන්නකි. ගල් ගුහාවල ජීවත් වූ අපේ ආදිතමයන් සතුන් දඩයම් කරන්නට වස විස භාවිත කළ බවට සාක්ෂි හමුවී තිබේ. විලියම් ෂේක්ස්පියර් සිය සුප්‍රකට හැම්ලට් නාටකයේ හැම්ලට් කුමරු ඝාතනය කරන්නට ලෙයාටස් අතට දෙන්නේ විෂ පෙවූ කඩුවකි.

අද මෙන් දියුණු සමාජයක් නොපැවති එදා වස විස බොහෝ අවස්ථාවලදී භාවිත කළේ අනුන් නසන්නටය. නවීන තාක්ෂණයෙන් සොබාදහමට පවා අභියෝග කරන අද දැනුවත්ව හෝ නොදැනුවත්ව වස විස භාවිත කරන්නේ තමාම නැසෙන්නටය.

පරිගණකය සහ ජංගම දුරකථනය වර්තමාන නවීන තාක්ෂණයේ ඉහළින්ම භාවිත කෙරෙන මෙවලම් දෙකකි. තාක්ෂණයේ අධිවේගී දියුණුව නිසාම වසරින් වසර මෙම උපකරණ නව මාදිලිවලින් වෙළෙඳපොළට එක්වෙයි. මේ නිසා වෙළෙඳපොළට එක්වන වේගයෙන්ම මේ ඉලෙක්ට්‍රොනික් උපකරණ වෙළෙඳපොළෙන් බැහැර වීමද සිදුවෙයි. මේ බොහෝ ඉලෙක්ට්‍රොනික උපකරණ නිෂ්පාදනය කෙරෙන්නේ දියුණු රටවලයි. බොහෝ විට මේ උපකරණ මිල දී ගන්නේ සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාව බඳු රටවල්ය.

නවීනත්වයත් අධික භාවිතයත් නිසා සීග්‍රයෙන් භාවිතයෙන් ඉවත් කෙරෙන මේ ඉලෙක්ට්‍රොනික උපකරණ අද අපේ රටේ පරිසරයට බලවත් තර්ජනයක් බවට පත්වී තිබේ. එයට ප්‍රධාන හේතුව වී තිබෙන්නේ මේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පරිසරයට හානි නොවන ආකාරයෙන් බැහැර කිරීමේ ක්‍රියාවලියක් අපේ රටේ තවම ක්‍රියාත්මක නොවීමයි.

භාවිතයෙන් ඉවත් කෙරුණු පරිගණක උපාංග, ජංගම දුරකථන, ඡායාරූප පිටපත් යන්ත්‍ර, නොයෙක් බැටරි වර්ග වැනි ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යයන් අද බොහෝ දෙනෙක් ගෙදර දොරේ සාමාන්‍ය අපද්‍රව්‍යයන් සමග එක්කොට බැහැර කරලීම සිදුකරති. සමහරු පුළුස්සති. එය බලවත් පරිසර හානියක් බව නොසිතති. මේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සාමාන්‍ය අපද්‍රව්‍ය මෙන් දිරාපත්ව පසට එක් වන්නේ නැත. සිදුවන්නේ ඒවායේ අඩංගු රසායනික ද්‍රව්‍ය පසට එකතු වී පාංශු ජීවීන්ට සහ ජලයට බරපතළ හානියක් සිදුකිරීමයි.

ඉලෙක්ට්‍රොනික හා විදුලි භාණ්ඩ භාවිත කරන බොහෝ දෙනා තුළ ඒවායේ අඩංගු රසායනික ද්‍රව්‍ය පිළිබඳ අවබෝධයක් නොමැති වීමත් මේ තත්ත්වයට එක් හේතුවකි. පරිගණක මොනිටර, රූපවාහිනී, ජංගම දුරකථන ඇතුළු තොරතුරු හුවමාරු තාක්ෂණික භාණ්ඩ, බැටරි වර්ග ශීතකරණ ඇතුළු සියලුම විදුලි උපකරණවල අඩංගු පොදු රසායනික ද්‍රව්‍ය ගණනාවක් තිබේ. ඒවා අතර කැඩ්මියම්, ලෙඩ්, රසදිය, ආසනික් හා බෙරලියම් ප්‍රධාන රසායනික ද්‍රව්‍ය කිහිපයකි. භාවිතයෙන් ඉවත් කරන ඉලෙක්ට්‍රොනික භාණ්ඩ පරිසරයට එකතු කළ පසු ඒවායේ බහුල වශයෙන් පවතින ඉහත රසායනික ද්‍රව්‍ය පසට එකතු වීමෙන් දීර්ඝ කාලීන පාරිසරික අර්බුද රාශියකට මග පෑදේ.

වර්තමානයේ අපේ රටේ පරිසරයට එකතු වන මේ රසායනික ද්‍රව්‍යවලින් ප්‍රබල බලපෑමක් එල්ල වී ඇත්තේ පානීය ජල මූලාශ්‍රවලටය. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යවල ඇති ලෙඩ්, බෙරලියම් වැනි බැර ලෝහ කෙළින්ම ජල මූලාශ්‍රවලට එකතු වීමෙන් ඒවා බරපතළ ලෙස අපිරිසිදු තත්ත්වයට පත්වේ. මෙම බැර ලෝහ හා හයිඩ්‍රොකාබන් නිසා අපේ රටේ ගංගා ඇළ දොළ ආදියේ ආම්ලිකත්වය වැඩිවීම හේතුවෙන් එම ජලයේ වෙසෙන සහ එම ජලය පානය කරන සතුන්ට විවිධ රෝගාබාධ හටගෙන ඇත.

පසට එකතුවන මේ අපද්‍රව්‍යවලින් දූෂණය වන්නේ පාංශු ජලය පමණක් නොවේ. මේ රසායනික ද්‍රව්‍ය පිටකරන වායු වර්ග නිසා වායුගෝලයද දූෂණය වේ. නවීන තාක්ෂණය යොදා විදුලිය අරපිරිමැසෙන සහ දිගුකල් පවතින බොහෝ විදුලි බුබුළුවල අඩංගු රසායනික ද්‍රව්‍ය රසදියයි. භාවිතයෙන් ඉවත් වන මේ විදුලි බුබුළු පරිසරයට එකතු වීම නිසා අද පසට එකතු වන රසදිය විශාල පාරිසරික අර්බුදයක් බවට පත්වී තිබේ. අද වන විට අපේ පරිසරයට එකතු වෙමින් පවතින මේ විශාල රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය හේතුවෙන් මිනිස් සිරුර තුළින් විවිධ සංකූලතා හා රෝගාබාධ හටගෙන ඇති බව හෙළිවී ඇත. ඒවා අතර ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රිය පද්ධතිවල සංකූලතා, පරම්පරාගත ජාන විකෘති, ඇස්වල විවිධ ආබාධ, වකුගඩු ආබාධ, පිළිකා සහ ආයු කාලය අඩුවීම වැනි තත්ත්වයන්ට හේතුවන බව පිළිගැනීමට සිදුවී තිබේ.

විශාල වශයෙන් පරිසරයට රසායන ද්‍රව්‍ය එකතු කෙරෙන තවත් අවස්ථාවකි රෙදි සේදුම් කුඩු භාවිතය. අපේ රටේ ආසන්න වශයෙන් පවුල් ලක්ෂ පනහක් පමණ සිටිති. මෙයින් පවුල් ලක්ෂ 30 ක් පමණ විවිධ වර්ගවල රෙදි සෝදන කුඩු භාවිත කරන බව සමීක්ෂණයකදී හෙළි වී ඇත. එක පවුලක් සතියකට රෙදි සෝදන කුඩු ග්‍රෑම් 30 ක් භාවිත කළහොත් ඒ අනුව එක් වසරක් තුළ පරිසරයට එකතු වන රෙදි සෝදන කුඩු ප්‍රමාණය ග්‍රෑම් ලක්ෂ 40 ක් පමණ වේ.

ඇත්ත වශයෙන්ම මේ රෙදි සේදුම් කාරක කුඩු හා දියර වර්ග යනු විවිධ රසායනික ගුණ හා ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මිශ්‍ර කරන ලද රසායනික සංයෝග රාශියක එකතුවකි. මේවා ශරීරයට විෂ සහිතය. රෙදි සෝදන කුඩුවල ඇති විවිධ රසායනික ද්‍රව්‍ය අතර පොස්පේට් සංයෝගය අඩංගු වේ.

රෙදි සෝදන කුඩුවලට යොදා ගන්නා පොස්පේට් සංයෝගවලින් සිදු කරන්නේ සේදුම් කාරක වර්ගවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමයි. නමුත් මෙම පොස්පේට් සංයෝග මිනිස් සිරුර තුළ සංකූලතා ඇති කරන බැවින් යුරෝපා සංගමය විසින් පොස්පේට් අඩංගු සියලු නිෂ්පාදන තහනම් කර තිබේ. නමුත් අපේ රටේ රෙදි සෝදන කුඩු හා දියරවල මුළු බරෙන් සියයට පනහක්ම පොස්පේට්ය.

අපේ රටේ රෙදි සේදීමේදී භාවිත කරන නිෂ්පාදන බොහොමයක ඒවායේ අඩංගු රසායනික ද්‍රව්‍ය පිළිබඳ පැහැදිලි සටහනක් නැත. නමුත් ලෝකයේ බොහෝ රටවල රෙදි සේදීම සඳහා භාවිත කරන සියලුම නිෂ්පාදන සඳහා ජෛව වියෝජනයට ලක්වන පරිසර හිතකාමී රසායනික ද්‍රව්‍යයන් පමණක් භාවිත කළ යුතු බවට නීති පනවා ඇත. නමුත් අපේ රටේ එබඳු නීති රීති ක්‍රියාත්මක නොවීමත් රෙදි සෝදන කුඩු භාවිත කරන්නන් තුළ ඒවා පිළිබඳ අවබෝධයක් නොමැති වීමත් නිසා නිෂ්පාදකයන්ට පහසුවෙන් පාරිභෝගිකයන් රැවටීමටද අවස්ථාව ලැබී ඇත. අපේ රෙදිපිළිවලට දිදුලන සුදක් ලැබෙන්නේ ඔවුන්ගේ රෙදි සෝදන කුඩු නිසා යැයි ඔවුන් කියති. නමුත් ඇත්ත කතාව රෙදිවලට දිදුලන සුදක් ලැබෙන්නේ රෙදි මේ සේදුම් කුඩුවලින් සේදූ පසු එම රෙදි පිරිසිදු වන නිසා නොවේ. සේදුම් කාරක වර්ගවල තිබෙන රසායනික සංයෝග හේතුවෙන් හිරු එළියේ අපේ ඇසට නොපෙනෙන පාරජම්බුල කිරණ අපේ ඇස්වලට පෙනෙන ආලෝක කිරණ බවට පත්කරවන නිසාය. රෙදි සෝදන කුඩුවලින් කරන්නේ දෘෂ්ටි මායාවක් මිස සැබෑ ලෙස අපේ රෙදි පිරිසිදු කිරීම නොවේ.

රෙදි සෝදන කුඩුවල ඇති බෙන්සිල් ඇසිටේට් නිසා අග්න්‍යාසයේ පිළිකා ඇතිවිය හැකි බවට සොයාගෙන ඇත. එසේම සමේ විවිධ අසාත්මිකතා, සොරයිසීස්, පණු කැවිලි, ඉරුවාරදය, ශ්වසන ආබාධ, ඇදුම, අක්මාවේ මොළයේ හා ස්නායු පද්ධතියේ ආබාධවලටද රෙදි සෝද කුඩු හේතුවිය හැකි බව දැන් හෙළිදරව් වී ඇත. එසේම ජලාශවල ඇල්ගී වේගයෙන් වර්ධනය වීමටත් ජලජ ජීවීන් විනාශ වීමටත් රෙදි සෝදන කුඩු ප්‍රධාන හේතුවකි.

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසා හෝ රෙදි සෝදන කුඩු සහ වෙනත් ගෘහාශ්‍රිතව භාවිත කරන නොයෙක් තීන්ත වර්ග, මදුරු දඟර ආදි රසායනික ද්‍රව්‍ය අඩංගු සංයෝග නිසා පරිසරයට එකතු වන රසායන ද්‍රව්‍යවල ක්‍රියාකාරීත්වය වේගවත් කිරීමට අපේ රටේ කෘෂිකර්මාන්තයේදී භාවිත වන කෘමි හා වල් නාශක හේතුවන බව සොයාගෙන ඇත. මේ නිසා ජලයේ හා පසේ ආම්ලිකතාව වැඩිවීමෙන් කැඩ්මියම් ලෙඩ් වැනි බැර ලෝහ ජලයේ දියවීමේ සීඝ්‍රතාව වැඩිවී ඇති බවද දැන් හෙළිදරව් වී ඇත. මේ නිසා අනාගතයේදී ජලය බීමට සුදුසු වනසේ සකස් කිරීම සඳහා දැවැන්ත වියදමක් දැරීමට සිදුවනු ඇත. ඒ නිසා නුදුරු අනාගතයේදීම පානීය ජලය වෙනුවෙන් ගෙවන්නට සිදුවිය හැකි මුදල අප සිතනවාටත් වඩා කිහිප ගුණයකින් වැඩිවිය හැකිය.

අතීතය සහ වර්තමානය අතර දැවැන්ත පරතරයක් තාක්ෂණය විසින් අද නිර්මාණය කර ඇත. නමුත් අතීතයේ තවකෙකු නසන්නට යොදාගත් වස විස නිසා දැනුවත්ව හෝ නොදැනුවත්ව අද අපටම නැසෙන්නට සිදුවී තිබීම ඒ ඉතිහාසයේ සරදමක් නොවේද?

# AJITH BERAGAMA LL.B, LL.M

BARRISTER, SOLICITOR AND NOTARY PUBLIC



experienced, quality, knowledgeable and affordable service

AB Ajith Law Office

Real Estate Law
Landlord and Tenent Law
Personal Injury Law
Wills & Estates Law
Immigration Law
Family Law

**24/7 Hotline - 647 328 6623**

10 MILNER BUSINESS COURT,
3 RD FLOOR SCARBOROUGH M1B 3C6

OFFICE - 647 777 8347
FAX - 647 777 8348
EMAIL - AJITH@AJITHLAWOFFICE.COM

# Ceylon Herbal Tea




Benefits of cinnamon tea..

- Positive effect on blood sugar.
- Aid weight loss and belly fat reduction.
- Helps to reduce menstrual discomfort and cramps.




A cup of tea 21 green tea and a life long benefits…

- Helps to reduce cholesterol levels.
- Helps to loose weight.
- Prevent hair loss.
- Contains most amount of anti oxidant polyphenols.
- Skin care and many more...




Benefits of drinking tea 21 hibiscus tea…

- Can prevent pre-cancerous cells from growing by inducing apoptosis.
- Good for heart diseases and diabetes.
- Protects liver
- Relief from cramps and menstrual pain and many more...




Benefits of drinking a cup of black cumin tea…

- Stimulates the energy of the body.
- Decrease fatigue and dispiritedness.
- Anti-hypertensive, carminative and anti-parasitic and many more...




Benefits of tea 21 bitter gourd tea …

- Very low in calories.
- Helps to reduce blood glucose level.




Ginger tea has a lot of benefits such as…

- relieve stress.
- Fight against respiratory problems.
- Reduce inflammations and many more….

Imports by

**S. N. S ENTERPRISES**

**Telphone : 416 890 9521**

Century 21 Leading Edge Realty Inc. Brokerage | invis Canada's Mortgage Experts™

# THUSITH WEERASURIYA

REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT

416 616 2402
THUSITH.WEE@GMAIL.COM
WWW.THUSITH.COM

"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"



Bus: 905-405-8484 Fax : 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3
*Independently owned and operated.

| | | | |
|---|---|---|---|
| Markham<br>165 Main St N. | Scarborough<br>1825 Markham Rd. | Ajax<br>527 Kingston Rd. W | Toronto North<br>1053 McNicoll Ave. |
| Yorkville<br>1300 Bay St. | Stouffville<br>6393 Main St. | Whitby<br>408 Dundas St. W | Don Mills<br>801 York Mills Rd. |

Designed@niukraids.ca

## රූප ඡායා

කළුවර අහස නිදිබර වුණු වෙලාවක
පුරහඳ සිටී දුක් මුහුනින් මලානික
තනිවී ඉතා ගැඹුරුම හුදෙකලාවක
ඇයි යහළුවේ ඔබ බර කල්පනාවක

රිදවා බිඳ දමා බෝ කල් තිබූ සෙනේ
ඈ ගිය දිනේදිය තනිකම උරුම වූණේ
ගිලිහුණු පෙමක ශෝකය කෙතරම්ද අනේ
යහළුව ඔබට මෙන් ඒ දුක මටද දැනේ

## මළ ගෙදර

සුසිනිදු සුමුදු මල් පෙති
මිලිනව විසිරී යන බව
දැල්වෙන පහන් සිළු
අඳුරේ සැඟව යන බව
කවදා කෙළෙසක හෝ
සියල්ල අත්හැරිය යුතු බව
පසක් කර දෙන
සදහම් පුස්තකයක් වැනි
මළගෙදර
'අතීතය'
උපේක්ෂාවෙන් පැවසීය

'බැනර්' තවානක
අසිරිය දැක ගන්න
අල්ලාප සල්ලාප
සමුදුරෙහි කිමිදෙන්න
නරලොවෙහි රඟ සොබා
අඩු නැතිව විඳගන්න
කදිම තෝතැන්නකිය
මළ ගෙදර
'වර්තමානය'
උජාරුවෙන් බෙරිහන් දුන්නේය

**ගාමිණී අබේරත්න**

## කවියාගේ පාපොච්චාරණය

පිනි බිඳ බිඳ අත්ලට ගෙන
ඇමිණූ මුතු ඇට මාලය
ලිහී බිඳී මුතු හැලුණා
පිනි මුතු යැයි ඇමිණූයේ
කඳුළු වගක් නොදත් නිසා

සිතිවිලි එක එක පොදි බැඳ
පැතුම් හුයෙන් ගෙතු කතාව
දිය වී සිතුවිලි මැරුණා
නොම ගැළපුණු පද වැල්වල
අකුරු මදිව තිබුණ නිසා

හීන හීන නෙක විසිතුරු
සොඳුරු අරුණ කිරණ රැඳුණ
දෙනෙතට යා වී මැකුණා
කඳුළැලි තැවරුණු ඇස්වල
හීනෙට ඉඩ නොමැති නිසා

**වත්සලා ප්‍රේමරත්න**

## ආදරය හැමදාම තරුණය...!

ඇවිදගෙන ඇවිදගෙන විගහට
ගොහින් හිත දුර ඈත එපිටට
එදා අප මුණගැහුන තැන ළඟ
නතර වී හති අරියි මගෙ හිත

දෙඩූ පෙම් බස් එදා නුඹ මම
උන් මුවින් අද ගලා යන හඬ
හුළඟ ඇවිදින් මට කියනකොට
කෝළ හැඟුමක් දැනේ හිත යට

අල්මාරියේ පෙට්ටියක ගුලි වුන
මඟුල් සාරියෙ පාට පිච්චුන
සුවඳ හිත අස්සටම රිංගා
කඳුළු අහුරක් ඇවිත් අරගෙන

දෙතුන් පොළකින් ඉරුණු හිත තුළ
රැළී නැති මුත් සියලු මතකය
දෙඩූ වදනක මිහිර ඇවිදින්
කිති කවයි හිත මෙවන් මොහොතක

බොහෝ දේ මග හැරී ගිය කල
හැර නොයෙන හෙවණැල්ල නුඹමය
ගතින් වියපත් නමුදු නුඹ මම
ආදරය හැමදාම තරුණය

**ස්වර්ණලතා බණ්ඩාරනායක**



## මේ අහන්න දෙවෙන්දරා

කමකුරා බිමට සෙනෙහෙ දිය අරන්
දෙවෙන්දරා අප පැතූ ඒ වසන්තය ඇවිත්
වසත් සමේ සිරි විඳින්නෙ ඉතිං කෙලෙස මං
මගේ හිතත් අරගෙන නුඹ කොහේදෝ ගිහිං

කප්පරක් තරම් සතුට සුවය දුන්නත් පෙර දා
කමකුරාව සිර මැදුරක් මට නුඹ නැති දා
කඳුළක්වත් දෙන්න නොඉඳ නුඹ දුර ගිය දා
සැනසීමක් යළි ලැබේද කෙලෙසක කවදා

වියැළුණු සිත් බිම් කඩ වෙත වස්සානේ පහස අරන්
දෙවෙන්දරා ඔබ එනවද නොරිකෝ මියැදෙන්න කලින්
ඔබ එනතුරු තනි රකීවි සිත් වදු ලූ සුසුම් පවන්
තව නම් ඉවසන්නට බෑ දෙවෙන්දරා එන්න ඉතිං

සත්තකින්ම නුඹ ආයෙත්
කිසි දා එන්නෙම නැත්තම්

මේ අහන්න දෙවෙන්දරා

පර වූ සකුරා මල් දෝතක
සඟවලා නුඹට පිදූ නිම් නැති ප්‍රේමය
මළවුන්ගේ ලෝකෙට පා ඔසවන්නද මම
මේ දුක් උහුලන්නට බැරි හින්දම

**ආර්. පී. යූ. මධුරංගිකා**

## අයියණ්ඩියේ....

කොටුරුඇල් පොත පුරාවට
හැමදාම බිංදුවම වූ කලට
රිදුම් දී ගුරු සිත
තලද්දී මා සුරතට
යාබද පන්තියට අවසැඟව
තෙමුණෝ නුඹෙයි දෙනුවන
අයියණ්ඩියේ එදවස

ලබා සූ සැට ශිල්ප
කෙළ පැමිණ
නුඹ වීය ගුරුගෙදර මිණි පහන
මැදුරු මාළිගා මැද
ජීවිතේ වළඳන
මෙදා පුන්සඳ නුඹයි
මහගෙදර නොපෙනෙන

තෙමසකට වතාවක්
සිව්රෝද මාළිගාවෙන් බැස
රසයක් නොවේමැයි මාපිය දෙපළට
පුදා නුඹ යළි දුවන පිටිකිර
තක්සලාවේ මගහසර නොමදැන
ගොඩබිමේ නිබඳ ඩාබිඳු හෙළන
ගිලන් මාපිය උවටැනින් සනසන
මළයණ්ඩි මම වෙමි
ජීවිතේ වැරදුන

**නිශාන්ත මල්ලවආරච්චි**

## ඉතිං කොහොමද?

ලොකු පුතා මෙල්බර්න්
පොඩි දෝනි ෆ්‍රාන්ස්වල
ලියුම් නං එවන් නෑ
skype තියෙනවනෙ
ගෙදර එක්කෙනත් දැන්
මාසයක් ෆ්‍රාන්ස්වල
පොඩි දුවගෙ බබා ළඟ
"කොහෙද මේ පාන්දර?"
"හාර්ට් ක්ලිනික් නෙ අද
දවල් වෙනකොට සෙනඟ...."

**අන්තර්ජාල කවියක්**


AirCare Plus
ONE CALL WILL FIX IT ALL
Sales | Service | Repair | Installation
Line: 416.605.8300
Email: ashokdon@live.ca
Heating & Air Conditioning
FAST, AFFORDABLE SERVICE
Ashok Hettege
Licensed H.V.A.C Technician
Furnace
Gas Piping
Hot Water Tank
Tankless Water Heater
Humidifier
Air Cleaner
Air Conditioning
Dishwasher & Fridge Water Line Installation
Gas Stove and Gas Dryer Installation
ග්‍රීෂ්ම සමය නිමා විය.
ඔබේ නිවසේ තාපන යන්ත්‍රයේ (furnace)
නිසි ක්‍රියාකාරිත්වය පිළිබඳ
සැලකිලිමත් වන්න.
එහි අත්‍යවශ්‍ය නඩත්තු කඩයුතු අලුත්වැඩියා
කටයුතු හා අලුතින් සවිකිරීම් සඳහා විමසන්න.
A MEMBER OF
CanLanka
BUSINESS ASSOCIATION
2004-2014
10
CELEBRATING
10 YEARS IN BUSINESS
SATISFACTION
100%
GUARANTEE


Why Pay More?
1%
Are You Planning to Sell a Property?
Listing Commission*
BUY or SELL through us and get an amazing chance to
WIN
1 of 10 GREAT PRIZES INCLUDING 2016 HONDA CIVIC
1st Prize
8 TVs
I will guide you through the process in a professional, friendly and accountable manner
Call for more information
Nishantha 416 417 0763
Century 21
Nishantha Donsiyambalapitiyage Sales Representative Email:nishan.don@gmail.com
Innovative Realty Inc. 2250 Markham Road Unit 3 Toronto ON M1B2W4. Office: 416 417 0763








# කැනඩාව රනින් සරසන දිමුතු

සෑම වසර 4 කට වරක්ම රටවල් 50 කට අධික සංඛ්‍යාවක සහභාගිත්වයෙන් ජර්මනියේ Erfurt හි සූපවේදීන්ගේ ඔලිම්පික් ගම්මානයේ පැවැත්වෙන IKA/ Culinary Olympics තරගාවලිය සඳහා කැනඩාවේ Humber College හි Culinary professor කණ්ඩායම නියෝජනය කරමින් එම කණ්ඩායමේ අතුරුපස (desserts) අංශයට නායකත්වය දුන් දිමුතු පෙරේරා සහ පිරිස එම අංශයේ රන් පදක්කම හිමිකර ගැනීමට සමත් වී ඇත.

Humber College වෙනුවෙන් පස්දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් 2016 වසර සඳහා ඉදිරිපත් වී සිටි අතර මෙම කණ්ඩායම වසර 2 ක් පුරා දිවා රාත්‍රී, කාලය හා ශ්‍රමය වැය කරමින් ඒ වෙනුවෙන් පුහුණුවීම් කටයුතු සිදුකර තිබුණි. මෙහිදී එම කණ්ඩායම මෙම තරගාවලියට ඉදිරිපත් වී තිබුණේ Regional Category අංශය නියෝජනය කරමිනි.

දිමුතු ඇතුළු පිරිසට එහිදී අතුරුපස, චොක්ලට් සහ විවිධ කෑම වර්ග රැසක් සාදා ඉදිරිපත් කිරීමට සිදුවූ අතර ඒ සියල්ල විශේෂ විනිශ්චය මණ්ඩලයකගේ දැඩි අධීක්ෂණයට ලක් කරනු ලැබ තිබුණි. විනිශ්චය මණ්ඩලය එම ආහාරපාන නිරීක්ෂණය කිරීමේදී ඒවායේ බාහිර අලංකාරය, රසය, ඇතුළත් කොට ඇති අමුද්‍රව්‍ය සහ ඒවා නිම කිරීම සඳහා භාවිත කර ඇති තාක්ෂණ ක්‍රමවේදයන් ආදි සියලු කරුණු පිළිබඳව අවධානය යොමු කරයි.

මෙවර සූපවේදී ඔලිම්පික් සඳහා Regional Category අංශය නියෝජනය කරමින් කණ්ඩායම් 43 ක් සහභාගි වී තිබුණු අතර රන් පදක්කම් හිමි කර ගැනීමේ අවස්ථාව හිමිව තිබුණේ කණ්ඩායම් 8 කට පමණි. ඒ අතර දිමුතු ඇතුළු පිරිස නියෝජනය කළ Humber College කණ්ඩායමද සිටීම විශේෂයෙන්ම සඳහන් කළ යුත්තකි.

IKA/Culinary Olympics තරගාවලියට Humber College Culinary professors කණ්ඩායම ඉදිරිපත් වූ පළමු අවස්ථාව මෙය වන අතර එහි පේස්ට්‍රි අංශයේ නායකත්වය ගැනීම සඳහා කොලේජිය විසින් දිමුතු වෙත කරන ලද ආරාධනයකට අනුව ඔහු එම තරගාවලිය නියෝජනය කිරීමට තීරණය කර තිබුණි. දිමුතු මෙවැනි ඔලිම්පික් තරග සඳහා ආගන්තුකයකු නොවේ. මින් පෙරද ඔලිම්පික් තරගාවලිය මෙන්ම වෙනත් ජාත්‍යන්තර තරගාවලිද නියෝජනය කිරීමේ අවස්ථා රැසක් දිමුතුට ලැබී ඇති අතර ඒවායින් රන් පදක්කම් ඇතුළු සම්මාන, සහතික රැසක් හිමි කර ගැනීමට දිමුතුට අවස්ථාව හිමි වී ඇත.

ඒ අතරින් ප්‍රධාන වශයෙන් සඳහන් කළ හැකි අවස්ථා ලෙස,

- 2008 වසරේ ජර්මනියේ Erfurt, පැවති ඔලිම්පික් තරගයේදී තනි සහභාගිත්වයකින් වැඩිම පදක්කම් සංඛ්‍යාවක් (Most individual medals in olympics) හිමි කර ගැනීම. මෙහිදී දිමුතු විසින් Marzipan carvings අංශයෙන් Marzipan සහ Salt නිර්මාණද Fruits and Vegetables carving අංශයෙන් පළතුරු සහ එළවළු යොදාගත් නිර්මාණ සහ මංගල කේක් ආකෘතිද ඉදිරිපත් කර තිබුණි. මෙහිදී ඔහුට රන් පදක්කම් දෙකක් සහ රිදී පදක්කමක්ද ලෝකඩ පදක්කමක්ද හිමි විය.
- 2007 වසරේදී Toronto culinary salon තරඟයට සහභාගි වෙමින් වැඩිම පදක්කම් දිනාගත් තනි නිර්මාණකරුවා බවට පත්වීමේ අවස්ථාව දිමුතුට හිමිවිය. එහිදී ඔහු ඉදිරිපත් කළ නිර්මාණ සඳහා රන් පදක්කම් හතරක්ද, රිදී පදක්කම් දෙකක්ද, ලෝකඩ පදක්කම් එකක්ද ලබා ගැනීමේ අවස්ථාව ඔහුට හිමි විය. මෙහි විශේෂයෙන්ම සඳහන් කළ යුත්තක් වන්නේ එහි විනිශ්චය මණ්ඩලයේ විශිෂ්ටතම සම්මානය වන Judges Award – Grand Gold Excellence සම්මානය දිමුතුට හිමි වීමය.
- 2006 වසරේදී Toronto culinary salon තරඟයට ඉදිරිපත් වූ දිමුතු එහිදී රන් පදක්කම් පහක්ද, රිදී පදක්කම් එකක්ද ලෝකඩ පදක්කම් එකක්ද හිමිකරගෙන තිබුණි. එවරද දිමුතු නියෝජනය කළ අංශ සඳහා විනිශ්චය මණ්ඩලයේ විශිෂ්ටතම සම්මානය Judges Award – Grand Gold Excellence සම්මානය හිමිකර ගැනීමට දිමුතු සමත් විය. ඊට අමතරව මෙම තරගාවලියේදීම Judges Award – Grand Gold Excellence, Best Professional Pastry Chef සම්මානයද Judges Awards Best Culinary Artist සම්මානයද දිමුතු වෙත හිමි වී තිබුණි.
- 2001 වසරේදී Emirates Culinary Salon තරගාවලිය නියෝජනය කළ දිමුතු එහිදී රන් පදක්කම් එකක්, රිදී පදක්කම් දෙකක් දිනාගෙන තිබුණි. එහිදීද Best pastry chef සම්මානය ලබා ගැනීමට දිමුතු සමත් වී තිබුණි.

සූපවේදයේ විවිධ අංශවලදී ලොව පුරා තරගාවලි නියෝජනය කරමින් දිමුතු ලබාගෙන ඇති පදක්කම්, සම්මාන රාශියකි. මේ සියල්ලම ඔහුගේ අප්‍රතිහත ධෛර්යය හා කැප කිරීමත් දක්ෂතාවත් මත ලබාගත් සම්මාන බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

Chocolate, Marzipan, Pulled and Blown Sugar, Salt Styrofoam, Ice, Pastillage, ආදිය යොදාගනිමින් විවිධ නිර්මාණ නිම කිරීමට දිමුතු විශේෂ දක්ෂතාවක් දක්වයි. ඔහු විසින් කරනු ලබන නිර්මාණ අතර මංගල කේක් ආකෘති, Speciality Cakes, Edible Portraits, විවිධ අතුරු පස වර්ග, Pralines, Truffles සහ වෙනත් බොහෝ නිර්මාණයන් දැකගත හැක.

දිමුතුගේ දක්ෂතාව සහ හැකියාව නිසාම ලොව සුප්‍රසිද්ධ පුද්ගලයන් වෙනුවෙන් විවිධ වූ අතුරුපස සහ කේක් නිර්මාණ සෑදීමේ භාග්‍යයද දිමුතු වෙත හිමිවී තිබුණි. එම පුද්ගලයන් අතරින් එක්සත් ජාතීන්ගේ සංගමයේ හිටපු සභාපති කොෆී අනන්, රුසියාවේ ජනාධිපති ව්ලදීමර් පුටින් ඇතුළු රටවල් හතක රාජ්‍ය නායකයන්, ඇමරිකාවේ හිටපු රාජ්‍ය ලේකම් කොලින් පවල්, ස්වීඩනයේ රජ කුමරු, බහරේන්හි රජ කුමරු ආදි නම් විශේෂයෙන්ම සඳහන් කළ හැක.

වර්තමානයේදී Humber College සහ Georgian College හි සූපවේදය පිළිබඳ මහාචාර්යවරයකු (Culinary professor) වශයෙන් කටයුතු කරන දිමුතු, මීට පෙර Thunder Bay Confederation College හි මහාචාර්යවරයකු වශයෙන් කටයුතු කර ඇත. දිමුතු 1992 දී ආහාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ලංකාවේදී ලබාගෙන ඇති අතර 1996 දී ස්විට්සර්ලන්තයේදී Sugar Art පිළිබඳ ඩිප්ලෝමාව හිමිකර ගනු ලැබුණි.

සූපවේදය සම්බන්ධයෙන් දිමුතුගේ වෘත්තීය ජීවිතය ඇරඹෙන්නේ කොළඹ ඔබරෝයි හෝටලයෙනි. ඉන්පසු ඩුබායි, බහරේන්, ජෝර්දාන, රුසියාව ඇතුළු ලොව බොහෝ රටවල තරු පහේ හෝටල්වල විධායක පේස්ට්‍රි සූපවේදියකු (Executive pastry chef) ලෙස වසර 25 කට අධික කාලයක් කටයුතු කර ඇත.

දිමුතු අද වන විට ලබාගෙන ඇති ජයග්‍රහන සියල්ල අතර ඔහු විසින් අරඹා ඇති Cakes to Dream on සමාගම පිළිබඳවද සඳහන් කළ යුතුව ඇත. එම ආයතනය මගින් නිර්මාණය කරනු ලබන ආහාර පාන අද දින වන විට උතුරු ඇමරිකාවේ බොහෝ පළාත්වලට බෙදා හරිනු ලැබේ. ලොව සුප්‍රසිද්ධ ආහාරපාන අලෙවි සල් ඇතුළු බොහෝ ස්ථානවලින් Cakes to Dream on සමාගමේ නිෂ්පාදන ඔබට ලබාග ැනීමට හැකියාව ඇත. දිමුතු විසින් නිර්මාණය කරනු ලබන සියලුම ආහාර පාන කෘත්‍රිම ද්‍රව්‍යවලින් සහ රසකාරකවලින් තොරව නිපදවෙන අතර ඒ සියලු නිෂ්පාදන සඳහා ස්වභාවික ද්‍රව්‍යය පමණක්ම යොදා ගැනීමට ඔහු සෑම විටකම සැලකිලිමත් වේ.

2016 සූපවේදීන්ගේ ඔලිම්පික් තරගාවලියට සහභාගි වෙමින් කැනඩාවට රන් පදක්කම් ගෙන ඒමට සමත් වූ දිමුතු පෙරේරා ඇතුළු Humber College, Culinary professors කණ්ඩායමට දසත සුභාෂිංසන මෙසේ පිරිනමන අතර ඔබගේ ඉදිරි වැඩකටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමු !

## ප්‍රවීණ පේස්ට්‍රි සූපවේදී දිමුතු පෙරේරා Culinary Olympics තරග නියෝජනය කරමින් ලබාගත් ජයග්‍රහණ



2008 වසරේදී ජර්මනියේ Erfurt, පැවති ඔලිම්පික් තරඟයේදී ඔහු විසින් කරන ලද මෙම නිර්මාණයට රන් පදක්කම හිමි විය. NATIVE SPIRIT ලෙස නම්කර ඇති මෙය නිර්මාණය කිරීම සඳහා ඔහු යොදාගෙන ඇත්තේ ලුණු ය.



CRAZY KITCHEN ලෙස නම් කර ඇති මෙම අලංකාර නිර්මාණය දිමුතු ඉදිරිපත් කර තිබුණේ Marzipan Showpiece අංශයෙනි. මෙයද 2008 වසරේදී ජර්මනියේ Erfurt, පැවති ඔලිම්පික් තරඟයට ඉදිරිපත් කරන ලද්දක් වන අතර එම අංශයේ රන් පදක්කමද මෙම නිර්මාණය වෙනුවෙන් දිමුතුට හිමි විය.



හේමමාලා දන්ත කුමරු සිතුවම අලංකාර අයුරින් තම නිර්මාණයකට දිමුතු යොදාගෙන තිබුණේ මෙසේය. ආමන්ඩ් පේස්ට් භාවිත කරමින් නිර්මාණය කර ඇති මෙම අපූරු නිර්මාණය 2006 වසරේදී Toronto culinary salon තරඟයට ඉදිරිපත් කෙරුණු අතර එහිදීද රන් පදක්කම හිමි කර ගැනීමට දිමුතු සමත් විය.

# අපාය හා දිව්‍ය ලෝකය ගැන කතා



■ ආර්. සී. වතුහේන

බෞද්ධ සාහිත්‍යයේදී දරුවන්ට ළමා කලම අඟවන්නේ දිව්‍යලෝකය (සුගතිය) අහසේ ඉහළ ඇති බවත් අපාය (දුගතිය) පොළව මධ්‍යයේ ඇති බවත්ය. උදාහරණ ලෙස දක්වතොත් මරණ මංචකයේ වැතිරී සිටින සුප්‍රසිද්ධ සුළුගුළු උපාසක මහතාට අවසන් මොහොතේ පිරිත් ධර්ම දේශනාවක් පැවැත්වීමට උපාසක මහතාගේ දූ දරුවන් විසින් බෞද්ධ ස්වාමින් වහන්සේලා කීප නමක් මරණ මංචකය ළඟට වැඩම්මවයි. උන් වහන්සේලා පිරිත් දේශනා කරන අතර මරණාසන්න උපාසක මහතා අතින් යම් සංඥාවක් කරයි. උපාසකගේ මේ ප්‍රතිචාරය පිරිත් නවත්වන්න යැයි වටහා ගන්නා ස්වාමින් වහන්සේලා පිරිත් දේශනය නවතා බැහැරට වඩී. ඒ මොහොතේ කලබල වන උපාසක මහතා 'පිරිත නැවැත්තුවේ ඇයිදැ' යි අසයි. 'තාත්තා අතින් එපා කී නිසානේ' යැයි දරුවෝ පිළිතුරු දෙති. 'මා කීවේ පිරිත් නවත්වන්න නොව ඉහළ අහසේ දිව්‍ය විමානවල ඉඳන් දිව්‍ය ලෝක හයේම දෙවිවරු මට එහාට එන්න එහාට එන්නයි අඬගසනවා. මා කීවේ ටිකක් ඉන්න කියලයි' සුළුගුළු උපාසක කියයි. ඒ මොහොතේ ඉහළ අහස බලන දුවා දරුවන් 'කෝ අහසේ දිව්‍ය විමාන හෝ දෙවිවරු පේන්න නැහැනේ' කියයි. එවිට සුළුගුළු උපාසක 'දිව්‍ය විමාන හයෙන් තමන් යා යුත්තේ මොන දිව්‍ය ලෝකයටදැ' යි දරුවන්ගෙන් අසා ඒ දිව්‍ය විමානය දැක ගන්නට අවශ්‍ය නම් මල්මාලා දාමයක් ගෙනවිත් 'අපේ පියා මෙන්න මේ දිව්‍ය ලෝකයට යේවා' යි කියා මාලාදාමය ඉහලට විසිකරන සේ උපදෙස් දෙයි. දරුවන් විසින් ඉහළට විසිකරන මාලා දාමය ඈත ඉහළ අහසේ රැඳී පවතියි. ඒ ඔවුන් පැතූ දිව්‍ය විමානයේ දෙවිවරු විසින් මාලා දාමය අල්වාගෙන සිටීමයි.

මෙලොව උපන් ඕනෑම අයෙකු මරණින් පසු දිව්‍ය ලෝකයට හෝ අපායට (සුගතිගාමි හෝ දුගතිගාමී වන්නේ) යන්නේ ජීවත්ව සිටින කල ඔවුන්වෙත තිබූ අභිප්‍රායනට හා ක්‍රියා පටිපාටියට අනුකූලවය. මේ ලිපියේ ප්‍රධාන හා මූලික අරමුණ වන්නේද දෙව්ලොව හා අපාය ගැන, එහි ස්වභාවය හා පිහිටීම මෙන්ම එහි ප්‍රවිෂ්ටය ගැනද සරල සුමට සවිස්තරයක් ලඝු කොට, වට කොට, මට කොට, සුමට කොට කීමමය. එහෙත් ඒ විස්තර යථාර්ථයට කොතරම් සමීපද යන්න තීරණය කළ යුත්තේද ගමන් මාර්ගය හා ගමනාන්තය තෝරාගත යුත්තේද ඔබ විසින්මය.

හයිකුන් හිමියන් වෙත පැමිණි නොබුෂිගේ නම් වූ සෙබළා හිමියන් අමතා විමසා සිටියේ 'ස්වාමීනි ඇත්තටම අපායයි දිව්‍යලෝකයයි කියා දෙකක් තිබෙනවාද?' යනුවෙනි. උත්තරය ඔව් හෝ නැත යන්න වුවත් හිමියන් විමසා සිටියේ 'තමා කවුද?' යන්නය. 'මම සමුරායි කෙනෙක්' සෙබළා වහා උද්දාමයෙන් පිළිතුරු දුන්නේය. 'හැබෑට, කොයි මෝඩයද? තමුසෙ සමුරායි කෙනෙකු කළේ' හිමියෝ එවර විමසූහ. 'මාර හිඟන මුහුණක්නෙ ඔහේට තියෙන්නෙ' හිමියෝ වැඩිදුරටත් දෙසා බෑහ. සෙබළාගේ කෝපය නිම්හිම් නැති වීය. හේ වහා ඉන බැඳි අසිපතට සුරත තැබීය. ඒ දුටු හිමියෝ 'ආ එහෙනම් තමුසෙට කඩුවකුත් තියෙනවා. ඒ වුණාට තමුසෙට මගෙ බෙල්ල කපන්න තරම් නම් ඔය කඩුවෙ මුවහත නැතිව ඇතැ' යි කීහ. කෝපය ඉහවහා ගිය සෙබළා වහාම සිය කඩුව කොපුවෙන් එළියට ඇද්දේය. ශාන්තව එදෙස බලා සිටි හිමියෝ එවර පහත් හඬින් 'ඔය ඇරෙන්නෙ අපායෙ දොර' යැයි කීය. මේ වදනත් සමගම යථාවබෝධයට පැමිණි සෙබළා වහා තම කඩුව කොපව තුළට තල්ලු කළේය. 'ඔය ඇරෙන්නෙ දිව්‍ය ලෝකෙ දොරත්' හයිකුන් හිමියෝ ශාන්තව වදාළහ.

දිව්‍ය ලෝකයේ හා අපායේ හැටි හා එහි ප්‍රවේශ වනහැටි දැනගත් ඔබ දැන් කියවන්න මේ කතාව.

පූජක තුමා උපශාන්ත මුහුණින් යුතුව සයනයේ දිගාවී සිටියේ තවත් මොහොතකින් තමා වෙත ළඟා වේ යැයි අපේක්ෂා කළ මරණය පිළිගැනීමටය. එතුමෝ සියවසක් දිවි ගෙවා තිබුණිශ්‍රී අබල දුබල සිරුරින් යුතු එතුමෝ මරණාසන්නව වැතිර කල්පනා කළේ අපාය හා දෙව්ලොව ඇති වෙනස කුමක්ද එහි ස්වභාවය කුමක්ද යන්න ගැනය. තමා තම පැවිදි දිවියේදී තම ශ්‍රාවකයින්ට සිය දහස් වරක් අපාය හා දිව්‍ය ලෝකය ගැන විස්තර කළ හැටි උන්වහන්සේට සිහිපත් විය. ඒත් මේ අවසන් මොහොතේ එතුමාට හැඟීගියේ තමා කළ දේශනාවත් කෙසේ වෙතත් අපාය හා දිව්‍ය ලෝක ගැන ස්ථිර නිගමනයක් හැඳින්වීමක් හා විශ්වාසයක් තමා සතුව තිබේද යන්නය.

දසතින් අඳුර ගලා එමින් තිබිණි. කෙනකු දුටු මතින් හැඳිනීමට අපහසු තරමටම අඳුර බලවත් වීය. මරණ මංචකයේ එතුමාගේ පය පාමුලින් එකවරම දෙදෙනකු නැගී සිටින බවක් පූජක තුමාට පෙනින. බිය නොවූ මහළු පූජක තුමා දෑතින් දෑස් පිසදමා අඳුරට නෙත හුරුකර වඩා හොඳින් ඒ පය පාමුලින් නැගී සිටි දෙදෙනා දෙස විපරමින් බැළුවේය. දෙවියන්ට ස්තූතිවේවා... පූජකතුමාට ඒ අමුත්තන් දෙදෙනා හඳුනාගත හැකිවීය. ඉන් එකෙකු වූයේ වැඩුණු සිරුරින් යුත් ශක්ති සම්පන්න මෝසස් වූ අතර අනෙකා මස් මරන්නෙකු වූ පීතර විය.

වචනයක් නොබිනූ මෝසස් හා පීතර ඉඟි මගින් මහළු පූජකතුමාට කියා පෑවේ තමන් සමග එන ලෙසය. කිසිත් නොසිතූ පූජකතුමාද ඉතා භක්තිවන්ත සුවච කීකරු දේව ගැතියකුසේ ඊට අනුකූළව සයනයෙන් නැගී සිටියේය. අමුත්තෝ දෙදෙනා පිටුපස නොබිණු මුවින් යුතුව නිදන කාමරයෙන් එළියට ආ පූජක තුමාට හැඟී ගියේ තමන් තිදෙනා මිදුලට පැමිණි වගය. තවත් මොහොතකින් තිදෙනාම අහසේ පාවී යන්නට විය. මෙසේ බොහෝ දුරක් ගමන් කිරීමෙන් පසුව විශාල මන්දිරයක් අභියස ඔවුන් නැවතුනහ.

ඉක්බිතිව කතා කළේ පීතරය, පූජකතුමා ඉදිරියට ආ ඔහු මෙසේ කීය. දෙවියන් වහන්සේගේ රාජධානිය සුවිශාල මන්දිර ගණනාවකින් සමන්විතය. දිව්‍ය ලෝකය, අපාය, වගේම තව බොහෝ දේවල් ඊට ඇතුළත් වෙනවා. පූජක තුමා දැන් ඔබ ඔය මන්දිරයේ පළමු කාමරයට පා තබන්න සාතන්ගේ පළමු කාමරය ඔබට පෙන්වා දීමට අප සූදානම්.

නිහඬ වතක් අනුගමනය කළ පූජකතුමා මන්දිරය තුළට පිවිසුනිශ්‍රී ඒ හාම ඔහුට ඇසුනේ විශාල ඝෝෂාවකි. පුද්ගලයින් රැසක් විශාල ඕවලාකාර මේසයක් වටා හිඳගෙන උන්හ. මේසය මත දුම් දමමින් තිබුණේ පූජක තුමාගේද අග්‍ර භෝජනය වන හරක් මස් සූපයකි. මේසය වටා වුන් හැම දෙනා අතම හැන්ද බැගින් වීය. එනමුදු ආහාර අහේනිය හේතුකොට ගෙන ඔවුන්ගේ උදර හැකිලි සිරුරු කෑශ වී තිබිණ. අධික කුස ගින්නේ සිටි ඔවුන්ගේ අඳෝනා ඝෝෂාව බලවත් වීය. හැම අයකු අතම හැන්ද බැගින් තිබුණද ඒ හැම හැන්දක්ම අත දරන්නාගේ අත මෙන් දෙගුණයක දිගින් වීය. හැඳිවලට සුප් ටිකක් ගත හැකිවුවද මිට දිගු නිසා ඒ සුප් ස්වල්පයක් හෝ මුවට ලංකර ගැනීමට එකෙකුට හෝ නොහැකි වීය. අඳෝනාව ඉවසනු නොහැකි වූ පූජකතුමා තමා ඒ ස්ථානයෙන් ඉවත් කරන මෙන් පීතරගෙන් හා මෝසස්ගෙන් ඉල්ලා සිටියේය.

ඉනික්බිති පීතර හා මෝසස් පූජක තුමා තවත් මන්දිරයක් වෙත ගෙන යන ලදී. ඔවුන් කීවේ ඒ දිව්‍යලෝකය බවය. පෙර සේම පූජක තුමා මන්දිරයේ පළමු කාමරයට පා තැබීය. එහිද පෙර මන්දිරයේ තිබූ වර්ගයේම විශාල මේසයක් වීය. ඒ වටා මිනිසුන් රැසක් සිටියෝය. ඔවුන් අතද ඔවුන්ගේ අත් මෙන් දෙගුණයක දිගු මිටින් යුතු හැන්ද බැගින් වීය. පෙර පරිදිම මේසය මත දුම් දමන අගනා හරක් මස් සූපයක්ද වීය. එහෙත් මෙහි සම්පූර්ණ වෙනස් ස්වභාවයක් මිනිසුන් අතර වීය. ඔවුන්ගේ මුහුණු ප්‍රසන්න බවෙන් පිරී ගොස් තිබුණි. තොරක් නැති සිනා හඬවල් අල්ලාප සල්ලාප බහුලවීය. ඒ අතර ඔවුන් තම අත්හි තිබූ දිගු හැඳිවලින් එකිනෙකාට සුප් පොවමින් උන්හ.

පීතර මෝසස් හා පූජකගේ කතාව මම මෙතකින් නතර කරමි. මන්ද දෙව්ලොව හා අපාය ගැන මේ කියවූ කතා කොටසින් ඔබට මනාව වැටහී ගිය හෙයිනි. දෙව්ලොවේ හා අපායේ ස්වභාවය හඳුනාගත් ඔබ ඔබේ සිතැඟි අනුව දැන් එහි පිවිසෙන්නේ කෙසේදැයි කල්පනා කරන බවද මම දනිමි. නොතැවෙන්න. 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි' යි අනාථනාථයාණන් වහන්සේ දේශනා කළ සේක. 'සිතින් දිලින්දෝ භාග්‍යවන්තයෝ' යි යේසුස් වහන්සේ කීහ.

රාම් චන්ද් හා සරත් චන්ද් ගජ මිතුරෝ වූහ. සම වයසේ වුන් මේ තරුණයින් දෙදෙනා විසූ ගම් දෙක වෙන්වුණේ මැදින් ගලාගිය සුවිශාල ගංගා රාජිනිය නිසාය. ජීවන වෘත්තියේම නියැලීම නිසා දෙදෙනා ළඟකදී එකිනෙකා හමු නොවූහ. රාම් ව්‍යාපාරිකයෙකු වූ අතර සරත් දක්ෂ ගොවියෙකු විය.

දිනක් වට්ටියක් තරමට පුරා හඳ පායා තිබූ මනරම් රැයෙක රාම් ගඟ හරහා ඔරුවකින් යමින් සිටියේය. ඒ සරත්ගේ ගමේ තිබූ විශාල සාදයකට සහභාගී වීම පිණිසයශ්‍රී ගඟ මැදදී ඔහුට මොගොඩ බලා පදින ඔරුවක් හමුවීය. ඔහු එහි හුන් මගියා දෙස බැලීය පුදුමයෙනුත් පුදුමයකි. එහි සිටියේ තම හිත මිතුරු සරත්ය. ඔරු නවත්වා දෙදෙනාම කථාවට වන්හ. 'සරත් මං ආවේ ඔයාලගෙ ගමට යන්නයි. මගේ තවත් යහළුවෙකු අද රෑ එහි ඉතා විශාල ප්‍රිය සාදයක් පවත්වනවා. මිනිහ මට කීවා ඔබේ තවත් යාළුවො ඉන්නවා නම් ඒ අයත් එක්කම සාදයට එන්න කියල. ඉතින් මට ඉන්න එකම යාළුව ඔයානෙ. මම ආවේ ඔයාත් අඬගසාගෙන ඒ සාදයට යන්න. දැන් ගොඩවන්න මා ඉන්න ඔරුවට. අපි සාදයට යමු අද හිතේ හැටියට සතුටු වන්න අපට පුළුවනි. එන්න මගේ ඔරුවට' රාම් කීය.

'ප්‍රිය මිතුර මේ ගැනත් අහන්න. මම මේ ආවෙ අද රාත්‍රි ඔයාලගෙ ගමේ කෙළවරේ ඇති කෝවිලට යන්නයි. අද එහි අයෝධ්‍යාවෙන් පැමිණි විශේෂ පූජකතුමකු පවත්වන භජන් පූජාවක් තියෙනවා. පූජාව අවසානයේ ප්‍රසාදම් ලබාදෙනවා. මා සිතාගෙනම ආවේ ඔබත් හමුවී ඔබත් එහි කැඳවාගෙන යන්නයි. නගින්න මා සිටින ඔරුවට අපි යමු කෝවිලේ පූජාවට'

කථාව මෙසේ වුවද දෙමිතුරන්ගෙන් එක් අයෙකු හෝ තමන් යන ගමන නවතා අනෙකා සමග යෑමට එකඟ නොවූහ. එයින් මිත්‍රදාමයට සුළු හෝ බාධාවක්ද නොවීය. එකිනෙකා පෙපෙනී යන තුරුම දෙඅත් වනමින් සුබපතා ගනිමින් දෙමිතුරෝ වෙන්ව තම තමන් යන ස්ථාන කරා ගියහ.

පසුදාට පහන් විය. ආගමික මෙහෙයකත් ප්‍රිය සාදයකත් නිදිවරා එලිවන තුරු වෙහෙස වුණ දෙමිතුරෝ ආපසු ගම් බිම් වලා යමින් සිටියහ. දෙදෙනොම ගඟේ ඔරු මත විය.

**42 වන පිටුව බලන්න**



# සුදර්ශිය විකිණේයිද?

කොළඹ බෞද්ධාලෝක මාවතේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව ඉදිරිපිට පිහිටා ඇති සිංහල සංස්කෘතික ආයතනය හෙවත් සුදර්ශිය ජපානයේ 'සසකාවා' සංවිධානයට විකුණා දැමීමට කටයුතු සකස් කර ඇති බව වාර්තා වේ.

සහන මිල ගණන් යටතේ නාට්‍ය ඇතුළු විවිධ කලා කටයුතුවල පුහුණු වීම් කිරීමට සහ කලා කරුවන්ට ඒකරාශී වීමට කොළඹ ඇති සුවිශේෂීම ස්ථානයක් ලෙස හැඳින්විය හැකි සුදර්ශී ආයතනයේ ඉතිහාසය වසර 62 ක පමණ දුරකට දිව යන්නකි. 1850 දශකයේදී කොළඹ ඉංග්‍රීසි පැළැන්තියට අභියෝගයක් ලෙස සිංහල සංස්කෘතිය ගොඩ නැගීම වෙනුවෙන් බිහි කෙරුණු මෙම ආයතනය සඳහා ඉඩම පරිත්‍යාග කොට ඇත්තේ නාලිනී රණසිංහ මහත්මිය විසිනි.

මෙම ඉඩම විකිණීමේ කටයුතු පසුගිය රජය සමයේදී සිදුකර ඇති බව පැවසෙන අතර එම අවස්ථාවේදී ජපන් සසකාව මධ්‍යස්ථානය සඳහා මෙන්ම චීන තානාපති කාර්යාල සඳහාද මෙම ඉඩම වෙන් කර දී ඇති බව ඒ පිළිබඳව ඇති ආරංචි මාර්ග සඳහන් කරයි. එහෙත් මේ වන විට චීන පිරිස මෙම ගනුදෙනුවෙන් බැහැර වී ඇති අතර ජපන් සසකාව ආයතනය වෙත මෙය ලබාදීමේ පියවර තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින බවත් වාර්තා වේ.

අදාළ ගොඩනැගිල්ල සහ ඉඩම විකුණා දැමීම සඳහා පසුගිය රජය සමයේ කැබිනට් පත්‍රිකාවක් අනුමත වී තිබුණත් එය එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා නීත්‍යනුකූල බලපත්‍රයක් නොවන බව මේ පිළිබඳව අදහස් දැක්වූ සිංහල සංස්කෘතික ආයතනයේ සභාපති ජීවන් කුමාරතුංග මහතා පවසයි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජීවන් කුමාරතුංග මහතා පැවසුවේ, මෙම සිදුවීමට ජපාන රජයේ කිසිදු සබඳතාවක් නොමැති බවත් සසකාවා ආයතනය ජපාන රජයට සම්බන්ධයක් නොමැති රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස කටයුතු කරන්නක් පමණක් බවත්ය.

මෙම ආයතනය සසකාවා වෙත විකිණීමට සකස් කර ඇති සියලුම කටයුතු නවතා දමා එම භූමිය නැවතත් දේශීය කලාකරුවන් වෙතම ලබා දීමට අවශ්‍ය පියවර වත්මන් ජනාධිපතිවරයා විසින් ගත යුතු බව ජීවන් කුමාරතුංග පවසයි.

ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු කලා කරුවන්ට ඒකරාශී වීමට ඇති මෙම භූමිය නැති වීම එම සියලුම ජාතීන්ට අයත් කලාකරුවන්ට සෘජුවම බලපාන්නක් නිසා ඊට එරෙහි වූ කලාකරුවන් සහ කලාවට ලැදි ජනතාව සුදර්ශිය රැක ගැනීම සඳහා විරෝධතා ව්‍යාපාරයක්ද ක්‍රියාත්මක කර තිබුණි. සුදර්ශිය ඉදිරිපිට කෙරුණු එම විරෝධතා ව්‍යාපාරය සඳහා කලාකරුවන් විශාල පිරිසක් මෙන්ම කලා කටයුතු හදාරන සිසු දරු දැරියන් සහ ගුරුවරුන්ද එක් වී සිටිනු දක්නට ලැබුණි.

# රේඛාවට මනමේට 60 යි !



මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'මනමේ' නාටකයට හා ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් සූරීන්ගේ 'රේඛාව' චිත්‍රපටයට වසර 60 ක් පිරීම නිමිත්තෙන් එම නිර්මාණයන්ට දායක වී දැනට සුජීවත්ව සිටින කලාකරුවන්ට උපහාර පිදීමක් පසුගියදා අරලියගහ මන්දිරයේදී අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

ටවර් හෝල් රඟහල පදනමේ වත්මන් සභාපතිවරයා ලෙස කටයුතු කරන රනිල් වික්‍රමසිංහ මහතාගේ අදහසකට අනුව ටවර් හෝල් පදනම විසින් මෙම උපහාර උළෙල සංවිධානය කොට තිබුණි.

මෙහිදී විශේෂතම සිදුවීම වූයේ රේඛාව චිත්‍රපටයේ අධ්‍යක්ෂ ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා වෙත අගමැතිවරයා අතින් විශේෂ සම්මානයක් පුද කිරීමයි. මේ වන විට 97 හැවිරිදි වියේ පසුවන ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා මෙම සම්මානය ලබාගත් ආකාරය දුටු කා තුළත් ඇති කළේ දැඩි සතුටකි.

රේඛාව චිත්‍රපටයට රංගනයෙන් දායකත්වය සැපයූ දැනට ජීවතුන් අතර සිටින අයිරාංගනී සේරසිංහ, මල්ලිකා පිලපිටිය, ඉන්ද්‍රානි සේනාරත්න, ආනන්ද වීරකෝන් (නිමල්ගේ චරිතය රඟ පෑ), විමලධර්ම දියසේන, ආතර් සිල්වා යන මහත්ම මහත්මීහුද මෙහිදී උපහාර සම්මානවලින් පුදනු ලැබුණි.

එසේම මනමේ වේදිකා නාට්‍යයට දායක වී මේ වන විට ජීවතුන් අතර සිටින නන්ද අබේවික්‍රම, හෙක්ටර් පීරිස්, ලයනල් ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන් වෙතද උපහාර සම්මාන පිරිනමනු ලැබුණි.

නිදහස් ජාතියක අනන්‍යතාව ඇතිවන්නේ පාලන ක්‍රමයෙන්, කලාවෙන් හා ආර්ථිකයෙන් බවත් මෙවැනි කලා නිර්මාණයන් දායක කිරීම සම්බන්ධයෙන් ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාටත් එදිරිවීර සරච්චන්ද්‍ර මහතාටත් කෘතඥතාව පළ කළ යුතු බවත් අග්‍රාමාත්‍යවරයා එහිදී පැවසීය. එසේම ශ්‍රී ලංකාවේ කලා කෙත තුළ ඓතිහාසික වටිනාකමකින් යුත් නිර්මාණ ද්වයක් වන මනමේ නාටකය සහ රේඛාව චිත්‍රපටය අනාගත පරපුර වෙනුවෙන් රැක ගැනීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සැකසීමට ටවර් හෝල් පදනමට භාර දී ඇති බවද අගමැතිවරයා ප්‍රකාශ කර තිබුණි.

මනමේ නාට්‍යයට සහ රේඛාව චිත්‍රපටයට 60 වසරක් පිරීම නිමිත්තෙන් නිර්මාණය කරන ලද සමරු ඵලකය විවෘත කිරීම මේ අවස්ථාවේදී අග්‍රාමාත්‍යවරයා අතින් සිදුකෙරුණු අතර මෙම සමරු ඵලකය එල්පින්ස්ටන් රඟහලේ ස්ථාපිත කිරීමට නියමිතව ඇත.

මනමේ නාට්‍යය මුලින්ම වේදිකාගත කෙරුණේ 1956 නොවැම්බර් 03 වන දින කොළඹ ලයනල් වෙන්ඩ්ට් රඟහලේදීය. එය සැමරීම වස් නොවැම්බර් 03 වන දින ලයනල් වෙන්ඩ්ට් රඟහලේදීම මනමේ වේදිකාගත කිරීමට මේ වන විට සියලු කටයුතු සූදානම් කර ඇත. මනමේ 60 වර්ෂ පූර්ණයට අනුග්‍රහයක් වශයෙන් එදින රඟ දැක්වෙන දර්ශනය සඳහා ලයනල් වෙන්ඩ්ට් රඟහල නොමිලේ ලබාදීමටද කටයුතු යොදා ඇත.

රේඛාව චිත්‍රපටය මුලින්ම තිරගත වූයේ 1956 දෙසැම්බර් 28 වන දිනයි. ඒ කොළඹ රීගල් සිනමා ශාලාවේදීය. එය සමරනු වස් දෙසැම්බර් මස 28 වන දින කොළඹ රීගල් සිනමාහලේදීම නැවතත් රේඛාව තිරගත කිරීමට සියලු කටයුතු යොදා ඇත. එදින රීගල් සිනමා ශාලාවේදී අජිත් ගලප්පත්ති විසින් රචනා කරන ලද 'රේඛාව සහ පනස් හයේ රේඛාව' නම් ග්‍රන්ථයද එළිදැක්වීමට නියමිතව ඇත.

එසේම මේ සියලු කටයුතුවලට සමගාමීව රීගල් සිනමා ශාලාව ආශ්‍රිත භූමිය 'සිනමා කලාපයක්' කිරීමටද මේ වන විට සැලසුම් සකස් කර ඇති බව සඳහන් වේ.

මෙම උපහාර සම්මාන උළෙලේදී අදහස් දැක්වූ ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ලයනල් ප්‍රනාන්දු මහතා පැවසුවේ අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත මනමේ සහ රේඛාව කලා නිර්මාණයන්ට දායක වූ කලාකරුවන්ට කොළඹ ජාතික රෝහලේ ගෙවන වාට්ටුවේ නොමිලේ ප්‍රතිකාර ලබා ගැනීමේ අවස්ථාව සලසා ඇති බවයි. එම කලාකරුවන්ගේ නාම ලේඛනය ජාතික රෝහලට මේ වන විට යවා ඇති බවද ඒ මහතා පවසා තිබුණි.

# 'උසාවිය නිහඬයි' වෙත උසාවි අවසරය !

ප්‍රසන්න විතානගේ විසින් අධ්‍යක්ෂණය කරන ලද 'උසාවිය නිහඬයි' චිත්‍රපටය මහජන ප්‍රදර්ශනයට ලක් කිරීම තහනම් කරමින් කොළඹ දිසා අධිකරණය විසින් පනවා තිබූ වාරණ නියෝගය ඉවත් කරගන්නා ලද අතර මේ වන විට එම චිත්‍රපටය ලංකාවේ තිරගත වෙමින් පවතී.

මෙම චිත්‍රපටය ප්‍රදර්ශනයට සූදානම්ව පවතිද්දී හිටපු විනිසුරුවරයකු වන ලෙනින් රත්නායක විසින් ගොනුකරනු ලැබූ පෙත්සමකට අනුව 'උසාවිය නිහඬයි' චිත්‍රපටය උසාවිය විසින්ම කරන ලද වාරණයකින් නිහඬ කරනු ලැබුණි.

එහිදී හිටපු විනිසුරුවරයා අධිකරණය හමුවේ පවසා සිටියේ අදාළ චිත්‍රපටය තිරගත කළහොත් තමාට මෙන්ම අධිකරණ පද්ධතියටද විශාල හානියක් සිදුවන බවයි. හිටපු විනිසුරුවරයා තවදුරටත් සිය පැමිණිල්ලෙන් කියා සිටියේ, මෙම චිත්‍රපටයේ වස්තු බීජය රැගත් කතාව 1999 දී ස්වර්ණවාහිනී නාලිකාව විසින් කරන ලද වැඩසටහනකින් විකාශනය වූවක් බවයි. තමාගේ වෘත්තීය ජීවිතය ගැන කරන ලද එම වැඩසටහන 'හෙළිදරව්ව' නම් වූ බවත් එම විකාශයට විරුද්ධව තමා විසින් ගොනු කළ පෙත්සමේ තීන්දුව ප්‍රකාශයට පත් කිරීමට තිබියදී එම වස්තු බීජයම රැගත් තවත් චිත්‍රපටයක් තිරගත කිරීමෙන් පෙර නඩුවට අගතියක් විය හැකි බවත් ඔහු පවසා ඇත.

මෙම පෙත්සම පිළිබඳව සලකා බැලූ අධිකරණය උසාවිය නිහඬයි චිත්‍රපටය අතුරු තහනමකට ලක් කරමින් ඔක්තෝබර් 05 වනදා වාරණ නියෝගයක් පනවනු ලැබුණි.

මෙම වාරණ නියෝගයට එරෙහිව චිත්‍රපටයේ අධ්‍යක්ෂ ප්‍රසන්න විතානගේ මහතා ඇතුළු පිරිසක් පසුගියදා (20 දා) කොළඹ දිසා අධිකරණය ඉදිරියේ කරුණු ඉදිරිපත් කළ අතර එහිදී එම පිරිස සඳහන් කර සිටියේ උසාවිය විසින් ලබාදුන් වාරණ නියෝගය නීතියට පටහැනි නිසා එම තහනම ඉවත් කරන ලෙසයි.

කරුණු විභාග කළ කොළඹ දිසා විනිසුරු එම්. යූ. ගුණවර්ධන මහතා අදාළ වාරණ නියෝගය අත්හිටුවීමට ඔක්තෝබර් 21 වන දින තීරණය කරනු ලැබුණි. නඩුවට අදාළ විරෝධතා ඇතොත් ලබන වසරේ ජනවාරි 19 වැනිදාට පෙර ඉදිරිපත් කරන ලෙසද දිසා විනිසුරුවරයා අදාළ පාර්ශ්ව වෙත දැනුම් දෙනු ලැබුණි. ලෙනින් රත්නායක හිටපු විනිසුරුවරයා මහව මහේස්ත්‍රාත් ලෙස සේවය කරමින් සිටියදී අධිකරණයේ විභාග වෙමින් පැවති නඩුවක සැකකරුවකුගේ බිරිඳ ගම්පොල ප්‍රදේශයේ තානායමකට කැඳවා දූෂණයට ලක් කළ බවටත් පසුව තම නිල කාමරය තුළදීද වෙනත් ස්ත්‍රියක් දූෂණය කළ බවටත් චෝදනා එල්ල වී තිබේ.

ප්‍රසන්න විතානගේ විසින් අධ්‍යක්ෂණය කරන ලද 'උසාවිය නිහඬයි' චිත්‍රපටයේ කතා තේමාව වී ඇත්තේද හිටපු විනිසුරු ලෙනින් රත්නායක විසින් සිය නීතිමය බලතල පාවිච්චි කරමින් සිදුකර ඇති මෙම අපරාධයි.

# නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය

දේශාන්තර සංස්කෘතික සහයෝගිතාව ගොඩනැගීම අරමුණ කරගත් සාක් රටවල නියෝජිතයන්ගේ රැස්වීම් පැවැත්වීමට කොළඹින් බැහැරව ඉදිකරනු ලබන 'සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය' ඉදිකිරීමේ කටයුතු මේ වන විට නිම වෙමින් පවතී. රුපියල් මිලියන 1637 ක වියදමක් දරමින් ඉදිකරනු ලබන මෙම මධ්‍යස්ථානය මාතර නාවිමනෙහි ඉදි කෙරෙයි.

විශාල සම්මන්ත්‍රණ ශාලාවක්ද, සිනමා මැදිරියක්ද, සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට පැමිණෙන නියෝජිතයන්ට හා කලාකරුවන්ට නවාතැන් ගැනීම සඳහා නේවාසිකාගාරයක්ද මෙම ඉදිකිරීම්වලට ඇතුළත්ව ඇති අතර මෙම මධ්‍යස්ථානයේ සියලු වැඩකටයුතු 2017 දෙසැම්බර් මාසය වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වේ.



# චුල්ල ධනුද්ධර ජාතකය හා මනමේ නාටකය

■ ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු

ජාතක කතාවකින් අපේක්ෂා කරන පරමාර්ථය චුල්ල ධනුද්දර ජාතක කතාවෙන් ඉටු වී ඇති අතර හුදී ජනයාගේ පහන් සංවේගය පිණිස මානව චින්තනයෙහි ඇති සුබාසුබ ගති ලක්ෂණයන් විවරණය කිරීමටත් ජාතක කතාකරුවා තත්කාලීන සමාජ තත්වය උපයෝගී කොටගෙන සාර්ථක චරිතයන් ගොඩනගයි. අංග සම්පූර්ණ කතාවක් පැවසීමත්, එමගින් උපදේශාත්මක ආදර්ශනයක් පාඨකයාට (ශ්‍රාවකයාට) සැපයීමත් ජාතක කතාවේ කාර්යභාරය විය. ධනුද්දර කුමරු සිප්සතර හදාරා තක්සලාවෙන් නික්මෙන මොහොතේ සම්ප්‍රදායානුකූලව ලැබුණ දිසාපාමොක් දියණිය තම චපල වූ පහත් චේතනාවන් ක්‍රියාත්මක කරවා වැදි රජු අතින් මරුමුවට පත් කරවන අයුරු ජාතක කතාවේ විස්තර කරනුයේ සමස්ත ස්ත්‍රී වර්ගයාම දෝෂ දර්ශනයට ලක්කරමිනි. එය බොහෝ කතා වස්තුවලින් කළ පරිදිම හේතු සාධකද සහිතවම ඉදිරිපත් කර ඇත.

නාට්‍යකරුවාගේ අභිලාශය වන්නේ ස්ත්‍රිය දෝෂ දර්ශනයට ලක්කිරීම හෝ කතාව තුළින් උපදේශයක් දීම හෝ නොව රසවින්දනාත්මක නිර්මාණයක් ඉදිරිපත් කිරීමයි. මිනිස් හැඟීම් පිළිබඳ අන්තගාමී පිළිවෙතක් අනුගමනය නොකොට තුලනාත්මක චෛතසික විභාග යක් කරමින් සිද්ධි ගවේෂණයක යෙදෙන නාට්‍යකරුවා, කිසිවෙකු දෝෂ දර්ශනයට ලක්කිරීමක් හෝ කිසිවකු පරමාදර්ශී කරවීමක් සිදුකොට නැත. මනමේ කුමරිය කුමරුන් සමග අතිනත ගත්තේ එවකට පැවති ප්‍රේමනීය අපේක්ෂාවක් මුදුන්පත් කරගනිමිනි. ඔවුන් දෙදෙනා අතර ප්‍රේමයක් පැවති බවට ජාතක කතාකරුවා කරුණු නොදක්වයි. එහි පරමාර්ථයට එවන් පසුබිමක් අවශ්‍ය නොවේ.

එදිරිවීර සරච්චන්ද්‍රයන් සිතා මතා කළ නිර්මාණයක් ලෙස මනමේ කුමරු හා කුමරියගේ ආදර කතාවත් නාට්‍යයට ඇතුළත් වේ. මනමේ කුමරු තක්සලාව අතහැර යාම මහත් සංවේගයක් ලෙස ප්‍රකාශ කරන්නේ එහෙයිනි.

දියණිය ඇදුරින්දු - රුව මාගේ සිතේ ඇන්දූ
රුසිරු එසුර ලන්දූ - දැඩි ආලේ ළයේ බැන්දූ
කෙළෙසේ අෑ හැර යම්දෝ - සරණේට කෙසේ ගම්දෝ

ඔවුන් දෙදෙනා අතර පැවති ආදරය වන මැද දී වැදිරජු සමග ඇතිවන සටන හා එහි ප්‍රතිඵලය කෙරෙහි සෘජු ලෙසට බලපෑමක් ඇති කරයි. කුමරිය රැක ගැනීමේ අභිලාෂයෙන් පෙළුණු මනමේද කුමරිය හිමිකර ගැනීමේ බලාපොරොත්තුවෙන් පෙළුණු වැදි රජුද දැවැන්ත සටනකට අවතීර්ණය වන්නේ කුමරිය කේන්ද්‍ර කොටගෙනය. ඇගේ අතෙහි තිබූ අසිපත වැදිරජු අතට පත්වීමේ අනුවේදනීය තත්ත්වය ජාතක කතාකරුවා හා නාට්‍යකරුවා දෘෂ්ටි කෝණයන් දෙකකින් බලා ඇති බව පැහැදිලි වේ.

මනමේ කුමරු සමග තනිවම සටන් වැදුණ වැදි රජු කෙරෙහි කුමරියගේ සිත උපන් අනුකම්පාව නාට්‍ය අවස්ථාවක් ලෙස දැකගත හැකිවන්නේ මෙලෙසිනි.

දිරියෙන් යුද කළ ඔබ සමගින්නේ
සෙනගින් පිහිටද නොම සොයමින්නේ
තනියෙන් සටනට සැරසී එමින්නේ
මෙකගින් ඇයි ඔහු ගෙල සිඳලන්නේ

ජාතක කතාකරුවා බලාපොරොත්තු වූ කුමරියගේ අතින් සොරදෙටු වෙතට අසිපත ලැබීම මෙම නාට්‍ය අවස්ථාව හා සම්බන්ධ වනුයේ මානව චින්තනයෙහි ගැඹුරු අධ්‍යායනයක්ද සමගිනි.

වැදි රජු නොමැරිය යුතු යැයි බිසව සිතනුයේ තම සැමියාට එරෙහි වීමක් ලෙස නොව අනුකම්පා සහගත සාධාරණ සංකල්පයක් ලෙසටය. තම සැමියාට එරෙහිව අසිපත මෙහෙයවන්නට මෙය කදිම අවස්ථාවක්දැයි ප්‍රේක්ෂකයා විසින් කුතුහලයෙන් යුතුව විමසිලිමත් වෙත්දී වැදි රජු ක්‍රියාත්මක වී අසිපත උදුරාගන්නා ආකාරය දර්ශනය වේ. වැද්දාගේ ස්ථානෝචිත ක්‍රියාශීලිත්වය හා බිසවගේ අවිනිශ්චිත සිතුවිලි ගැටුම සටන නිමාවට පසුබිම උදා කළේය.

මනමේ රජු මරුමුව වැටුණු අයුරු නරඹන ප්‍රේක්ෂකයා මනමේ බිසව පිළිබඳ ද්වේශයක් හෝ පිළිකුලක් ඇති කර ගැනීමට සමත් නොවේ. ජාතක කතාකරුවා එවැනි ස්වභාවයක් සිතා මතාම තම කතාවට ඇතුළත් කරයි.

කුමරියගේ වැළපීම තම සැමියා අහිමි වීමේ වේදනාවෙන්ම බව නාට්‍ය රචනයේදී සරත්චන්ද්‍රයන් තහවුරු කර ඇත.

මා පිය සැමියා මරුමුව වැටුණා
කිමද කළේ ඔබ මේ අපරාදේ
යහතින් සිටි ඔහු ඔබ ඇන මැරුවා
මේ ඔබ දෝසා මේ ඔබ දෝසා ....

තම විජිතය ආරක්ෂා කර ගැනීමේ වගකීම වැදි රජු අත පැවරී ඇති බැවින් සහ කුමරිය හිමි කර ගැනීමේ අභිලාශයෙන් පෙළුණු වැදි රජුගේ හදවත කුමරියගේ විලාපයෙන් තෙත් වූ බව, ඔහු ස්වකීය නිවැරැදි බව තහවුරු කිරීමට කුමරිය සමග කරන සංවාදයෙන් පැහැදිලිය. අවසානයේදි අන්සරණක් නොමැති වූ කුමරියට වැදි රජුගේ සරණ ලැබීම දෛවෝපගත සිදුවීමක් වුවද ප්‍රේමය වෙනුවෙන් පතිදම් රැකීමට හෝ සැමියා ගිය මග යාමට හෝ පුහුදුන් ගැහැණියක ලෙස මනමේ කුමරිය බැඳී සිටියා යැයි නාට්‍යකරුවා කිසිසේත් නොඅදහයි. චපල වූ ගැහැණියකට දිය යුතු දඬුවම ජාතක කතාව තුළින් නිර්දය ලෙස ලබාදුන්නද මානව චින්තනය පිළිබඳ කරන ලද තුලනාත්මක විග්‍රයට එවැන්නක් සිදුකිරීමේ වගකීම නාට්‍යකරුවා සතුව නොපැවතුණි.

ජාතක කතාකරුවා මනමේ කුමරිය කඩුව සොරදෙටුවා අතට දීම නිර්මාණය කර ඇති අතර නාට්‍යකරුවා එය වැදි රජු විසින් කඩුපත උදුරා ගැනීමක් ලෙස නිර්මාණය කරයි.

“වැදි රජු වහාම ඔහුගෙන් මිදි පැනවිත් බිසවගේ අතින් කඩුව ගෙන මනමේ රජුට ඇන ඔහු මරයි”

නාට්‍යකරුවාගේ පරමාර්ථය සාර්ථක කරගනු පිණිස එවැනි වෙනසක් සිදුකිරීමේදි ප්‍රේක්ෂක මනස තුළ මනමේ කුමරියගේ නිරවද්‍යතාවය පිළිබඳව පැහැදිලි සටහනක් වේ. එයින් නොනැවතුණ නාට්‍යකරුවා යුක්තිය හා ස්වාමි භක්තිය අතර අතරමං වූ අවිනිශ්චිත බවක් කුමරිය කෙරෙහි සම්බන්ධ කරයි.

‘දිරියෙන් යුදකළ ඔබ සමගින්නේ....’ කුමරිය එසේ විමසයි.

ස්වාමියා පිළිබඳව පවතින පති භක්තිය එසේම පවතිද්දි වැදි රජු පිළිබඳ දයානුකම්පාවක් දැක්වීම කුමරියගේ සිරිතේ පවතින යුක්තිගරුක බව ප්‍රකාශ කිරීමක් ලෙස කල්පනා කිරීමට බාධාවක් නොවන පරිදි ඊළඟ පරිච්ඡේදය නාට්‍යකරුවා නිර්මාණය කරයි. ස්වාමි භක්තියත්, යුක්ති ගරුක බවත් අතර අතරමං වන මනමේ කුමරියගේ ප්‍රමාදයෙන් ප්‍රයෝජන ගන්නා වැදි රජු එම තත්පර කීපය තුළ අසිපත උදුරාගෙන කුමරු මරා දමයි. එහිදී වැළපෙන මනමේ කුමරියගේ දුක්මුසු වාග් ප්‍රවාදයෙන් හද රැඳි පතිදම හා සෙනෙහස නොමදව පල කරයි.

නැති වුණි මට දැන් අන් කිසි සරණා
මෙතනම මරණා වෙනුනම් නියතා

මනමේ කුමරියගේ විලාපය වැදි රජුගේ අනුකම්පා සහගත සිතුවිලි අවදි කිරීමට සමත් වන්නේ තවදුරටත් කුමරියගේ අභ්‍යන්තරික මනස ගවේෂණය කරන්නට ප්‍රේක්ෂකයාට ඇරයුම් කරමිනි.

මම වෙමි ඔබ හට සැමදා සරණා....

යනුවෙන් වැදි රජු තම සිතැඟි පැවසීමේදී ක්ෂණයකුදු පමා නොවන කුමරිය මෙසේ කියයි.

නැත අන් සරණා ඔබ හැර මෙමටා
වනයේ විසුමා වන්නේ සැමදා

මනමේ කුමරිය වැදි රජුට අවනත වීම එසේ සටහන් වන්නේ නාට්‍යකරුවාගේ පරමාර්ථය මදක් පාලනය කරගත නොහැකි අයුරින් අන් මගකට යොමු වෙමිනි. වැදි රජුගේ සරණ ක්ෂණයකින් කුමරිය පැතීම නාට්‍යකරුවා විසින් නිර්මාණය කළ යුක්තිගරුක ආදරවන්තියගේ චරිතයට කැළලකි.

මෙහිදී අපි අවධානය යොමු කළ යුතු තවත් අවස්ථාවක් ලෙස මනමේ කුමරුන්ගේ හා රාජගුරු දියණියගේ පෙම් පුවත සාකච්ඡාවට ගත යුතුය. ජාතක කතාවේදී මනමේ කුමරු රාජගුරු දියණිය හා පෙමින් බැඳෙන්නේ නැත. විවාහය සිදුවන්නේ හුදෙක් ගුරුගෙ දර සිරිතක් ලෙස පමණි. එහෙත් දෙදෙනාගේ ප්‍රේමය සමස්ත නාට්‍ය පුරාම සුවිශේෂී චමත්කාරයක් පතුරුවයි. ඔවුන් දෙදෙනා ප්‍රේමයෙන් බැඳ තැබීම නාට්‍යකරුවා සිතා මතාම කළ දෙයකි. එම නිසා වැදි රජුට අවනත වීම ඉක්මනින් සිදුවීම පිළිබඳව කුමරිය කෙරෙහි ගැටලුවක් පැන නගී.

නාට්‍යයේදි පෙම් වදන් දොඩමින් වන සිරි නරඹමින් සිටිද්දී වැදි සෙනග පැමිණේ. ප්‍රීතිමත් අවස්ථාවට ප්‍රතිවිරුද්ධ වූ බියජනක අවස්ථාවක් වේදිකාවේ නිරූපනය වීම නාට්‍යෝචිත අවස්ථාවකි.

දැදුරු කර නිසලතා රුදුරු හඬ ගොරවමිනා
අඳුරු සෙවෙනේ සැගවී වැදි දන මතු වෙන්නා

නාට්‍යයේ ත්‍රාසය මතු කරවන අවස්ථාවක් මේ මොහොතේ වේදිකාවේ නිරූපණය වේ.

ගියා වැද්දෝ නොම විද්දෝ...

උන් යළි ආපසු නොයෙතැයි කල්පනා කරන කුමරු යළි එබඳු බියජනක මොහොතක් නොඑළඹෙනු ඇතැයි කල්පනා කරන අතර,

පසු එද්දෝ බිය නැද්දෝ...

යනුවෙන් කුමරිය කල්පනා කරයි. මෙම එකිනෙකට වෙනස් වූ සංකල්පනාවන් අතර උත්ප්‍රාස රසය වඩාත් වැඩි කරවන අවස්ථාවක යළි වැදි සෙනඟ වැදි රජු සමග පැමිණේ. ජාතක කතාවේදි කුමරා සිය ශක්තිය යොදා වැදි මුළ පරාජය කරයි. ඉන් අනතුරුවයි වැද්දා සමග සටන ඇතිවන්නේ . එම තත්වය මත කුමරා සතු එඩිතර බවක් හා වැද්දා සතු දුබලතාවක් ඉස්මතු කරගත හැකි වුවද නාට්‍යයේදී එම ඉඩ ප්‍රස්තාව වැදි රජු ලබාග නී. ඔහු නාට්‍යයේදි වැදි සෙනග ඉවත් කොට මනමේ හා තනිව සටන් කිරීමට පෙළඹීමෙන් එඩිතර, සාධාරණ සටන්කාමියෙකුගේ ස්වරූපයක් මවයි. එම පරිවර්තනය තුළ මනමේ කුමරියගේ මානසික තත්වය ජාතක කතා කරුවාගේ පරමාර්ථය වෙනස්කොට නාට්‍යකරුවාගේ පරමාර්ථයන් විනිවිද යන අයුරින් සකස් වේ.

‘මොහුගේ නම් භයංකර විලාශයක් නැත්තේය. කුමරුවනි, තේජස් පෙනුමින් ඔහු රජෙකු විය යුතුයැයි හඟිමි’

මුලින් කී කුමරියගේ මානසික පරිවර්තනය නාට්‍යකරුවා සිතාමතා ඇතුළත් නොකළත් වැදි රජුගේ චරිත විග්‍රහය තුළ මනමේ කුමරියගේ චරිත විපර්යාසයට අත්‍යවශ්‍ය සාධක නිර්මාණය වී ඇත. ඇය තවදුරටත් අසිපත ඉල්ලා සිටින සැමියාට යුක්තියේ සියපත දිගුකරයි.

තනියෙන් සටනට සැරසී එමින්නේ
මෙ කගින් ඇයි ඔහු ගෙල සිඳලන්නේ

එහෙත් ඇයගේ එම තර්කය කුමරා පසුවන මානසික තත්වය පසිඳලනු පිණිස ප්‍රමාණවත් නොවේ. නාට්‍යකරු මනමේ කුමරිය මගින් තවදුරටත් යුක්තියේ ශක්තිය මතු කරයි.

‘ඔහු ධෛර්යයෙන් හා උතුම් ගුණයෙන් යුත් කෙනෙකු බව පෙනේ. ඔහු මරා දැමීම නොවටින්නේය හිමියනි.

48 වන පිටුව බලන්න




■ එච්. දමිත් හෙට්ටිආරච්චි
සායනික මෝහන වෛද්‍ය

තරහාවෙන් සිදුවන්නේ යහපතකට වඩා අයහපතක් බව අපි කවුරුත් දනිමු. එහෙත් දැන දැනත් තරහ ඇතිකරගෙන පීඩාවට පත්වීම, තරහව සැබවින්ම මිනිස් සිතේ ඇතිවන ස්වාභාවික හැඟීමකි. අප අකමැති දෙයක් සිදුවන විට ඊට ප්‍රතිචාරයක් ලෙස තරහාව මතු වී එයි. සමහර අවස්ථාවලදී තරහව ආරක්ෂිත දෙයක් ලෙස ද හැඳින්වීමට පුළුවනශ්‍රී තරහාව මඟින් අපට අපහසු අවස්ථාවලට මුහුණ දීමට ශරීරය හැඩ ගස්වයි.

එහෙත් තරහාව පිළිබඳ ගැටලුව මෙයයි. තරහාව මතු වී එන තරම් ඉක්මනින් තරහව අපෙන් ඉවත් වී යන්නේ නැතශ්‍රී එය පාලනය කරගත නොහැකි වුවහොත් ජීවිත විනාශ වීම දක්වා දුර දිග යා හැකිය.

ඉක්මනින් කේන්ති යන අය හඳුන්වන්නේ 'කුකුල් කේන්තිකාරයන්' ලෙසය. එය ඔවුනට මෙන්ම සමාජයටද විශාල පීඩාවකි. ඇතැම් පුද්ගලයන්ට තරහාව පවතින්නේ කෙස් ගසක් තරම් ඈතිනි. එය මතුවීමට ගතවන්නේ ඇසිපිය හෙළන තරමේ නිමේෂයකි.

තරහාව ඇතිවීමට සාධාරණ හේතු තිබෙන බව බොහෝ අය පවසති. තරහාව අපට අවශ්‍ය වන අවස්ථා ඇති බවද සමහරු සිතති. තමාගේ දරුවන් වැරැදි ක්‍රියා කරන විට මවුපියන් තරමක් තදින් සිටිය යුතුය යන්න එක් අදහසකි. ආයතනයක ප්‍රධානියා සැරෙන් නොසිටියහොත් එහි සේවකයන් පාලනය කරගත නොහැකි යැයි ඇතැම් අය සිතති. එම කාරණයෙහි සත්‍යයක් නැත්තේද නොවේ. මවුපියන්, ගුරුවරුන් සහ පාලකයන්ට ඇතැම් විට තමා කෝපයට පත්වී සිටින බව පෙන්වීමට සිදුවෙයි. නමුත් එම කෝපය අදාළ කාර්යය සඳහා පමණක් විය යුතුය.

ඇතැම් අය එසේ නොකර තමාගේ අභ්‍යන්තර පීඩනය පිටකිරීම සඳහා තරහව යොදා ගනිති. තවත් අය මුලදී එසේ 'සාධාරණ' හේතුවකට තරහා ගත්තද පසුව තමාටම නොදැනී එය දුරදිග යන ආකාරය හඳුනා නොග නිති. ඉන්පසු එය පුරුද්දකට යයි. පසුව තමා නොදැනීම තමා තරහවේ ගොදුරක් බවට පත්වෙයි.

තරහවට වයස් බේදයක්, තරාතිරමක් හෝ උගත්කමක් බලපාන්නේ නැත. මා දන්නා විශේෂඥ වෛද්‍යවරයෙක් සිටියේය. ඔහු තමාගේ කාර්යාලය තරහින් පාලනය කළ අතර ඔහුව පාලනය කළේ ඔහුගේම තරහව විසිනි. තමා කරන කියන දෙය ද සුදුසුදැයි ඔහුම නොදත්තේයශ්‍රී ඒ නිසා ඔහු අනෙක් අය අතර බොහෝ අප්‍රසාදයට සහ පිළිකුලට භාජනය විය.

## නිතරම තරහෙන් සිටින අයකුට සිදුවන්නේ කුමක් ද?

පළමුවැනි කරුණ නම් ඔහුගේ මානසික සෞඛ්‍යය පිරිහී යාමයි. නිතර නිතර තරහ යන පුද්ගලයන් ඒ නිසාම මානසික පීඩනයට පත්වෙති. ඒ තත්ත්වය කාලයක් ගතවීමේදී මානසික අවපීඩනය හෝ විශාදය බවට හැරෙයි. මානසික පීඩනය නිසා සිරුරේ විවිධ තැන්වල විවිධ රෝග ලක්ෂණ ඇතිවෙයි. හිසරදය ඉන් ප්‍රධානය. එවැනි අයකුට හොඳ නින්දක් නොලැබෙයි. කොතරම් බෙහෙත් කළද එම රෝග සුව නොවෙයි. ඒ නිසා තවදුරටත් පීඩාවට පත්වෙයි.

දෙවැනි කරුණ නම් ශාරීරික රෝග බහුල වීමයි. අධික රුධිර පීඩනය, හදවත් රෝග, ශ්වසන රෝග, පිළිකා, ආහාර අජීර්ණය සහ අරුචිය ඒ අතර වෙයි.

ඊළඟ කාරණය නම් නිතර කිපෙන පුද්ගලයාගේ සමාජ සම්බන්ධතා බිඳ වැටීමයි. ඔහුට තම පවුල තුළ හෝ බාහිර සමාජය තුළ සාර්ථක ලෙස ජීවත් විය හැකිද? අනෙක් අය ඔහුට අප්‍රිය කරති. විහිළුවට හෝ කොන් කිරීමට ලක් කරති.

## තරහාව පාලනය කරන්නේ කෙසේ ද?

මෙය බොහෝ දෙනකු අසන වැදගත් ප්‍රශ්නයකි. ඒ සඳහා ක්‍රමවේද රාශියක් ඇත. ඒවා එක් එක් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙයි. කෙසේ වුවත් ඔබට සතුටුදායක ආරංචියක් පැවසිය හැකිය. එනම් තරහාව පාලනය කිරීම අප සිතන තරම් අපහසු දෙයක් නොවීමය.

**තරහාව පාලනය කිරීම අදියර දෙකකට කළ හැකිය.**

- තරහාව ඇතිවීම පාලනය කිරීම පළමු අදියරයි.
- දෙවන අදියර, තරහක් ඇතිවූ විට එයට සුදුසු ලෙස ප්‍රතිචාර දැක්වීමය.

ඔබ මෙහිදී ඉතා පැහැදිලිව අවබෝධ කරගත යුතු දෙයක් තිබේ. එනම් අප විසින් පාලනය කළ යුත්තේ තරහාව නොවේ. තරහාව ඇතිවීමයි. තරහක් ඇතිවුවාට පසුව එය පාලනය කරන්නට යාම සුදුසු නැත. එසේ කරන්නට ගියහොත් තරහව තවත් වැඩිවීමට හෝ ඒ නිසා ශරීරයේ විවිධ ලෙඩ රෝග ඇතිවීමට ඉඩ ඇත. එබැවින් ඇතිවූ තරහාව 'පාලනය කිරීම' නොව 'පිට කිරීම' සිදුකළ යුතුය. නමුත් තරහා පිටකළ යුත්තේ ඒ සඳහා සුදුසු අවස්ථාවේදීය. එමෙන්ම තමාටත් අනුන්ටත් අහිතකර නොවන ආකාරයටය.

තරහක් ඇතිවූ විට එය පිටකළ යුතු බව ඇත්තය. නමුත් අප තරහින් සිටින විට අපව පාලනය කරන්නේ තරහව විසිනි. එබැවින් ඒ අවස්ථාවේදී ප්‍රතිචාර දක්වන්නට යාම භයානකය. තරහාව ඉවත් වූ විට බුද්ධිය අපව හසුරුවයි. එවිට සුදුසු දෙයක් කල්පනා කර ප්‍රතිචාර දැක්විය හැකිය.

යම් දෙයක් නිසා තරහාව ඇතිවෙයි නම් තාවකාලිකව ඒ දෙයින් ඉවත් වී සිටීම සුදුසුයශ්‍රී කිසිවක් කතා නොකර සිටීමද සුදුසුය. කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා කාලය ගත වීමට ඉඩ හැරීම සුදුසුම ක්‍රමයකි.

බොහෝ දෙනෙකු පවසන්නේ තමාට වැඩියෙන්ම තරහා යන්නේ තමාගේ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව සමඟ බවයි. ඒ පිළිබඳව මා ඇසූ කතාවක් ඇත.

එක් භාර්යාවක් තම ස්වාමියාට නිතර දෙවේලේ දෝෂාරෝපණය කිරීමට පුරුදුව සිටියාය. දිනක් ඔහු කිසිවක් නොකියා ගෙදරින් පිටවී යම් වේලාවක් නගරයේ ඇවිද නැවතත් ගෙදරට පැමිණියේය. එවිට ඇය නැවතත් ඔහුට දෝෂාරෝපණය කිරීමට පටන්ගත්තාය. ඉන්පසු ඔහු නැවතත් නගරයට පැමිණ එදින රාත්‍රියේ තම ඥාති නිවසක නතර වී පසුවදා නැවත ගෙදර ගියේය. ඒ වන විට බිරියගේ තරහා අඩුවී තිබිණි. ඇය නැවතත් කිසිවක් නොකීවේ එසේ වුවහොත් තම ස්වාමියා බොහෝ කලකට තමාට දකින්නට නොලැබෙනු ඇතැයි සිතා විය හැකිය.

තරහවක් පැමිණි විට තමාගේ අවධානය සම්පූර්ණයෙන් වෙන අතකට යොමු කළ හැකි නම් එයද සුදුසු ක්‍රමයකි. තමා ප්‍රියකරන ක්‍රීඩාවක්, විනෝදාංශයක් හෝ ව්‍යායාමයක් කළ හැකිය. තමා ප්‍රිය කරන දෙයක් කළ විට මොළයේ ස්‍රාවය වන්නේ හිතකර රසායන ද්‍රව්‍යයි. එවිට සුව පහසුවක් ඇති වෙයි. තරහක් පැමිණි විට එකේ සිට දහයට සෙමින් ගණන් කරන්න යැයි පවසන්නේද මේ නිසාය. එසේ නැතිනම් දීර්ඝ හුස්ම ගනිමින් ඒ ගැන අවධානයෙන් සිටිය හැකිය.

තමාගේ පීඩාකාරී සිතුවිලි සහ තරහා මුසු හැඟීම් තමාට හිතවත් කෙනෙකුට පැවසීම හෝ ඒවා කොළයක ලියා තැබීම සිදුකළ හැකිය. එවිට සිත සැහැල්ලු වෙයි.

සාමාන්‍යයෙන්, ඔබට දැනෙන තරහව විනාඩි පහකට වඩා සිතේ නොපවතින්නේ නම් ඒ පිළිබඳව එතරම් කරදර විය යුතු නැත. තරහව විනාඩි පහකට වඩා පවතියි නම් එයට සුදුසු පරිදි ප්‍රතිචාර දැක්විය යුතුය.

ගුවන් විදුලියේ එක්තරා හාස්‍යජනක වැඩසටහනක තරහව පාලනය කිරීමේ ක්‍රම කීපයක් ඉදිරිපත් කළේය. තමාට තරහා ඇතිවන්නේ තමාගේ පෙම්වතා සමඟ නම් පෙම්වතිය සිතිය යුත්තේ ලෝකයෙහි ගැහැනු සහ පිරිමි අතර අනුපාතය තුනට එකක් පමණ වන බවය. එසේම තමන්ට තරහා යන්නේ තම පෙම්වතිය සමඟ නම් ඔහු සිතිය යුත්තේ ඇය යහළු කරගැනීමට පසුපසින් ගොස් තමා කොතරම් දුක් වින්දේද යන්නයි. ඇය සමඟ තරහා වී වෙනත් අයෙකු ගැන සිතන්නේ නම් නැවතත් තමාට ඉහත දුකම විඳීමට සිදුවිය හැකිය.

යම් සේවකයකුට තරහා ඇතිවන්නේ තමාගේ ස්වාමියා පිළිබඳව නම් ඔහු සිතිය යුත්තේ තම වැටුප ලැබී සුමාන දෙකක් තුනක් ගත වන විට තමා ජීවත් වන්නේ කෙසේද යන්නය. එවිට තමාගේ තරහා පාලනය වන බව එහි සඳහන් විය.

ඒවා හාස්‍යජනක කරුණු වුවද ඒවා තුළ වැදගත් පණිවිඩයක් ඇත. එනම් තරහාවක් ඇතිවූ විට කල්පනා කළ යුත්තේ එම තරහාව නිසා තමාට ඇතිවන අවාසි පිළිබඳවය. තරහින් තමාට වන වාසිවලට වඩා අවාසි බෙහෙවින් වැඩිය. බුද්ධිමත් පුද්ගලයන් තරහා නොග න්නේ ඒ නිසාය.

තරහා ඇතිවන අයට මෛත්‍රී භාවනාව පුරුදු කරන ලෙස උපදෙස් ලබාදෙන අවස්ථා තිබේ. එය ඉතා හොඳ දෙයකි. නමුත් මෛත්‍රී භාවනාව පුරුදු කළ යුත්තේ තරහා ඇතිවීමට පෙර සිටය. එනම් තමාට ඉදිරි ජීවිතයේදී විවිධ අවස්ථාවලදී තරහාවල් ඇතිවිය හැකි බැවින් කලින් සිට ඊට සූදානම් වීමක් ලෙස භාවනාව වැඩිය යුතුය. යම් අයකු අධික ලෙස තරහින් සිටින විට භාවනා කරන්නට යැයි කීම වැරැදි උපදෙසකි.

මෝහනය මඟින්ද තරහා ඇතිවීම සාර්ථකව පාලනය කළ හැකිය. ඉතා කුඩා සිදුවීමකට වුවද ඇතැම් විට අපට අනවශ්‍ය පරිදි තරහා යන බව ඔබට හැඟී තිබේද? එයට හේතුව අපගේ යටි සිතේ පවතින අධික තරහාවයි. යටි සිතේ පවතින එම තරහාව අපට මතුපිටින් නොපෙනෙයි. එය ඉවත් කිරීමට සුදුසුම ක්‍රමය මෝහන චිකිත්සාවයි.

තරහාව යළි ඇති නොවන පරිදි නැති කිරීමට නම් එයට බලපාන සැබෑ හේතු සොයා බලා ඒවා ඉවත් කළ යුතුය. එම හේතු පවතින්නේ තමා තුළම මිස බාහිර ලෝකයෙහි නොවේ. තමාට තරහා ඇතිවීම පිළිබඳව බාහිර ලෝකයට චෝදනා එල්ල කළාට එයින් වැඩක් නැත. අප කිසි කෙනෙකුට අපට අවශ්‍ය පරිදි ලෝකය වෙනස්කර එමඟින් තමාට තරහා ඇතිවීම නැවැත්වීම කළ නොහැකිය. අපට කළ හැක්කේ අප සිතන ආකාරය වෙනස් කර ගැනීමයි. මේ ලෝකයෙහි තරහාව ජයගත් සෑම මිනිසෙකුම කර ඇත්තේ එයයි.




# තිබහට වතුර

■ **ඉන්දීය ලේඛක ප්‍රේම්චන්ද්ගේ**
The Takur's Well කෙටි කතාවේ පරිවර්තනයකිග
පරිවර්තනය - ඩී. එම්. රණවීර

ජෝකු, සෙම්බුව කටට ළං කළා. වතුර ගඳයි. ඔහු ගංගිට කිව්වා.

"මේ මොන වතුරක්ද? මේ වතුර බොන්ඩ බෑ. මගෙ උගුර කට වේලිලා. උඹ මට බොන්ඩ දුන්නේ පල්වෙච්ච වතුර..."

සෑම සැන්දෑවකම ගංගි වතුර පුරවා තැබුවා. ළිඳ තිබුණෙ ගොඩක් ඈත. ඒ හින්දා දවසට දෙතුන් සැරයක් එහි යෑම අමාරු කටයුත්තක්. ඇය මේ වතුර ගෙනාවෙ ඊයේ. එතකොට නම් මේ වතුරෙන් ගඳක් ආවෙ නෑ. දැන් වතුර ගඳ වෙන්නෙ කොහොමද? ඇය සෙම්බුව ගෙන නහයට ළං කළා. ඇත්ත නේන්නම්. වතුර ගඳයි. ආයෙ දෙකක් නෑ මොකෙක් හරි සතෙක් ළිඳට වැටිලා මැරෙන්නට ඇති. දැන් ඉතිං වතුර ගෙනෙන්නේ කොහෙන්ද? අනේ මන්දා.

ටාකූර් ගේ ළිඳට යෑමට ඇයට අවසර නැහැ. වෙන කොහේ හරි තියෙන ළිඳකට මේ වෙලාවෙ ගියොත් මිනිස්සු ඇයට මොනවා නොකියයිද? ගමේ එහා කෙළවරේ කඩේ මුදලාලිගේ ගෙදර නම් ළිඳක් තියෙනවා. නමුත් ඒකෙන් වතුර ටිකක් ඇද ගන්නට ඔවුන් ඇයට ඉඩ දෙන්නේ නැහැ. ඇය වැනි මිනිස්සුන්ට වතුර ටිකක් ගත හැකි ළිඳක් ගමේ අහළක නැත.

ජෝකු ලෙඩින් වැටී දින කීපයක් ගත වී ඇත. ටික වේලාවක් පිපාසය ඉවසා ගෙන සිටි ඔහු, "මට හොඳටම වතුර තිබහයි දිව ගිලෙන්ට යනවා. අනේ මට වතුර ටිකක් දියං. මම නහය මිරිකාගෙන හරි ඩිංගක් බොන්නං...."

ගංගි, සෙම්බුව ඔහු අසල තැබුවා. ගඳ ගහන පල් වතුර බීලා ලෙඩේ හොඳටම වැඩි වෙයිශ්‍රී ඇය දන්නේ එපමණිශ්‍රී නමුත් වතුර උණුකර බීම වඩාත් පරිස්සම් බව ඇය දැන සිටියේ නැත. ඇය කිව්වේ, "කොහොමද මේ වතුර බොන්නෙ? කව්ද දන්නෙ මොන වගේ සතෙක් ළිඳට වැටිල මැරුණද කියලා. මම වෙන ළිඳකින් වතුර ටිකක් හොයාගෙන එන්නම්....."

විමතියට පත් ජෝකු ඇස් දල්වා ඇය දෙස බලා සිටියා.

"මේ අවේලාවෙ කොහෙන් වතුර ගේන්ඩද?"

"ටාකූර්ටයි මුදලාලිටයි ළිං තියෙනවනෙ. ඒ අය මට වතුර ටිකක් ගන්ඩ නොදී ඉන්න එකක් නැහැ"

"උඹට නම් ආපහු එන්ඩ වෙන්නෙ අත පය කඩාගෙන තමයි. ඕං මං කිව්ව. මෙන්න මෙහාට වෙලා නිකං හිටපං. බ්‍රාහ්මණයො උඹට සාප කරයි. ටාකූර් උඹට කෙව්ට පාර දෙයි. සල්ලි පොලියට ණයට දීලා ගිනි කන මුදලාලි එකට පහක් ගනියි. අපි වගේ මිනිස්සු මොන කරදරේක වැටිල හිටියත් අනුකම්පාවක් දක්වල, උදව්වක් පදව්වක් කරන එක්කෙනෙක් මේ ගමේ ඉන්නවද? අපි මැරුණත් ගෙයි දොරකඩට ඇවිල්ල ඇහැක් ඇරල බලන කෙනෙක් ඉන්නවද? එහෙව් එකේ ඒ මිනිස්සු උඹට වතුර ටිකක් ළිඳකින් ඇදගන්ඩ ඉඩ දෙයි කියල හිතනවද?"

ඔහොම තමයි ගමේ මිනිස්සුන්ගෙ හැටි. ඒක එහෙම නොවේ කියල ගංගි නොදන්නවා නොවේශ්‍රී ඒ වුණාට ගඳ ගහන පල් වතුර බොනකං බලා ඉන්ට පුළුවනෑ.

වෙලාව රෑ නමයට ඇති. උදේ හිට රෑ වෙනකං කුඹුරුවල වෙහෙස මහන්සි වී වැඩ කරපු සියලු දෙනා හරියට තලා දැම්මා වගේ තද නින්දේය. නමුත් පස් හය දෙනෙක් වල්පල් දෙඩීම සඳහා ටාකූර්ගේ ගෙදරට එකතු වී සිටියා. මේ දිනවල කුඹුරු වැඩ ගැන කතා බහ ඇතිවුණේ නැහැ. මේ දිනවල කතාබහට ලක්වුණ ප්‍රධාන මාතෘකාව වූයේ උසාවියේදී වුණ සිදුවීම් සම්බන්ධ එක එක්කෙනාගේ දස්ස පස්ස කම් ගැනයි. පළාතේ පොලිස් ප්‍රධානියාට පගාව දීලා. තමාට විරුද්ධව පවරා තිබූ නඩුවෙන් කිසිම දඩයක්, දඬුවමක් නැතිව නිදහස් වෙන්නට තරම් ටාකූර් මොන තරම් දක්ෂයෙක්ද හැබෑට. ඒ විතරක් නං මදෑ. වැදගත් නඩුවක, නඩු පයිල් එක එහෙම පිටින්ම තමන් අතට ගන්ඩ ටාකූර් දැම්ම කපටි සූත්තරේ කොහොමද? නඩුකාරයයි, උසාවියෙ ලියන්නයි දෙන්නම කියල තිබුණෙ, ඒ නඩුවෙ කොපියක් නම් කොහොමටවත් ගන්න බැරි වගක්ලු. එක්කෙනෙක් සීයක් ඉල්ලුවලු. අනෙක් එක්කෙනා පනහක්. ඒ වුණාට සත පහක්වත් නොදී නඩු කොපිය ටාකූර්ගෙ අතට ඉගිල්ලිල ආව. "ඒ වගේ වැඩ කරන්ඩ ක්‍රම සහ විදි තියෙනවා. උඹල දැනගනිල්ලා"

ටාකූර්ගෙ ළිඳෙන් වතුර ටිකක් ගන්ඩ හිතාගෙන, ගංගි මේ වෙලාවෙ එබිකං කර කර ටාකූර්ගෙ වත්ත ළඟට ඇවිත් හිටියා.

අසලින් දල්වා තිබූ තෙල් පහනක මඳ එළිය ළිඳ දිහාවට යාංතං වැටී තිබුණා. ගංගි තාප්පයකට මුවා වෙලා සුදුසු වෙලාව එනකං බලා හිටියා. ගමේ අනිත් හුඟ දෙනෙක් වතුර බීවේ මේ ළිඳෙන්. ඇය වැනි අවාසනාවන්ත කීප දෙනෙකුට මේ ළිඳෙන් වතුර පනිට්ටුවක් ඇද ගැනීම තහනම් වෙලයි තිබුණෙ.

ආත්මානුකම්පාවෙන් වේදනාවට පත් ඇගේ පපු කැනති, මේ වැට කඩොලු, සීමා බන්ධන, තහංචි ගැන මුර ගාන්නට වුණා. අනික් අය උසස් යැයි සැලකෙත්දී ඇය විතරක් පහත් ඇයි? ඔවුන් කරේ පූණ නූලක් දාගෙන ඉන්න හින්දද? උන්ගෙන් එකෙක් ඉන්නවද පහත් නීච වැඩ නොකරන? ඔවුන් හොරකං කරනවා. වංචා කරනවා. උසාවියේදී පවා බොරු කියනවා. එළුවන් මේච්චල් කරගෙන යන්තම් දවස ගැට ගහ ගන්නා දුප්පත් වේලූගෙන්, ටාකූර් එළුවෙක් හොරකම් කළා. එදා රෑම සතාව මස්කරගෙන කෑවා.



උසාවියේදී බොරු කීවා. ගමේ පූජකයගේ ගෙදර, ඔවුන් අවුරුද්දෙ දොළොස් මහේම සූදු කෙළිනවා. මුදලාලි එළඟිතෙල්වලට පොල්තෙල් කලවං කරල විකුණනවා. මේ අය ගමේ මිනිස්සුන්ගෙන් පුළුවන් තරම් වැඩ ගන්නවා. දෙන්නෙ සොච්චම් ගාණක්. ඒකෙන් ජීවත් වෙනවා තියා ලෙවකන්ඩවත් පුළුවනෑ. ඔන්න ඔහොමයි ඔවුන් උසස් වෙලා ඉන්නෙ. බලපුළුවන්කාරයො වෙලා ඉන්නෙ. මේව නිකං වචනෙට විතරක් සීමා වෙච්ච දේවල්නෙ. නෑ. ගංගි හිතුවා. අපි උන් වගේ හොඳ අයයි කිය කියා ගම වටේ ඇවිදින්නෙ නෑනෙ. ගංගි ගෙදරින් එළියට බැහැල යනකොට ඔවුන් ඈ දෙස බැලුවේ කාම රාගයෙන් දැල්වුණ දෑස්වලින්. ඇය දෙස බැලූ හැම එකාම එහෙමයි. නමුත් ඔවුන් පුරසාරම් දෙඩුවෙ ඔවුන් තරම් හොඳ වැදගත් අය වෙන කොහේවත් නෑ කියලා.

ඇයට ඇහුණා මිනිසුන් කීපදෙනෙක් ළිඳ දිහාවට එන සද්දෙ. ඇගේ පපුව ගැහෙන්ඩ පටන් ගත්තෙ හරියට දෙමෝලෙන් වී කොටනව වගේ. කාගෙ හරි ඇහැ ගැහුණොත් ඉතිං මොන යකෙක්වත් නෑ ඇයව බේරා ගන්ඩ. ඈට සිද්ධ වන්නෙ උන් එකෙකුගෙ නිහීන පා පහරකට ලක් වන්නට. බාල්දියයි කඹයයි කිහිලි ගසාගත් ඇය කළුවරේම හීන් සැරේ රිංගලා රිංගලා ගිහින් ගහකට මුවා වුණා. කවදද මේ මිනිස්සුන්ගෙන් කාට හරි අනුකම්පාවක් ලැබෙන්නෙ. තමන්ගේ කුඹුරේ වැඩ කරන්ඩයි කියල බල කළහම, ඒක බෑ යි කිව්ව එම කාරණාවට, ඔවුන් මහගුට තඩිබෑවෙ හරියට තිරිසනෙකුට වගේ. මාස ගණනක් යනකං මහගු කෙළ ගහන කොට කටින් ලේ පිටවුණා. මේ වගේ වැඩ හින්ද මිනිස්සු හිතන්නෙ ඔවුන් අනෙක් අයට වඩා උසස් කියල

ගෑනු දෙන්නෙක් වතුර ගෙනියන්ඩ ළිඳට ආවා. කදේට වැටුණ ඔවුන්ගෙන් එකියක්.

"ඒ ගොල්ලො එහාට වෙලා කකා බිබී ඉඳගෙන අපට කියනව වතුර ගෙනෙල්ල කියල. කොච්චර වතුර ඇද්දත් වැඩියෙන් එක සත පහක් දෙනවද?"

"මහංන්සි අරින්ඩ කියල අපි ඩිංගක්වත් ඉඳගෙන හිටියොත් පිරිමින්ට ඒ ගැන තියෙන්නෙ හරිම රුදාවක්නෙ. ඒ අය හිතන්නෙන් අපි නිකං ඔහේ ඉඳගෙන ඉන්නව කියල"

"ඒක නං ඇත්ත තමයි. උඹ කිසි දවසක දැකල තියෙනවද උන්ට වතුර ඕන වුණහම ළිඳ ළඟට ඇවිත් එක වතුර ජෝගුවක් වත් අරගන යනව. උන් අපට අණ කරන්නෙ හරියට අපි වහල්ලුයි කියල හිතාගෙන"

"ඉතිං උඹ වහලියක් නොවෙයි නං වෙන කවුද? උඹ සුමේ කරන්නෙ කන්ඩ බත් කටකුයි, අඳින්ට වස්තරේකුයි, තව ඔය රුපියල පහක් හයක් ලැබෙන එකටනෙ. උඹ මායං දංල වැඩිපුර කීයක්වත් ගහගත්තෙ නැත්තං ඔයිට වැඩිය වෙන මොනවද?. ඒකත් උන් දෙන්නෙ හරියට ඇඟෙන් ඇටයක් යනව වගේ. මෙහෙම කඹුරන්නෙ වහලියො නැත්තං වෙන මොක්කුද?"

"මට ලජ්ජ කරන්ඩ එපා අක්කෙ. මේ සුම්මක්කරේ ඔක්කොම කරන්නෙ පණ කෙන්ද රැක ගන්ඩනෙ. මේ කරන වැඩ කන්දරාව වෙන අයට කරල දුන්න නං මට හොඳට සලකාවි. මීට වඩා ලේසියෙන් ඉන්ඩත් තිබුණ එහෙනං. මේ වැඩවලින් හෙම්බත් වෙලා අපි මැරිල වැටුණත් මෙහෙ ඉන්න එකෙක්වත් ඇහැක් ඇරල බලයිද? අපිටම දොස් කියනව මිසක්"

කළගෙඩිවලට වතුර පුරවා ගත් ගැහැනු දෙන්නා ආපසු ගියා. ගංගි හැංගිලා හිටපු ගහ අස්සෙන් එළියට ඇවිත් හීං සැරේ ළිඳට කිට්ටු කෙරුවා. වල්පල් කතා කරන්ඩ ඇවිල්ල හිටිය මිනිස්සු පිට වී ගොසින්. දොර වසා දැමූ ටාකූර් නිදා ගැනීමට ගෙයි ඇතුළට ගියා. ගංගි සැනසුම් සුසුමක් හෙළුවා. වතුර ඩිංගක් ගන්න හොඳම වෙලාව. රාස්සයාගෙන් මී පැණි ටිකක් හොරෙන් ගන්ඩ ගිය කුමාරයාත් ගියෙ බොහොම පරිස්සමින්ලුනෙ. ගංගි ඇඟිලි උඩින් අඩිය අඩිය තියමින් ළිං බැම්ම වෙත ළං වුණා. මෙවැනි ජයග්‍රාහී හැඟීමක් ඇයට කවදාවත් ඇතිවෙලා නැහැ.

ගංගි කඹේ බොලෙක්කෙට දාල, ළිඳෙන් වතුර බාල්දියක් ඇද ගැනීමට සැරසුනේ හරියට රාත්‍රියකදී සොල්දාදුවෙක් සතුරු බලකොටුවකට බහිනව වගේ. ඒ අතරතුර වටින් පිටින් කවුරු හරි ඒ දැයි ඔලුව හරව හරවා බැලූවා. අහුවුණොත් නං ඉඳල ඉවරයි. ආයෙ කිසිම අනුකම්පාවක් නෑ. අන්තිමේදී දෙවියන්ගෙන් පිහිට ඉල්ලමින් හිතට දහිරිය ඇරං බාල්දිය ළිඳ ඇතුළට පාත් කළා. හෙමින් හෙමින් බාල්දිය වතුරෙන් පිරුණා. කිසිම සද්දයක් බද්දයක් නෑ. ගංගි සියලු වැර යොදා බාල්දිය ඉහළට ඇද්දා. බාල්දිය ළිං බැම්මෙ කට මට්ටමට පැමිණි පසු ඇය එය ඔසවා ළිං බැම්ම උඩින් තැබීමට උත්සහ කළා. හැඩි දැඩි අත් තියෙන කෙනෙකුට වුණත් ඒක එතරම් ලේසියෙන් කරන්නට බැරි දෙයක්. ඇය බාල්දිය අල්ලා ළිං බැම්ම උඩින් තැබීමට හැදුවා විතරයි. කන කීරි ගැහෙන සද්දෙන් ටාකූර්ගෙ ගෙදර දොර ඇරුණා. දැන් නමං ඉතිං කොටි කටෙන් ගැලවිල්ලක් වෙන්නෙ නැහැ.

ඇගේ අතින් කඹය අතෑරුණා. හඬ නගාගෙන බාල්දිය ළිඳ ඇතුළට වැටුණා. ඊට පස්සෙ කඹය. කුබුහ්.... කුබුහ්..... කියා බාල්දිය වතුරේ ගිලෙන සද්දෙ ඇහුණා.

"කවුද ඔය..... කවුද ඔය......." යැයි මොරදීගෙන ටාකූර් ළිං දිහාට දුවගෙන ආවා. ළිං පඩියෙන් පැන්න ගංගි පණ එපා කියා දිව්වා. පුළුවන් තරම් හයියෙන් දිව්වා.

ගංගි හතිමුණින් දාගෙන ගෙදර එනකොට, ජෝකු ගඳ ගහන පල් වතුර සෙම්බුව කටේ තියාගෙන හිටියා.

# ගොණා තණ හොයා තන කයිද!

■ කරුණාදාස සූරියආරච්චි

ජයකොඩි මහත්තයා සිටියේ ගම්පහ බණ්ඩාරවත්ත ප්‍රාථමික පාඨශාලාවේය. එකල මං එහි හතරවැනි කැලෑසියේ ඉගෙනගන්නවාය. පංතිය බාරව තිබුණේ ජයකොඩි මහත්තයාටය. ජයකොඩි මහත්තයා ආරිය සිංහල සූටි කාරයෙක්ය. ආවේ බයිසිකලයෙන්ය. මෝටර් සයිකලයෙන් නෙමේය. පාගල් එකෙන්ය. දැන් නම් පාගල් එකෙන් එන ඉස්කෝලෙ මහත්තයෙක් දකින්නට නොලැබෙන තරම්ය.

මේ කියන දවසේ ජයකොඩි මහත්තයා අපට දීලා තිබුණේ 'අම්මා' ය. ඒ කියන්නේ 'අම්මා' ගැන රචනාවක් ලියන්නටය.

පුංචි සන්දියේ ඉඳලාම මගේ රචනා නරකම නැතිය. ජයකොඩි මහත්තයා කාටත් ඇහෙන්ට පන්තියේ කියවනවාය. එදත් ජයකොඩි මහත්තයා මගෙන් රචනා ලියන පොත ඉල්ලාගන්ට යෙදුණාය. ගත්ත ගමන් ඒක කියවන්ඩ පටන් ගත්තේ නැතුවාය. මට කතා කෙරුවාය. ටිකක් වෙන්ට සුද්ධ කළ භාෂාවෙන්ය.

"මෙහාට වරෙං..."

එහෙම කියලා අතින් නොව කන්කෙටියෙන් අල්ලා ගන්ට යෙදුණාය.

"යකෝ භාෂාවට ගරු කරලා නෙමෙයි අම්මට ගරු කරලා හරියට මයන්න ලියාපිය ගැටේ දාලා"

එහෙම කියලා නතර වුණේ නැතිය. කන්කෙටියෙන් අල්ලලා හොල්ලලා හොල්ලලා කළුලෑල්ල පැත්තට තල්ලු කෙරුවාය. මගේ අඩසඳ නළල බොහොම සැරේට කළුලෑල්ලේ හැප්පිලා නැවතුණායශ්‍රී ඒ කාලයේ ඉස්කෝල කළුලෑලි තිබුණේ ලී රාමුවල, ලී ඇණවලින් රඳවා තබාලාය.

මගේ නළල හැපෙනවාත් සමඟම ඇණවලින් ගිලිහී ගිහිල්ලා කළු ලෑල්ල කකුල උඩ වැටෙන්ට යෙදුණාය. ඉහළින් ගිනි පිටවුණෝය. පහළින් මුත්තරා ගිහිල්ලාය. නළලේ දොඹ ගෙඩියක තරම ගෙඩියක්ය.

ජයකොඩි මහත්තයා ආරිය සූටි සාක්කුවෙන් ලේන්සුවක් ගෙන ගුලිකොට කටට තද කොට පිඹලා රත්කරගෙන තුන් හතර විඩයක්ම දොඹ ගෙඩිය මත තබා තෙරපුවාය. එහෙම වුණා කියලා මගේ නළල අතගාලා ගෙදර යන්ට ඇරියේ නැතුවාය. ඉස්කෝලෙන් පස්සෙත් තබාග න්ඩ යෙදුණාය.

"ලියාපං මයන්න පිටුවක් පිරෙන්ඩ" එහෙම නියෝගයක්ද දුන්නාය. මං දොඹ ගෙඩිය අතගාමින් මයනු ලිව්වෙමිය. ලියා අහවර වූ පසු පිටුව පිරෙන්ට ලොකු හරියක් දමා පත්තර කෑල්ලක ඔතලා තිබුණු සීනි බනිසක් මට දික්කරන්ට යෙදුණාය.

"ගනිං.. කාපං.. කාල වතුර ටිකක් බීලා ගෙදර පලයන්.. ගිහින් කියාපං මයන්න වැරදියට ලියලා තියාගත්ත කියලා. අම්මට කියල නළල උණුඅළු පොට්ටනියකින් තවා ගනිං.. හෙට එනකොට අම්මා කියලා පිටුවක් ලියාගෙන වරෙං"

එහෙම අවවාද අනුශාසනා දීලා ජයකොඩි මහත්තයා පාගල් එකෙන් උඩතුත්තිරිපිටිය බලා යාමට යෙදුණාය.

ඒ කාලයේ ගුරුවරු එහෙමය. ලෝබ නැතුව දණගහලා වඳින්ට පුළුවන්යශ්‍රී අකුරක ගැටයක් වෙනුවෙන් ඒ තරමට මහන්සි වුණාය.

ඉස්කෝල මහත්තුරු, සර්ලා, ටීචර්ලා, මැඩම්ලා සිය ගණනක් මට උගන්නලා තිබෙනවාය. ඒත් ඉස්කෝලෙ ගිය කාලය සිහිපත් වෙනකොට මට මතක් වෙන්නේ ජයකොඩි මහත්තයාය. අදටත් මයන්න ලියනකොට ජයකොඩි මහත්තයා පිටිපස්සෙන් ඉඳගෙන කරට උඩින් බලාගෙන ඉන්නවා කියලා හිතෙනවාය. එහෙම වෙන්ට විදියක් නැතිය. ඒ උත්තමයා සිටින්නේ නිච්චියටම දිව්‍යලෝකයේය. මයන්නේ ගැටය විතරක් නෙමේය. දොඹගෙඩියක් අතට ගන්නා විටත් සිහිවෙන්නේ ජයකොඩි මහත්තයාය.

ඒ කාලයේ එහෙම කියලා දුන්නාට මේ කාලයේ කවුරුත් ඕවා ගණන් ගන්නේ නැතිය.

'බාලිකාවියන්..' කියලා සිංදුවකුත් ඇහෙන්ට යෙදුණාය. 'බාලිකාවන්' මිසක 'බාලිකාවියන්' කියලා වචනයක් නැහැ කියලා මහාචාර්ය මට්ටමේ මතයක්ද ඉදිරිපත් වුණා මතකය. ඒ වුණාට ඉතින් ජේ. ආර්. ගේ භාෂාවෙන් කියනවා නම් "නොදන්නා කොමට කොරන වැරදි ගැන වැඩි දුර හිතන්ට වුවමනා කොරන්නේ නැත" කියලා අත පිහදාගන්ටත් පුළුවන්ය.

එහෙම කිව්වාට ඔය භාෂාවේ නිවැරැදි අක්ෂර වින්‍යාසය කියාදෙන්ට ගිහිල්ලා සමහර ඉස්කෝල මහත්තැන්ලාට හරි අපූරු දේවලට මුහුණ දෙන්ට වෙලා තියෙනවා කියලාත් කියනවාය.

භාෂාව සහ අක්ෂර වින්‍යාසය එහෙම ගැන මහා දැනුමක් ඇති ඉස්කෝල මහත්තයෙක් හද්දා වන්නියේ දුෂ්කර ඉස්කෝලයකට යන්ට යෙදුණාය. ඒ දඬුවම් මාරුවක් වශයෙන්ය.

දඬුවම මොනවා වුණත් දරුවන්ට නිවැරැදි දේ උගන්නන්ට ඕනෑ කියලා හිතලා සිංහල පාඩම පටන්ගන්ට යෙදුණාය.

'ගොනා තන කයි'

ඉස්කෝල මහත්තයා කළුලෑල්ලේ ලොකුවට එහෙම ලියලා පන්තිය දෙස බැලුවේ කන්නාඩිය යටින්ය. ඔහු උත්සාහ ගත්තේ 'න, ණ, ල, ළ' භේදය ගැන යමක් කියා දෙන්නටය.

"ළමයි මොකද මේ වාක්‍යය ගැන හිතන්නෙ?"

මහත්තයා පටන්ගත්තේ වැරැදි තැනකින්ය. වැරැදි ප්‍රශ්නයකින්ය. එතකොට පසුපස පේළියෙහි සිටි ඇට්ටර පහේ කොලුවෙක් නැඟී සිටියේ අත්දෙකම වනමින්ය.

"මහත්තය ඕකාව හමගහන්ට වටිනවා. ඕකා අසමජ්ජාති ගොනෙක් වෙන්ට ඕනෑ.. වැව්පිටියේ මෙච්චර මූර්ධජ තණ තියෙද්දි ඕකා මොකටද දන්තජ තන කන්ට ගියේ. වනචර ගොනෙක්.. ගස් බඳින්ට වටිනවා"

එතකොටම තවත් කොලුවෙක් තවත් පුරස්නයක් අහනවාය.

"මහත්තය වැව් පිටියෙ හිටියෙ ගම හාමිනේද? ගම දුවද? කවුරු හිටියත් තනනෙ.... අම්මාපල්ල ඕකාව ගස් බඳින්ටම වටිනවා"

එතකොට පිටිපස්සේ කොනේම ඩැස්කුවේ සිටි ඇට්ටරයා යළිත් වරක් මෙහෙම කියනවාය.

"ඕකා න, ණ, ල, ළ භේදය සලකන්නෙ නැති ගොනෙක් වෙන්ටෑ මහත්තයො"

ඒ ඇට්ටරයාගේ ඒ වචන හත අට ගැන නම් දුර දිගට හිතා බලන්ට වටිනවාය. ජයකොඩි මහත්තයා හිටියා නම් ගොන්නුන්ට සීනි බනිස් දී අක්ෂර වින්‍යාසය උගන්වනවාය. එහෙම වුණා නම් ගොන් ලා වැව් පිටියේ තණ කද්දී ගමගෙදර ඇත්තන්ට කරදරයක් නැතිව පලා නෙළන්ටත් නැතිනම් පොල්අතු වියන්නටත් ඉඩකඩක් ලැබෙනවාය.

ගොනුන් කෙසේ වෙතත් ආදරවන්තයින්ට නම් භාෂාව හොඳටෝම වටිනවාය.

ඒ කාලයේ පෙම් හසුන් කියා ජාතියක් තිබුණාය. හොඳම වචන සැට් එකක් තිබුණේ ඒ ලියුම්වලය. මේවාට හොර ලියුම් කියාද කියනවාය.

හොඳ හොර ලියුම් කාරයන්ට සිංහල සම්මානය සිම්පලයක්ය. ඒ කාලයේ කැලෑසිවල එහෙම හොඳ හොර ලියුම්කාරයන් සිටින්ට යෙදුණාය. තමන්ගේ පෙම්වතියට විතරක් නෙමේය. යාළුවන්ගේ පෙම්වතියන්ටත් දෙන්ට ලියුම් ලියා දෙනවාය.

'ඊයෙ ඉස්කෝලෙ ඇරිලා කුඩේ යටින් ඔයා යනකොට පුංචි වැහි බිංදුවක් පාවෙලා ඇවිත් කම්මුල උඩ වාඩිවෙලා මං පස්සෙන් තෙමි තෙමි එනව කියල ඔයාට කිව්වද?'

එහෙම කෑල්ලක් ලියාගන්ඩ පුළුවන් හොර ලියුම් කාරයන්ට සිංහල රචනාවෙන් ලකුණු ගන්න එක වැඩක් නෙමේය.

ඒ වුණාට භාෂාංග ගැන ඒ තරම් අවධානයක් නැති පෙම්වතියන් හින්දා පෙම්වතුන්ට මාර වැඩ වෙනවාය.

'මගේ ලපයට ඉක්මනට පලතුරු එවන්න'

පෙම්වතියගේ හොර ලියුම දුටු වේලාවේ ඉඳලා පෙම්වතා එහෙ දුවනවාය. මෙහෙ දුවනවාය. පලතුරු හොයනවාය. අඹ, දඹ, නාරං, කෙසෙල්, පැපොල් විතරක් නෙමේය. ආනමාළුද හොයන්ට යෙදුණාය. මේ පලතුරු කාපුවාම ෂුවර් එකටම ලපය මැකිලා යයි කියලා ඔහු හිතනවාය.

මහා පලතුරු කූඩයක් ඇවිල්ලා කියලා පියුං මහත්තයා කිව්ව වේලේ පෙම්වතියගේ හිත ගැස්සුණෝය. එහෙම එකක් ඉල්ලුවේ නැති හින්දාය. වහාම පෙම්වතාට මොබයිල් කෝල් එකක් දෙන්ට යෙදුණාය.

"ඇයි එවලා තිබුණෙ ලපයට පලතුරු එවන්ට කියල"

"අනේ සොරි... මට ඉස්පිලි දාන්ඩ බැරිවුණා.. සොරි මෙයා" පෙම්වතිය එහෙම කිව්වා කියලා තමාය කතාවේ තියෙන්නේ.

ඒ කතා යාං හෑලි තමාය. ඒත් භාෂාව ගැන හොඳ පාඩම් කියාදෙන හින්ද මෙහි සටහන් කරන්ට යෙදුණාය.

පසුගිය දවසක බුද්ධදාස ගලප්පත්තිගේ කෙටිකතා පොතක් දොරට වැඩියේ බණ්ඩාරානායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ මිහිලක මැදුරේය. එහිදී මහාචාර්ය ගංගානාත් දිසානායක හරි අපූරු දේශනයක් පවත්වන්නට යෙදුණාය.

ඒ තරුණ පෙම්වතුන් ගැනය. පේරාදෙණිය, ජයවර්ධනපුර, කොළඹ විශ්වවිද්‍යාල පෙම්වතුන් ජෝඩු පනහකට අධික සංඛ්‍යාවක් විමසුමට ලක්කරමින් කළ සමීක්ෂණයක ප්‍රතිඵල ඔහු එහිදී පවසන්ට යෙදුණාය.

ඒ සමීක්ෂණ අනුව නම් හොර ලියුම් ලියන එකම පෙම්යුවළක් හෝ ඉඳලා නැතිය. එසේම හුඟාක් පෙම්වතුන් මූණට මූණ බලාගෙන ඉන්ට කැමතිලු.. ඔඩොක්කුවේ හිස තියාන ඉන්ඩත් වැඩිය කැමති නැතිලු.

හැබැයි ඉතින් හොර ලියුම් ලියන්නේ නැති නිසා අක්ෂර වින්‍යාසය නිසා ඇතිවන පටලැවිලි ඔවුන්ට නැතුවා වෙන්ට ඇතිය. මොනවා වුණත් න ණ ල ළ භේදය හරි හැටි දැනගත්තොත් වැව්පිටියෙ ගොන්නුන්ට මෙන්ම සරසවි බිමේ පෙම්වතුන්ටද වරදින්ට විදියක් නැතුවාය. නැතිනම් ඔවුන්ට කන්ට වෙන්නේ තණකොළය.

බොහොම ඉස්සර දවසක ඒ කියන්නේ දිවයින පත්තරේ ඉන්න කාලෙ දවසක අමරදේවයන් මුණගැසෙන්නට ගිය වේලාවක අපූරු කතාවක් කියන්ට යෙදුණාය.

"සමහර අය හරි වැරදියටනෙ වචන කියන්නෙ.. තේරුමක් දන්නෙ නැති හින්දා වෙන්ඩ ඇති. සමහර දෙනා මෙන්න මෙහෙම කියනවා, 'පාරමිතා බල පූරිත පූරිත - බුද්ධ දිවාකරයාණෝ' ඒක කිසිම තේරුමක් නැති දෙයක්. ඒකෙ තියෙන්නෙ මෙහෙමයි. 'පාරමිතා බල පූරිත පූජිත'. 'පාරමිතා පිරූ හෙයින් පූජිත වූ' මේක ඉතින් ගීතවල වචන ගැන හිතන්නෙ නැති එකේ වැරැද්දනෙ"

අමරදේවයෝ මා සමඟ එහෙම කියන්ට යෙදුණාය. ඒ නුගේගොඩ අනුලා එක ළඟ වාසය කරන කාලයේ දවසකය.

එහෙම කිව්වාට මෙහෙමත් ගැයුමක් තිබෙනවාය. ඒ ගැන හුඟාක් දෙනා කතා කරලා තිබෙන හින්දා වැඩිපුර කතා කරන්ටත් වුවමනා නැතිය. ඒ වුණත් මෙහෙම සටහන් කරන එක වටිනවා කියලා හිතුණාය. 'පියඹා ආවා ප්‍රේම කුරුල්ලා - රත්නපුරේ හී කූඩු තනන්ටා'. ඒක වෙන්ට ඕනෑ මෙහෙමය. 'ස්වප්නපුරේ හී කූඩු තනන්ටා' කරුණාරත්න අබේසේකර ලිව්වෙත් එහෙමය. ඒ වුණාට බෙග් මාස්ටර් ට ඒක කියවෙන්නෙම නැතුව ගියාලුය.

"කමක් නෑ"

පස්සේ කට්ටිය එහෙම හිතුවාලුය. හැබැයි බෙග් මාස්ටර් එහෙම සිංහල උච්චාරණය කරන කොට පොඩි ගතියකුත් තියෙනවා ය. හරියට ජේ. ආර්.ගේ කතාව වගේය. "සංස්ථා.. මණ්ඩල්... වැඩි දියුණු කොරන්ට වුවමනායි"

හැබැයි ඔය සමහර ගුවන් විදුලි විතරක් නෙමෙයි ටී.වී. නංගිලා මල්ලිලා දිව නැමෙන විදියට වචන නමලා දෙනවාය. "ප්‍රධාන අමුත්තා විසින් සම්මාන ප්‍රධානය කරන ලදී.." කියන කොට හැමතැනම මහප්‍රාණය. ලියනකොට හැමතැනම මූර්ධජය. මූර්ධජ කියවලා පෙන්නන්ඩ බැරිය. ඒත් මහප්‍රාණ කියවලා පෙන්නන්ඩ පුළුවන්ය.

46 වන පිටුව බලන්න

# WANT TO BE A DOCTOR?

*THEN CONSIDER*

## ALL SAINTS UNIVERSITY
## SCHOOL OF MEDICINE

**416-839-6461**




LAST 2 YEARS **(CLINICAL ROTATIONS)** OF EDUCATION COMPLETED AT TEACHING HOSPITALS IN **USA & CANADA**

2 CAMPUSES TO CHOOSE: **DOMINICA ST. VINCENT**

PROVISIONAL ADMISSION WITH MIDTERM MARKS






**NOW ENTER DIRECTLY FROM HIGH SCHOOL TO MEDICAL SCHOOL**



**STUDY MEDICINE AT ALL SAINTS UNIVERSITY**

**CALL TO REGISTER: 1-866-602-9555 or 416-743-9222**

**For our 10th Anniversary in operation, All Saints University will offer 50% tuition fee scholarship plus an additional 25% interest free loan, which is payable at the end of the program. MCAT preparatory classes in Toronto will be of one year duration only (three semesters)**

## Saliroo Creations

All Your Publishing Needs
under one roof

**Graphics**
Illustrations, Logos,
Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

**Web Sites**
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

**Computer Repairs**
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

**ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා**
**Tel : 416 201 0628**



## French Tutoring

Individual and small group classes for French learners'French reading, writing, and conversing'Any grade from grade 1-12, university minors and French Immersion

**Kumudu Abeywardena,** B.A
(Modern Languages), Dip (AFC)
**T.P - 647 824 1897**



## MARRIAGE PROPOSALS

Sister living in Toronto seeks an Educated partner (below 35 years), for her younger sister, Academically/professionally qualified, 30 years old, 5`6", B.Sc (Eng) at SLITT, MBA at University of Moratuwa, Working for a leading Telecommunication company in Colombo as a Senior Engineer IT and owns substantial assets.

Kindly contact at **Maheeka266@gmail.com**


## පිළිකාව...

28 වන පිටුවෙන්

යම් අයෙකු තුළ එකී නිෂ්ක්‍රීය පිළිකා සෛල වර්ධනය වී පිළිකා රෝගය හටගන්නේ නම් එම පුද්ගලයා පෝෂණ දුර්වලතාවයෙන් පෙළෙන බව පෙන්නුම් කරයි. මෙකී දුර්වලතා ඇතිවීමට පාදක වන්නේ එක්කෝ ජානමය සම්බන්ධතාවන් මත හෝ එසේ නැතහොත් පාරිසරික හේතු හෝ වැරැදි ආහාරපාන වර්ග හෝ වැරැදි ජීවන චර්යා ආදිය හේතු කොටගෙනය.

ඉහත කී පෝෂණ මන්දතාවයෙන් මිදීම උදෙසා නිවැරැදි පෝෂණ ගුණයෙන් යුත් පූර්ණ ආහාර වේල් කිහිපයක් එනම් දිනකට හතර පස් වේලක්ම ලබාගැනීම ආරම්භ කළහොත් එවන් පුද්ගලයෙකු තුළ නිසි ප්‍රතිශක්තිය වර්ධනය වීමෙන් පිළිකා සෛල නිෂ්ක්‍රීය වන්නේය.

විකිරණ ධාරා ප්‍රතිකාරය නිසා වේගයෙන් වැඩෙන පිළිකා සෛල මර්දනය වන බව සැබෑය. එහෙත් ඒ ක්‍රියාවලිය තුළින්ම එවන් පුද්ගලයෙකුගේ ශරීරයේ ඇති නිරෝගී ප්‍රධාන ඉන්ද්‍රියයන් වන අක්මාව, වකුගඩුව, හෘදය, පෙනහළු ආදියත් එසේම වැදගත් පටකයන් වන අස්ථි මජ්ජා සහ ජීර්ණ පද්ධතිය ආදියත් ක්‍රමයෙන් ක්‍රියා විරහිත වී හෝ විනාශ වී යන්නේය.

ඉහත කී ලෙස විකිරණශීලී ධාරා ප්‍රතිකාරය නිසා පිළිකා සෛල විනාශ වීම සමග ශරීරයේ පවතින නිරෝගී පටක සෛල සහ වෙනත් ඉන්ද්‍රියයන්ටද හානි සිදු වන්නේය.

බටහිර ඖෂධ මගින් හෝ විකිරණ ධාරා ප්‍රතිකාර කරන මුල් වකවානුව තුළ පිළිකාව බොහෝ දුරට විනාශ වී යන බව සැබෑය. ආරම්භයේදී එසේ වුවද නිරතුරුවම එකී ප්‍රතිකාර කිරීම නිසා ශරීරය තුළ ප්‍රතිරෝධයක් ඇති වී අලුතින් හටගන්නා පිළිකා සෛල හෝ ගැටිති විනාශ වීමේ වේගය අඩාල වන්නේය.

පිළිකා ප්‍රතිකාරය උදෙසා ලබාදෙන ඉහත කී විකිරණ ධාරා හෝ රසායනික ඖෂධ හේතු කොටගෙන ශරීරය තුළ හටගන්නා විෂ (ධූලක) නිසා ස්වභාවයෙන් ශරීරය තුළ පවතින ප්‍රතිශක්තියට හානි කරවන්නේය. එසේ නැතහොත් ප්‍රතිශක්තිය හීන කරවන්නේය. එමනිසා වෙනත් විෂබීජයක් හෝ රෝග කාරකයක් ඇතුළු වූ පමණින් එය මෙවන් රෝගියෙකුට නිතැතින්ම බෝ වන්නේ යශ්‍රී එසේම එවැනි රෝග නිසා ඇතිවන භයානක අතුරු ප්‍රතිඵලවලට ගොදුරු වන්නේය.

විකිරණ ධාරා හෝ රසායනික ඖෂධ ප්‍රතිකාරවලින් පසු ඉතිරිවන පිළිකා සෛල එකී ප්‍රතිකාරයට ප්‍රතිරෝධය ඇති කර ගැනීම හේතු කොටගෙන සෛල තුළ ශක්ති විපර්යාසයක් (mutation) ඇති වේ. මේ නිසා ඊළඟ ප්‍රතිකාර වටයේදී ප්‍රථමයෙන් ප්‍රයෝග කරන ලද ඖෂධ හෝ විකිරණවලින් නිසි පිළියම් නොලැබෙන හෙයින් වඩාත් සැර ඖෂධ අවශ්‍ය වේශ්‍රී එසේම ශල්‍යකර්ම නිසා ඇතිවන තුවාල නිසා මෙන්ම ලේ ගැලීම් ආදිය හේතු කොටගෙන පිළිකා සෛල වෙනත් ඉන්ද්‍රියයන් වෙත පැතිර යෑමේ අවදානම වර්ධනය වේ.

මාගේ අත්දැකීම් අනුව, පිළිකා සෛල විනාශ කිරීමට නම් එකී සෛල තුළට ලබා දෙන පෝෂණය වළකාලිය යුතුය. එනම් පිළිකා සෛල 'හාමතේ' තැබිය යුතුය. එවිට ඒවායේ වර්ධනය අඩාල වේ.

### පිළිකා සෛලවලට පෝෂණය ලැබෙන්නේ පහත දැක්වෙන ආහාරවලිනි.

- සීනි හෝ සීනි වෙනුවට යොදා ගන්නා (aspartame) වැනි රස කාරක වර්ග.
- ඇතැම් ලුණු වර්ගවල සුදු පැහැය වැඩිකිරීමට යොදාග න්නා රසායනික වර්ග
- එළකිරි නිසා සෙම ඇතිවේ. සෙම පටල පිළිකා වර්ධනයට රුකුලකි. සෝයා කිරි නිසා පිළිකා මර්දනය වේ.
- අම්ල අධික පරිසරයක් පිළිකා වර්ධනයට යහපත්ය. මස් වර්ග ආහාරයට ගන්නා අයගේ ආම්ලික ගතිය වැඩිය. එසේම සත්ව ගොවිපළවල මස් වර්ග වැඩියෙන් නිපදවීමට හෝමෝන වර්ග භාවිත කෙරේ. ඒවා මිනිසාට විශේෂයෙන්ම පිළිකා රෝගීන්ට අහිතකරය. මාළු වර්ග සෑම අතින්ම යහපත්ය.
- අම්ලවලට ප්‍රතිවිරුද්ධ එනම් යහපත් ක්ෂාරීය පරිසරයක් නිපදවන ආහාර ලෙස එළවළු, පලතුරු, ඇට වර්ග, ධාන්‍ය වර්ග ආදිය බහුලව ඇති ආහාර සුදුසුය. පලතුරු යුෂ ඉතා සුදුසු වේ. එසේම අමුවෙන් ආහාරයට ගත හැකි පලා වර්ග ඉතා යෝග්‍ය වේ. සෙන්ටිග්‍රේඩ් 40 (එනම් ෆැරන්හයිට් 104) උෂ්ණත්වයේදී ඉහත කී පලා හෝ පලතුරුවල ඇති හිතකර එන්සයිම විනාශ වේ.
- කෝපි, තේ සහ චොකලට් ආදියෙන් හැකිතාක් ඈත විය යුතුය. ග්‍රීන් තේ වඩා හොඳය. සියල්ලටම වඩා පිරිසිදු ජලය හොඳය. ලවන ලෝහ මිශ්‍ර වූ පයිප්ප ජලයට වඩා යහපත් වන්නේ පිරිසිදු ළිං ජලයයි.
- මස් වර්ග දිරවීම අපහසුය. නොදිරවූ ආහාර පිළිකා වර්ධනයට සුදුසු විෂ වර්ග ඇති කරවය.
- නිර්මාංශ හෝ ස්වල්ප වූ මස් ප්‍රමාණයක් ආහාරයට ගන්නා පුද්ගලයන්ගේ ශරීරය තුළ පිළිකා සෛල විනාශ කිරීමේ බලයක් ඇති එන්සයිම වර්ග බිහි වේ.
- ශරීර ප්‍රතිශක්තිය වර්ධනය කිරීමට ඇති IP6, Florssence, Essiac, anti-oxidants, vitamins, minerals, EFAs වැනි රසායනික ද්‍රව්‍ය සහ විටමින් සහිත ආහාර නිසා පිළිකා සෛල වර්ධනය අඩාල වේ.
- පිළිකා යනු මනස, ශරීරය සහ ජීව ගුණය (spirit) යන ත්‍රිත්වයම යටපත් කරවන රෝගයකි. ජීව ගුණය ශක්තිමත් අය තුළ පිළිකා වර්ධනය බාල වේ. සමාව නොදීම සහ අප්‍රිය භාවය නිසා ශරීරය තුළ ක්ලමථය (stress) සහ ආම්ලිකත්වය වර්ධනය වේ. සමාව දෙන්න. ආදරය කරන්න. සතුටින් සහ සාමයෙන් ජීවත් වන්න.
- ඔක්සිජන් යනු පිළිකා සතුරෙකි. සිරුරට ඔක්සිජන් වැඩියෙන් ලබා ගැනීමට වැඩියෙන් ව්‍යායාමයන්හි යෙදෙන්න.

### පහත සඳහන් අනතුරුකාරී දේවලින් ඈත් වන්න.

- මයික්‍රොවේව් උදුනේ ප්ලාස්ටික් භාජන නොදමන්න.
- මයික්‍රොවේව් උදුනේ ප්ලාස්ටික් ඔතනයන් නොයොදන්න.
- ප්ලාස්ටික් වතුර බෝතල් deep freezer නොකරන්න.
- ආහාර වසා තැබීමට ප්ලාස්ටික් කවර නොව රෙදි කඩක් භාවිත කරන්න.

## ගොනා තණ...

44 වන පිටුවෙන්

'ලැම විතරක් ලොවට පෙනෙන-ලය නොපෙනෙන ළඳුනේ' ගයන කොට ඕකේ වෙනසක් නැතුවාය. එහෙත් ඒත් ඔය විදියට ලිව්වොත් නම් ජයකොඩි මහත්තයාගෙ න් දොඹගෙඩි ටොක්කක් කන්ඩ යෙදෙනවාමය. ලය තියෙන්නේ ගීතවලය. ඒක ඇහෙනවා මිසක පෙනෙන්නේ නැත. කාන්තාව එකම ගීතයක් තමාය. දුප්පත්කමට ඇඟ විකුණන කාන්තාව එකම දුක් ගීතයක් තමාය. ඒ වුණාට රන්බණ්ඩා සෙනෙවිරත්න මෙතන ලියා තිබෙන්නේ 'ළය' හෙවත් හද ගැනය. එසේම ළඳුනේ කිය කියා යන්ට වෙන්නේ කැළෑවලටයශ්‍රී ලඳු කියන්නේ පුංචි කැළෑවල්වලට හින්දායශ්‍රී කැළෑ පඳුරුවල නම් ළයක් තබා ලයක්වත් තිබෙන්ට පුළුවන්කමක් නැතුවාය. එය 'ළඳුනේ' විය යුත්තේමය.

එහෙම භාෂාව හසුරුවන ලෝකයක ගොනුන් තන කෑවාට කාටවත් මොකුත්ම කියන්ට දෙයක් නැතුවාය.

ඒ වුණාට ජයකොඩි මහත්තේලාට පිංසිදුවන්නට ගොන්නුත් භාෂාව ඉගෙනගෙන තියෙනවාය. ඒක හින්දා ඔය අසමජ්ජාති ගොනෙක් දෙන්නෙක් 'තන' කෑවාට හුඟාක් ගොනුන් කන්නේ 'තණ' ය. ඒක හින්දා ගොනෙක් දැක්ක ගමන් බවලත් උදවිය බයවෙන්ට කාරණා නැතුවාය. මොනවා වුණත් බේරාගන්ට උඩතුත්තිරිපිටියේ ජයකොඩි මහත්තේලා අදටත් ඉන්නවාය.

# Tutoring

## From Grade 08 to 12

| Mathematics<br>Physics<br>Programming<br>(Java, C#) | Grade 12 Mathematics<br>Advance Functions<br>Limits<br>Calculus |
| --- | --- |

- Supporting for homework and tests
- Full attention for improving knowledge
- Home Visits possible

**Experience and qualified teacher for excellent results**

Contact
Kithsiri Jayasinghe
(BSc. , MSc. Mathematics & Comp. Science)

Email: jayakithsiri@hotmail.com
Phone: (416) 745-6675, (647) 705-1606



# If you are Buying or Selling For a Reliable Inspection

## Yohan De Mel
Certified Home Inspector



TEL:
416 885 4625

E-Mail
nirhanhomeinspections@gmail.com

Nirhan Property Inspection Services



# BRISK INTERNATIONAL CARGO INC
Worldwide Movers

Any Document Shipping worldwide
DHL EXPRESS

AIR-SEA-LAND

## Household Goods & Commercial Cargo
## Packing / Relocation / Transport / Express delivery
DELIVERY SERVICE ALL PART OF SRI LANKA (GIFT PACK)

Warehouse In Colombo
LAKSIRI SEVA (PVT) Lid
66 New Nuge Road,Peliyagoda
Kelaniya
Tel: 11-257-4180

Kurunegala Warehouse
Laksiri Seva (PVT)Lid
118/96 Negombo Road
Malkaduwawa
Kurunegala
Tel : 037-2052-810

Warehouse In Batticaloa
LAKSIRI SEVA (PVT)Lid
26,Hmyl Lane
Main Street,Addapalam
Ninthavur
Tel : 0672051050

**Toronto: - 416-321-0400**

Proud member of
IAM International Association Of Movers
CIMC Canadian International Movers Club

Ajax / Whitby - Mr.Prasad,1-289-200-4288

Ottawa : Kannan -1-613-828-2221 Montreal: Uthayan -1-514-736-2525

Web:www.briskcargo.com Email: info@briskcargo.com

919 Ellesmere Road Suite # 306 M1P2W7

# බුද්ධාභිවන්දනා 2016

## සදහම් සිසිලෙන් නැහැවෙන කැනඩාවේ අදත කෙළවරයේ...

දුකේදී එකා මෙන් එකට එක්ව උදවු උපකාර කිරීමේ උතුම් ගුණය බාල, තරුණ, වැඩිහිටි සියලු දෙනා අතරම ඉතිරීව තිබුණේයශ්‍රී ඒ හිතවත්කමට සබැඳියාවට ජාති භේද, ආගම් භේද නොතිබුණේයශ්‍රී රෝගී හිතවතකුට, හිතවතියකට පිරිත් සජ්ඣායනා කර සෙත් පැතීම සහ තිසරණ ගුණ සිහිපත් කොට බුද්ධ පූජා පවත්වා සෙත් පැතීම ආදි කාර්යයන්හිදී සියලුදෙනාම බැති සිතින් එක් රොක් වූහ.

මෙසේ එකතු වූ සෑම දිනකම තරුණ, වැඩිහිටි සියලුදෙනාගේම කතාබහට බඳුන් වූ කරුණක් වූයේ අපගේ පුංචි දුවා දරුවන්ට දහම් අධ්‍යාපනය ලබන්නට, බුද්ධ පුත්‍රයාණන් වහන්සේ නමකගෙන් බණ පදයක් අසන්නට, ධර්ම සාකච්ඡා පවත්වන්නට, සීල-භාවනා පුරුදු පුහුණු කරන්නට සහ වෙසක් සැරසිල්ලක් සියතින්ම සාදා අර්ථවත්ව බුදු තෙමගුල සමරන්නට අවස්ථාවක් උදා කරගන්නේ කෙසේද යන්නය. වසර ගණනාවක් මුළුල්ලේ සාකච්ඡාවට බඳුන් වූ මෙම කරුණු කාරණාවල අග්‍රඵලය ලෙස, බුද්ධ වර්ෂ 2559 මැයි මස 07 වන දින සියලු ශ්‍රී ලාංකේය ආගම් සහ ජාතීන් නියෝජනය කරමින් නිව්ෆවුන්ඩ්ලන්ඩ් හා ලැබ්‍රඩෝ හි ආරම්භ කිරීමට යෙදුණු 'ශ්‍රී ලංකා බෞද්ධ සහ සුභාශිංසන එකමුතුව' හඳුන්වා දිය හැකිය.

### බුද්ධාභිවන්දනා 2016 (පළමු අදියර)

මෙසේ ආරම්භ කරන ලද සංසදයේ පළමු කාර්යය ලෙස පෙළ ගැසෙන්නේ 'බුද්ධාභිවන්දනා 2016 - ප්‍රදර්ශනය සහ බුද්ධ පූජා' වැඩසටහනයි. මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වූයේ සියලු දෙනාම පොදු අරමුණක් වෙනුවෙන් ගොනු කර ගැනීම සහ කාලයක් මුළුල්ලේ අපගෙන් ඈත්ව යමින් තිබූ බොදු වත් පිළිවෙත් සහ සැරසිලි පිළිබඳ කුඩා දරුවන් සහ බොදු පසුබිමක් නොමැති හිතවතුන් දැනුවත් කිරීමය.

දීර්ඝ කාලයක් මුළුල්ලේ ධර්මය ඇසුරු කළ, මනා දැනුමකින් යුත් සිසිර ද සිල්වා මහතාගේ නායකත්වය සහ මඟ පෙන්වීම මෙම වැඩසටහන්වල සාර්ථකත්වය කෙරෙහි මහඟු උපකාරයක් වූවා සේම තරුණ පිරිස්වල දායකත්වය මෙම කාර්යය සඳහා උපරිමයෙන් ගොනු කර ගැනීමට අප සංසදයේ ලේකම්තුමිය වන රසාංජලී සමරකෝන් මෙනවිය දැක්වූ කුසලතාව සියලුම සාමාජිකයන්ගේ ප්‍රශංසාවට ලක් විය. දිවා කාලයේ විශ්ව විද්‍යාලයේ දේශනවලට සහභාගි වී සවස් කාලයේ සහ සති අන්තයේ සුළු රැකියාවල නිරතවන අතරතුර තරුණ තරුණියන්ද, වැඩිහිටියන්ද ඇතැම් අවස්ථාවල කුඩා දරු දැරියන්ද රැය පහන් වනතුරු වෙසක් කූඩු සහ සැරසිලි නිර්මාණය කිරීමට දැරූ කැපවීම දකින විට සිතට දැනුණේ ගමේ පන්සල සෙවණේ ගෙවුණු අතීතය යළි පුනරාගමනයක් ලබා ඇති බවය.

මෙසේ මහන්සි වන තරුණ තරුණියන් හට ධර්ම කරුණු කියා දෙමින් පුංචි පුංචි ධර්ම සංවාද පැවැත්වීමට ලේකම්තුමිය දැරූ ප්‍රයත්නය ඉරු දින දහම් පාසලක සිරියක් එක් කරන ලද්දාය. මෙසේ සියලු දෙනාගේම දායකත්වයෙන් නිර්මාණය කරන ලද වෙසක් සැරසිලි, වෙසක් තොරණ, බෞද්ධ වෙහෙර විහාර ආකෘති ආදි සියලුම අංගයන්ගෙන් සැදුම් ලත් ප්‍රදර්ශනයක් බුද්ධ වර්ෂ 2559 හි පොසොන් පුර පසළොස්වක පොහෝ දින සෙන්ට් ජෝන්ස් හි මෙමෝරියල් විශ්වවිද්‍යාල (Memorial University of Newfoundland) භූමියේදී පවත්වන්නට යෙදුණේය. මෙම ප්‍රදර්ශනයට සමගාමීව බුද්ධ පූජා වැඩසටහනක් හා දන්සලක්ද සංවිධානය කෙරුණ අතර මේ සියලු කටයුතු සඳහා හැලිෆැක්ස් (Halifax) විහාරවාසී පූජ්‍ය බඳගිරියේ සිරිනන්ද ස්වාමීන් වහන්සේගෙන් ලැබුණු ගුරුහරුකම් සහ මඟ පෙන්වීම නමස්කාර පූර්වකව සිහිපත් කළ යුතුය. මෙම වැඩසටහන පැවති දිනයේම හැලිෆැක්ස් විහාරයේදී නිවාස නොමැතිව ජීවත් වන පිරිසක් උදෙසා දානය ලබාදීමේ මහා පුන්‍යකර්මයක් පැවති බැවින් අප නගරය වෙත වැඩම කිරීමට නොහැකි වුවද අප කෙරෙහි මෙත් කරුණාව හෙලූ පූජ්‍ය බඳගිරියේ සිරිනන්ද ස්වාමීන්වහන්සේ ස්කයිප් (skype) තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වෙමින් බුද්ධ පූජා කටයුතු මෙහෙයවන ලදහ. මෙසේ අති සාර්ථක ලෙස කිරීමට යෙදුණ බුද්ධාභිවන්දනා 2016 පළමු අදියර CBC මාධ්‍ය ජාලය විසින්ද වාර්තා කර තිබීම අප ලද ජයග්‍රහණයකි.

### බුද්ධාභිවන්දනා 2016 (දෙවන අදියර)

සාර්ථකව අවසන් කළ පළමු වැඩසටහන ප්‍රදේශවාසී ලාංකේය ප්‍රජාව තුළ විශාල බොදු පිබිදීමක් ඇති කිරීමට සමත් විය. සියලුදෙනාගේ මීළඟ ඉලක්කය වූයේ අමා මෑණී බුදු පියාණන් වහන්සේ දේශනා කර වදාළ අරි-අට මඟ ඔස්සේ යමින් ධර්මය ප්‍රගුණ කරන භික්ෂූන් වහන්සේ නමක් අප ප්‍රදේශයට වැඩම කරවා සීල, භාවනා, ධර්ම සාකච්ඡා ආදි වැඩසටහන් මාලාවක් පැවැත්වීමය. ඒ සඳහා හැලිෆැක්ස් විහාර වාසී පූජ්‍ය බඳගිරියේ සිරිනන්ද ස්වාමීන්වහන්සේගේ කැමැත්ත ලැබීම අප ලද මහත් භාග්‍යයකි.

මෙම වැඩසටහනට පාසල් හා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ සහභාගිත්වය පහසු කරවීමට පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු සමය යොදා ගන්නා ලදී. දෙදිනක් පුරා පැවති මෙම වැඩසටහන දාන, ශීල, භාවනා, ධර්ම දේශනා හා ධර්ම සාකච්ඡා ආදි පින්කම් රාශියකින් සමන්විත වූ අතර දශක ගණනකට පසු තම නිවෙස්වලට සංඝයා වහන්සේ නමක් වැඩමවා සිවුපසයෙන් සංග්‍රහ කිරීමට අප සියලු දෙනාටම අවස්ථාව උදා විය. වඩාත්ම වැදගත් කරුණ වූයේ දැක බලා වැඳ නමස්කාර කිරීම උදෙසා කඨින චීවරයද අප ස්වාමීන් වහන්සේ විසින් අපගේ ප්‍රදේශයට වැඩමවා තිබීමය. ඉතිහාසයේ ප්‍රථම වතාවට අප ප්‍රදේශය, අප නිවෙස් උතුම් වූ කඨින චීවර වහන්සේ නමකගේ පහස ලැබූයේ මේ පිංකමට සමගාමීවය. බුද්ධාභිවන්දනා 2016 දෙවන අදියර අවසන් කරනු ලැබුයේ අප සියලුදෙනා හට කෙටි කලකට පුද පූජා පැවැත්වීම සඳහා කඨින චීවරයද ලබා දෙමිනි.

### කඨින චීවර වන්දනාව

පූජ්‍ය බඳගිරියේ සිරිනන්ද ස්වාමීන්වහන්සේ විසින් අප හට ලබා දුන් කඨින චීවර වහන්සේ වඩා හිඳුවා වතාවත් කිරීම සඳහා විශේෂිත කුටියක් නිර්මාණය වන්නේ අප සංසදයේ සභාපති සිසිර ද සිල්වා මහතා සහ එම මැතිනියගේ දෑතිනි. පන්සලක් සේ සැදැහැ සිතින් නිවැරදි වත් පිළිවෙත්වලින් යුතුව කඨින චීවර වහන්සේට පුද පූජා පවත්වන අප සභාපති තුමන් මෙහි සිටින සියලු ලාංකේය සැදැහැවතුන් වෙතද එම අවස්ථාව උදාකර දෙමින් සියලු දෙනාගේ නිවෙස් වෙත කඨින චීවරය වඩම්මන ලද්දේය. ඒ සෑම අවස්ථාවකදීම නිවැරදි වත් පිළිවෙත් අනුගමනය කරමින් විනයානුකූලව කඨින චීවරය වැඩමවීම සහ වන්දනාමාන කටයුතු කිරීමේ භාරදූර කාර්යය සියලුදෙනා ඉතා සැදැහැ සිතින් ඉටු කළෝය.

මීට මාස ගණනකට ඉහතදී පිරිසක් ලෙස එකට එකතුව බොදු වන්දනාමාන කිරීමට පහසුකමක්වත් නොතිබුණු අප ප්‍රදේශවාසීන් අද දවසේ කඨින චීවර වහන්සේ නමක් නිවසට වඩමවා පුද පූජා පවත්වන දෙස දකින කල මා හට සිහියට නැගෙන්නේ ධම්මපදයේ අප්පමාද වග්ගයේ සිවුවන ගාථාවය.

උට්ඨාන වතෝ සතිමතො
සුචි කම්මස්ස නිසම්ම කාරිනෝ
සඤ්ඤතස්සන ධම්ම ජීවිනෝ
අප්පමත්තස්ස යසෝභි වඩ්ඩති

උත්සාහයෙන්, මනා සිහියෙන්, යහපත් ක්‍රියාවෙන්, හොඳ නරක ක්‍රියාවල ප්‍රතිඵල විමසා බැලීමෙන්, සිතේ සංවර බවින් අප්‍රමාදව දැහැමිව ගත කරන ජීවිතය තුළ යසස වැඩේ.

**සටහන - සාමාජිකයකුගේ නෙතිනි.**
**බෞද්ධ සහ සුභාශිංසන එකමුතුව**
Newfoundland and Labrador

---

## අපාය හා දිව්‍ය...

39 වන පිටුවෙන්

හිටිහැටියේම මේඝ ගර්ජනා නැගිණ අකුණු පිපිරින, චන්ඩ මාරුතයක් නැඟින. මහවැසි ඇද හැලින. තොටියෝ යුහු යුහුව ඔරු දෙක එගොඩ මෙගොඩ පදවන්නට වූහ. දෙමිතුරන් එකිනෙකා හඳුනාගත හැකි තරමට ඔරු ලංවීය. අවාසනාවක මහත. චන්ඩ රළක් නැගිණ. එකිනෙකාට කථා කරන්න ඉඩක් නොතබා ගඟ දිය රැලි නංවා ඔරු දෙක පෙරළා දැමීය. මිතුරන් දෙදෙනාම ජල රකුසාට බිලිවිය.

ඊළඟ මොහොතේ ඔවුන් දෙදෙනා හමුවූයේ භූතාත්ම ලෙසිනි. ඔවුන් එකිනෙකා හඳුනා කතා කරන්න සැරසුණා පමණි ඔවුන් අසලම ප්‍රාදුර්භූත වූ නිලධාරීන් දෙදෙනකුගේ වෙස් ගත් අයවළුන් දෙදෙනකු සරත් චන්ද්ගේ අතින් අල්ලා ඔහු තමන්වෙතට ඇදගෙන යන්නට වූහ. 'කොහෙද මාව ඇදගෙන යන්නෙ' සරත් චන්ද් ඇසීය. 'නිරයට' කෙළින්ම පිළිතුරු ලැබිණ.

වික්ෂිප්ත වූ රාම් කට ඇර යමක් අසන්නට සැරසුණා පමණි. පෙර පරිදිම පහළ වූ දෙදෙනෙක් ඔහුද වෙනතකට ඇදගෙන යන්නට වූහ. ඉඩ ලද පළමු මොහොතේම රාම්ද ප්‍රශ්න නැගීය. 'කොහෙටෙද මාව ගෙනියන්නේ'. 'දිව්‍ය ලෝකයට...' පිළිතුරු ලැබිණ. රාම් කතා කළේය. 'මේ අහන්න ඔබලාට ලොකු වැරදීමක් වෙලා. දිව්‍ය ලෝකයට ගෙනයනවා නම් ගෙනගිය යුත්තේ මා නොව සරත්වයි. මන්ද මිය යන්නට පෙර මා සිටියේ ප්‍රිය සාදයකට සහභාගි වී කෑමෙන් බීමෙන් නැටීමෙන් යුතුවයි. ඒත් මගේ මිතුරා සරත් ඔහු සිටියේ කෝවිලක ආගමික පූජාවකට සහභාගි වෙමින් කුසල් රැස් කරමිනුයි'

එවර කතා කළේ නිලධාරීන් වෙසින් සිටි දේව දූතයින් දෙදෙනාය. 'ඔබ හරි සත්‍ය කථා කිරීමත් ඔබගේ යහ ගුණයක්. ඒත් අපට වරදින්න බැහැ. මිනිස්සු දෙබිඩි චරිත රඟපෑවට අපට බොරු කරන්න ඒ අයට බැහැ. අහගන්න සත්‍ය කතාව මෙන්න මේකයි. ඔබේ යහළුවා ඔබ කී පරිදි කෝවිලේ සිටි බවත් භජන් පූජාවට සහභාගි වූ බවත් වැදුම් පිදුම් කළ බවත් ඇත්ත. ඔබ දන්නවාද ඒත් එයාගේ හිත තිබුණේ ඔබ ගිය ප්‍රිය සාදයේ. අනේ මං වගේ මෝඩයෙක් කෝවිලට නම් කවදා එන්න බැරිද දෙවියන් ඕන වෙලාවක නැමදිය හැකියි. ඒත් ප්‍රියසාද හැමදාමත් තියෙනවාද. රාම් සමග ගියා නම් හිතේ හැටියට කෑම ජාති බීම ජාති නැටුම් ගැයුම් වැයුම් ලස්සන කෙල්ලො. අනේ මම වගේ මෝඩයෙක් ඔන්න ඔය විදියට තමා එයා හිතුවෙ. ඒත් ඔබේ සිතුවිලි ඊට වෙනස් වුණා. අනේ මම වගේ මෝඩයෙක් මේ කෑම බීම නැටුම් ගැයුම් වල ඇති තේරුම කුමක්ද. ඉන් ලැබෙණ සුගතිය කුමක්ද? සරත් චන්ද් සමග ගියා නම් මොනතරම් සැනසීමක් හිතට ළඟා කරගන්න තිබුණද ජීවිතයේ අර්ථය ධර්මයම නොවේද? කුසල් රැස් කරගත හැකි වෙලාව මම අතහැරියා නේද? ඔන්න ඔය වැනි අදහස් තමා ප්‍රිය සාදය පුරාම ඔබේ හිතේ බල පැවැත්වූවේ, කොටින්ම ඔබ ගතින් ප්‍රිය සාදයේ සිටියත් හිතෙන් හිටියේ කෝවිලේ භජන් පූජාවේ. ඒ වගෙම තමයි මතක තියාග න්න සරත් චන්ද් ගතින් කෝවිලේ සිටියත් එයා මානසින් සිටියේ ප්‍රියසාදයේ බව ඔන්න ඔතනයි වෙනස'

බෞද්ධ. සංස්කෘත, ජපන් හා බටහිර සාහිත්‍යාංග ඇසුරුකරමින් රචිත මේ ලිපියෙන් ඔබට දෙව්ලොව හා අපාය ගැන අලුත් චිත්ත රූපාවලියක් මවා ගැන්ම අපහසු නොවන බව වගේ විශ්වාසයයි. යා යුතු ස්ථානය හා මාර්ගය පැහැදිළිය. තෝරා ගැනීම හා ක්‍රියාවට

---

## චුල්ල ධනුද්ධර...

41 වන පිටුවෙන්

ඔහුට සමාව දුන මැනවි'

කුමරිය තම සැමියාගෙන් කරන ඉල්ලීම ඉටුකිරීම පිළිබඳව යුක්ති යුක්ත බව සිහිකිරීම නිසා සිදුවන තත්පර කිහිපයක ප්‍රමාදයෙන් ප්‍රයෝජන ගන්නා වැදි රජු කුමරිය අතින් කඩුවගෙන ඇගේ සැමියා මරයි.

නාට්‍යයකට උචිතවන අයුරින් එම අවස්ථාව නිරූපණය කිරීමේදි ජාතක කතාව ශ්‍රවණය කරන ශ්‍රාවකයාගේ මනෝමය සිතුවමට වඩා සන්දෘෂ්ටික චිත්‍රයක් ප්‍රේක්ෂකයා ඉදිරියෙහි නිර්මාණය වේ.

ජාතක කතාකරුවා ගොඩනැගූ කුමරියගේ චරිතයට වඩා නාට්‍යකරුවා බිහිකළ මනමේ කුමරිය නම් වූ ගැහැණිය වඩාත් සංවේදීතාවයකින් යුතුව ප්‍රේක්ෂකයාගේ මනෝමය අධිකරණයට සම්ප්‍රාප්ත වේ. ඇගේ සාධාරණත්වය විනිශ්චය කිරීමේ අයිතිය හා වගකීම ජාතක කතාකරුවා මෙන් තම ඒකාධිකාරයට යටත් නොකොට ජනතා විනිශ්චයකට පැවරීම නාට්‍යකරුවාගේ විශිෂ්ට ගුණයකි.
















## බුද්ධාභිවන්දනා 2016



































# www.dasatha.com

## දසත වෙබ් අඩවිය නව මුහුණුවරකින්...




දසත පුවත් සේවාව ඔබ වෙත තවත් සමීප කරමින් www.dasatha.com වෙබ් අඩවිය නව මුහුණුවරකින් එළි දක්වා ඇත.

දසත නව වෙබ් අඩවියට පිවිසීමෙන් එතෙරෙ මෙතෙර විශේෂ පුවත්, කාලීන ලිපි, කලා පුවත්, විනෝදාත්මක තොරතුරු සමග සුපුරුදු දසත පුවත්පතද ඔබට ලබාගත හැක.

## දසත ඔබේ නිවසටම

සෑම මසකම දසත පුවත්පත ඔබේ නිවසටම තැපැල් මගින් ගෙන්වා ගැනීමේ අවස්ථාව දැන් සලසා ඇත.

**දසත දායකත්ව ගාස්තු**
**Subscription Rates for Dasatha**

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

Please make all Cheques payable to **Dasatha Publications**

**www.dasatha.com**

RE/MAX Diamond
Realty Inc., Brokerage
Independantly Owned and Operated




**IT IS A FANTASTIC TIME TO INVEST IN REAL ESTATE**
**LET ME HELP YOU GET STARTED!!**

**CALL DAN!**

ATTANA KUMBURE GEDARA
SALES REPRESENTATIVE
Mobile: (647) 995-3391
Office: (416) 235-2500
danAKG.realtor@gmail.com
www.danakg.ca



REALTOR® MLS MULTIPLE LISTING SERVICE®

# BEYOND YOUR EXPECTATIONS !

**Residential & Commercial**
## Real Estate

proud sponsor of Children's Miracle Network

**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.



**Stuck with new mortgage rules ?**
**Only have 5% DOWN ? No problem!**

I will guide you through obtaining your
DREAM HOME
through my proven system!

# Gamini Abeysinghe. ABR, CNE
## Real Estate Sales Representative

RE/MAX 100% Club Award
2014, 2013, 2011, 2010

RE/MAX Platinum Club Award
2015, 2012

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

RE/MAX HALL OF FAME

RE/MAX Diamond Realty Inc., Brokerage

A member of CanLanka BUSINESS ASSOCIATION

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

## Call me Today !

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.
Join the many happy home owners I've helped and find the perfect home for you!

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828
1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

**www.gaminiabeysinghe.com**

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements